

රන්දෝනු
හලදිව ප්‍රකාශකයෝ
ර- අනේපුස්ස- වරකාපොල

ප්‍රථම මුද්‍රණය - 2001 ජුනි

රන් දෝලි
© චන්ද්‍රි කොඩිකාර

රන්දෝලි කෘතිය ඇසුරෙන් කෙරෙන කවර නිර්මාණ කටයුත්තකදී හෝ උපුටා දැක්වීමකදී හෝ කතුවරියගේ අනුමැතිය හා අවසරය ලිඛිතව ලබා ගත යුතුය.



# 1

"පත්තර පොත් කියවා කියවා කන්න එපා කියලා මේ ළමයට කොච්චර කිව්වත් අහනවයැ"

අත්තනායක මැතිණිය උදේ ආහාරය ගනිමින් සිටි දෙව්න්දි අසලින් තේ කෝප්පය තැබුවේ දෝෂාරෝපණයක හඬින් එසේ කියමිනි. දෙව්න්දි පුවත් පත දෙසම බලාගෙන ආප්ප කැබැල්ලක් සැපුවාය. මව කිවේ කුමක්දැයි ඇයට ඇසුණේ නැත. අත්තනායක මැතිණිය ඇය අසලම පුටුවකට බර දී පිගානකට ලුණු මිරිස් ස්වල්පයක් බෙදා ගත්තාය. ඇය ආප්පයක් අතට ගත්තේ බාල දියණිය දෙස බලාගෙනමය.

"සීගාගෙන ලුණු මිරිස් තියාගෙන අත ළඟ කෙසෙල් ගෙඩි තියාගෙන ආප්ප නිකම් කනවා. ඇයි ඉතින් පත්තරයක් අතට ගත්තම මෙලොව සිහියක් තියෙන එකක්යැ. දැන් ඔය තේ එකවත් බොන්න නිවෙන්න ඉස්සර."

දෙව්නිදි එක් අතෙකින් අල්ලාගෙන සිටි පුවත්පත මදක් පහත් කොට අම්මා දෙස බලා සිනාසුණාය. අම්මාගේ මෙවන් ආදරණීය දෝෂාරෝපණ ඇයට හොඳින් හුරුය.

"අප්පච්චිලා ගියා ද අම්මා...?"

"අයියයි අක්කයි ගියා - අප්පච්චි ටිකක් දවල් වෙලා යනවා කිව්වෙ..."

අත්තනායක පවුල සතු දකුම්කළු සංචාරක හෝටලය විදේශීය මෙන්ම දේශීය සංචාරකයින් ද බෙහෙවින් ප්‍රිය කරන ස්ථානයකි. රසවත් ආහාර පාන පිළිබඳව ප්‍රසිද්ධියක් උසුලන නිසාම විදේශීය සංචාරකයන් නොපැමිණෙන කාලයකදී වුව ද ඔවුන්ගේ හෝටලයට පාඩුවක් නොවීය.

කැලණි ගඟ අභියස සුන්දර බිම් කඩක් අත්තනායක මහතා මිල දී ගත්තේ සංචාරක හෝටලයක් පිළිබඳව අදහසක්වත් ඇතිව නොවේ. සිනා නැගීමටත් නොහැකි තරමේ අඩු මුදලකට ලැබුණු හෙයිනි. අමාත්‍යාංශයක නිලධාරියෙකු වූ ඔහුට ඉඩම් ගැන සොයා බැලීමට කාලයක් නොවීණි. එවකට ඔවුන් පදිංචි වී සිටියේ මහනුවරය. අත්තනායක මහතා නිවසට ගියේ සතියකට වරකි. පාසැල් නිවාඩු කාලයේ පවුලේ සියලු දෙනාම කොළඹ පැමිණ අත්තනායක මහතා සමඟ නිල නිවාසයේ නතර වූහ. අප්පච්චි සමඟ කාලය ගත කිරීම දැඩිව ප්‍රිය කරන දෙව්නිදි පාසැල්



නිවාඩු කාලය පැමිණෙන තුරු ඇඟිලි ගැන්නාය.

"අනේ අප්පච්චි අපි ගෙයක් හදාගෙන මෙහෙ පදිංචි වෙමුකෝ..."

පළමු වතාවට ඉඩම දුටු විගස දෙව්නිදි දැඩි උනන්දුවෙන් යෝජනා කළාය. සෞන්දර්යයට බෙහෙවින් ප්‍රිය කරන ඇය කැලණි ගඟ දුටු මනාතින්ම ඊට වශී වූවාය.

"ඔව්, මෙයාට දවස තිස්සෙ වතුරෙ ලැගගෙන ඉන්න පුළුවන්නෙ..." අක්කා සරදම් කළාය.

"අනේ අප්පච්චි..." ඇය අක්කා කී දෙය නෑසුණාක් මෙන් අප්පච්චිගේ ඇඟේ එල්ලෙමින් සුරතල් වූවාය.

"ටුවරිස්ට් හොටෙල් එකකට නම් කියාපු තැන..."

කිසිදු කතා බහකින් තොරව වට පිටාව නිරීක්ෂණය කරමින් සිටි අයියා පැවසුවේය. අප්පච්චි උනන්දුවෙන් ඔහු දෙස බැලුවේය. තවමත් උසස් පෙළ පන්තියේ ඉගෙන ගන්නා අයියා වෙතින් එවන් ව්‍යාපාරික අදහසක් ඉදිරිපත් වෙතැයි අප්පච්චි නොසිතන්නට ඇත.

"මගෙ යාළුවෙකුත් ඔකම කිව්වා. මටත් හිතෙනවා ඒක හොඳ අයිඩියා එකක් කියලා..."

අප්පච්චි කීවේ කල්පනාකාරී ස්වරයකිනි.

"අනේ එපා... එතකොට මෙතන මේ තියෙන ලස්සන එහෙම පිටින්ම නැති වෙලා යාවි..." දෙව්නිදි වහා එම අදහසට විරුද්ධ වූවාය. ඇගේ මුහුණ ද අඳුරු වී ගියේය.

www.sinhalaelibrary.com

"මෝඩි..." අයියා ආදරයෙන් ඇගේ කන මිරිකුවේය.

"මෙතන ලස්සන නැති වෙනවා නෙමෙයි... අපි තවත් ලස්සන කරන අයිඩියා එකක් ගැන කතා කෙරුවෙ..."

"ටුවරිස්ට් හොටෙල් එකක් කියන්නෙ රටේම තියෙන කුණු කන්දල් මෙතෙන්ට එකතු වෙනවා කියන එක..." දේවින්දි තර්ක කළාය.

"මෙයා ඉතින් පුංචි කාලෙ ඉඳලම අපි හිතන දේවල්වල අනිත් පැත්ත හිතන එක්කෙනානෙ..."

අප්පච්චි පැවසුවේ බාල දියණියගේ හිස පිරිමදිමිනි. ඔහුගේ ස්වරයේ වූයේ ඇගේ එවන් අදහස් අගය කරන බවකි.

කෙසේ වුව ද පවුලේ සුරතලිය ද බාල දියණිය ද වූ ඇයට අනෙක් අයගේ අදහස් වෙනස් කිරීමට තරම් ශක්තියක් නොවීය. සංචාරක හෝටලය පිළිබඳව සිහිනය සැබෑ විය. එය දියුණු කරන්නට පවුලේ සියලු දෙනාම ඇප කැප වූහ. අයියා ඉගෙනීම පවා නවතා දැමුවේය. ඔවුන් සියලු දෙනාටම කොළඹ පදිංචියට ඒමට ද සිදු විය. දිනෙන් දින හෝටලය දියුණු වෙද්දී වුව ද දේවින්දිගේ සිතෙන් පමණක් විශේෂ සතුටක් ගට ගත්තේ නැත.

"චූටි ඔයත් ටිකක් අපට උදව් වෙන්නකෝ... දැන් ඉස්කෝලෙත් නිවාඩු එකේ..."

ඇතැම් නිවාඩු කාලයක අයියා හෝ අක්කා යෝජනා කළහ. එහෙත් දේවින්දි හෝටලයට ගියේ ඔවුනට උදව්වට නොවේ. කැලණි ගඟ ඉවුරේ පනවනු ලැබූ අසුනක වාඩි වී



පොත් පත් කියවීමටය. නැතහොත් කවියක් කෙටි කතාවක් ලිවීමටය.

"මෙයාට ඉතින් පොත් කියවන්නයි කුරුටු ගාන්නයි තියෙනව නම් වෙන කිසිම දෙයක් ඕන නැනෙ..."

නිවසේ අය නිරතුරුවම සරදම් කළත් ඇගේ පුරුද්ද වෙනස් වූයේම නැත. හෝටලයේ අනෙක් වැඩවලට අකමැති වුව ද ඉවුම් පිහුම් කටයුතු වලට ඇය එක් වූයේ ආශාවෙනි. ඇය හෝටල් පාසලට බැඳී ඉවුම් පිහුම් පාඨමාලාවක් ද හැදෑරුවාය. දේශීය හා විදේශීය ආහාර සකස් කිරීමට ඇය දක්වූයේ ඉමහත් දක්ෂතාවයකි.

"ඔයාගෙ පුරුදුත් හරියට අයිස්ක්‍රීමුයි කිරි හොදියි වාගෙ ගැලපෙන්නෙ නැති ඒවා..." ඇතැම් විට යෙහෙළියෝ ඇයට සරදම් කළහ. දේවින්දිගේ පිළිතුර වූයේ සිනාවක් පමණකි.

උසස් පෙළ විභාගයට පෙනී සිටීමෙන් අනතුරුව නිවසට වී ගත කළ ගන්ධබ්බ අවදියේදී දේවින්දි අතින් නවකතා කෙටි කතා කිහිපයක්ම ලියැවිණි. ඇය එක් නවකතාවක් එවකට ජනප්‍රිය වී තිබූ යොවුන් පුවත්පතකට යැව්වේ නිකමට මෙනි. ඇය මවිතයට පත් කරමින් එම නවකතාව පුවත්පතේ පළ වූවා පමණක් නොව ඇයට එහි සේවය කිරීමට අවස්ථාව ද ලැබිණි.

"මොනවද ළමයො ඔය කුට්ටු දෙකේ පඩියට නිකම් නගින්න යන්නෙ...? අර අයියයි අක්කයි වාගෙ හෝටලේ බලා කියාගෙන ඉන්න..."

අම්මා එම රැකියාවට කෙළින්ම එරෙහි වූවාය. එහෙත්,

www.sinhalaelibrary.com

අප්පච්චි ගත්තේ දේවින්දිගේ පැත්තය.

"හැමෝම බිස්නස් කොකළට කමක් නෑ... පුළුවි කැමති නම් රජ්සාවට ගියාවෙ... නිවාඩු වෙලාවට උදව් කරන්න පුළුවන්නෙ හෝටලේ වැඩවලටත්..."

අප්පච්චි කියද්දී අම්මාගේ විරෝධතාවය නිකම්ම අහෝසි වී ගියේය. දේවින්දි රැකියාවේ නියැලුණේ ආශාවෙනි. සරසවියට ඇතුලත් වීමට සුදුසුකම් සහිතව උසස් පෙළ සමත් වුවද ලකුණු දෙකක මදි පාඩුවක් නිසා ඒ වරම ගිලිහී ගියේය. නැවත වරක් විභාගයට පෙනී සිටින ලෙස පවුලේ අය බලපෑම් කළ ද දේවින්දි එයට අදි මදි කළාය.

"ආයෙ එක්සෑම් කරන්න බෑ... මම මේ ජොබ් එක කරගෙන ඉන්නම්..." ඇය අවධාරණයෙන්ම පැවසුවාය. කිසිවෙකුට එම තීරණය වෙනස් කරලීමට හැකියාවක් නොවීණි.

එහෙත් හදිසියේම අධ්‍යක්ෂ මණ්ඩලය තුළ වූ මත භේදයක් උග්‍ර වීම නිසා පුවත්පත වසා දමන්නට සිදු විය. එය පුවත්පතේ අනෙක් කාර්ය මණ්ඩලයට වඩා දේවින්දිගේ සිතට වේදනාවක් දැනවිය. පුවත්පත වසා දැමූ දින සිටම දේවින්දි උත්සාහ කළේ වෙනත් එවන් රැකියාවක් සොයා ගැනීමටය.

"ඔය රස්සා හෙවිල්ල අතෑරල දාලා අපේ හෝටලේ දිගාමට ගිහින් වැඩක් කරන්න ළමයො..."

අම්මා කිහිප වරක්ම පැවසුවාය. හෝටල් කුස්සියේ උපදේශිකාවක ලෙස දින කිහිපයක් වැඩ කළ දේවින්දිට එය ඉතා ඒකාකාරී රැකියාවක් ලෙස දැනෙන්නට විය. ඇය ටිකින්



ටික මග හරින්නට පටන් ගත්තාය. ප්‍රමාද වී අවදි වෙන්නට ඇය පුරුදු වූයේ ද එහෙයිනි.

"ඉක්මනට කාලා බීල ලෑස්ති වෙන්න ළමයො... ඔයාට අප්පච්චි එක්කම හෝටලේට යන්න පුළුවන්නෙ..."

අම්මා පැවසුව ද නිවාඩු පාඩුවේ තේ කෝප්පය පානය කරමින් පුවත්පත දෙසම නෙත් හෙළාගෙන සිටි දේවින්දිට එය ශ්‍රවණය වූ බවක්වත් නොපෙනිණි. අත්තනායක මැතිණිය ගේ සිතට නොරිස්සුමක් දැනෙන්නට විය.

"අම්මෙ... අම්මෙ මේ බලන්නකො..."

හිටි හැටියේම පුළුල් සිනාවකින් මුව සරසාගත් දේවින්දි අම්මා වෙතට පුවත්පත පෑවාය.

"මොනවද මොකක්ද...?" ඇය විමසුවේ කුතුහලයෙනි.

සූරිය නැන්න වලව්වට ගෘහ පාලිකාවක් අවශ්‍ය බවට පළ වී තිබූ දැන්වීම පිළිබඳව දේවින්දි මෙතරම් උනන්දුවක් දක්වන්නේ මන්දැයි අත්තනායක මැතිණියට තේරුම් ගත නොහැකි විය. දේශීය විදේශීය ආහාර සැකසීම පිළිබඳ පළපුරුද්දක් ඇති නිරෝගී කාන්තාවක් බලාපොරොත්තු වන බවත් වැටුප සාකච්ඡා කොට තීරණය කර ගත හැකි බවත් ඉදුම් පිහුම් සපයන බවත් එහි සඳහන් කොට තිබිණි.

"මට නම් මේකෙ මොකුත් විශේෂත්වයක් පේන්නෙ නෑ..."

දැන්වීම කියවා බැලූ ඇය දෙබැම රැළි කොට ගෙන දියණිය දෙස බැලුවාය. දේවින්දිගේ මුහුණේ වූයේ සිනාවකි.

www.sinhalaelibrary.com

"මම මේකට ඇප්ලිකේෂන් එකක් දාන්න යන්නෙ..." ඇය පුවත්පතත් රැගෙන නැගී සිටියාය.

"මොනවා...? කුස්සි අම්මා කෙනෙක් වෙන්න යන්න ඔයා...?" අත්තනායක මැතිණිය මවිතයෙන් විමසුවාය.

"මම හෝටලේ කුස්සියෙත් වැඩ කරන එකේ වලව්වක කුස්සියක වැඩ කළාම මොකද වෙන්නෙ...? අනික් එක මේක ගෘහ පාලිකා. ඒ කියන්නේ හවුස් කීපර් පෝස්ට් එකක්..." දේවින්දි පැවසුවේ ගණනකට නැතිවය.

"ඔයාට පිස්සු තිබුණට ඔය තරම්ම පිස්සු කියල නම් මම හිතුවෙ නැහැ. කන්න, බොන්න, අඳින්න නැතුව හම් ඒ වගේ රස්සාවකට ගියත් කමක් නෑ. අපි පත්තරේ රස්සාවට යන්න දුන්නෙත් ඔයා හිත නරක් කර ගනී කියලා... මේ වාගෙ රස්සාවකට යන්න අප්පච්චි ඉඩ දෙයි කියලා ඔයා හිතනව ද?"

අම්මා දිගින් දිගටම අමනාපයෙන් කතා කරද්දී දේවින්දි අම්මාගේ කර වටා අත දමා ගත්තාය.

"අප්පච්චි ඔච්චර පටු විදිහට හිතන්නෙ නෑ අම්මා..."

"අප්පච්චි තමයි ඔයා කරන කියන ඔනම දෙයක් හරි කියලා හිතල ඔයාව නරක් කරන්නෙ..."

අම්මා කර වටා රැඳුණු දේවින්දිගේ සුරත ඉවත් කරන්නට බොරු වෑයමක් කළාය. අත්තනායක මහතා කෑම කාමරයට පිවිසියේ ඒ සමගමය.

"මොකද මේ උදේ පාන්දර අම්මගෙයි දුවගෙයි තරහෙ...?"



ඔහු විමසුවේ දියණිය දෙස ආදරයෙන් බලමිනි. ඔහු කියන ඕනෑම දෙයකට කීකරු වෙන අනෙක් දරුවන් දෙදෙනාට වඩා හැම දෙයක් දෙසම කුතුහලයෙන් බලන වෙනස් ආකාරයේ සිතුම් පැතුම් ඇති බාල දියණියට ඔහු වැඩියෙන් ආදරය කළේය. දේවින්දි ඒ ගැන හොඳින් දැන සිටියාය. ඇය අම්මා අත තැර පුවත්පත ද රැගෙන ගොස් අප්පච්චිගේ කරේ එල්ලී පුවත්පත ඔහුට පෑවාය.

"මොකක්ද පුතා...?" ඔහු පුවත්පත අතට නොගෙන විමසුවේය.

"හොඳ ජොබ් එකකට වේකන්සි එකක්..." අම්මා පිළිතුරු දුන්නේ සාවඥ හඬිනි.

"අප්පච්චිට මතකද සූරියතැන්න වලව්ව...?" අම්මාගේ සාවඥ ස්වරය නොතකා හළ දේවින්දි අප්පච්චි සමග කතා කළාය.

"සූරියතැන්න වලව්ව ගැන මොකද මම නොදන්නෙ...? නුවර පළාතටම තියෙන ලොකුම වලව්වනේ... ඇයි ඉස්කෝලෙ යන දවස්වල ඔයාලා ඒක බලන්නත් ගියේ...?" අප්පච්චි මතකය අවදි කළේය.

එහෙත් විශාල මන්දිරයක් වශයෙන් සිතේ ඇඳුණා විනා එහි නිශ්චිත රූපයක් ගොඩ නගා ගැනීමට දේවින්දිට හැකි වූයේ නැත. ඉතිහාසය හා චිත්‍රකර්ම පාඩම්වලට අදාළ බොහෝ දේවල් වලව්ව ඇසුරින් ඉගෙන ගත් බව නම් ඇයට සිහිපත් විය.

"දැන් ඉතින් මොකක්ද සූරියතැන්න වලව්ව ගැන

කියන්න තියෙන්නෙ...?"

"අද පත්තරේ වෙකන්සි එකක් තියෙනවා සූරියතැන්න වලව්වට හවුස් කීපර් කෙනෙක් ඕන කියලා. මම ඇප්ලිකේෂන් එකක් දාන්නයි හිතුවෙ..." දේවින්දි කාරණාව කොටින් පැවසුවාය.

"හවුස් කීපර් කෙනෙක් වෙන්න ඔයා...?"

අප්පච්චි නළල රැලි කොට ගෙන කෑම මේසයට වාඩි වූයේය. ඔහුගේ මුව කොනක් සිනාවකට විවර වී තිබිණි. දේවින්දි ගේ සිතේ ඇති වූයේ බලාපොරොත්තු සුන් වී ගිය බවට හැඟීමකි.

"සූරියතැන්න වලව්ව කියන්නෙ ලොකු ඉඩමක් මැද්දෙ තියෙන තට්ටු දෙකක මාලිගාවක් වාගෙ ලොකු ගෙයක්. අහළක පහළක ගෙයක් දොරක්වත් පේන්න නෑ. එවගේ තැනක ඉන්න පුළුවන් වෙයි කියල ඔයා හිතනව ද...?"

"මං ඒ වාගේ තැන්වල ඉන්න කොහොමත් කැමතියිනෙ අප්පච්චී. අනිත් එක මගෙ හිතේ තියෙනවා වලව්වක් සම්බන්ධ කර ගෙන ලස්සන පොතක් ලියන්න... ඒකට සූරියතැන්න කියල වලව්ව හොඳම තැන කියල මට හිතෙනවා..."

දේවින්දි අප්පච්චි කැමති කරවා ගන්නට හේතු දක්වූවාය. සැබැවින්ම පාසැල් වියේදී සූරියතැන්න වලව්ව නැරඹීමට ගිය දා පටන්ම වලව්වක් ගැන කියද්දී දේවින්දිගේ සිතේ ඇඳුණේ එයමය. කුමක්දෝ ගුප්ත බවක් එහි රැඳී ඇතැයි එකල පවා ඇයට සිතී තිබිණි. අප්පච්චි කල්පනාකාරීව



ආප්පයක් සපමින් සිටියේ දේවින්දිගේ සිත නොසන්සුන් කරවමිනි. අම්මා ද කෑම මේසය අසළම ගැවසුණේ අප්පච්චිගේ තීරණය දැන ගනු රිසියෙන් විය යුතුය.

"පොතක් ලියන්න නම් එහෙන් ඕන තරම් කරුණු එකතු කර ගන්න පුළුවන් තමයි... ඔය වලව්වෙ කුමාරිහාමිත් අතුරුදහන් වුණානෙ..."

අප්පච්චිගේ කතාව දේවින්දිගේ මෙන්ම අම්මාගේ සිතට ද දනවූයේ කුතුහලයෙකි. ඔවුන් දෙදෙනා එකට කතා කරගෙන මෙන් ඔහු දෙස බැලූහ.

"අතුරුදහන් වුණා...? ඒ මොනව වෙලා ද...?"

දේවින්දිට පළමුව අම්මා විමසුවාය. දේවින්දි අප්පච්චි අසලම පුටුවට බර දුන්නේ වඩාත් හොඳින් කතාන්දරය අසා ගන්නා රිසියෙනි.

"ඒ කුමාරිහාමි හරිම ලස්සනයි, මේ අපේ චූටිගෙ කොණ්ඩෙ වාගෙ දණිස්සෙන් පහළට කඩා වැටෙන දිග කොණ්ඩයක් තිබුණෙ... සූරියතැන්න බණ්ඩාර මහත්තයත් එක්ක ඇවිදින්න එහෙම යනකොට ගමේ මිනිස්සු, ආසාවෙන් බලාගෙන හිටියා. මිනිස්සු කිව්වෙ සුරංගනාවියක් කියලා..."

අප්පච්චි ආප්ප කෑබැල්ලක් කන්නට කතාව නතර කළේය. දේවින්දි නොඉවසිලිමත්ව බලා සිටියාය. එමොහොතෙහි දී පවා නවකතාවක සැකිල්ලක් ඇයගේ සිත තුළ ගොඩ නැගෙමින් පැවතිණි.

"ඉතින් කොහොමද අප්පච්චි එයා අතුරුදහන් වුණේ...?"

www.sinhalaelibrary.com

"අප්පච්චි කාල ඉවර වෙනකම් ඉන්න ලැයෙයො..." අම්මා නොසතුටින් මෙන් කීව ද දියණියගේ නොඉවසිලිමත් බව ඇයට තේරුම් ගොස් තිබිණි.

"මේක අවුරුදු විස්සකට විතර කලින් වුණ දෙයක්.. එතකොට සූරියතැන්න බණ්ඩාර මහත්තයට අස්සයො හිටියා. මෙයා දවසක් අස්සයෙක් පිටින් වැටිලා කොන්ද කැඩුණා. හුඟක් දවස් ඉස්පිරිතාලෙ ඉන්න වුණා.. එයා ඉස්පිරිතාලෙන් එන දවසෙම කුමාරිහාමි එයාගෙ ඇඳුම් පැළඳුමුත් අරගෙන ගෙදරින් යන්න ගිහිල්ලා..."

"මන්න බලමු ගෑණුන්ගෙ හැටි..! මිනිහට සාත්තු කරන්න වෙයි කියල ගෙදරින් යන්න ඇති... ඉතින් ළමයි හිටියෙ නැද්ද...?" අම්මා කම්පාවෙන් මෙන් විමසුවාය.

"එක පුතයි හිටියෙ.. ඒ කාලෙ පුතාට අවුරුදු හතක් විතර ඇතිලු. කොහොම හරි මේ වෙනකම්ම කුමාරිහාමි කොහෙද ගියෙ කියල කවුරුවත් දන්නෙ නෑ..."

"එක හරි පුදුමයිනෙ අප්පච්චි..."

දෙව්න්දි කල්පනාකාරී ස්වරයෙන් පැවසුවාය. ඇගේ සිත තුළ ඇඳුණු කතාවේ සැකිල්ල නිශ්චිත හැඩයක් ගනිමින් වැඩෙනු ඇයට දැනිණි.

"ඔය ඔනම වලව්වක ඔය වාගෙ ගුප්ත දේවල් තියෙනවා..."

"එහෙනම් මට හොඳම පොතක් ලියන්න පුළුවන් වෙයි අප්පච්චි..."

"ඔව්... ලියන කෙනෙකුට හැම පැත්තෙන්ම අත්දැකීම



තියෙන එක හොඳයි... ඔයාට මැනේජ් කරගන්න පුළුවන් කියල හිතෙනව නම් ඔයාට වැරැද්දක් නෑ..." අප්පච්චි අනුමැතිය දුන්නේය.

"මගෙ හොඳ අප්පච්චි..."

දෙව්න්දි වහා ඔහුගේ මුහුණ සිප ගත්තාය. අප්පච්චි සිනාසුණේය. දෙව්න්දි ජයග්‍රාහී හැඟීමෙන් යුතුව අම්මා දෙස බැලුවාය. අම්මා හිස සලා ඉවත බලා ගත්තාය. දෙව්න්දි උඩ පැනගෙන කාමරයට දිව ගියේ සිනා විසිරුණු මුවින් යුතුවය.

"ඔහොම වැඩිය බුරුල දීල ඔයා තමයි කෙල්ලව නරක් කරන්නෙ... වලව්වක වැඩ කාර කමට දුවෙක් යවනව ද මොළේ තියෙන අප්පච්චි කෙනෙක්...?"

අත්තනායක මැතිනිය සිය සැමියාට දොස් පවරන්නට වූවාය.

"තමන් කරන දේක හොඳ නරක තෝර ගන්න හොඳ ඉවක් පුටි දුවට තියෙනවා මැණිකෙ... එයා කවදාවත් වැරදි තීරණයක් ගන්නෙ නෑ කියල මට විශ්වාසයි... අනික් එක එයා අනාගත බලාපොරොත්තුවක් ඇතුවනෙ ඔය ගමන යන්න හදන්නෙ... ඉතින් අපි මොකටද බාධා කරන්නෙ...?"

අප්පච්චි පැවසුවේ තවත් ඔය ගැන වාද කරල පලක් නෑ යනුවෙන් අඟවන හඬකිනි. කවදත් නිවසේ වැඩ කටයුතුවලදී අවසාන තීන්දුව ගන්නේ අප්පච්චිය.

"මම දන්නෙ නෑ... අප්පච්චිලා දුවලා ඕන එකක්..." කියාගෙන අම්මා කුස්සිය දෙසට ගියේ එහෙයිනි.

www.sinhalaelibrary.com

නිවසේ සියලු දෙනාම අකැමති වුව ද අප්පච්චිගේ කැමැත්තෙන් අනුබලය ලත් දේවින්දි සූරියතැන්න වලව්වට ඉල්ලුම් පත්‍රයක් යැව්වාය. ඇය එහි සඳහන් කළේ ඉවීම හා ගෘහ පාලනය පිළිබඳව ඇති දක්ෂතා පමණකි. ඒ අතරම ඇය පොත ලිවීම සඳහා ද සූදානම් වන්නට වූවාය. පැරණි වලව්වල විස්තර කියවා බලමින් කතාවේ සැකිල්ල ගොනු කිරීම ඇයට අලුත්ම අත්දැකීමක් විය. සූරියතැන්න වලව්වෙන් ජීවය ලබා එම පොත පෝෂණය වෙනු දකින්නට ඇය උදක්ම බලාපොරොත්තු වූවාය.

එහෙත් ඉල්ලුම් පත්‍රය යවා සති දෙක තුනක් ගත වෙන තුරුම එයට පිළිතුරක් ලැබුණේ නැත. දේවින්දිගේ සිත දුක්බර බවකින් උදාසීන විය. පොත පිළිබඳව වූ උනන්දුව ද හීන වී ගියේය.

"ඒ වෙකන්සි එකට කවුරු හරි තෝරගන්න ඇති..." අම්මා ඇය සනසන්නට මෙන් කීව ද ඇගේ වදන් තුළ වූයේ 'ඒක එහෙම වුණ එක හොඳයි' වැන්නකි.



# 2

"මට තේරෙන්නෙ නෑ දේවින්දි ඔයා තටන්න යන නාඩගම මොකක්ද කියලා..."

කෝසල කතා කළේ අමනාපයෙනි. දේවින්දි සිනාසෙමින් ඔහු දෙස බලා සිටියාය. උස සිහින් සිරුරැති කෝසලගේ දඟකාර කොණ්ඩය නිරන්තරයෙන්ම නළලට කඩා වැටිණි. ඔහු හිස ගස්සා වරින් වර කොණ්ඩය සකස් කළේ අපූරු ලාලිත්‍යයකටය. ඒ ලාලිත්‍යයටත් ඔහුගේ දිගු මුහුණට හා සිහින් උඩු රැවුලටත් දේවින්දි අතිශයින් ප්‍රිය කළාය. එහෙත් එමොහොතෙහි හුරු පුරුදු ප්‍රියමනාප බව ඔහුගේ මුහුණින් පලා ගොස් තිබිණි. ඔහු ඇගේ මුහුණ ඉක්මවා ඉවත බලාගෙන සිටියේය.

ඔවුන් දෙදෙනා වාඩි වී සිටියේ සමර් ගාඩින් අවන්හලේ කොට්ටන් ගසක් මැදි කරගෙන තැනුණු මේසයක් අසලය. එකිනෙකාට බෙහෙවින් සමීපව වාඩි වී සිටිය ද ඔහු තමාගෙන් බොහෝ දුරස් වී ඇතැයි ඇයට සිතිණි. අලුතින් ලැබුණු රැකියාව පිළිබඳ බලාපොරොත්තු රැසක් ඇගේ සිත තුළ පොදි කමින් තිබූ බැවින් ඔහුගේ මේ වෙනස ඇය තුළ කණගාටුවක් ඇති කළේ නැත.

සූරියකැන්ද වලව්වේ රැකියාව ලැබුණු මොහොතේ සිටම ඇය සිටියේ ප්‍රීතියෙන් උද්දාම වෙමිනි. කෝසල සමඟ ද ඒ සතුට බෙදා හදා ගන්නට ඇයට ඕනෑ විය. ඔහුත් ඇයත් අතර සම්බන්ධතාවයක් ඇති වූයේ ඇය පුවත්පත් ආයතනයේ රැකියාවට ගොස් ටික දවසකට පසුවය.

කෝසල සේවය කළේ රූපවාහිනී ආයතනයක කැමරා ශිල්පියෙකු වශයෙනි. ඒ අතරම ඔහු ස්වාධීන ලේඛකයකු ලෙස පුවත්පතට ද ලිපි සැපයීය. නිරන්තරයෙන්ම හමු වීම තුළින් ඇති වූ පැහැදීම ඔවුන් ආදරවන්තයින් බවට පත් කළේය. එහෙත් කෝසල මෙතරම් පටු ආකාරයකට සිතන අයෙක් යයි දේවින්දි මීට පෙර සිතුවේ නැත. රැකියාව පිළිබඳ පුවත පැවසූ අවස්ථාවේ සිටම ඔහු පුපුරා හැලුණේය.

"ඔයා හිතන්නෙ මම මේ නාඩගම් නටන්න යන ගමනක් කියල ද...?"

දේවින්දි උගුරක්වත් පානය නොකළ සිසිල් බීම වීදුරුව දෑතින්ම අල්ලා ගෙන හිස ඇල කොට කෝසල දෙස බැලුවාය. ඔහු ඇය දෙස සැණින බැල්මක් හෙලා නැවතත් ඉවත බලා ගත්තේය. දේවින්දි මේසය මත වූ ඔහුගේ අත මත අත



තැබුවාය. සිසිල් බීම වීදුරුව අල්ලා ගෙන සිටි බැවින් ඇගේ අත්ලේ වූයේ ඔහු හිගස්වන තරමේ සීතලකි. ඔහු අත ඉවතට ඇද ගත්තේය. ඇය රිදුණු දෑසින් ඔහු දෙස බැලුවාය.

"මොනවද කෝසල ඔයාට වෙලා තියෙන්නෙ...?"

"මගෙ නම් තවම ඔයාගෙ වාගෙ ඔළුව අවුල් වෙලා නෑ.." ඔහු පැවසුවේ සරදම් ස්වරයෙනි.

"ඔයාට පිස්සු තිබුණට ඔය තරමටම පිස්සු කියල නම් හිතුවෙ නෑ..."

සූරියකැන්ද වලව්වේ ඇබෑර්තුවට ඉල්ලුම් පත්‍රයක් යොමු කරන බව පැවසූ මොහොතේ අම්මා කීවේ ද එලෙසය. දේවින්දි මොහොතක් කල්පනා කළාය. අප ලෝකයේ ජීවත් විය යුත්තේ අපට ඕනෑ ආකාරයට නොව ලෝකයේ අනෙක් අයට ඕනෑ ආකාරයටය. සියලු දේම කළ යුත්තේත් ආකාරයේ ලෝක සම්මතයට එරෙහිව යන්නවුන් සියලු දෙනාම හංවඩු ගැසෙන්නේ පිස්සන් වශයෙනි. එසේත් නැත්නම් පෙරළිකාරයන් වශයෙනි. රැකියාවක උස් පහත් භේදයක් නැතැයි බණ දේශනා කරන අය පවා ඒවා පිළිපදින්නේ තමන්ට වාසියක් වන අවස්ථාවකදී පමණකි. දේවින්දිගේ මුවට සරදම් සිනාවක් නැඟිණි. කෝසල ඇය දෙස බැලුවේ දෙබැම හකුළුවාගෙනය.

"මොකද ඔයා හිනා වෙන්නෙ...?"

ඔළුව අවුල් වුණ මිනිස්සු කරන කියන දේවල් ගැන අනිත් මිනිස්සු එච්චර හිතන්නෙ මොකටද...?"

www.sinhalaelibrary.com

ඇය පැවසුවේ ගණනකට නැතිවය. එවර කෝසලගේ මුවග ද සිනාවක් නැගිණි.

"අපොයි ඇති ඩිංගක් හිතා වුණා..."

දේවින්දි ඇනුම්පදයක හඬින් කීවාය. ඇය දෙස බලාගෙනම සිසිල් බීම වීදුරුවෙන් උගුරක් දෙකක් පානය කළ කෝසල ඇගේ අත අල්ලා ගත්තේය. දේවින්දි අත ඉවතට ඇද ගන්නට වෑයම් කළාය. එහෙත් ඔහු ග්‍රහණය දැඩි කළේ හෝක්කාඩු පෙනුමක් මුහුණට නංවා ගනිමිනි.

"මං අතින් අල්ලනකොට අත අහකට ඇදල ගත්ත මිනිහා දැන් මොකටද මගෙ අතින් අල්ලන්නෙ...?"

ඇය විමසුවේ අමනාපයෙනි. ඔහුගේ මුවග වූ සිනාව පුළුල් විය.

"ඔයාගෙ අත සීතල වෙලා තිබුණ හින්දා මං ගැස්සුණා. එතකොට අත එහාට වෙන්න ඇති. දැන් ඕක බීල ඉන්නකො..."

දේවින්දි සිසිල් බීම වීදුරුව දෙස බැලුවේවත් නැත. ඔවුන් දෙදෙනා නිරන්තරයෙන්ම යන්නට පුරුදු වී සිටි අවන්හල් අතුරින් දේවින්දි වඩාත් ප්‍රිය කළේ මෙතැනටය. අහස පොළව අතර ඇති බොහෝ දේවල් පිළිබඳව කතා බහ කරමින් පැය ගණනාවක් වුව ද ගත කරන්නට ඔවුනට හැකියාව තිබිණි. එහෙත් මෙදින නම් දෙදෙනාටම කතා බහ කරන්නට යමක් නොතිබූ තරම්ය. ඇත්ත වශයෙන්ම වචන වශයෙන් පිට කර ගත නොහැකි හැඟීම් රැසකින් දෙදෙනාම පීඩාවට පත් වූහ.



"බොන්න දේවින්දි..."

දයාබර හඬකින් පැවසූ කෝසල සිසිල් බීම වීදුරුව ඇයට වඩාත් ළං කළේය. එවර ඇය ඔහුගේ ඉල්ලීමට කීකරු වූවාය. ඇය බීම වීදුරුව පානය කර අවසන් වන තුරුම ඔහු ඇගේ අත මුදා හැරියේ නැත.

"ඇත්තටම කියන්න කෝසල ඇයි ඔයා මං මේ ජොබ් එකට යනවට අකැමැති...?"

හිස් වීදුරුවේ ගැට්ට මත ප්ලාස්ටික් බටය නමමින් දේවින්දි විමසුවාය.

"ඕක රස්සාවක් ද ළමයො...? දැන් කාලෙ ඉස්කෝලෙ දෙකට තුනට ගිය ගෑණු ළමයෙක් වත් ඔය වගේ එකකට යන්නෙ නෑ..."

"මේක ඉස්කෝලෙ දෙකට තුනට ගිය කෙනෙකුට කරන්න පුළුවන් ජොබ් එකක් නෙමෙයි. මං වාගෙ එක්ස්පීරියන්ස් තියෙන කෙනෙකුට මිසක්. අනිත් එක මම මේකට යන්නෙ ජොබ් එකක් ඕනවට නෙමෙයි... මට ඕනෙ අත්දැකීම..."

"ඔය පොතක් කියවන්නකො ඉවරනෙ..."

"පොතක් කියෙව්වම ලැබෙන්නෙ දැනුම මිසක් අත්දැකීම නෙමෙයි..."

"ඔයා දන්නව වැඩියි දේවින්දි... එකයි ඔක්කොටම මුල..."

කෝසල මෙතෙක් ග්‍රහණය කොට ගෙන සිටි ඇගේ සුරත මුදා හැරියේ කෝපයෙන් යුතුවය.

"කෝසල ඔයා දන්නවනෙ මම රස්සාවක් කරන්න ඕන කෙනෙක් නෙමෙයි. මට ඕන තරම් සල්லි තියෙනවා. ඒත් මගෙ අප්පච්චි මට ඉඩ දුන්නා ඕන රස්සාවකට යන්න. ඉතින් ඇයි ඔයාට බැරි අපේ අප්පච්චි වාගෙ ටිකක් පුළුල් විදියට හිතන්න..." දේවින්දි විමසුවේ කෝසලගේ මුහුණ දෙස ඍජුව බලාගෙනය.

"අප්පච්චියි මායි එක්කෙනෙක් නෙමෙයිනෙ දේවින්දි..." ඔහු පැවසුවේ නොඉවසිල්ලෙනි.

"ඔව් ඒක මටත් දැන් නම් හොඳටම තේරුණා..." ඇය දිගු සුසුමක් හෙළුවාය.

"මොකක්ද ඔයාට හොඳටම තේරුණේ...?"

"මගෙ අප්පච්චි කවදාවත් එකක් හිතලා තව එකක් කියල වෙනස්ම දෙයක් කරන ජාතියෙ කෙනෙක් නෙමෙයි... එයා කිසිම දවසක කරන්න බැරි දෙයක් කියන්නෙ නෑ..."

ඔහුගේ නොඉවසිලිමත් බව ගණනකට වත් නොගත් නියාවෙන් ඇය නැවතිල්ලේ කතා කළාය. ඇය කිසිම දිනෙක කෝසල හමුවේ මෙතරම් විවෘතව කතා බහ කොට නොතිබිණි. සැබැවින්ම ඔවුන් සැම දිනම කතා කළේ ආදරවන්තයන්ටම පොදු සරල සුන්දර මාතෘකා ඔස්සේය. ඔවුන් දෙදෙනාගේ ඇතැම් අදහස් පරස්පර විරෝධී බව දේවින්දි නොදැන සිටියා නොවේ, එහෙත් එම අදහස් ගැටුමක් තරම් දුර දිග යන අවස්ථාවක් මින් පෙර එළඹී නොතිබිණි.



මෙය ද නැවුම් අත්දැකීමකැයි ඇයට සිතුණේ එනිසාය.

"ඒ කියන්නෙ මම එකක් හිතල වෙන එකක් කරන ජාතියෙ කෙනෙක් කියලයි ඔයා හිතන්නෙ නේද...?"

"ඇත්තටම ඔව්... ඔයාට මතක ද පත්තරේ වැඩ කරන දවස්වල අපි ඔක්කොමල ඔය රස්සාවල් ගැන කතා කළා...? එතකොට ඔයා කිව්වෙ පඩියක් හම්බ වෙන හැම එකක්ම රස්සාවක්... ඒවයෙ උස් පහත් භේදයක් නෑ කියලා... දැන් ඔයා කියනවා මට මේ රස්සාවට යන්න එපාලු... මං කැමති නෑ ඒ වාගෙ දිව දෙකකින් කතා කරන පිරිමින්ට... මං කැමති මගෙ අප්පච්චි වගෙ කෙළින් කතා කරන අයට..."

දේවින්දි කියාගෙන කියාගෙන ගියාය. කෝසල නිරුත්තර විය. ඔහු යටි තොල දැඩිව විකාගෙන දේවින්දි දෙස බලා සිටියේය.

"ඒ කියන්නෙ මං කොච්චර අකැමැති වුණත් ඔයා ඔය ජොබ් එකට යනවමයි...?"

මඳ වේලාවක් කතා නොකර සිටි ඔහු එවර වෙනස්ම තැනකින් කතාව ඇරඹුවේය.

"ඔව්...!"

ඇය පොල්ලෙන් ගසන්නාක් මෙන් ඍජුවම පිළිතුරු දුන්නාය. කෝසල හිස දෙපසට සලමින් දිගු සුසුමක් හෙළුවේය.

"ඔයා මං කියන දෙයක් අහන්න කැමති නැද්ද දේවින්දි...?"

www.sinhalaelibrary.com

"මගෙ හිත දන්නවා මම ඔයාටවත් වෙන කිසිම කෙනෙකුට වත් වරදක් කරන්නෙ නෑ කියලා. අනිත් එක මේ ජොබ් එකට ගියා කියලා මට කිසිම හානියක් වෙන්නෙත් නෑ කියලා මම දන්නවා. ඒ හින්දා මේ වතාවෙදි නම් මම ඔයාට අකීකරු වෙනවා. කෝසල මගෙත් එක්ක තරහ වෙන්න එපා." ඇය තදින් පැවසුවාය.

"ඔයා වාගෙ හිතුවක්කාර මුරණ්ඩු කෙල්ලෙක් එක්ක ජීවත් වෙන්න මට පුළුවන් වෙයි කියල මම නම් හිතන්නෙ නෑ."

නීරණාත්මක හඬකින් පැවසූ කෝසල බිල ගේන්නැයි වේටර් වරයාට සන් කළේය. ඇය නිහඬව ඔහු දෙස බලා සිටියාය. ඔහු ද තවත් එක සම්ප්‍රදායික පිරිමියෙක් පමණකි. ඔහුට අවශ්‍ය වන්නේත් ඇය තුළින් සම්ප්‍රදායික ගැහැණියක දැකීමටය. එම ගැහැණිය හඬක් නොනගා ඔහුගේ හැම අණකටම කීකරු විය යුතුය. ඔහු වෙනුවෙන් ඇය කැප වී සිටිය යුතුය. මෙවන් පිරිමියෙකු සමග ජීවිත කාලයම ගෙවීමට සිදු වුවහොත් එය මහා හිසරදයක් වනු ඇතැයි ඇයට සිතුණේ ඔවුන්ගේ ඇසුරේ පළමු වතාවටය. ඇය සුසුමක් හෙළුවාය.

වේටර්වරයා බිල ගෙනාවේය. කෝසල සාක්කුවට අත දමා පසුම්බිය ගනිද්දී වහා අත් බෑගය විවර කළ දෙව්මිනි මුදල් නෝට්ටුවක් පීරිසිය මතට දැමුවාය. ඇගේ එම ක්‍රියාවෙන් ද ඔහුගේ සිත රිදුණු බව මුහුණින් ඇඟවිණි. ඇය එයට අවධානයක් යොමු නොකළාය. අනෙක් අයගේ සිත් සතුටු කරනු උදෙසා සිය සතුට පාවා දීමට ඇය සූදානම් නැත.

"අපි යමු..." වේටර් වරයා නික්ම යද්දී ඇය හැඟී



සිටියාය.

"ඉතුරු සල්ලි...?"

"වේටර් ගන්නාවෙ."

"ඔව් ඉතින් ඔයා සල්ලි කාරියන්නෙ..."

ඔහු පැවසුවේ සරදමට ද ඇනුම් පදයක් වශයෙන්දැයි වෙන් කර හැඳින ගැනීමට ඇය උත්සාහ කළේ නැත.

www.sinhalaelibrary.com

## 3

"කුස්සි අම්මා කෙනෙකුට මෙච්චර ඇඳුම් තොගයක් ඕනෙද...? ඊටත් ඔය වගේ හොඳ වටිනා ඇඳුම්...?"

දේවින්දි ඇඳුම් බෑගය අසුරමින් සිටියදී කාමරයට එබී බැලූ නිමන්ති සිනාසුණාය. දේවින්දි යටි තොල තදින් සපා ගත්තා විනා අක්කාගේ වදන්වලට එරෙහිව කිසිවක් පැවසුවේ නැත. අප්පච්චි හැර නිවසේ අනෙක් සියලුම දෙනා කෙරෙහි ද කෝසල කෙරෙහි ද ඇගේ සිතේ කළකිරීමක් හා නොරිස්සුමක් වැඩෙමින් තිබිණි. මොවුන් කිසිවෙකුට තමා තේරුම් ගැනීමට නොහැකි මන්දැයි ඇය සිතුවාය. ඇය හැම විටෙකම ජීවිතයෙන් විචිත්‍රත්වයක් අපේක්ෂා කළාය. සම්මතයට එරෙහි යමක් කිරීමට වුව ද ඇය නොපැකිලුණාය.



ඇගේ සිතැඟි හරි හැටි තේරුම් ගත්තේ අප්පච්චි පමණකි. ඔහුගේ අනුබලය නොවන්නට මේ ගමන යාම සිහිනයක් පමණක්ම වන්නට ඉඩ තිබිණි.

"තරහ ගියාද ඔයාට...?"

නිමන්ති කාමරය තුළට පැමිණියේ දේවින්දිගේ මුහුණ වෙනස් වනු දුටු බැවිනි. දේවින්දි කිසිවක් නොකියා ඇඳුම් කිහිපයක් තමා බෑගය තුළ තැන්පත් කළාය.

"මම කියන්නෙ විහිළුවටවත් තරහටවත් නෙමෙයි චූටි... ඔය වාගෙ ජොබ් එකක් ඔයා වාගෙ කෙනෙකුට කොහොමටවත්ම ගැලපෙන්නෙ නෑ..."

නිමන්ති ඇඳ මත වාඩි වෙමින් පැවසුවාය. පිරිසිදු කම හා පිළිවෙල ඉහළින්ම අගය කරන දේවින්දිගේ කාමරය ඉතාමත්ම ක්‍රමානුකූලව සකස් කොට තිබිණි. එය හැම සැප පහසුකමක්ම සහිත කාමරයකි. මෙවන් සුව පහසු ජීවිතයක් හැර දමා ඇය අභිනික්මන් කරන්නට සැරසෙන්නේ මන්දැයි නිමන්ති කණගාටුවෙන් යුතුව සිතුවාය.

"රජකම් කළත් කරුම කියන ඒවා පල දෙනවනෙ.."

දේවින්දිගේ සිත වෙනස් කරන්නට නොහැකි වූ කල අම්මා හිත හදා ගත්තේ එසේ කියමිනි.

"රස්සාව ගැලපෙනව ද කරන්න පුළුවන් ද බැරි ද කියන එක තීරණය කරන්නෙ මම... ඒක ඔයාලගෙ ප්‍රශ්නයක් නෙමෙයි..."

දේවින්දි පැවසුවේ කටුක හඬිනි. අක්කා මවිතයෙන්

www.sinhalaelibrary.com

ඇය දෙස බැලුවාය. සැබැවින්ම දේවින්දි කිසිම දිනයෙක සමුලේ අයට මෙලෙසින් කතා කොට නොතිබිණි. එහෙත් ඔවුන් දිගින් දිගටම ඇය හෙළා දකිමින් කතා කරද්දී ඇයට හැඟීම් පාලනය කර ගන්නට හැකියාවක් නොවිණි. ඇය පෙරදා කෝසලට ද මෙවදනම පැවසුවාය. ඔහු වෙන්ව ගියේ ඇය සමග අමනාපයෙනි. එහෙත් නිවසේ අය සමග හිත් නොහොඳින් මේ ගමන යන්නට ඇය තුළ කැමැත්තක් නොවිණි. එම නිසා ඇය අක්කා අසල වාඩි වී ඇගේ උරහිස මත අත තැබුවාය.

"ඔයාට මච්චර කේන්ති ගන්න දෙයක් මම කිව්වෙ නැහැ චූටි..." නිමන්ති පැවසුවේ පසුතැවිලි හඬිනි.

"කියලා කාටවුත් මාව තේරුම් ගන්න බෑ අක්කා.. මම මේ කල්ලි හොයන්නවත් රස්සාවක් කිහවටවත් යන ගමනක් නෙමෙයිනෙ. මගෙ හිතේ තියෙනවා හොඳ පොතක් ලියන්න.. ඒකට කරුණු හොයා ගන්නයි මම මේ යන්නෙ..."

"පොතක් ලියන්න මච්චර දුක් විඳින්න ඕනෑද ළමයො.." නිමන්ති සිනාසුණාය.

"වේදනාවෙන් තොර සැපතක් නැහැ කියලා තියෙනව අහල නැද්ද...?"

"ඒක අර ඉත්තෑවෙකුගෙන් කිස් එකක් ගන්න හාවෙක් කිව්ව කතාවක්නෙ..."

නිමන්ති එය කී ආකාරයට දේවින්දිට සිනා ගියේය. නිමන්ති ද ඒ සිනාවට එක් වූවාය. සිතේ වූ බර ගතිය ඒ සිනාවත් සමගම පහ වී ගියාක් මෙන් ඇයට දැනිණි.



එදින උදේ ඔවුන් සියලු දෙනාම කෑම මේසයට වාඩි වූයේ එකටය. දේවින්දිට ආහාර ගැනීමේ ප්‍රියතාවයක් නොවිණි. එහෙත් මේසය මත වූ කිරිබත් පිඟානත් ලුණු මිරිසත් දුටු විට කොහේ දෝ නොතිබූ කෑම රුචියක් සිතට නැඟුණේය. අම්මා කිරිබත් උයන්නට ඇත්තේ තමා වෙනුවෙන්ම යයි ඇයට සිතිණි. ඇය කෘතඥතා පූර්වක දෑසින් අම්මා දෙස බැලුවාය. එහෙත් අම්මාගේ මුහුණෙහි වූයේ වේදනාව සමග කැලතුණු කනස්සල්ලකි.

"හා.... මගෙ දුව හරි ලස්සනයිනෙ..."

අත්තනායක මහතා සිනාමුසු මුහුණින් දියණිය දෙස බැලීය. රෝස පැහැති බෝට්ච්ච් අත් හැට්ටයකින් සහ සායකින් සැරසී දිගු කොණ්ඩය තනි කරලට ගොතා ගත් ඇය තුළින් සැබැවටම අපූර්ව සුන්දරත්වයක් දිස් විණි.

"මෙයාව දැක්කට පස්සෙ සූරියතැන්න වලව්වෙ බණ්ඩාර මහත්තයා එයාගෙ කුමාරිහාමි කර ගනී ද දන්නෙත් නෑ කුස්සි අම්මා වෙනුවට..."

දුමිඳු පැවසුවේ සරදම් හඬිනි. සැබැවින්ම සිය සුන්දර නැගණිය ගැලපෙන්නේ එවන් තනතුරකට බව ඔහුට සිතෙමින් තිබිණි. දේවින්දි ඔහුගේ පිටට පහරක් ගැසුවාය.

"නංගිට ඕන නැති විහිළු කරන්න එපා පුතා..."

අම්මා සැර කළාය. දුමිඳුගේ මුහුණ අඳුරු විය. අම්මාගේ කටහඬෙහි වූ සංකාකුල බව දේවින්දි වහා හැඳින ගත්තාය. ගෙදරින් පිට සිටීම දේවින්දිට අලුත් දෙයක් නොවිණි. පාසැල් යන කාලයේදී ඇය මාස ගණනාවක්ම බෝඩිම්වල ගත කොට

www.sinhalaelibrary.com

තිබිණි. අම්මා පෙළෙන්නේ ඇය නිවස හැර දා යන දුකින් පමණක් නොවන බව දේවින්දිට ඉව වැටිණි. අයියා පැවසූ දෙයම අම්මාත් සිතනු නොඅනුමානය. ඔහු කළ සරදමට ඇය කිපුණේ එහෙයිනි. අප්පච්චිටත් අයියාටත් මැදිව කෑම මේසයේ වාඩි වූ දේවින්දිගේ පිඟානට අම්මා කිරිබත් කෑබැල්ලක් බෙදුවාය.

"අම්මා මගෙත් එක්ක තරහ ද ?"

දේවින්දි ඇගේ අත අල්ලා ගනිමින් විමසුවේ දුක්බර හඬිනි. අම්මාගේ දෑසට කඳුළු පිරිණි. ඇය කොණ්ඩය අවුල් නොවන ලෙස දේවින්දිගේ හිස පිරිමැද්දාය.

"මම මොකටද මගෙ දුවත් එක්ක තරහ වෙන්නෙ...? ඒත් මගෙ හිතට බයයි... මේ කවුරුවත් විශ්වාස කරන්න පුළුවන් කාලයක් නෙමෙයි.."

ඇය සුසුමක් හෙළමින් කිරිබත් කෑබැල්ල මතට ලුණු මිරිස් ටිකක් ද බෙදුවාය.

"මට මාව විශ්වාසයිනෙ අම්මා.."

දේවින්දි පැවසුවේ සිනාසෙන්නට තැත් දරමිනි.

"අන්න හරි පුතේ. මටත් කන පුරාම ඇහුණෙ එච්චරයි. තමන්ට තමන් විශ්වාස නම් අනිත් අය මොනවා කිව්වත් කමක් නෑ..."

අප්පච්චි කියද්දී අම්මා සුපුරුදු නෝක්කාඩු බැල්ම හෙළුවාය. එහෙත් අප්පච්චි ගේ මුහුණෙහි වූයේ සිනාවකි. නිහඬවම කෑම ගන්න ද සියලු දෙනාගේම සිත් හැඟුම්බරව



ඇති බව දේවින්දි දැන සිටියාය.

"චූටි ගියාම මට තමයි පාළු..."

නිමන්ති පැවසුවේ සුසුමක් හෙළමිනි. දේවින්දි වහා අක්කා දෙස බැලුවාය. අක්කාත් ඇයත් ජීවත් වූයේ ලෝක දෙකකය. දේවින්දි පොත් පිලටම ඇලී ගැලී සිටිය ද අක්කා සිටියේ ව්‍යාපාරයට යොමු වූ මනසින් යුතුවය. එබැවින් තමා නිවසින් බැහැර වීම ඇගේ සිතට බලපෑමක් ඇති කරනු ඇතැයි දේවින්දි සිතුවේ නැත.

"චූටි ගියාම අපි කාටත් පාළුයි තමයි... ඒ වුණාට එයා ආසාවෙන් යන ගමනට අපි සුබ පතමු..."

අප්පච්චි පැවසුවේ ඉංග්‍රීසියෙනි. සිත බොහෝ හැඟුම්බර වූ වේලාවට ඔහු සිංහලෙන් කතා නොකරන බව දේවින්දි දැන සිටියාය. ඇයට පපුව දවාගෙන යන වේදනාවක් දැනිණි.

"තෑන්ක් යූ අප්පච්චි"

කමින් සිටි කිරිබත් කෑබැල්ල සහිත පිඟාන පසෙකට තල්ලු කළ දේවින්දි අප්පච්චිගේ කම්මුලක් සිප ගත්තාය.

"අන්න අප්පච්චිගෙ මූණෙ ලුණු මිරිස් ගෑවා.." දුමිඳු කෑ ගැසුවේය.

"ඔන්න එහෙනම් ඔයාටත්..."

දේවින්දි අනෙක් පසට හැරී අයියාගේ කම්මුල සිප ගත්තේ සිනාසෙමිනි.

සමු ගන්නා මොහොත එළඹිණි. දේවින්දි සියලු

www.sinhalaelibrary.com

දෙනාටම දණ ගසා වැන්දාය. අත් හරින්නට ලෝබ කමින් මෙන් අම්මා ඇය මඳ වේලාවක් තුරුල් කොටගෙන සිටියාය. ගිලිහෙන්නට ඔන්න මෙන්න කඳුළු බිඳු ඇගේ දෑස පුරා දිලිසෙමින් තිබිණි. තමා ගියාට පසුව ඇය සිත් සේ වැලපෙනු ඇතැයි දේවින්දිට සිතිණි. කෙනෙකු ගෙදරින් පිට වෙද්දී අනෙක් අය කඳුළු සැලීම අප්පච්චි කිසිම දිනෙක අනුමත කළේ නැත. අම්මා සිය කඳුළු අසීරුවෙන් සඟවා ගන්නට ඇත්තේ එහෙයිනි.

"අම්මා දුක් වෙන්න එපා... කොහේ ගියත් පරිස්සම් වෙන්න මං දන්නවා..." ඇය අම්මාගේ දෙකොපුල් සිප ගනිමින් පැවසුවේ පොරොන්දුවක හඬිනි.

"අනිත් එක මේක ලංකාවෙම තැනක්නෙ... නුවර කියන්නෙ අපිට නුපුරුදු පළාතකුත් නෙවෙයි... ගිහින් දවසක් දෙකක් ඉඳලා බලලා හොඳ නැත්නම් අනිත් අතට හැරිලා එන එකයි තියෙන්නෙ... ඔයිට වැඩිය ගැණු දුන් පිට රට රස්සාවලටත් යන්නෙ..." අත්තනායක මහතා පැවසුවේ බිරිඳගේ හිත් හැදීමේ අරමුණින් යුතුවය. ඇය ආදරයෙන් දේවින්දිගේ නළලත සිප සිය ශුභාශිංසනයෙන් මිදුවාය.

දේවින්දි කාරයට නැගුණේ යළිත් වරක් ආපසු හැරී නොබලාමය.

"කාර්වලින් ගිහින් බහින කුස්සි අම්මලා ලංකාවෙ නම් නෑ..."

දුමිඳු සරදම් කළේය. ඔහු දෙස බැලූ දේවින්දි මුහුණ ඇද කළාය. එහෙත් ඔවුන් දෙදෙනාම හැසිරුණේ සිතේ කැරකෙන නියම හැඟුම් සඟවාගෙනය. අප්පච්චි රියැදුරු අසුනට



නැගුණේය. දේවින්දි ආපසු හැරී බැලුවේ කාරය ගේට්ටුවෙන් පිට වූවාට පසුවය. අම්මා කඳුළක් පිස ගනුත් අක්කා ඇගේ උරහිසට අත තබාගෙන යමක් මුමුණනුත් ඇයට පෙනිණි. අයියා නිකට පිරිමදිමින් කාරය දෙස බලා සිටියේය.

"අම්මට සාංකාව නැද්දැයි ද දන්නෙ නෑ අප්පච්චි..." දේවින්දි මිමිණුවේ සැබෑම දුකකිනි.

"ගෑණු කියන්නෙ මහ පුදුමාකාර ජාතියක් පුතා... ඇල්පෙනෙත්ති තුඩක් ඇගේ ඇනුණත් ඉකි ගගහ අඬනවා... ඒත් ප්‍රසව වේදනාව දරා ගන්නවා - අම්මා ඉක්මනට හිත හදා ගනීවි... ඔයා ඒ ගැන හුඟක් දුරට හිතන්න එපා..."

අප්පච්චි දිගටම කතා කළේ ඉංග්‍රීසියෙනි. ඔහු අනෙක් අය ඉදිරියේදී නොසැලී සිටින්නට උත්සාහ කළ ද සිත් වේදනාවෙන් පෙළෙන බව වටහා ගත් දේවින්දි දිගු සුසුමක් හෙලුවාය.

කිරි ගරුඬින් නිම වුණු ගේට්ටු කුළුණු දෙකේ සවි වුණු පිත්තල තහඩුවල සූරියතැන්න වලව්ව යයි ඉංග්‍රීසියෙන් හා සිංහලෙන් ලියැවී තිබිණි. ගේට්ටු කුළුණු වල පවා ඇත්තේ මහේශාක්‍ය පෙනුමකැයි දේවින්දි සිතුවාය. ගෝලාකාර හැඩයට එකම ගණනකට කපන ලද පයිනස් ගස් දෙපේළියක් අතරින් පාර වැටී තිබිණි. ධවල පැහැයෙන් බබලන දෙමහල් මන්දිරය දකිද්දී දේවින්දිගේ සිතට බියක් බඳු හැඟීමක් ද දැනිණි. ඇය පයිනස් ගස් අතර පාරේ නිහඬව රිය පදවමින් සිටි අප්පච්චි දෙස බැලුවාය.

"ඔයාට හිතෙනව ද මැනේජ් කර ගන්න පුළුවන් වේවි කියලා...?"

www.sinhalaelibrary.com

ඇගේ බැල්ම තේරුම් ගත්තාක් මෙන් අප්පච්චි විමසුවේය. ඔහුගේ මුවග මඳ සිනාවක් තිබුණ ද දෙනෙතෙහි වූයේ ගැඹුරු බැල්මකි.

"පුළුවන් වෙයි අප්පච්චි..." දේවින්ද්‍ර පහන් වුව ද ස්ථිර හඬින් පැවසුවාය.

පයිනස් මාවත කෙළවර වූයේ පොකුණක් මැදි කොට ගෙන දෙකට බෙදීමෙනි. ඒ මාවත් දෙකම වියනක් මෙන් එක දිගටම පැතිරුණු බෝගන්විලා මල් ආරුක්කු වලින් යුතු විය. ඇය මෙතෙක් කල් නොදුටු විරූ පාටැති බෝගන්විලා ද ඒ අතර තිබිණි. සරුවට මල් පිපුණු ඇන්තූරියම්, රෝස, ඔකිඩ්, බාබටන්වෙසි, ඩේලියා ආදී මල් පාත්ති රැසක් මිදුල පුරා විසිරී තිබිණි. දේවින්ද්‍ර වට පිට බැලුවේ ආශාවෙනි. මල් පාත්ති පසුබිම් කොට ගෙන ගරු ගාම්භීරාකාරයෙන් වැජඹෙන වලව්ව ඕනෑම අයෙකුගේ සිත් පැහැර ගන්නකි. ඇය කුඩා කාලයේ දුටු වලව්වම කිසිදු වෙනසක් නොමැතිව තිබෙනු දුටු දේවින්ද්‍ර ප්‍රීතියෙන් ඉපිල ගියාය.

"හේ හරිම ලස්සනයි අප්පච්චි..." ඇය පැවසුවේ අලුත් ඇඳුමක් දුටු දැරියකගේ සතුටින් යුතුවය.

"ඔව් ලස්සනයි, නිස්කලංකයි..." අප්පච්චි එකඟ වූවේය.

බෝගන්විලා වියනින් සෙවන වූ පාරවල් දෙකම යොමු වී තිබුණේ වලව්වේ ඉදිරිපසට නොව පසුපසටය.

"වලව්වට එන අය ඉස්සරහින් ආවොත් මහන්සත්තෙට මදි වෙයි කියලා වෙන්නැති පාර මෙහෙම හදල තියෙන්නෙ.."



දකුණු පස පාර දිගේ රිය පදවාගෙන යමින් අප්පච්චි පැවසුවේය. කාරයේ හඬ ඇසුණු විගසම විසල් කුළුණු වලින් පැළුණු ආලින්දයට විවර වූ දොරකින් කාන්තාවක් මතු වූවාය. සුදු බොහිච්චි අත් හැට්ටයකින් සහ සිහින් සුදු මල් විසිරුණු හසරියකින් සැරසී සිටි ඇය මැදි විය ඉක්මවා සිටින්නියක් බව බැලූ බැල්මට පෙනිණි. අප්පච්චි කාරය නතර කළේය. කරුණාවන්ත ප්‍රසන්න මුහුණකින් යුතු ඇය සිනාවකින් යුතුව මිදුලට බැස්සාය. පැළඳ සිටි උපැස් යුවල සකස් කොට ගනිමින් කාරය දෙස උනන්දුවෙන් බැලුවාය. දේවින්ද්‍ර කාරයෙන් බසිමින් ඇය දෙස බලා සිනාවක් පෑවාය. මවිතයෙන් මෙන් කාන්තාවගේ දෙනෙත් විසල් විය.

"මේ... මේ..." ඇය ගොත ගැසුවාය.

"මම හිතන්නෙ මං අද මෙහෙ එන බව දන්නවා ඇති. මම දේවින්ද්‍ර අත්තනායක"

ඇගේ විස්මය දුරු කරන්නට මෙන් දේවින්ද්‍ර පැවසුවාය. එහෙත් ඇය වඩාත් පුදුමයට පත් වෙනු දේවින්ද්‍රට පෙනිණි.

"එතකොට ඔයාද මේ එනවා කිව්ව අලුත් හවුස් කීපර්..?"

ඇය දන උගත් කාන්තාවක බව වචන උච්චාරණය කළ විලාසයෙන්ම දේවින්ද්‍රට දැනිණි. මෙවන් වලව්වක නූගත් කාන්තාවකට රැකියාවක් කරන්නට නොහැකි බව ඇය කලින්ම දැන සිටියාය.

"ඔව්... ඒ මම තමයි..."

දේවින්ද්‍ර පැවසුවේ මුවෙහි වූ සිනාව මඳකිනුදු වෙනස් නොකරමිනි.

www.sinhalaelibrary.com

"දනට මෙහෙ ඉන්න හවුස් කීපර් මමයි... මම ළඟදිම රිටයර් වෙනවා... ඒකයි වෙන කෙනෙක්ට ගෙව්වෙ... හැබැයි අපි හිතාගෙන හිටියෙ මේ වගේ පුංචි කෙල්ලෙක් එයි කියල නෙමෙයි..."

මෙසේ කී කාන්තාව කාරය දෙසට එබී බැලුවාය. අත්තනායක මහතා ස්ටියරින් වීලය මත දෑත තබාගෙන ඔවුන්ගේ සංවාදය අසා සිටියේය. දෙව්න්දි කාරයට නැඹුරු වූවාය.

"අප්පච්චිට පරක්කු වෙනවනෙ... ඒ හින්දා යන්න..." ඇය මිමිණුවාය.

"ඔව්. කොහොමත් මං ඉන්න එක හරි මදි... ඔයා එහෙනම් පරිස්සමින් ඉන්න. මොනවා හරි ප්‍රශ්නයක් වුණොත් ටක් ගාලා කෝල් එකක් දෙන්න..."

අප්පච්චි ඉංග්‍රීසියෙන් පැවසුවේය. එහෙත් කට හඬේ වූ බිඳුණු බව සඟවන්නට ඔහුට හැකි වූයේ නැත. මෙතෙක් නොදනුණු වේදනාවක් හදවත ආක්‍රමණය කරනු දෙව්න්දිට දනිණි.

"මම පරිස්සම් වෙන්නම් අප්පච්චි..." ඇය මිමිණුවාය.

කාරයෙන් බට අත්තනායක මහතා දෙව්න්දිගේ බෑගය ආලින්දයෙන් තැබීය. කාන්තාවගේ මුහුණින් මවිතය පලා ගියේම නැත.

"කාර් වලින් ගිහිල්ලා බහින කුස්සි අම්මලා ලංකාවෙ නම් නෑ..."



දෙව්න්දිට අයියාගේ සරදම් සහගත වදන් සිහිපත් විය. අප්පච්චි ගෘහ පාලිකාව දෙස සිනාමුසුව බැලීය. එහෙත් ඒ සිනාවට යටින් වූ කනස්සල්ල දෙව්න්දි හැඳින ගත්තාය.

"මේ අප්පච්චි ද...?" ඇය දෙව්න්දි දෙස බලා විමසුවාය.

"ඔව්..." ඇය පැවසුවේ ඔහුගේ අතින් ද අල්ලා ගනිමිනි. ගෘහ පාලිකාව හිස සැලුවාය.

"මෙහෙ ළමයට තිසල යන්න පොඩ්ඩක්වත් බය වෙන්න එපා... කිසිම කරදරයක් තියෙන තැනක් නෙමෙයි... මම අවුරුදු තිහක්ම වැඩ කළේ මෙහෙ... පුතාගෙ කරදරේටයි රිටයර් වෙලා එයාලගෙ ගෙදර යන්න හිතුවෙ..."

ගෘහ පාලිකාව කියාගෙන ගියාය. අප්පච්චිගේ හැඟුම්බර මුහුණ යන්තමින් එළිය වෙනු දෙව්න්දිට පෙනිණි. මෙතෙක් වෙලාම ඇයගේ ආරක්ෂාව පිළිබඳව ඔහු කල්පනා කරමින් සිටින්නට ඇත.

"කාමර අස් පස් කරන්න. රෙදි සෝදන්න හැම දේටම ගමේ ගෑණු කීප දෙනෙක් එනවා. මෙයාට තියෙන්නෙ ඉවුම් පිහුම් වැඩයි කාමර සරසන එකයි විතරයි... වෙනම ඇනෙක්ස් එකක් තියෙනවා ඉන්න. ඕන වෙලාවට නිවාඩු ගන්න පුළුවන්..."

ඇය එවර කතා කළේ ඉංග්‍රීසියෙනි. එය තම දනුම ප්‍රදර්ශනය කරනු සඳහා ද අප්පච්චි තුළ විශ්වාසය තහවුරු කරනු සඳහා ද යන්න දෙව්න්දි දන සිටියේ නැත. එහෙත් අප්පච්චි තුළ සුළු සැකයක් හෝ තිබිණි නම් එය ඉවත්ව යන්නට ඇත.

"මෙයාට පොඩ්ඩක් ට්‍රේන් කරන්න... මේ වගේ ජොබ් එකක් කරලා පුරුද්දක් නැහැ..." අප්පච්චි පවසද්දී ගෘහ සේවිකාව සිනාසුණාය.

"කොහොමත් මෙයා ට්‍රේන් වෙනකම් මම මෙහෙන් යන්නෙ නෑ... අනිත් එක අමුතුවෙන් ට්‍රේන් කරන්න දෙයක් නැහැ.. දවස් දෙක තුනක් ඉන්නකොට කරන්න ඕන මොනවද කියල තේරුම් ගන්න පුළුවන්... මම අවුරුදු ගණනක් ආණ්ඩුවේ ටයිපිස්ට් කෙනෙක් විදියට වැඩ කර කර ඉඳලයි මෙහෙ ආවෙ... හැම වැඩක්ම නිකම්ම පුරුදු වුණා..."

ගෘහ පාලිකාවගේ කතා බහ නිසා අප්පච්චි සැහීමකට පත් වෙන්නට ඇත. ඔහු සිනාවකින් යුතුව දේවින්දි දෙස බැලුවේය.

"ඔයාගෙ අලුත් රස්සාව සාර්ථක වෙනවා කියල මට සහතිකයි"

ඔහු ඉංග්‍රීසියෙන් පැවසුවේය. ගෘහ පාලිකාව එය අනුමත කරමින් හිස සැලුවාය.

දේවින්දි අප්පච්චිගේ දෙපා වැන්දාය. නැඹුරු වී දෑලවින් අල්ලා ඇය එසවූ ඔහු ඇගේ දෙකොපුල් සිප ගත්තේය. ඇය දෙනෙතින් පිට වෙන්නට අර අඳින කඳුළු ආයාසයෙන් සිර කොටගෙන සුසුමක් හෙලුවාය.

"පරිස්සමින් යන්න අප්පච්චි. මුදු පරණයි... අම්මට දුක් වෙන්න එපා කියන්න..."

අප්පච්චි හිස සලා කාරයට නැගුණේය. දේවින්දි ආපසු හැරුණේ කාරය නොපෙනී ගියාට ද පසුවය. ඒ වන විට ගෘහ



පාලිකාව අසළ හැඩි දැඩි පෙනුමෙන් යුතු මැදිවියේ පුද්ගලයෙක් ද සිටගෙන සිටියේය. ඔහුගේ දෙනෙත බලවත් කුතුහලයකින් මෙන් දේවින්දි දෙසම යොමු වී තිබිණි.

"මේ වලව්වෙ හාමුදුරුවන්ගෙ නෑයෙක් ද නෝනා...?" ඔහු දේවින්දි දෙස බලාගෙනම ගෘහ පාලිකාවගෙන් විමසුවේය.

"මේ අපේ ගාඩිනර්... එයා තමයි මුළු වත්තෙම මෙච්චර ලස්සනට මල් වවල තියෙන්නෙ..."

ඔහු කී දෙය නෑසුණාක් මෙන් ඇය දේවින්දි දෙසට හැරී පැවසුවාය. ඔහු බැගෑපත් ලෙස සිනාසී දේවින්දිට හිස පහත් කළේය. පිටතින් දකින්නට තිබෙන හැඩි දැඩි බව ඔහුගේ ඇතුළාන්තයේ නැතැයි ඇය අනුමාන කළාය. දේවින්දි යන්තමින් සිනාසුණාය.

"ආයෙ ඇරලු අහක් නෑ... අපේ වලව්වෙ හාමුදුරුවො වගේම තමයි..."

ඔහු තමාටම කියා ගන්නාක් මෙන් මිමිණුවේය. දේවින්දි ප්‍රශ්නාර්ථයෙන් ගෘහ පාලිකාව දෙස බැලුවාය.

"මං මෙහෙන් අස්වෙලා ගියාම මෙයා තමයි මං වෙනුවට ඉන්නෙ..." ඇය උයන්පල්ලාට පැවසුවාය.

උයන්පල්ලා එය අදහා ගත නොහැකිව මෙන් මොහොතක් බලා සිටියේය.

"අනේ වාසනාවන්..." ඒ ළඟ මොහොතේ ඔහු මිමිණුවේය.

www.sinhalaelibrary.com

"අපි යමු ඇතුළට..."

ගෘහ පාලිකාව පවසද්දී දේවින්දි බෑගය අතට ගැනීමට නැමුරු වූවාය. උයන්පල්ලා වහා එය ඇය අතින් ගත්තේය.

"මම ගිහින් දෙන්නම් බෑග් එක..."

"හරි පුදුමයි... මන්නේ වැඩ ඇර වෙන කිසිම දෙයක් කරන මිනිහෙක් නෙමෙයි කවදාවත්..."

ඇය දේවින්දි දෙසට හැරී ඉංග්‍රීසියෙන් පැවසුවාය.

වලව්වක තිබිය යුතු යයි දේවින්දි අනුමාන කළ හැම අංගෝපාංගයක්ම සූර්යකාන්ත වලව්වේ තිබිණි. පෞරාණික කැටයම් භාණ්ඩ කළුවර ලීයෙන් තනා ඇත් දත් කැටයමින් අලංකාර කරන ලද ගෘහ භාණ්ඩ, සේසත් ආදියෙන් සැරසුණු මනෝඥතා පෙනුමින් යුතු සාලය පසෙකින් උඩුමහල කරා යොමු වූ පියගැට පෙළ වැටී තිබිණි. එය මුහුණ පෙනෙන තරමට ඔප දැමූ තේක්ක ලීයෙන් නිම වූ පියගැට පෙළකැයි දේවින්දි අනුමාන කළාය. උස පිත්තල පහන් දෙක දෙපස වූ පිත්තල මල් පෝච්චිවල වූයේ කෘත්‍රිම සූර්යකාන්ත මල් යයි දේවින්දිට සිතිණි. නැබැවින්ම මෙවන් ස්ථානයක සේවය කිරීම සතුටුදායක අත්දැකීමක් විය හැකි යයි ඇය සිතුවාය. ඇය සාලය මැද සිටගෙන සිරි නරඹද්දී ගෘහ පාලිකාව සිනාමුසු මුහුණින් ඇය දෙසම බලා සිටියාය.

"කොහොමද වැඩ කරගෙන යන්න පුළුවන් වෙයි කියලා ඔයා හිතනව ද...?"

මෙහි පැමිණෙද්දී අප්පච්චි විමසූ ආකාරයටම ඇය ද



විමසුවාය. ඇය සිනාසී හිස සැලුවාය. ඇයට කෝසල මෙනෙහි විය. ඇය මෙහි එනවාට විරුද්ධත්වය පෑමක් වශයෙන් ඔහු ඇය හමු වීමටවත් පැමිණියේ නැත. එහෙත් මේ වලව්ව දුටුවේ නම් ඔහුට පවා මෙහි සේවය කිරීමේ ආශාවක් ඇති වනු ඇතැයි ඇයට සිතිණි.

සුන්දර තරුණ කාන්තාවකගේ චිත්‍රයක් පිය ගැට පෙළ අබියස බිම තබා තිබිණි. ඇය සිරියේ වැලමිටට වාරු දී කවිච්චියක ඇළ වී ගෙනය. ඇගේ දිගු වරලස උරහිස මතින් ඉදිරියට ගෙන සිරුර පුරාම විසුරුවා තමා තිබිණි. එම සුන්දර මුහුණේ කුමක්දෝ නුරු පුරුදු බවක් ඇතැයි දේවින්දිට සිතිණි. ඇය වඩාත් ළං වී එදෙස බැලුවාය.

"හරිම ලස්සන චිත්‍රයක්... චිත්‍රයක් කියල කියන්නත් බෑ... හරියට පණ පිටින් ඉන්නව වගේ..." දේවින්දිට කියැවිණි.

"ඔය අපෙ වලව්වෙ හාමුදුරුවෝ... ඒ කාලෙ හිටපු හුගක් දක්ෂ ආටිස්ට් කෙනෙක් ඔය පින්තූරය ඇඳල තියෙන්නෙ"

ගෘහ පාලිකාව පැවසුවාය. දේවින්දිගේ සිතට දැනුණේ විස්මයකි. ඇය පින්තූරය දෙස වඩාත් ඕනෑකමින් බැලුවාය. සැමියා අසනීපයෙන් සිටියදී කුඩා පුතු ද තනි කොට දමා අතුරුදහන් වූයේ යයි අප්පච්චි පැවසුවේ ඇය පිළිබඳව විය යුතුය. එහෙත් එවැනි අකාරුණිකවන්ත කමක් එම මුහුණේ ගැබ් වී තිබුණේවත් නැත. ඇය ගැන විස්තර විමසන්නට ආ සිතුවිල්ල දේවින්දි ආයාසයෙන් මැඩ ගත්තාය.

"ආ... ලියන මහත්තයා..."

www.sinhalaelibrary.com

ගෘහ පාලිකාවගේ කට හඬ ඇසුණු දේවින්දි පින්තූරයට නැඹුරුව තිබූ හිස ඔසවා හැරී බැලුවාය. කළු කලිසමකින් හා සුදු කමිසයකින් සැරසුණු මැදි වියේ පිරිමියෙක් සාක්කු දෙකට දෑත රුවාගෙන ඇය දෙස බලා සිටියේය. ඔහු උස කෙට්ටු, හැනැත්තෙකි. හිස මුදුනේ මුළුමනින්ම තට්ටය පෑදී තිබිණි. ඝන දෙබැම එකට යාවී තිබූ නිසාත් පොල් ගෙඩියක් මෙන් දිගැටි මුහුණ නිසාත් ඔහුගේ මුහුණේ වූයේ තපුරු පෙනුමකි. බැලූ බැල්මටම දේවින්දිට ඔහු අප්‍රසන්න විය. ඔහු සිනාවක් පවා නොපා දේවින්දිගේ හිසේ සිට දෙපතුල දක්වාම බැලුවේය. ඔහුගේ දෙනෙතේ විස්මයක් උදා වී නැති වී යනු දේවින්දි දුටුවාය.

"කවුද මාජ් මේ...?" ඔහු ගෘහ පාලිකාව දෙසට හැරී විමසුවේය.

"මේ තමයි අපේ අලුත් හවුස් කීපර්... දේවින්දි, මේ අපේ ලියන මහත්තයා... බණ්ඩාර හාමුදුරුවන්ගෙ වැඩවලට උදව් වෙන්නෙ එයා තමයි..."

ගෘහ පාලිකාව සිනාමුසු මුහුණින් ඔවුන් එකිනෙකාට හඳුන්වා දුන්නාය. ඇගේ නම මාජ් බව දේවින්දි දැන ගත්තේ එවිටය. ලියන මහත්තයා දෙස බලා සිනාවක් පාන්නට දේවින්දි සමත් වූවාය. එහෙත් ඔහු කිහිප වතාවක් හිස සැලුවා පමණකි.

"අපි මෙච්චර පොඩි කෙල්ලෙක් බලාපොරොත්තු වුණේ නෑ නේද මාජ්..." ඔහු විමසුවේය.

"ඒ වුණාට මම නම් හිතන්නෙ මේ වගේ වලව්වකට කෙල්ලෙක් තමයි ගැලපෙන්නෙ... වලව්ව ඇතුළේ හැතැප්ම



කියක් නම් ඇවිදින්න තියෙනව ද...?"

මාජ් පැවසුවේ සිනාව මදකටවත් මුවින් බැහැර නොකරමිනි. එහෙත් ඔහුගේ මුහුණේ වූ දැඩි කුඩු නොවූ පෙනුම එකම මොහොතකටවත් වෙනස් වූයේ නැත.

"මේ වාගෙ කෙල්ලෙකුට රහට උයන්න පුළුවන් වෙයි කියල මම නම් හිතන්නෙ නෑ..."

ඔහු මුමුණද්දී දේවින්දිගේ පමණක් නොව මාජ්ගේ මුහුණේ පෙනුම ද වෙනස් වී ගියේය. මාජ් යමක් කියන්නට මෙන් කට පාදා නැවතත් නිහඬ වූවාය.

මිනිසුන් මෙතරම් සම්ප්‍රදායික ආකාරයට සිතන්නේ මන්දැයි දේවින්දි කල්පනා කළාය. දැන උගත් අයෙකුට ගෘහ පාලිකා තනතුර වැනි රැකියාවක් ගැලපෙන්නේ නැත. මැදි වියේ අයෙකුට මිස තරුණියකට රසට කෑම පිසින්නට හැකියාවක් නැත.

"මට පුළුවන් වුණොත් හැමෝගෙම ඔය අදහස් වෙනස් කරන්නම්කො..." දේවින්දි තරයේ සිතුවාය.

"මාජ් මම මෙයාව බණ්ඩාර මහත්තයා ළඟට එක්කරගෙන යන්නම්... ඔයා ගිහින් වැඩක් කරගන්න..."

ඔහු පැවසුවේ අණ කරන ස්වරයෙනි. එම ස්වරයට ඇය අකැමැති බව මාජ්ගේ වෙනස් වූ මුහුණින්ම දේවින්දිට වැටහිණි. එහෙත් ඇය කිසිවක් නොකියාම සාලය සියමං කොට නොපෙනී ගියාය. එදෙස බලා සිටි දේවින්දිගේ සිතේ තනිකමක් බඳු හැඟීමක් ඇති විය.

www.sinhalaelibrary.com

"එන්න දේවින්දි..."

විශාල සාලය දකුණු පසින් වූ කාමරයක් වෙතට ගිය ලියන මහත්තයා එහි දොරට තට්ටු කළේය. හිස කෙස් හා ඔසරි පොට සකස් කොට ගත් දේවින්දි ඔහු පසෙකින් සිටගෙන සිටියේ තරමක චකිතයෙන් යුතුවය. මැදි වියේ ගෘහ පාලිකාවක බලාපොරොත්තුවෙන් සිටි බව සියලු දෙනාගෙන්ම තියැවිණි. බණ්ඩාර හාමුදුරුවෝ වශයෙන් හැඳින්වෙන තැනැත්තා ද එලෙසම සිතුවහොත් රැකියාව අහිමි වෙනු ඇද්දැයි බියක් ඇගේ සිත තුළ විය.

"එන්න..."

කාමරය තුළින් හඬක් ඇසිණි.

ලියන මහත්තයා කාමරය තුළට පිවිසියේ දේවින්දිට හිසින් සන් කර ගෙනමය. ඇය ද ඔහු අනුව කාමරයට පිවිසියාය. එය විශාල කාමරයකි. කාර්යාලයක් වශයෙන් මෙන්ම පුස්තකාලයක් වශයෙන් ද එය භාවිතා කරන බව බැලූ බැල්මටම පෙනිණි. දොර කෙළින්ම බිත්තියේ වූයේ ඇය මොහොතකට පෙර දුටු සුන්දර කාන්තාවගේම උඩුකය සේයාරුවකි.

කාමරයේ එහා කොණේ ජනේලය ළඟ රෝද පුටුවක වාඩි වී ගෙවත්ත දෙස බලා සිටින තැනැත්තා වෙත දේවින්දිගේ අවධානය යොමු වූයේ මොහොතකට පසුවය. ඔහු සෙමින් රෝද පුටුව හැරවූයේය.

"ඇයි පියතිලක...?"



"බණ්ඩාර හාමුදුරුවො මේ දේවින්දි අත්තනායක..."

ඔහු පූර්ව හැඳින්වීමක් නොකොට දේවින්දිගේ නම පමණක් පැවසීය. පුරියතැන්න වලව්වේ හිමිකරුවා මොහු බව දේවින්දිට එක් වරම වැටහිණි. එහෙත් ඔහු තුළ වූයේ දේවින්දි බලාපොරොත්තු වූ ආකාරයේ තේජවන්ත පෙනුමක් නොව නිවුණු කරුණාවන්ත පෙනුමකි. ඇයට අප්පච්චි සිහිපත් විය. පියතිලකගේ මුහුණේ වූ රැලුරු පෙනුම නිසාම බණ්ඩාර හාමුදුරුවන්ගේ මුහුණ වඩාත් කැපී පෙනිණි. ඇයට ඔහු පිළිබඳව අනුකම්පාවක් හා ළෙන්ගතු හැඟීමක් එක් වරම දැනිණි.

"දේවින්දි අත්තනායක...?"

එසේ කියමින් ඔහු රෝද පුටුව පදවාගෙන දේවින්දි ඉදිරියට ආවේය. දේවින්දි මදක් බිය මුසු සිනාවක් පෑවාය. බණ්ඩාර හාමුදුරුවන්ගේ මුහුණ එක්වරම වෙනස් වී යනු ඇයට පෙනිණි. ඔහු පුටුවේ ඇඳි දෙක තරයේ අල්ලාගෙන නැඟිටින්නට මෙන් උඩු කය සෘජු කොටගෙන ඇය දෙස බලා සිටියේය. ඔහුගේ දෙනෙත මෙන්ම මුව ද මවිතයෙන් මෙන් විවර වී තිබිණි.

"මාජ් වෙනුවට වැඩට එන්නෙ මෙයා තමයි බණ්ඩාර හාමුදුරුවනේ..."

ඔහුගේ මුහුණේ පෙනුම එතරම් වෙනස් වූයේ මන්දැයි දේවින්දි දුක්මුසුව සිතද්දීම පියතිලක පැවසුවේය. ඔහු සුසුමක් හෙළා සන්සුන් වූ බව අඟවමින් පුටු ඇන්දට හේත්තු වූයේය. ඊ ළඟට දේවින්දි දෙස බලා සිනාවක් පෑවේය. ඔහු තමා පිටු දකිනු ඇතැයි හැඟීම ඇගේ සිතින් ඉවත් වී ගියේ

www.sinhalaelibrary.com

එමෝංගොනේය.

"කාලෙකට පස්සෙ ගෙදරට තරුණ කෙල්ලෙක් ආව එකත් ලොකු දෙයක් නැද්ද පියතිලක..."

බණ්ඩාර හාමුදුරුවෝ සිනාසෙමින්ම පියතිලක දෙස බැලුවේය. එහෙත් ඔහු සුපුරුදු ලෙස හිස සැලුවා පමණකි.

"මේ මිනිහා හිනා වෙන්න දන්නෙම නැද්ද මන්දා..." දේවින්දි සිතුවේ අමනාපයෙනි.

"දන් මේ ගෙදර වැඩ කරන අයත් මාත් එක්කම වයසට ගිහිල්ලා... දේවින්දී වාගෙ කෙනෙකුට අපිත් එක්ක ඉන්න එපා වෙයි ද දන්නෙ නෑ..."

බණ්ඩාර හාමුදුරුවන්ගේ ප්‍රසන්න ස්වරයෙන් දේවින්දිගේ සිතේ ඇති වූ ලෙන්ගතු හැඟීම වඩාත් වැඩි වූයේය.

"මගෙ පුතත් වැඩිපුර ගෙදර ඉන්නෙ නෑ... කතා කරන්නවත් කෙනෙක් නැති නිසා ඔයාට ටිකක් පාළු දැනෙයි..."

"මං හරිම කැමතියි නිස්කලංකව ඉන්න. ඒ නිසා මට පාළුවක් දැනෙන එකක් නෑ..." ඇය සැණෙකින් පිළිතුරු දුන්නාය.

"කෝ බලන්න අපේ අලුත් හවුස් කීපර්...?"

දොරකඩින් ඇසුණු කටහඬින් තිගැස්සුණු දේවින්දි හැරී බැලුවාය. හැඳ සිටි වෙහිම කලිසමේ සාක්කු දෙකේ දැත රුවා



ගත් තඩමසම් තරුණයෙක් ඇය දෙස බලාගෙන සිටියේය. ඔහුගේ දෙබැම හැකිළී තිබුණේ ඇය කෙරෙහි අප්‍රසාදයක් පළ කරන ආකාරයෙනි. ඔහුගේ යන්තමින් රැළි ගැසුණු කොණ්ඩය නොසැලකිලිමත් ආකාරයකට මුහුණ වටා විසිරී තිබිණි. එසින් ද තඩමසම් බව වැඩි වන බව බැලූ බැල්මටම දේවින්දිට වටහා ගත හැකි විය.

"දේවින්දි... මේ මගේ පුතා ධනුෂ්ක..."

සූරියතැන්න මහතා පැවසුවේය. දේවින්දි මඳ සිනාවක් පෑවාය. එහෙත් ධනුෂ්කගේ ඉරියව් මොහොතකටවත් වෙනස් වූයේ නැත. ඔහු තවමත් අර තියුණු බැල්මෙන් ඇය දෙස බලා සිටියේය. ඇගේ මුහුණින් සිනාව පලා ගියේය. ඇය නැවතත් සූරියතැන්න මහතා වෙතට හැරුණාය. පියතිලක හෙවත් ලියන මහත්තයා අර නපුරු මුහුණට බැරෑරුම් පෙනුමක් ආරූඪ කරගෙන ඔහු අභියසම සිටගෙන සිටියේ ආරක්ෂක භටයෙකු පරිද්දෙනි.

"අපි මේ වාගෙ හවුස් කීපර් කෙනෙක් නෙමෙයිනෙ බලාපොරොත්තු වුණේ..."

ධනුෂ්ක පවසද්දී එය අනුමත කරන්නාක් මෙන් පියතිලක හිස සැලුවේය. දේවින්දිගේ සිතට බියක් බඳු හැඟීමක් දැනිණි. මෙම නිවසට පැමිණි මොහොතේ සිටම ඇය තුළ මෙහි ජීවත් වීමේ ආශාව වැඩි වැඩියෙන් ඇති විය. ධනුෂ්ක ඇයට රැකියාව ලබා නොදෙනු ඇතැයි හැඟීම ඇය බියට පත් කළේ එහෙයිනි. හැම දෙනාම බලාපොරොත්තු වී සිටින්නට ඇත්තේ මාසීගේ වයසේ ගෘහ පාලිකාවක් වෙන්නට ඇත. ඇගේ පැත්තට කතා කළේ සූරියතැන්න මහතා පමණකි.

"මට නම් දේවින්දිගෙ මොකුත් වරදක් පේන්නෙ නැහැ... එයා එවපු සහතිකවලත් ඕන තරම් සුදුසුකම් තියෙන බව අපි දක්කනෙ... අනික් එක මේ වගේ ලොකු ගෙදරක වැඩ කරන්න මේ වයසෙ කෙල්ලෙක් තමයි ගැලපෙන්නෙ..."

ඔහු පැවසුවේ දේවින්දි දෙස බලා සිනාවක් ද පාමිනි. මාජි ද මෙම අදහසම දරූ බව දේවින්දි සිහිපත් කළාය.

"සහතික නම් කාටත් හදා ගන්න බැරියැ... කවුද දන්නෙ මෙයා මොකක් හරි ප්ලෑන් එකක් හිතේ තියාගෙන ආව කෙනෙක් ද කියලා..."

ධනුෂ්ක පැවසුවේ දේවින්දි හොඳින් බලා ගැනීමට මෙන් කාමරය තුළට තවත් අඩි දෙක තුනක් පැමිණෙමිනි. දේවින්දිගේ සිතට බලවත් අපහසුවක් දැනිණි. සැලසුමක් වශයෙන් ඔහු අදහස් කරන ලද්දේ කුමක්දැයි ඇයට එක්වරම වැටහුණේ නැත. ඇය සූරියතැන්න මහතා දෙස බැලුවාය. ඔහුගේ මුහුණේ වූයේ ද ප්‍රහේලිකාත්මක බැල්මකි.

"ඔව් කියන්න බෑ... අද සංවිධානාත්මක හොරු කල්ලි ඉන්නවා... මේ වගේ කෙල්ලෙක් ඇමට දමලා ඕන දෙයක් කරගන්න ලේසියිනෙ..."

පියතිලක පැවසුවේ ඉංග්‍රීසියෙනි. තමා ඉංග්‍රීසි නොදන්නා බව ඔහු සිතුවේ දැයි දේවින්දි නොදන්නාය. දේවින්දිගේ සිතට දැනුණේ කෝපයකි. එහෙත් අප්පච්චිගේ ඔවදන් සිහි කළ ඇය හැකි තාක් සන්සුන් වෙන්නට වෙර දැරුවාය.

"මම මේ රස්සාවට ආසයි... ඒ මිසක් වෙන කිසිම



ප්ලෑන් එකක් නෑ... මට රස්සාව දෙන්න අකමැති නම් ඒක කෙළින්ම කියන්න... මං කැමති නෑ අපහාස කරනවට..."

දේවින්දි ද ඉංග්‍රීසියෙන්ම පැවසුවාය. ඔවුන් තිදෙනාම මුහුණින් මුහුණ බලා ගනු ඇයට පෙනිණි. පියතිලක තිත්ත කසාය බිව් ගොලුවෙකු මෙන් වටපිට බලන්නට විය. දේවින්දිට සිනාසෙන්නට සිතුණත් ඇය නිහඬ වූවාය.

"දැන් ඔය කතාව නවත්තමු... දේවින්දිගෙ වයස අපිට ප්‍රශ්නයක් නෑ. එයාව සැක කරන්න තරම් හේතුවකුත් නැහෙ... එයාගෙ වැඩ කොහොමද කියල අපි සතියක් විතර බලමු... හොඳ නැත්නම් අයින් කරමු..."

සූරියතැන්න මහතා පැවසුවේ සියල්ල තීරණය කළ හඬකිනි. දේවින්දිට ඔහු කෙරෙහි ඇතිවූ පැහැදීම නිමක් නැති තරම් විය.

"මට වගේම අප්පච්චිටත් රසට කෑම ඕන... ගෙදර හැම දෙයක්ම පිළිවෙලට තියෙන්න ඕන... ඒක හොඳට මතක තියා ගන්න..." ධනුෂ්ක දැඩි හඬින් පැවසුවේය.

"හොඳයි සර්..."

ඇය ආචාරශීලීව පැවසුවාය. එහෙත් ඇගේ කටහඬෙහි සිහින් උපහාසයක් ද වූ බව ඇයටම වැටහිණි.

"අප්පච්චි මම හෙට ලන්ච් එකට එන්න කියලා තැන්දලට කිව්වා... හෙට ලන්ච් හදන්න ඕන දේවින්දි... මාජිට නිවාඩු දෙන්න..."

ධනුෂ්ක පැවසුවේය. සිනා පොදකුදු නොමැති වුව ද ඒ

www.sinhalaelibrary.com

මුහුණේ වූ තේජවන්ත පෙනුම පිළිබඳව දේවින්දිට මවිත නොවී සිටින්නට නොහැකි විය.

"මෙයාව දක්කම හවුස් කීපර් නෙමෙයි මනමාලි කියල් හිතයි ද දන්නෙ නෑ..."

දේවින්දිට අයියාගේ වදන් සිහිපත් විය. ඇතැම් විට කෝසල පවා එවන් යමක් සිතන්නට ඇත. එහෙත් මෙතරම් රළු, අහංකාර හැසිරීමක් ඇති තැනැත්තෙකුගෙන් මෘදු වචනයක්වත් බලාපොරොත්තු වීම සිහිනයක් යයි ඇයට සිතිණි.

"මාජි කොහොමත් තව දවස් දෙක තුනයි ඉන්නෙ... හෙට එයාව නිවාඩු දෙන්න බැහැ..." සූරියතැන්න මහතා පැවසුවේ ස්ථිර හඬිනි.

"හෙට ලන්ච් එකෙන් පස්සෙ දේවින්දිව මෙහෙ තියා ගන්නව ද නැද්ද කියල මම තීරණය කරන්නම්..."

ධනුෂ්ක පිටවී ගියේ ඇයට තර්ජනය කරන්නාක් මෙන් එසේ කියාගෙනය. සිය ඉවීමේ හැකියාව ගැන කිසිදු අවිශ්වාසයක් නැතත් එම තර්ජනය දේවින්දිගේ සිතට තදින් කා වැදුණේය. ඇය යටි තොල සපාගෙන ඉදිරි බිත්තියේ වූ සූරියතැන්න මැතිණියගේ ඡායාරූපය දෙස බැලුවාය. ඇයට දනුණේ ඡායා රූපය ද තමා දෙසම බලාගෙන සිටින්නාක් මෙනි.

සැබැවින්ම එය බොහෝ වේලාවක් බලාගෙන සිටිය හැකි තරම් කාරුණික බවකින් යුතු මුහුණකි. ඇය සිටියේ මෙවුද මත දෑත බැඳගෙනය. පැළඳ සිටියේ වාම් අබරණ වුව ද



චලල් ද අමුතුම ස්වරූපයේ කැටයම් සහිත එකක් විය. තව මදක් ළං වී බැලුවේ නම් ඒවා වඩාත් පැහැදිලිව දක ගන්නට හැකිවනු ඇත.

"ධනුෂ්ක කියන දේවල් එච්චර ගණන් ගන්න එපා දේවින්දි... එයාගෙ හැටි එහෙම තමයි... හුගක් කාලයක් එයා ලංකාවෙ හිටියෙත් නැහැනෙ..."

සූරියතැන්න මහතා පැවසුවේ දේවින්දිගේ විදුණු සිත සුවපත් කරන්නට මෙනි. ඇය ඡායාරූපයෙන් දෙනෙත මෑත් කොටගෙන මඳ සිනාවක් පෑවාය.

"මට වෙස්ටර්න්, ඊස්ටර්න් ඕනම කෑමක් හදන්න පුළුවන් සර්..."

බණ්ඩාර හාමුදුරුවෝ යන වදන එතරම් කටට හුරු බැවින් දේවින්දි පැවසුවාය.

"සර් නෙමෙයි බණ්ඩාර හාමුදුරුවෝ..."

පියතිලක රළු හඬින් විරෝධය පෑවේය. මේ මිනිසා සමග කටයුතු කිරීම නම් එතරම් පහසු වනු නැතැයි දේවින්දිට සිතිණි.

"නැහැ දේවින්දිට කැමති විදියකට කතා කරපුවාවෙ... ඒක ප්‍රශ්නයක් කර ගන්න එපා... පියතිලක මාජිට කියන්න දේවින්දිට එයාගෙ රූම් එක පෙන්නන්න කියලා. ඊට පස්සෙ මෙහාට එන්න... මට වැඩ වගයක් තියෙනවා කරන්න..."

සූරියතැන්න මහතා පියතිලකට අණ කළේය. දේවින්දි දණ නමා සූරියතැන්න මහතාට ආචාර කළාය. ඇය හිස

www.sinhalaelibrary.com

ඔසවන විට ඔහුගේ දෙනෙත මුළු කඳුළක තෙතමනය රැඳී තිබිණි. ඒ මන්දැයි ඇයට අනුමාන කිරීමට හැකියාවක් තිබුණේ නැත.

පියතිලක ඇය කාමරයෙන් පිටතට කැටුව ගියේය. මාජ් ඇය බලාපොරොත්තුවෙන් මෙන් කුස්සියේ සිටියාය.

"යමු දෙවින්දි මම ඔයාගෙ කාමරේ පෙන්නන්නම්... ඒක තියෙන්නෙ උඩ තට්ටුවේ කෙලවරේ... පිට පැත්තෙන් එන්න පඩි පෙළකුත් තියෙනවා... කුස්සිය ඇතුළෙන් උඩට යන්නත් පුළුවන්..." මාජ් පැවසුවාය.

"මාජ් ඇන්ටි ඉන්නෙ කොහෙද...?"

"මට ඒ කාමරේ ලොකු වැඩියි... මම ඉන්නෙ මේ ස්ටෝර් රූම් එකට අල්ලපු කාමරේ..."

සැබැවින්ම එය දෙවින්දි බලාපොරොත්තු වූවාට වඩා බෙහෙවින් සුව පහසු හා ඉඩකඩ සහිත කාමරයක් විය. කුඩා සාලයක් ද නාන කාමරයක් ද සහිත එහි වම්පස ජනේල පේළිය ඇරුණේ ගෙවත්තටය. ගෙවත්තෙන් එහා වූයේ ගස් කොළන් පිරුණු පුංචි වන රොදකි.

"අනේ හරිම ලස්සනයි මාජ් ඇන්ටි..." ජනේලයෙන් පිටත බැලූ දෙවින්දි කෑ ගැසුවාය. මාජ් සිනාවක් පෑවාය.

"තව ඔයා ලස්සන දකින්නෙ නැහැනෙ... ඔය අඩිපාර දිගේ ඇතුළට යනකොට පුංචි වැවක් තියෙනවා... ඒ හරිය හරිම ලස්සනයි..."

"මගෙ කතාව හරි ලස්සනට ලියා ගන්න පුළුවන් වෙයි.."



දෙවින්දි සිතුවාය.

"එහෙනම් දෙවින්දි ඔයා ඇඳුම් මාරු කරගෙන වොෂ් එකක් දා ගෙන එන්න කෑම කන්න... දැන් බඩගිනිත් ඇතිනෙ... ඊට පස්සෙ පොඩ්ඩක් රෙස්ට් කරන්නකො... හවසට මම කියලා දෙන්නම් ඔයාට කරන්න තියෙන වැඩ මොනවද කියලා..." මාජ් පැවසුවේ කාමරයෙන් පිට වී යමිනි.

"තැන්ක් යූ මාජ් ඇන්ටි..."

දෙවින්දි කෘතඥතා පූර්වකව පැවසුවාය.

උයන්පල්ලා විසින් ඇගේ ඇඳුම් බෑගය කාමරය තුළ තබා තිබිණි. ඇය එය ද තල්ලු කොට ගෙන නිදන කාමරයට පිවිසියාය. සුව පහසු ඇඳක්, ඇඳුම් අල්මාරියක් පමණක් නොව කුඩා ප්‍රමාණයේ රූපවාහිනී යන්ත්‍රයක් ද කාමරය තුළ තිබිණි.

"හේ... කියල වැඩක් නෑ..." දෙවින්දිට කියැවිණි.

www.sinhalaelibrary.com

# 4

**මාජ්** බෙහෙවින් කරුණාවන්ත කත්තාවක වූවාය. ඇය වලව්වේ කාමරයක් කාමරයක් පාසා දෙව්න්දි කැටුව යමින් ඇය විසින් කළ යුතු කාර්යයන් විස්තර කොට දුන්නාය. නිවසේ වෙසෙන එකිනෙකාගේ චර්යාවන් පිළිබඳව ද ඇය වෙන වෙනම පැවසුවාය. එහෙත් දෙව්න්දිගේ කුතුහලයෙන් බර වූ සිතට දැන ගැනීමට අවශ්‍යව තිබුණේ සූරියතැන්න මැතිණිය පිළිබඳවය. මාජ් අඩුවෙන්ම කතා කළේත් ඒ පිළිබඳවමය.

"බණ්ඩාර හාමුදුරුවන්ගෙන්වත් පුංචි බණ්ඩාර මහත්තයගෙන්වත් කවදාවත් වලව්වෙ හාමුදුරුවො ගැන අහන්න එපා..."



මාජ් අවවාද කළාය. එම අවවාදයෙහි පිහිටි බව ඇඟවූව ද දෙව්න්දි කුතුහලය යටපත් කොට ගත්තේ අසීරුවෙනි.

"ලියන මහත්තයා ඉන්නෙ උඩ තට්ටුවේ අනිත් පැත්තෙ කාමරේ... කිසිම දේකට ඒ කාමරේට එහෙම යන්න එපා... ඒ කාමරේ අහළ පහළ තියෙන දේවල් මොකුත් වෙනස් කරන්න යන්නත් එපා... එයා කැමති නෑ එයාගෙ දේවල්වලට කවුරුවත් ඇඟිලි ගහනවට..."

මාජ් දිගින් දිගටම කතා කළේ අවවාදාත්මක ස්වරයෙනි. කොහොමටත් පියතිලක පිළිබඳව නම් දෙව්න්දි තුළ කිසිදු පැහැදීමක් නොවීය. ඔහු අතේ දුරින් ඇසුරු කළ යුතු කුඩු කෙට්ටු මිනිසෙකු බව පළමු හමුවේදීම ඇයට අවබෝධ වී තිබිණි.

ඇය කුතුහලයෙන් මෙන්ම බලවත් ඕනෑකමින් තොරතුරු සොයන්නට වෑයම් කළේ සූරියතැන්න මැතිණිය ගැනය. ඇගේත් තමාගේත් රුවේ බොහෝ සමානකම් ඇති බව මේ වන විට දෙව්න්දිට වැටහෙමින් තිබිණි. ඇය දුටු විගසම මාජ් තිගැස්සුණේත් "අපෙ වලව්වෙ හාමුදුරුවො වගේමයි..." යනුවෙන් උයන්පල්ලා පැවසුවේත්, සූරියතැන්න මහතා අදහා ගත නොහැකි ආකාරයෙන් බලා සිටියේත් එම නිසා විය යුතුය.

"මට ඊස්ටර්න්, වෙස්ටර්න්, ඕනෑම කෑමක් රසට හදන්න පුළුවන් මාජ් ඇන්ටි... ඒත් ධනුෂ්ක මහත්තයා ඒක විශ්වාස කරන්නෙ නැහැ... එයා කිව්වා හෙට ලන්ච් හදන විදිය බලලා මං ගැන තීරණයක් ගන්නවා කියලා..."

මාජ්ත් සමඟ කුස්සියට වී එහි බඩු බාහිරාදිය පරීක්ෂා

www.sinhalalibrary.com

කොට බලමින් සිටියදී දෙව්නිඳි පැවසුවේ දුක් ගැනවිල්ලක ස්වරයෙනි. මාජ් සිනාසුණාය.

"එයා කියන ඒවා එච්චර හිතට ගන්න එපා දෙව්නිඳි... මට නම් එයා ගැන හරි දුකයි... හැමෝටම පේන්නෙ එයා කිසිම දේකින් අඩුවක් නැති කෙනෙක් කියල තමයි... ඒත් එයා ඉන්නෙ සන්තෝසෙන් නෙමෙයි..."

"ඒ මොකද...?"

දෙව්නිඳි උවමනාවෙන් මාජ්ගේ මුහුණ දෙස බැලුවාය. කුළු බඩු, මිරිස් කුඩු ආදී බෝතල් එකින් එක දෙව්නිඳිට පෙන්වමින් සිටි මාජ් සුසුමක් හෙළා දැන් එකිනෙක පිසලා ගත්තාය.

"අම්මා පුංචි කාලෙම එයාව දාලා ගිය හින්ද ද මන්දා එයාට ගෑණු පෙන්නන්න බෑ... ගෑණු වැඩි දෙනෙක් විශ්වාස කරන්න බැරි, ආත්මාර්ථකාමී අය කියල තමයි එයා හිතාගෙන ඉන්නෙ... ඒක අතකින් එයාට දොස් කියන්නත් බෑ... මොකද එයා අම්මට හරිම ආදරෙන් හිටියෙ..."

මාජ් දොඩමළු වූ මොහොතෙහි සූරියතැන්න මැතිණිය පිළිබඳ විස්තර දැනගත යුතු යයි දෙව්නිඳිට සිතිණි.

"මිසිස් සූරියතැන්න කොයි වාගෙ එක්කෙනෙක් ද...?"

තුන පහ රාත්තය අසළින් මෑත් වූ දෙව්නිඳි කුස්සිය මැද රවුම් මේසය අසළ වූ පුටුවක වාඩි ගත්තාය.

"දෙව්නිඳිට මෙහෙ කතා කරන විදිය හුරු නෑ වාගෙ නේද...?" මාජ් විමසුවාය.



"මමත් වැඩිපුර කාලයක් හිටියෙ නුවර තමයි... ඒත් බණ්ඩාර හාමුදුරුවො වලව්වෙ හාමුදුරුවො කියන්න මට හුරු නෑ..."

"ඒකට කමක් නෑ... බණ්ඩාර හාමුදුරුවො නම් කොහොමත් ඒ වගේ දේවල් ගැන හිතන්නෙ නෑ... ඔයාට කටට හුරු විදියකට කතා කරන්න..."

මාජ් ද පුටුවක් ඇදගෙන හරි බරි ගැසී වාඩි වූවාය. දෙව්නිඳි ඇගේ මුහුණ දෙස බලා සිටියේ උනන්දුවෙනි. තමා ලියන්නට අදහස් කරන පොතට හැම පැත්තකින්ම කරුණු එක් රැස් කර ගැනීම ඇගේ අරමුණ විය.

"වලව්වෙ හාමුදුරුවන්ට ගමේ හැමෝම හරි කැමතියි... එයා හරිම හොඳයි... වැඩට හිටිය අයටත් කරුණාවන්තයි... මම රස්සාව කරන ගමන් සෙනසුරාදා ඉරිදා දවස්වල මෙහෙ වැඩට ආවෙ... එයා අපි හැමෝටම හොඳට සැලකුවා..."

මාජ් ඒ අතීතයේ ශ්‍රී විභූතිය සිහිපත් කරන්නට මෙන් මොහොතක් දෑස් පියාගෙන රැළි ගැසුණු නළල පිරි මැද ගත්තාය. දෙව්නිඳි ඇය දෙස බලා සිටියේ නොඉවසිල්ලෙනි.

"එයත් එක්ක වැඩ කරන්න හැමෝම හරි ආසයි... ඔය ලොකු පවුල්වල හුගක් ගෑණු තමන්ගෙ මට්ටමේ අය විතරයිනෙ ආශ්‍රය කරන්නෙ... ඒත් වලව්වෙ හාමුදුරුවො එහෙම කෙනෙක් නෙමෙයි... එයා වැඩට ඉන්න අය එක්කත් හොඳට කතා බහ කෙරුවා... විහිළු කෙරුවා... මට තවමත් හිතා ගන්න බෑ එච්චර හොඳට හිටිය එයා තමන්ගෙ හස්බන්ඩ්වයි දරුවයි දාලා ඔය විදියට ගියෙ කොහොමද කියලා... මං විතරක් නෙමෙයි කිසිම කෙනෙක් ඒක විශ්වාස

www.sinhalaelibrary.com

කෙරුවෙ නෑ..."

සැබැවින්ම මෙහි කුමක්දෝ ගුප්ත බවක් සැඟවී ඇතැයි දෙව්න්දිට සිතිණි. සූරියතැන්න මැතිණියගේ පින්තූරය තුළ පවා වූයේ ඇයට අදහා ගත නොහැකි කුමක්දෝ ගුප්තාකර්ෂණයකි. එය තුළට තමා කාන්දමකින් මෙන් ඇදී යන්නාක් සේ ඇයට දැනිණි. ඇය සිය දෑසේ ඇඳුණු සූරියතැන්න මැතිණියගේ රුව මකා දමන්නට මෙන් කිහිප වරක් වේගයෙන් ඇසිපිය සැලුවාය.

"මොනවද දෙව්න්දි කල්පනා කරන්නෙ...?" මාජි ඇය දෙස ඕනෑකමින් බලමින් විමසුවාය.

"ධනුෂ්ක මහත්තයා හුගක් කාලයක් ලංකාවෙන් හිටියෙ නෑ කිව්ව නේද...?"

"එයා සෑහෙන කාලයක් තිස්සෙම හිටියෙ ලන්ඩන්වල.. දැන් අවුරුද්දක් දෙකකට ඉස්සර තමයි ආපහු ආවෙ... මේ දේපොළ නැති නාස්ති වෙලා යන නිසා බණ්ඩාර හාමුදුරුවෝ බොහොම අමාරුවෙන් ගෙන්න ගත්තෙ... නෑදෑයො කියන ජාතියත් බලාගෙන ඉන්නෙ තියෙන දේවල් කොහොම හරි කඩා වඩා ගන්නනෙ..."

මාජි අවසන් වදන් තෙපලේ තරමක් කෝපයෙන් මෙනි. ඇය සේවය කරන ස්ථානයට ඇදිකමක් දක්වන, ස්වාමියාට පක්ෂපාත අවංක සේවිකාවකැයි හැඟීම දෙව්න්දිගේ සිතෙහි තදින්ම කා වැදුණේය. එසේ නොවිණි නම් ඇයට දශක තුනක් තිස්සේම එක දිගට මෙහි සේවය කරන්නට හැකියාව නොලැබෙනු ඇත. උයන්පල්ලා වූ හීන්බණ්ඩා මෙන්ම පියතිලක ද මේ වලව්ව වෙනුවෙන්ම කැප වූ අය වූහ. රෙදි



සේදීම, අතු ගෑම ආදී කටයුතු සඳහා උදේ පැමිණ සවස ආපසු යන සේවක සේවිකාවන් පිරිසක් ද සිටින බව මාජිගෙන් දැන ගන්නට ලැබිණි. නිවසේ උත්සවයක් වැනි අවස්ථාවකදී ඔවුන්ගෙන් ලැබුණේ නොමඳ සහායකි.

"හෙට දවල්ට තියෙන්නෙත් පාර්ටි එකක් ද...?"

දෙව්න්දි විමසුවේ චකිතයෙන් නොව ඉවිය යුතු ස්වභාවය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නටය.

"අපෝ නෑ... හෙට දවල් කෑමට එන්නෙ ලෙව්කේ බණ්ඩාර ෆැමිලි එකනෙ... අපේ බණ්ඩාර හාමුදුරුවන්ගෙ නංගියි... දුවයි... මහත්තයයි."

එසේ පැවසූ මාජි වටපිට බලා රහසක් කියන්නට මෙන් දෙව්න්දි වෙතට නැඹුරු වූවාය.

"මේ දේපොළ ගැන හුගක්ම කැක්කුම තියෙන්නෙ ඒ ගොල්ලන්ට. තමයි... දේපොළ පිට යයි කියල බයට දුවව බන්දල දෙන්න හිතේ තියෙනවා පුංචි බණ්ඩාර මහත්තයට... අපෝ ඒක නම් පුදුම විසේකාර බඩුවක්... බැඳල ආවදාට වලව්වෙ කාටවත් කනක් ඇහිල ඉන්න ලැබෙන එකක් නෑ..."

මාජි ලෙව්කේ බණ්ඩාර දියණිය පිළිබඳව කතා කළේ අප්‍රසාදයෙනි. පවුලේ එකම දියණිය බැවින් හුරතලයට හැදී වැඩීම නිසා ඇය නරක් වෙන්නට ඇතැයි දෙව්න්දි සිතුවාය.

"මම මේ ඕපාදූප කියනවා කියල හිතන්න එපා දෙව්න්දි... ඒත් ඔයා තවම පුංචි කෙල්ලෙක්නෙ... ඒ නිසා හැමෝම ගැන වෙන වෙනම දැන ගෙන ඉන්න එක හොඳයි...

එතකොට කාටවත් මොකුත් වරදක් අල්ලා ගන්න ඉඩ දෙන්නෙ නැතුව තමන්ගෙ වැඩ ටික කර ගන්න පුළුවන්.."

මාජ් හුන් තැනින් නැගිට ගොස් විදුලි කේතලයේ ප්ලග් එක ගැසුවාය.

"තව ටිකකින් බණ්ඩාර හාමුදුරුවන්ට කෝපි එකක් ඕන වෙනවා.." ඇය පැවසුවේ දේවින්දි ගෙලූ බැල්මට පිළිතුරු වශයෙනි.

"මෙහෙ අනිත් අයගෙ වැරදි හොයන අයත් ඉන්නව ද?"

දේවින්දි විමසුවේ පියතිලකගේ රුව මනසට නගා ගනිමිනි. ඇය සිතූ දෙය සියයට සියයක්ම නිවැරදි විය.

"ඇයි ලියන මහත්තයා...? එයා හිතාගෙන ඉන්නෙ මේ වලව්වෙ හැමදේම කෙරෙන්න ඕන එයාට ඕන විදියට කියලයි... එයාගෙ වැඩේ හැම දේටම හොට දාන එක තමයි... අපි හැමෝටම ඉස්සර වෙලා වලව්වෙ වැඩට ඇවිත් තියෙන්නෙ... එක සැරයක් හොරු කට්ටියකගෙන් බණ්ඩාර හාමුදුරුවන්ව බේර ගෙනත් තියෙනවා... ඉතින් කවදාවත් මෙහෙන් එයාව අස් කරල දාන්නෙ නෑ කියල දන්න හින්දා වැඩ කරන හැමෝම බය කරගෙන ඉන්න තමයි බලන්නෙ... එයා ගෙන් හොඳට පරිස්සම් වෙලා ඉන්න... එයා කාටවත් දනෙන්නෙ නැතුව හොල්මනක් වාගෙ පස්සෙන් යනවා අනිත් අයගෙ හොර අල්ලන්න..."

මාජ් පැවසුවේ අවවාදයක ස්වරයෙනි. එවදන් දේවින්දිගේ සිතට තදින් කා වැදිණි.



"හොරයක් නොකර හිටියම ඉවරයිනෙ..." සිතුව ද ඇය එම සිතුවිල්ල මුවින් පිට කළේ නැත.

* * *

කිසිවෙකුගෙන් වරදක් අසන්නට ඉඩ නොතබා තමාට නියමිත සියලුම වැඩ කටයුතු නොපිරිහෙළා ඉටු කළ යුතු යයි දේවින්දිට සිතිණි. සිය අරමුණු ඉටු කර ගැනීමට ඉඩ ලැබෙනු ඇත්තේ එවිටය. ඇය උදෑසන සීතලත් මින්නත් නොතකා මිදුලට බැස්සේ සාලයේ ඇති ප්ලාස්ටික් මල් සහිත බඳුන් වෙනස් කොට ස්වාභාවික මල්වලින් ඒවා සරසන්නට අදිටන් කොට ගෙනය.

"මෙච්චර ෆ්‍රෙෂ් මල් තියෙද්දි මොනවට ආටිෆිෂල් මල් පුරවගෙන ඉන්නව ද මන්දා..."

ඇය තමාටම කියා ගනිමින් රෝස පාත්ති දෙසට ගමන් කළාය. අක්කාත් අයියාත් මේ තරම් මල් කන්දරාවක් දුටුවේ නම් ඒවායින් කුමක් හෝ ව්‍යාපාරයක් කරන්නට සිතනවා නියැතය. අක්කා නම් දැනටමත් හෝටලය පිහිටි ඉඩමේ කොටසක ඕකිඩ් වගාවක් ඇරඹීමට සිහින මවමින් සිටියාය.

"ඕකිඩ් වලින් හොඳට සල්ලි හොයන්න පුළුවන්..."

ඇය නිතරම පැවසුවාය. එහෙත් හෝටලයේ ඉඩම ඒ සඳහා ප්‍රමාණවත් නොවන බව අයියා මෙන්ම අප්පච්චි ද පැවසූහ.

"අපි මේ ළඟ පාතකින් වෙන ඉඩමක් අරගෙන ඕකිඩ් වවමු..." අප්පච්චි පැවසුවේය.

www.sinhalaelibrary.com

ඔවුන්ගේ ව්‍යාපාරික අදහස් වලට එකම එක වචනයකින් හෝ අනුබලයක් නොලැබුණේ දේවින්ද්‍රිගෙන් පමණකි. සල්ලි ගොඩවල් උඩ පීනන්නට ඇයට අවශ්‍යතාවයක් නොවීය. ඇය නිතරම පැතුවේ කලබලයකින් තොරව ගෙවන නිස්කලංක ජීවිතයකි. ඒ ජීවිතයේදී ඇයට මුදල් යනු සාමාන්‍ය අවශ්‍යතාවයක් පමණක් විය.

"මිනිස්සුන්ට ජීවත් වෙන්න සල්ලි ඕන තමයි... ඒත් ජීවිතේ කියන්නෙ සල්ලිම නෙමෙයි..."

ඇය කෝසල සමග ද යහළු යෙහෙළියන් සමග ද පැවසුවාය. සමහරු උපහාසයෙන් ඇය දෙස බැලූහ.

"සල්ලි තියෙන නිසා දේවින්ද්‍රි එහෙම කතා කරන්නෙ... සල්ලි නොතිබුණා නම් කොහොම හරි සල්ලි හොයන්නම ඔයා මහන්සි වෙයි..." සමහරු පැවසූහ.

කෝසල සමග ඇගේ සම්බන්ධතාවයක් ඇති වූයේ ද ඔහුගේත් ඇගේත් අදහස් බොහෝ දුරට එකිනෙකට ගැළපුණු නිසාය. එහෙත් දැන්නම් ඔහු තව දුරටත් තමා ආදරය කළ කෝසල නොවන බව ඇයට වැටහී ගොස් තිබිණි. ඇත්තෙන්ම මිනිසුන් වෙනස් වන්නේ කොතරම් ඉක්මනින්දැයි ඇය සිතුවාය. නූරියතැන්න මැතිණිය සිය සැමියාත් දරුවාත් හැරදා යන්නට සිත හදා ගන්නට ඇත්තේත් එවැනි වෙනස් වීමක ප්‍රතිඵල වශයෙන් ද...?

"ආ මම මේ බැලුවා කවුද උදේ පාන්දරම රෝස පාත්තියෙ ඉන්නෙ කියලා..."

හීන් බණ්ඩා සිනාවකින් යුතුව ඇය ඉදිරියේ පෙනී සිටියදී



දේවින්ද්‍රි දැහැනින් මිදුණාය. ඔහු කොයි පැත්තෙන් පැමිණියේදැයි ඇය දැන සිටියේ නැත. ඇය ඔහු වෙත කාරුණික සිනාවක් පා මල් පාත්ති දෙස බැලුවාය. ඒ හැම එකකම නොයෙක් වර්ගයේ හා නොයෙක් වර්ණයේ මල් පිපී තිබිණි. ඒවායින් හමන සුවඳින් පරිසරය මෙහෙවින් සුවඳවත්ව තිබිණි.

"හරිම ලස්සනයි හීන් බණ්ඩා... මම මේ මෙච්චර ලස්සන මල් වත්තක් දැක්කමයි..."

ඇය පැවසුවේ ගාම්පස දෙනෙත් යවමිනි. ඔහුගේ මුහුණේ ජයග්‍රහණය හා ආඩම්බරය මුසු පෙනුමක් උදා වෙනු ඇයට පෙනිණි.

"මම ඉතින් දන්නා කියන කාලෙ ඉඳන්ම කෙරුවෙ මල් වවන එකමනෙ නෝනා... මට මේ මල් පාත්තිත් මගෙ ජීවිතේ වාගෙ තමයි..."

ඔහු රෝස ගසක වූ වියැලුණු අතු රිකිල්ලක් ප්‍රවේසමින් කපා ඉවත් කළේය. ඔහු මල් ගස් වලට කොතරම් ආදරය කරන්නේදැයි දේවින්ද්‍රිට එම ක්‍රියාව තුළින්ම හැඟීමක් ඇති කර ගන්නට හැකි විය. සිරුරින් හැඩි දැඩි වුව ද මල් වලට ආදරය කරන මේ මිනිසාගේ සිත ඉතාමත් සංවේදී විය යුතු යයි ඇයට සිතිණි.

"හීන් බණ්ඩා පදිංචි වෙලා ඉන්නෙත් මේ වලව්වෙම ද?" ඇය විමසුවේ ඔහු සමග කුළුපග වීමේ සිතින් යුතුවය.

"ඉස්සර නම් මෙහෙ තමයි හිටියෙ... දැන් මං වලව්වෙ වත්තකම වෙන ගේක පදිංචි වෙලා ඉන්නෙ... මගෙ පවුල තමයි වලව්වෙ අතු ගාන්නෙ... තව ටිකකින් එයි..."

www.sinhalaelibrary.com

ඔහු කියා ගෙන ගියේ විටින් විට මල් පාත්ති දෙස බලමිනි.

"දරුවො එහෙමත් ඉන්නව ද...?"

"දෙන්නෙක් ඉන්නවා නෝනා... උන් දෙන්නා තවම ඉස්කෝලෙ යනවා. ලොකු කෙල්ල මේ අවුරුද්දෙ විභාගෙට ලියනවා නෙව..."

"ආ.. එහෙනම් ලොකු ළමයිනෙ හීන් බණ්ඩට ඉන්නෙ..."

"කිව්වහම මොකද නෝනා උන් කැමති නෑ අපි මේ වලව්වෙ රස්සාවල් කරනවට. උන්ට ඒක මදිකමක්ලු... මම ඊයෙ ගිහින් උන්ට නෝනගෙ වග කිව්වහම පුදුම වුණා... නෝනා බලන්ට එන්ට ඕනෑ කියලත් කිව්වා..."

"කාටවත් කරදරයක් නැතිව තමන්ගෙ දාඩිය මහන්සියෙන් කරන කිසිම රස්සාවක ලොකු පුංචිකමක් නෑ හීන් බණ්ඩා... අපි ලැජ්ජා වෙන්න ඕන රස්සාවක තරාතිරම ගැන හිතලා නෙමෙයි... රස්සාවක් නොකර නිකම් ඉන්න එකටයි..."

"ඔන්න ඔය බණේම තමයි නෝනා මම අපෙ උන්ට නිතරම කියන්නෙ... මම උන්ගෙ අත පය නොකඩා හදාගෙන වඩාගෙන තියෙන්නෙ මේ රස්සාවෙම පිහිටෙන් තමයි... උන් කොච්චර කිව්වත් මම මේක අතාරින්නෙ නෑ..."

ඔහු කතා කළේ දේවින්ද්‍රි කෙරෙහි බලවත් ප්‍රසාදයක් ඇති කර ගත් බව අඟවමිනි. ඔහු දෙනෙතින් පවා සිනාසෙමින් සිටියේය.



"නෝනට පෝච්චිවලට දාන්ට මල් එහෙම ඕන ද...?"

"මල් ටිකක් හොයා ගන්නත් එක්ක තමයි මම මිදුලට බැස්සෙ. ඒත් මේ ගස්වල තියෙනකොට කඩන්න හිතෙන්නෙ නෑ..." ඇය සිනාසුණාය.

"මලක් ගහක තියෙනකොට තමයි ලස්සන... ඒත් කොච්චර ලස්සනට තිබ්බත් මල් පර වෙලා යනවනෙ නෝනා... ඒ හින්දා ගහෙන් කඩලා පෝච්චියක දාලා තිබ්බා කියලා වෙනසක් වෙන්නෙ නෑ..."

හීන් බණ්ඩා නූගත් ගැමියෙකු වුව ද ඔහු කතා කළේ ගැඹුරු අරුතකිනැයි දේවින්ද්‍රිට සිතිණි. ඇතැම් විට ඔහු එහි ගැඹුරක් දකින්නට නැත. ඔහු පළ කළේ දෙනෙත ඉදිරියේ පෙනෙන යථාර්ථයේ ස්වභාවයයි.

"නෝනට මොන මල් ද ඕන...?"

ඇගේ කල්පනාවලියට දුර දිග යන්නට ඉඩ නොදී හීන් බණ්ඩා විමසුවේය. දේවින්ද්‍රි ඇඟිල්ලක් මුවග රුවාගෙන මොහොතක් කල්පනා කළාය.

"කහයි රතුයි රෝස මල් ටිකකුයි පොන්ඩිස් අතු ටිකකුයි තියෙනවා නම් හොඳයි..."

අවසානයේදී ඇය පැවසුවාය. ප්‍රවේසමින් මල් පාත්ති අතරින් ඇවිද ගිය හීන් බණ්ඩා ගස්වලට අඩුවක් නොවන සේ අත තිබූ මුවහත් පිහියෙන් මල් කපන අයුරු ඇය බලා සිටියාය. ඇයට නම් එතරම් හුරුබුහුටි ලෙසත් ඉක්මනටත් එම කාර්යය කිරීමට නොහැකි බව සහතිකය. ඇය එම කාර්යයේ

www.sinhalaelibrary.com

නිරත වූවා නම් රෝස කටු කිහිපයක්වත් අත් ලේ ඇන ගනු ඇත.

"අපේ වලව්වෙ හාමුදුරුවොත් මේ රෝස මල්වලට පුදුම ආසාවක් තිබුණෙ..."

හීන් බණ්ඩා පැවසුවේ හෙලා ගත් මල් මිටිය දෝතින්ම ඇයට පිරි නමමිනි. දෙව්න්දිගේ සිතේ ඇති වූයේ සූරියතැන්න මැතිණිය පිළිබඳව ඔහුගෙන්ද විමසීමේ ආශාවකි.

"වලව්වෙ හාමුදුරුවන්ට කොච්චර එපා කිව්වත් ඇහැව්වෙ නෑ... හැමදාම මට මල් වවන්ට උදව් කෙරුවා... ඔය එහායින් හිටවලා තියෙන්නෙ බට් කරපු රෝස ගස්... වලව්වෙ හාමුදුරුවො තමයි මට ඒවා හදන හැටි කියල දුන්නෙ... එයා මල් ගැන හුගක් දේවල් දැනගෙන හිටියා... මට කියල දෙන්නම කියලත් කිව්වා... ඒත්..."

ඔහු කතාව අවසන් නොකරම දිගු සුසුමක් හෙලා බෝගන්විලා මල් ආරුක්කුව යටින් අනෙක් පැත්තට ගියේය. මඳ වේලාවක් එදෙස බලා සිටි දෙව්න්දි මල් මිටිය ද තුරුළු කොටගෙන ආපසු හැරුණාය. ඉස්තෝප්පුවේ විසල් කුළුණක් අසල සිටගෙන දැත් බැඳගෙන තමා දෙස බලා සිටින ධනුෂ්ක ඇය දුටුවේ එවිටමය. කොට කලිසමක් හා ටී ෂර්ට්යක් ද ඇඳ සිටි ඔහු වෙතින් දිස් වූයේ ක්‍රීඩකයකුගේ පෙනුමකි. එහෙත් දෙනෙත්වල වූ තියුණු බැල්ම එකම එක දශමයකින් හෝ වෙනස් වී නොතිබිණි. ඇගේ සිතට සිහින් තිගැස්මක් දැනිණි.

"ගුඩ් මෝර්නින් සර්..." ඇය සිහින් සරින් ඔහුට සුබ පැතුවාය.



"මෝර්නින්..." ඔහු කතා කළේ වාතය විනිවිද යන තරම් ගැඹුරු හඬකිනි.

මල් මිටිය ද තුරුළු කොට ගත් දෙව්න්දි ධනුෂ්ක පසුකොට යාමට නොහැකිවාක් මෙන් මොහොතක් ඔහු අසල නැවතී සිටියාය. සිනාවක් නොමැති මුහුණේ වූ තේජාන්විත බවම ඔහුගේ කඩවසම් බව වැඩි කළේය. දශකාර කෙස් කැරැල්ලක් නළල මත රැඳී තිබිණි. දෙව්න්දිට තව දුරටත් ඔහු දෙස බලා සිටීමට හැකි වූයේ නැත. කිසිම පිරිමියෙකු හමුවේදී කෝසල හමුවේදී පවා නොදැනුණු තරම් හදවතේ ගැස්මක් සසල බවක් ඇති වනු ඇයට දැනිණි. ඇය මීනෑ තරම් පිරිමි ඇසුරු කොට තිබිණි. එහෙත් මෙතරම් ආඩම්බරකාර සිත නොසන්සුන් බවට පත් කළ පිරිමියෙකු ඒ අතර නොවීය. ඇය සැලෙන දැතින් මල් මිටිය දරාගෙන සැණින් ගෙතුළට වැදුණාය. බොහෝ දුරක් දිවූ කල මෙන් ඇගේ පපුව ගැහෙමින් තිබිණි.

දෙව්න්දි මල් බඳුන්වල තිබූ ප්ලාස්ටික් මල් ඉවත් කොට ඒවා නැවුම් මලින් සැරසුවාය. කෑම මේසය මත තිබූ අගනා පුළුම් මල් බඳුනට ද අලංකාර හැඩයක් ලැබෙන සේ මල් දමූ ඇය හිස පසෙකට ඇල කොට ගෙන එදෙස බලාගෙන මදක් සතුටට වූවාය. එක් වරම කිසිවෙකු ගේ සිරුරේ ස්පර්ශ වනු දැනුණෙන් ඇය තිගැස්සී හැරී බැලුවාය. ඇය අසල සිටගෙන සිටියේ අර ආඩම්බරකාරයාය. නැවතත් ඇගේ සිත සසල විය.

"මට කියන්න අමතක වුණානෙ දෙව්න්දි... ඔයාට කෝල් එකක් ආවා පිරිමි කෙනෙකුගෙන්..."

ඔහු පිරිමි කෙනෙකුගෙන් යන වදන පැවසුවේ

අවධාරණයෙනි. එහෙත් ඒ අප්පච්චි හෝ අයියා මිස වෙන කෙනෙකු වෙන්නට නොහැකි බව ඇය දැන සිටියාය. කෝසල අම්භාපයෙන් සිටි බැවින් දේවින්දි ඔහුගෙන් සමු ගත්තේවත් නැත.

"අප්පච්චි හරි අයියා හරි වෙන්න ඇති.." ඇය සෙමින් පැවසුවාය.

"කවුද මන්දා... කැලණි වීව් හොටෙල් එකෙන් කතා කරන්නෙ කියලා කිව්වා... කවුද අප්පච්චි ද අයිය ද හොටෙල් එකේ වැඩ කරන්නෙ...?"

දේවින්දි මදක් කල්පනා කළාය. බොරුවක් කිව යුතු යයි ඇයට සිතිණි. කැලණි වීව් හෝටලය ඉතා ප්‍රසිද්ධය. තමන්ටත් එහි අයිතියක් ඇති බව කිවහොත් ඔහු තුළ සැකයක් ඇති වනු වැළැක්විය නොහැකිය. පියතිලක නම් දැනටමත් ඇය පිළිබඳව සිතා සිටින්නේ සංවිධානාත්මක හොර කල්ලියක සාමාජිකාවක් ලෙසින් බව ඔහුගේ කටින්ම කියැවිණි. එම නිසාම බොරුවක් කීම ප්‍රායෝගික බව ඇයට සිතිණි.

"අප්පච්චි..." දේවින්දි මිමිණුවාය.

"මම ගිහින් තියෙනවා කැලණි වීව් හෝටෙල් එකට. හරිම ලස්සන තැනක තියෙන්නෙ... කෑමත් හරි රසයි..."

ධනුෂ්ක හදිසියේම දොඩමලු වී සිටියේය. දේවින්දිගේ සිතට දැනුණේ ආඩම්බරයකි. ඇත්ත වශයෙන්ම හෝටලය වැඩි පුරම ජනප්‍රිය වූයේ රසවත් ආහාර පාන නිසාය. දේශීය හා විදේශීය ඕනෑම ආහාර වේලක් එයින් ලබා ගැනීමට හැකියාව තිබිණි.



"අප්පච්චි එතන තුන් කෙනෙක් ද ?"

දේවින්දිගේ සිතට අපහසුවක් දැනිණි. රැකියාවක උස් පහත් භේදයක් නැතැයි කොතරම් කියුව ද තමාට ඕනෑම රැකියාවක නිරත වෙන්නට හැකියාව තිබුණ ද අප්පච්චි අරක්කැමියෙකුගේ ඇඳුමින් සැරසී සිටින ආකාරය සිතේ ඇඳ ගැනීමට ඇය කැමති වූයේ නැත. එහෙත් අවශ්‍යම අවස්ථාවක මිස සිය අනන්‍යතාවය හෙළි නොකරන ලෙස අප්පච්චි දුන් උපදෙස් සිහි කළ ඇය හිත හදා ගත්තාය.

"අප්පච්චි තමයි හොටෙල් එකේ ශෙෆ්..."

ඇය අසීරුවෙන් වදන් ගොනු කොට ගත්තාය. නිකම්ම අරක්කැමියෙකු යයි කියනවාට වඩා නායක අරක්කැමියා යයි කීමේ වටිනාකමක් තිබිණි. ධනුෂ්ක ගේ මුහුණේ පුළුල් සිනාවක් නැගිණි. නායක අරක්කැමියාගේ නිල ඇඳුමින් සැරසුණු අප්පච්චි මනසින් මවා ගන්නට ඇය උත්සාහ දැරුවාය.

"ආ ඒක තමයි එහෙනම් දුවත් ඒ අඩි පාරෙම යන්නෙ නේද ? දැන් මට හිතෙනවා ඔයාව අවනක්සේරු කරපු එක වැරැද්දී කියලා... අප්පච්චිගේ හැකියාවෙන් ටිකක් හරි දුවටත් ඇතිනෙ..."

ධනුෂ්කගේ සිනාව පළමු වරට දුටු දේවින්දිට එදෙස තව වරක් බැලීමේ ආශාව මැඩ ගත නොහැකි විය. එහෙත් ඇය කතා කළේ බිම බලාගත් වනමය.

"ලන්ච් එකෙන් පස්සෙ ඩිසයිඩ් කරන්නකො..."

www.sinhalaelibrary.com

ඇය පවසද්දී මොහොතක් නිහඬව සිටි ධනුෂ්ක කාමරයෙන් පිටවී ගියේය. ඇයට පහසුවෙන් හුස්ම ගන්නට හැකි වූයේ ඉන් පසුවය. තමා කී දෙය ඔහු ඇනුම් පදයක් වශයෙන් බාර ගත්තේ දැයි සැකය ඇය තුළ ඇති විය. එහෙත් දුන් මුවින් පිට වූ වදන් ආපසු ඇද ගැනීමේ හැකියාවක් නැත. ඇය සුසුමක් හෙළා නැවතත් මල් බඳුනේ අඩුපාඩු සකස් කරන්නට වූවාය.

"දෙයියනේ...!"

කාමරයට ඇතුළු වූ මාජි එක්වරම හිසේ අත ගසා ගත්තාය. දේවින්දි ඇය දෙස මවිතයෙන් බැලුවේ තමාගෙන් සිදුවූ අඩුපාඩුව කුමක්දැයි දැන ගැනීමටය.

"ඔයා කාගෙන් අහල ද රෝස මල් කැඩුවෙ...?"

මාජි විමසුවේ ඇය විශාල වරදක් කළ බව අඟවන හඬකිනි. දේවින්දිගේ සිතට දැනුණේ බියකි. මෙතෙක් කල්ම ප්ලාස්ටික් මල්වලින් මල් බඳුන් සරසා තිබුණේ ගෙවත්තේ පිපෙන මල් නෙළීම වරදක් නිසා විය යුතුය. ඇය සිනාසෙන්නට තැත් දරමින් මාජි දෙස බැලුවාය.

"මං කාගෙන්වත් ඇහුවෙ නම් නෑ... මල් ටික මට කපල දුන්නෙ හීන් බණ්ඩා..."

ඔහු පාවා දීම වරදක් යයි සිතුණ නමුදු ඒ අවස්ථාවේදී ඇයට ගත හැකි වෙන පියවරක් තිබුණේ නැත. හීන් බණ්ඩා කුඩා කල සිටම මෙහි ඇති දැඩි වූ අයෙකි. දේවින්දි මෙහි පැමිණියේ පෙර දිනයේය. එනිසාම ඇයට සමාවක් නොලැබෙන බව ඒකාන්තය.



"හීන් බණ්ඩා මල් කපලා දුන්නා...?"

මාජි විමසුවේ අදහා ගත නොහැකි යමක් සිදුවූ කලෙක මෙනි. මාජිගේ මුහුණේ වූ ගැඹුරු පෙනුම පහ වී ගොස් දෙතොලට සිහින් සිනාවක් නැඟිණි.

"මට විශ්වාස කරන්නත් බෑ හීන් බණ්ඩා එහෙම දෙයක් කළා කියලා කිව්වම..."

"ඕන නම් ධනුෂ්ක සර්ගෙන් අහල බලන්නකො මාජි ඇන්ටි... හීන් බණ්ඩා මට මල් මිටිය දෙන කොට එයත් ඉස්තෝප්පුවෙ හිටියා."

ගුරුවරියක හමුවේ නිදහසට කරුණු කියන පාසැල් දැරියකගේ හඬින් දේවින්දි පවසද්දී මාජිගේ දෙතොලේ වූ සිනාව වඩාත් පුළුල් විය. ඇය දේවින්දිගේ උරහිසට අත තැබුවාය.

"මම ඔයාට වරදක් කිව්වා නෙමෙයි දේවින්දි.. ඒත් හීන් බණ්ඩා කිසිම කෙනෙකුට ඔය මල්වලට අත තියන්න දෙන්නෙ නෑ... වලව්වෙ හාමුදුරුවො හිටිය කාලෙ විතරයි මෙහෙ වාස් වලට ෆ්‍රෙෂ් මල් දාලා තිබුණෙ... එයා නැති වුණාට පස්සෙ හීන් බණ්ඩා කිසිම කෙනෙකුට මලක් කඩන්න ඉඩ දුන්නෙ නෑ... ඒකයි අපි ඉමිටේෂන් මල් දාලා තිබුණෙ..."

"ඉතින් එහෙම නම් එයා කැමැත්තෙන්ම මට මල් කපලා දුන්නෙ...?"

මාජිගේ කතාවෙන් සැහැල්ලු වූ සිතැති දේවින්දි විමසුවාය.

www.sinhalaelibrary.com

"ඒකනෙ මටත් පුදුම හිතුණෙ... හීන් බණ්ඩා ලේසියෙන් කෙනෙක් ගැන පැහැදෙන කෙනෙක් නෙමෙයි... දන්නවනෙ ඊයෙ ඔයාගෙ බෑග් එකත් ගේ ඇතුළට ගිහින් දුන්න හැටි... බණ්ඩාර හාමුදුරුවො කිව්වා වුණත් එයාට කියල ඔය බාගෙ වැඩක් ගන්න බෑ..."

"ඇයි දන්නෙ නෑ එහෙම නම් මට උදව් කෙරුවෙ...?"

"ඔයාගෙ පෙනුමත් වලව්වෙ හාමුදුරුවන්ගෙ වගේනෙ... ඊයෙ හීන් බණ්ඩා ඔයා වලව්වෙ හාමුදුරුවන්ගෙ නෑයෙක් ද කියලත් ඇහුවෙ ඒකනෙ..."

රෝද පුටුව පැදගෙන සූරියතැන්න මහතා කාමරයෙන් පිටතට පැමිණියේ 'ගුඩ් මෝර්නින්' යයි කියාගෙනමය.

"ආ... කාලෙකට පස්සෙ ගේ ඇතුළෙන් රෝස මල් සුවඳක් දැනෙනවා..."

ඔහු සිය සුබ පැතුමට කාන්තාවන් දෙදෙනා පිළිතුරු දෙන්නටත් පෙරම නාසය පොපියවමින් වට පිට බැලුවේය. දේවින්දි විසින් කෑම මේසය මත තබා තිබූ මල් බඳුන දෙස ඔහුගේ බැල්ම මොහොතකට රැඳී තිබිණි. ඒ සමගම මුහුණේ පෙනුම ද අඳුරු විය. ඔහුට තමාගෙන් වියෝ වූ බිරිඳ සිහිපත් වෙන්නට ඇති බව දේවින්දි වහා වටහා ගත්තාය.

"බණ්ඩාර හාමුදුරුවන්ට පුදුමත් හිතෙයි ඇහුවම... දේවින්දිට මේ මල් ඔක්කොම දීල තියෙන්නෙ හීන් බණ්ඩා..." මාජී පැවසුවාය.

"එයා ඉස්සර ඔහොම මල් කඩල දුන්නෙ සුජානිට



විතරයි. දේවින්දි දක්කම එයාට සුජානිව මතක් වෙන්න ඇති.."

සූරියතැන්න මහතා පැවසුවේ සුසුමක්ද හෙළමිනි. ඊළඟට ඔහු රෝද පුටුව පදවාගෙන නැවතත් කාමරයට ගියේය. මාජීත් දේවින්දිත් මුහුණෙන් මුහුණ බලා ගත්හ.

"සුජානි කියන්නෙ වලව්වෙ හාමුදුරුවන්ට..." මාජී කෙඳිරුවාය.

# 5

'මාධවී' ලෙව්කේ බණ්ඩාර පැමිණි මොහොතේ සිටම වලව්ව පුරා ඇවිදින්නට වූයේ මටත් මේ ගෙදර අයිතියක් තියෙනවා යන්න ඇඟවෙන පරිද්දෙනි. ලෙව්කේ බණ්ඩාර මැතිණිය ද ඊට දෙවෙනි නොවීය. වලව්වේ සේවකයින් මුහුණින් මුහුණ බලමින් උපහාසාත්මක සිනා පහළ කරනු දේවින්දිට පෙනිණි.

"ඔය ආවෙ... ඔය ආවෙ... දන් ඉතින් වලව්ව පුරා ඇවිද ඇවිද දාහක් අඩු පාඩු හොයයි... මම දන්නවනෙ අම්මගෙයි දුවගෙයි හැටි... පුංචි බණ්ඩාර මහත්තයාගෙන් ගිහට එක එක වස කවන්නෙ ඔය අම්මල දුවල තමයි..."

මාජ් දේවින්දි දෙසට නැඹුරු වී පහත් හඬින් පැවසුවාය. එළවළු, මස්, ඉස්සන් ආදිය යොදා අලුත්ම ක්‍රමයේ බතක්



උයමින් සිටි දේවින්දි මාජ් දෙස බලා සිනාසුණාය. ඇගේ මුහුණේ වූයේ අප්‍රසාදයක ලකුණුය.

"ගණන් ගන්න එපා මාජ් ඇන්ටි. ඔයාමනෙ කිව්වෙ අපි කාටවත් වරදක් දකින්න බැරි විදියට වැඩ කරමු කියලා... ඉතින් එහෙම කළාම ඉවරනෙ..." දේවින්දි පැවසුවේ මාජ් අස්වසන හඬිනි.

"වරදක් නැති එකත් වරදක් විදිහට දකින අම්මණ්ඩිලා දෙන්නෙක් තමයි ඔය..." මාජ් තමාටම කියා ගන්නාක් මෙන් පැවසුවාය.

ඇය ශීතකරණයෙන් පලතුරු යුෂ සහිත ඩිගෑන්ටරය එළියට ගෙන උස වීදුරු පහක් පිරවූවාය. එය සාදන ලද්දේද දේවින්දි විසිනි.

"ෂේ මේ ඩ්‍රින්ක් එක නම් හරිම සුවඳයි..." මාජ් හුස්ම ඉහළට ඇද්දාය.

"පලතුරු වර්ග කීපෙක සුවඳ එකට එකතු වුණාම අලුත්ම සුවඳක් එනවනෙ..."

"මම නම් ඔය තරම් දේවල් කර කර ඉන්නෙ නෑ... මොනවා හරි එක පලතුරු වර්ගයකින් ඩ්‍රින්ක් එකක් හදනවා මිසක්..."

මාජ් වීදුරු කිහිපය ප්‍රවේසමින් බත්දේසිය මත තැන්පත් කළාය.

"මම ඉතින් අද දන්න ශිල්ප ඔක්කොම දාන්න එපායැ... කෑම රස නොවුණොත් මගෙ ජොබ් එකත් ඉවරයිනෙ..."

www.sinhalaelibrary.com

දේවින්දි සිනාසුණාය. මාජ් ද එම සිනාවට එක් වූවාය.

"මම ඉස්සෝ ටික සුද්ද කරල තියන්නම්... දේවින්දි ගිහින් මේ ඩ්‍රින්ක් එක අල්ලල එන්න කට්ටියට... ඔයා කට්ටිය අඳුන ගන්නත් එපායැ..." මාජ් යෝජනා කළාය. එහෙත් දේවින්දි තරමක් පසුබට වූවාය.

"අනේ මට බෑ මාජ් ඇන්ටි එයාලා මට මොකුත් කිව්වොත් එහෙම..."

"මොකුත් කියන එකක් නෑ...අනික් එක මම හෙට අනිද්දා ගියාම ඔයා මේ හැම දේම බලා කියා ගන්න එපායැ..."

හැඳ සිටි ඒප්‍රනය ගලවා බිත්තියේ එල්ලූ දේවින්දි දෝතින්ම හිස කෙස් හා ගවුම සකස් කොට ගත්තාය. ඇය හැඳ සිටියේ එකල කාර්යාලයට යද්දී අඳින්නට පුරුදුව සිටි ගවුමකි. නිල් පැහැති කොටු රෙද්දකින් මසා තිබූ එය සැබෑවටම සුන්දර විය. එයින් දේවින්දිගේ නැඹ රුව වඩාත් මත් නැංවී තිබිණි.

"ඔයා ලස්සනයි දරුවෝ... ඇස් වහක් කට වහක් නෑ ඉන්න ගෙදරට කිරි ඉතිරෙන්න ඔය හිනාවම ඇති..."

ඇය ගවුම සකස් කරනු දුටු මාජ් කට කොනට සිනාවක් නංවා ගනිමින් පැවසුවාය. දේවින්දිගේ සිතට ලැජ්ජාවක් දැනිණි. ඇය සිනාසෙන්නට තැත් දැරුවාය.

"දැන් ඉතින් යන්න ඕකත් අරගෙන... මනමාලයා ඉස්සරහට ඉස්සර වෙලාම යනවා වාගෙ ඇඹරෙන්නෙ නැතුව..."



මාජ් සිනාවකින් යුතුව දේවින්දිගේ උරහිසට අත තබා ඇය දිරිමත් කළාය. දේවින්දි බන්දේසිය ද රැගෙන සාලයට පිවිසුණේ දෙගිඩියාවෙන් මෙන්ම චකිතයෙන් ද යුතුවය. මාජ් පැවසුවාක් මෙන්ම එය අනාගත සැමියා පිළිගන්නට හා පුරා සියා ඉදිරියට යන යුවතියකගේ සිතට නැගෙන කෝල හැඟීමට සමාන විය.

දේවින්දි සාලයට පිවිසෙද්දී සියලු දෙනාම එකට කතා කරගෙන මෙන් හිස එසවූහ. ආගන්තුකයන් තිදෙනාගේම නෙත් විස්මයෙන් විවර වෙනු දේවින්දි එක බැල්මටම දුටුවාය. ඇය මඳ සිනාවක් නගා ගෙන ලෙව්කේ බණ්ඩාර මැතිණිය ඉදිරියේ නතර වූවාය. සුදු ලේස් හැට්ටයකින් සහ වටිනා ඉන්දියන් සාරියකින් සැරසී සිටි ඇය පැළඳ සිටියේ පටුම් පහක පමණ මාලයකි. මහත දෙහෙත සිරුරකින් හා සාඩම්බර බැල්මකින් යුතු ලෙව්කේ බණ්ඩාර මැතිණිය දකිද්දී දේවින්දිට සිහිපත් වූයේ පාසැලේ විදුහල්පතිනියයි.

"මෙයාද මේ අලුතින් කුස්සියෙ වැඩට ආවා කිව්වෙ...?"

ඇය දෙබැම රැලි කොටගෙන දේවින්දිගේ කේශාන්තයේ සිට පාදාන්තය දක්වාම බලමින් බීම වීදුරුවක් අතට ගත්තාය.

ගෙල දක්වා කැපූ කොණ්ඩයකින් යුතු මාධවී ලෙව්කේ බණ්ඩාර අම්මාගේ හැඩරුවට එලෙසින්ම උරුමකම් කීවාය. වෙනසකට තිබුණේ ඇය අම්මා මෙන් මහත නොවීම පමණය. අත් කොට ටී ෂර්ටයකින් හා කොට කලිසමකින් සැරසී සිටි ඇගේ මුහුණේ ද සිනාවක් නොවීය. බැලූ බැල්මට ඇය මේ සමාජයට නොගැලපෙන තැනැත්තියකැයි හැඟීම දේවින්දිගේ සිතේ ඇති විය. මුව පුරා විසිරුණු සිනාවෙන් යුතුව බීම වීදුරු

www.sinhalaelibrary.com

පිළිගත්තේ ලෙව්කේ බණ්ඩාර මහතා සහ සූරියතැන්න මහතා පමණකි. ධනුෂ්කගේ මුහුණේ එමොහොතේ පවා වූයේ සුපුරුදු ගැඹුරු බැල්මමය.

"මොකද්ද දරුවො නම...?"

ලෙව්කේ බණ්ඩාර මහතා කරුණාවෙන් විමසුවේය.

"දේවින්දි..." ඇය සිහින් සරින් මිමිණුවාය.

"දේවින්දි..."

මාධවී යටි තොල පෙරළමින් එය උච්චාරණය කළේ කුස්සි අම්මා කෙනෙකුට එතරම් හොඳ නමක් ගැලපෙන්නේ නැතැයි ඇඟවෙන හඬකින් යැයි දේවින්දිට සිතිණි. ඇගේ එම ක්‍රියාව නිසා මාධවී කෙරෙහි දුටු මනතින්ම ඇති වූ අපැහැදීම වඩාත් දැඩි විය.

"මේ පොඩි කෙල්ලෙකුට මාජිට වාගෙ වැඩ කරන්න පුළුවන් ද ? අනික් එක මෙහාට ගැලපෙන්නෙ මැදි වයසේ ගෑණියෙක්..."

ලෙව්කේ බණ්ඩාර මැතිණිය පැවසුවේ ඉංග්‍රීසියෙනි. ඔවුන් හැමදෙනා තුළම ගෘහ පාලිකාවක් සම්බන්ධයෙන් තිබෙන්නේ එකම සාම්ප්‍රදායික අදහස් යැයි දේවින්දි සිතුවේ කලකිරීමෙනි. ගෘහ පාලිකාවක් මැදි වයස් කැනැත්තියක් විය යුතුමය. ඔවුන් ඉගෙන ගත් අය නොවූවාට කම් නැත.

"දේවින්දිට මේ රස්සාවට ඕන තරම් සුදුසුකම් තියෙනවා. ඒ වගේම එයා මේකට කැමතියි... ඒ හින්දා වයස ප්‍රශ්නයක් නෑ... එහෙම නේද දේවින්දි...?"



සූරියතැන්න මහතා විමසුවේ ද ඉංග්‍රීසියෙනි. දේවින්දි ඉංග්‍රීසි දන්නා කැනැත්තියක බව ඇඟවීමට ඔහුට අවශ්‍ය විනිණි.

"ඔව් සර්..." ඇය මිමිණුවාය. අම්මාත් දුවත් මුහුණින් මුහුණ බලා ගත්හ.

"ගෙදර වැඩ කළත් උයන්න මෙයාට පුළුවන් ද...?" මාධවී සැක මුසු බැල්මක් හෙළුවාය.

"අද උන්ව හදන්නෙ දේවින්දි... කාල ඉවර වුණාට පස්සෙ තමයි මම තීරණය කරන්නෙ මෙයා ස්ථිරවම රස්සාවට ගන්නවද නැද්ද කියලා..."

මෙතෙක් නිහඬව සිටි ධනුෂ්ක පැවසුවේය. මාධවීගේ මුහුණ එකෙණෙහිම ආලෝකමත් වෙනු දේවින්දිට පෙනිණි.

"කොහොමත් මම මෙහෙ පදිංචියට ආවට පස්සෙ නම් මේ වාගෙ අයව තියා ගන්නෙ නැහැ..."

මාධවී අහංකාර හඬකින් පැවසුවාය. සූරියතැන්න මහතාගේ මුහුණ වෙනස් වී ගියේය. එහෙත් ඔහු කිසිවක් පැවසුවේ නැත.

"මේ වාසස් ඇරේන්ජ් කළේ දේවින්දි ද...?"

මාධවී විමසුවේ භාජනය නෙත් යොමිනි. දේවින්දි හිස සැලුවාය.

"ඔව් මිස්..."

"මට මෙහෙ හැමෝම කතා කරන්නෙ පුංචි ඩිංගිරි

www.sinhalaelibrary.com

හාමුදුරුවෙො කියලා..." මාධවී පැවසුවේ දේවින්දිට එසේ කතා කරන ලෙස නොකියා කියමිනි.

"මට ඒ විදියට කතා කරන්න පුරු නැහැ..."

ආචාරශීලී බව බිඳ නොගැනීමට දැඩි ආයාසයක් දරමින් දේවින්දි පැවසුවාය. ඇගේ සිතට කෝපයක සේයාව එබිකම් කරමින් තිබිණි.

"දේවින්දි මං හිතන්නෙ ඔයාටත් වැඩිය මාල ඇති... ඒ හින්දා එයාට කැමති විදිහකට කතා කරපුවාවෙ... ඒක ප්‍රශ්නයක් කරගන්න එපා..."

ලෙව්කේ බණ්ඩාර මහතා පැවසුවේය. සූරියතැන්න මහතා ද එය අනුමත කරන්නාක් මෙන් හිස සැලුවේය.

"මේ මල් කොහෙන් ද ගෙනාවෙ...?"

මාධවී කතාව වෙනතකට හරවන්නට වෑයම් කරන්නාක් මෙන් විමසුවාය.

"කොහෙන්වත් නෑ... මේ වත්තෙන්මයි කඩා ගත්තෙ..."

දේවින්දි පිළිතුරු දුන්නේ අවිහිංසක ලෙසය. මාධවී නැඟිට දැත් ඉහට ගසාගෙන දේවින්දි දෙස නපුරු බැල්මක් හෙළුවාය. තමා කළ වරද කුමක් දැයි දේවින්දිට වැටහුණේ නැත.

"බොරු කියන්නෙපා... මේ වත්තෙ මල් කඩන්න හීන් බණ්ඩා මටවත් ඉඩ දෙන්නෙ නැහැ..."

ඇය දැඩි හඬකින් පැවසුවාය. දේවින්දිට ඉබේටම



ධනුෂ්ක දෙස බැලිණි. හීන් බණ්ඩා ඇයට මල් නෙලන්නට ඉඩ දුන් විස්මයක් ලෙස සියලු දෙනාම කල්පනා කරති. ඇයට ශක්තියට සිටියේ ධනුෂ්ක පමණකි. එහෙත් ඔහු එමොහොතේ ඇගේ බැල්ම මඟ හැර ඉවත බලා ගත්තේය. දේවින්දිගේ සිත රිදිණි.

"එක්ස්කියුස් මී..." මන්දේසිය එහැනම වූ කුඩා ස්ටූලය මත තැබූ දේවින්දි ආපසු හැරුණාය.

"මොකද මේ ට්‍රේ එකවත් ගෙනෙන්නෙ නැතිව කඩාගෙන බිඳගෙන දුවගෙන ආවෙ...?"

කුස්සියට පිවිසි දේවින්දි දෙස මාජ් බැලුවේ විමසිල්ලෙනි. දේවින්දි සිනාසී මදකට පෙර ගලවා ඉවත් කළ එප්‍රනය නැවතත් හැඳ ගත්තාය.

"උයන්න පරක්කු වෙයි කියල මම ඉක්මනට ආවා... මාජ් ඇන්ටි ගිහිල්ලා ට්‍රේ එක අරන් එන්න"

"මට පේන්නෙ මොකක් හරි දෙයක් වෙලා වගේ... ඇයි අර අම්මයි දුවයි මොනව හරි කිව්වද...?"

"අපෝ නෑ..."

"නැති වෙන්න බෑ... මම දන්නවනෙ දෙන්නගෙ කටවල්වල හැටි..."

දේවින්දි කිසිවක් නොකියා මාජ් විසින් පිරිසිදු කොට තබන ලද ඉස්සන් බඳුන අතට ගත්තාය.

"මොන වගේ කෑමක් ද ඔයා හදන්න යන්නෙ දේවින්දි..?

www.sinhalaelibrary.com

මෙ විදියෙ බතක් මම කවදාවත් දකල නෑ..." මාජ් පැවසුවේ කුතුහලයෙනි.

"අද මම හදන්නෙ එයාල කවදාවත් කාල නැති විදියෙ අච්චාරු කෑම වේලක්. ඉන්දුනීසියන් බතක්, ඉන්දියන් කුකුල් මස් බැදුමක්, ප්‍රංශ සලාදයක්, ඉංග්‍රීසි ඩෙසර්ට් එකක්..." දේවින්දි පැවසුවේ සිනාසෙමිනි. ඇය එය කී ආකාරයට මාජ්ට ද සිනා නැගිණි.

"ඒක නම් අච්චාරුවක්ම තමයි..." පුංචි බණ්ඩාර මහත්තයා ඒවා කෑවට පස්සෙ එක්කො ඔයාව තියා ගනියි.. එක්කො යවයි..."

"මාධවී මිස් නම් කිව්වා එයා මේ ගෙදරට ආවට පස්සෙ මං වගේ අයව තියා ගන්නෙ නැහැ කියලා.."

"එයා එහෙම කිව්වා...?"

මාජ් මවිතයෙන් මෙන් විමසුවේ දොර දෙස ද විමසිල්ලෙන් බලමිනි. පියතිලක හොර රහසේම පැමිණ ඔවුන්ගේ කතා බහට ඇහුම්කන් දෙන්නට ඉඩ ඇති බව දේවින්දිට සිහිපත් වූයේ එමොහොතේය.

"කොහොමටත් එයා ආවට පස්සෙ නම් මෙතන සර්වන්ට්ස්ලට තියා බණ්ඩාර හාමුදුරුවන්ටවත් ඉන්න ලැබෙන එකක් නෑ... වෙන මොනවද කිව්වෙ...?"

"හීන් බණ්ඩා එයාටවත් නොදෙන එකේ මට මල් කඩා ගන්න දෙයි ද කියල ඇහැව්වා..."

දේවින්දි කියද්දි මාජ් පිට වෙන්නට ආ සිනාව මැඩ



ගත්තේ කට අතින් වසා ගනිමිනි. දේවින්දි ඇය දෙස බැලුවේ කුතුලිනි.

"ඇයි හිනා වෙන්නෙ...?"

"හීන් බණ්ඩට එයාව පෙන්නන්න බෑ... මල් කඩන්න තියා මල් වත්තට එනවටවත් කැමති නෑ... මුලදී මුලදී බලෙන්ම මල් කැඩුවා. අන්තිමට හීන් බණ්ඩා බණ්ඩාර හාමුදුරුවන්ට කිව්වා ආයෙත් එහෙම මල් කැඩුවොත් අස් වෙලා යන්න යනවා කියලා.. පුංචි කාලෙ ඉඳලම හිටිය හීන් බණ්ඩා යනවට බණ්ඩාර හාමුදුරුවො කොහෙත්ම කැමති වුණේ නැහැ. ඒ නිසා පුංචි ඩිංගිරි හාමුදුරුවන්ට ආයෙ මල් වත්තට යන්න එපා කියල කිව්වා..."

"මාධවී මිස් මට කිව්වා එයාට හැමෝම කතා කරන්නෙ පුංචි ඩිංගිරි හාමුදුරුවෝ කියලලු... හැබැයි මට නම් ඒ විදියට කතා කරන්න පුරුදු නැහැ..."

"ඔයාට කැමති විදියකට කතා කරන්න කියල බණ්ඩාර හාමුදුරුවො කිව්වනෙ.." මාජ් පැවසුවේ ගණනකට නැතිවය.

"මං ගිහිල්ලා ට්‍රේ එක අරගෙන එන්නම්..."

කුස්සියේ බිත්තියේ වූ සංගීතමය සීනුවක් නාද වෙනු ඇසෙද්දී මාජ් ඉක්මන් ගමනින් එළියට ගියාය. මේ සංඥා සියල්ලම තමන් විසින් ද ඉගෙන ගත යුතු බව දේවින්දි කල්පනා කළාය.

විදුලි පෝරණුව තුළ රෝස්ට් වෙමින් තිබූ කුකුළු මස් වලින් ප්‍රණීත සුවඳක් නැගිණි. දේවින්දි එහි වීදුරු දොරෙන්

www.sinhalaelibrary.com

එබී බැලුවාය. කුකුළු මස් රත්වන් පැහැ ගැනෙමින් තිබිණි.

"හැමෝම ඔයාගෙ ඩ්‍රින්ක් එක ගැන වර්ණනාව.. රස්සාව නැති වෙයිද කියල දැන් බය වෙන්න දෙයක් නැ..." කියාගෙන මාජ් හිස් වීදුරු සහිත බන්දේසිය ද රැගෙන කුස්සිය තුළට ආවාය.

"හා.. නියම සුවඳක් එන්නෙ.. මගෙ කටට කෙළත් උනනවා.. මට බයයි අර ග්‍රේටල්ට වුණ වැඩේ වෙයි ද කියලා..."

මාජ් නාසය පොපියවමින් වටපිට බලද්දී දෙව්නිදි ඇය දෙස බැලුවේ කුහුලිනි.

"ග්‍රේටල්...? ඒ කවුද...? මොකද්ද එයාට වුණ වැඩේ...?"

"ඇයි දෙව්නිදි ඒ කතාව දන්නෙ නැද්ද...?"

"අනේ දන්නෙ නැනෙ.. කියන්නකෝ..."

"ග්‍රේටල් කියන්නෙ එංගලන්තෙ එක ගෙදරක හිටපු කුස්සි අම්මා කෙනෙක්..."

මාජ් හිස් වීදුරු ටික බඳුන් සෝදන යන්ත්‍රය තුළ තැන්පත් කළාය. මෙම කුස්සියේ වැඩ කිරීම මොන තරම් පහසුවක්දැයි එදෙස බලා සිටියදී දෙව්නිදිට සිතිණි. ඇයට අම්මා මෙනෙහි විය. අම්මා නිවසේ වැඩ කළේ තනිවමය. ඇය වැඩ කරද්දී වෙනත් කිසිවෙකු ඒවාට ඇඟිලි ගසනු ඇය ඉවසුවේ නැත.

"මට මේවා කර ගන්න පුළුවන්. ඔයාල එළියට යන්න..."



දෙව්නිදි හෝ අක්කා උදව් කරන්නට යද්දී අම්මා ඔවුන් පලවා හැරියාය. එහෙත් සතියේ නිශ්චිත දිනකදී හෝ දෙකකදී ඔවුන් තනිවම කුස්සියේ වැඩ කළ යුතු විය. අක්කාත් ඇයත් දෙදෙනාම කටට රසට කෑම බීම හදන්නට අත් පොත් තැබුවේ එලෙසය.

"ඔයා කතාව අහගෙන ද ඉන්නෙ දෙව්නිදි...?"

මාජ් විමසුවේ ඇයට සිතුවිලි ලෝකයේ වල්මත් වෙන්නට ඉඩ නොහරිමිනි.

"ආ... ඔව් මාජ් ඇන්ටි... මම අහගෙන ඉන්නෙ... කියන්න..." ඇය වහා පිළිතුරු දුන්නාය.

"ඉතින් මේ ග්‍රේටල් වැඩ කරපු ගෙදර මහත්තයා දවසක් කිව්වලු දවල් කෑමට එයාගෙ යාළුවෙක් එනවා කුකුල්ලු දෙන්නෙක් බැදල තියන්න කියලා... ග්‍රේටල් හා කිව්වලු..." මාජ් මදකට කතාව නැවැත්තුවාය.

"ඉතින්...?" දෙව්නිදි නොඉවසිල්ලෙන් විමසුවාය. මුලදී උනන්දුවක් නොදැක්වුව ද එමොහොතේ කතාව දැන ගැනීමේ බලවත් වුවමනාවක් ඇගේ සිත තුළ ඉපදෙමින් තිබිණි.

"ග්‍රේටල් කුකුල්ලු දෙන්නව අවන් එක ඇතුළට දම්මලු... මේ වගේ රෝස්ට් වෙන සුවඳ එනකොට ගෑණිට ඉවසුමක් නැතුව ගියා... කුකුල්ලු දෙන්නෙක්ම තියෙන එකේ පොඩ්ඩක් කැවට කමක් නැ කියල හිතල එක කුකුළු අණ්ඩක් කැවලු..."

"දැන් මං කියන්නම් ඉතුරු ටික... මෙහෙම ටික ටික කාල කුකුල්ලු දෙන්නම ඉවර වුණාලු..." දෙව්නිදි පැවසුවේ සිනාසෙමිනි.

"ඔයා කතාව දන්නවා ද...?"

"අනේ නෑ... ඒ විදියට වෙන්න ඇති කියල මට හිතුණා.."

"මට් එහෙම තමයි වුණේ... එයා කුකුල්ලු දෙන්නම කාල ඉවර කළා.."

"හරිම පෙරේත ගෑණියෙක්නෙ... ඉතින් ඊට පස්සෙ මොකද වුණේ...?"

"දැන් කතාව අහගෙන ඉන්න ගිහින් ඔයාටත් ග්‍රේටල්ට වුණ දේ වෙයි..."

මාජ් පැවසුවේ දේවින්දි වැඩ නවත්වා කතාවට සවන් දී සිටි බැවිනි.

"එහෙම වෙන්නෙ නෑ... මම වටපිට ගැන හොඳට ඇහගහගෙන ඉන්නෙ..."

"කොහොමත් මෙහෙ ඉන්න කොට වට පිට ගැන ඇහැ ගහගෙන ඉන්න එක හුඟක් හොඳයි..."

මාජ් පැවසුවේ පියතිලක අරමුණු කොට ගෙන යයි දේවින්දිට සිතිණි.

"ග්‍රේටල් ගෙ කතාව කියල ඉන්නකො මාජ් ඇන්ටි..."

"මේ කෙල්ලට තියෙන හදිස්සිය..."

මාජ් නැවත කතාව ඇරඹුවේ දේවින්දිට සුරතල් දෝෂාරෝපණයක් කිරීමෙන් ද අනතුරුවය.



ඉතින් බොස් ඇවිත් ඇහුවා 'ග්‍රේටල් කෑම ලෑස්ති ද දැන් මගෙ යාළුවා මග එනවා ඇති' කියලා. ග්‍රේටල් කිව්වා 'කෑම ලෑස්තියි හැබැයි පිහිය කැපෙන්නෙ නෑ. පිහිය ටිකක් මුවාත් කියල දෙන්න' කියලා... බොස් පිහිය මුවාත් කරන්න පටන් ගන්න කොටම දොරට තට්ටු කරන සද්දයක් ඇහුණා. ග්‍රේටල් ගිහින් දොර අරින කොට යාළුවා දොර ළඟ... ග්‍රේටල් ඇහුවා 'මහත්තයා මෙහෙ ආවෙ අපේ මහත්තයට පිස්සු බව දන්නෙ නැතුව ද කියල..' අර මනුස්සයා බය වෙලා බලාගෙන ඉන්නවා... 'එයා අද ලෑස්ති වෙන්නෙ ඔයාගෙ කනක් කපා ගන්න. ඒ නිසා පණ බේරාගෙන දුවන්න' කියල ග්‍රේටල් ඒ මනුස්සයාට තවත් බය කළා. එයා දිව්වා. ග්‍රේටල් ගියා බොස් ළඟට. ගිහින් මෙහෙම කිව්වා. 'මහත්තයා හරිම යාළුවෙක් තමයි එක්කරගෙන ආවෙ... අන්න ඒ මනුස්සයා කුකුල්ලු දෙන්නම අරගෙන දුවනවා' කියලා. බොස් පිහියත් අරගෙනම යාළුවගෙ පිටි පස්සෙන් දුවන්න පටන් ගත්තා. අනේ මට එකක්වත් දීල යන්න කිය කියා. යාළුවා හිතුවා කනක් තමයි ඉල්ලන්නෙ කියලා තවත් හයියෙන් දිව්වා..."

මාජ් කතාව අවසන් කරද්දී දේවින්දිට සිනාව පාලනය කර ගත නොහැකි විය. ඇය මහ හයියෙන් සිනාසෙන්නට පටන් ගත්තාය. කුස්සියට ඇතුළු වන දොර විවර වෙනු ඔවුන් දෙදෙනාම දුටුවේ නැත.

"හරි අපූරුයිනෙ ගෑණු ළමිස්සියෙකුගෙ හිනාව..."

ඒ කටුක හඬ සවන් වැකෙද්දීම දේවින්දිගේ සිනාව වියැකී ගියේය.

www.sinhalaelibrary.com

## 6

දේවින්දි කවුළු තිරය දෙපසට කොට අඳුරු වූත් නිසසල වූත් අතිශයින් සීතල වූත් රාත්‍රිය දෙස එබී බැලුවාය. වෙනත් දිනක නම් දේවින්දිගේ සිත හුදෙකලා හැඟීම් වලින් පීඩිත වෙන්නට මේ රාත්‍රිය ප්‍රමාණවත්ය. එහෙත් ජයග්‍රාහී හැඟීමකින් සිත උද්දාමයට පත්ව තිබූ මෙමොහොතේ කිසිදු අඳුරු හැඟීමකට ඉඩ කඩක් නොවීය.

කවුළු තිරය වසා දමූ ඇය කණ්ණාඩි මේසය ඉදිරිපිට වාඩි වී තද කළු පැහැයෙන් යුතු දිගු කොණ්ඩය ලිහාගෙන පීරන්නට පටන් ගත්තේය.

"සුජානිගෙ වාගෙම දිග ලස්සන කොණ්ඩයක් දේවින්දිටත් තියෙන්නෙ..."



ලෙව්කේ බණ්ඩාර මහතා පැවසූ අයුරු සිහිපත් වූ දේවින්දි කණ්නාඩිය තුළින් පෙනෙන සිය පිළිබිඹුව සමග සිනාසුණාය. ඔහුගේ එම ප්‍රකාශයත් සමගම දේවින්දිගේ ඇස් ඉබේටම යොමු වූයේ ලෙව්කේ බණ්ඩාර මැතිණිය සහ මාධවී දෙසය. ඔවුන් දෙදෙනාගේම මුහුණු හැඟීමකින් වෙනස් වී ගියේය.

"හරියටම කරත්තෙට අහු වුණ කපු ලෙලි වගේ..." දේවින්දිට සිතිණි. ධනුෂ්කගේ මුහුණේ නම් වූයේ ප්‍රතිමාවක මෙන් වෙනස් නොවන පෙනුමකි. තේජවන්ත වූත් සිනාවෙන් රහිත වූත් එම මුහුණ වැනි මුහුණක් ඇය කිසිදු දිනයෙක දැක නොතිබිණි. ඇය නැවතත් ලෙව්කේ බණ්ඩාර මැතිණිය දෙස බැලුවාය. යම් කිසි අදහසක් ප්‍රකාශ කර ගැනීමේ නොඉවසිල්ලෙන් ඇය පසු වන බව දේවින්දිට වහා වැටහිණි. එම නිසාම ඇය කෑම මේසය අස් කිරීම තවත් ටික වෙලාවක් ප්‍රමාද කරමින් ඒ අවට ගැවසුණාය. මාජින් ඇයත් උස් හඬින් සිනාසීම පිළිබඳව දොස් පැවරූ මොහොතේ සිටම ඇයට ලෙව්කේ බණ්ඩාර මැතිණිය එපා වී තිබිණි.

"අපේ වලව්වෙ හාමුදුරුවො හිටිය නම් ඔය ගෑණි ඔහොම අහංකාර කම් පෙන්නන්න එන්නෙ නෑ..."

ඇය ඔවුනට දොස් පවරා කුස්සියෙන් එළියට ගිය විට මාජ් නොරිස්සුමින් යුතුව පැවසුවාය.

"අපෙන් වැරැද්දෙ මාජ් ඇන්ටි..." දේවින්දි පැවසුවේ සිනාසීම වරදක්යයි සැබැවටම සිතූ නිසා නොව මාජ්ගේ සිත අස්වසන්නටය. එහෙත් ඉන් පසුව මාජ් ඇයට අත් උදව් දුන්නේ නිහඬවමය.

www.sinhalaelibrary.com

"වලව්වේ හාමුදුරුවොත් ඔය වගේම කෑමක් හැදුවා මට මතකයි..."

ඇය නැවතත් දොඩමළු වූයේ දේවින්දි පලතුරු පුඩිම සකස් කරමින් සිටියදීය. තමාගේ පැමිණීමෙන් අනතුරුව සියලු දෙනාගේම සිත් තුළ සූරියතැන්න මැතිණිය පිළිබඳව මතකය අලුත් වී ඇතැයි දේවින්දිට සිතිණි. ධනුෂ්ක අම්මා නිසාම කාන්තාවන් පිළිබඳව අපැහැදීමෙන් යුතුව සිටින බව මාජ් පවසා තිබිණි. ඔහු තමා වෙත සිනාවක් පවා නොපාන්නේ අම්මා මෙමෙහි වීම නිසා විය යුතු යයි ඇය සිතුවාය.

"ධනුෂ්ක ගැන පවි කියලත් තිබෙනවා..."

දේවින්දි කොණ්ඩය දෙපසට පීරා කරල් දෙකකට ගොතා ගනිමින් සිතුවාය. ඇගේ සිත පුරාම පැතිර තිබුණේ සැහැල්ලුවකි. දිවා ආහාර වේලෙහි වූ ප්‍රණීත බවට පින් සිදු වන්නට ඇගේ රැකියාව පිළිබඳව තිබූ අවිනිශ්චිත භාවය පහව ගොස් තිබිණි. කෑම වේල රසවත් බව දන සිටියත් ඔහුන් එය අනුභව කරන තුරු දේවින්දි සිටියේ නඩුවක තීන්දුව ලැබෙන තුරු සිටින විත්තිකරුවෙකුගේ නොඉවසිල්ලෙන් යුතුවය.

"අන්න දේවින්දිට පුංචි බණ්ඩාර මහත්තයා කතා කරනවා..."

අතුරුපස පිළිගැන්වීමෙන් පසුව කෑම මේසයේ අඩු පාඩු බලන්නට ගිය මාජ් ආපසු පැමිණ පවසද්දී දේවින්දි තිගැස්සී ගියාය. අනපේක්ෂිත සිදුවීමකට මුහුණ දෙන්නට සිදුවූ කලෙක මෙන් ඇගේ පපුව ගැහෙන්නට විය. ඇය මාජ් දෙස බැලුවාය. මාජ් ඇයට පිටු පා ගෙන ඉඳුල් පිඟන් සෝදන යන්ත්‍රය තුළ



තැන්පත් කරමින් සිටියාය.

"මොකටද දන්නෙ නැහැ නේද මාජ් ඇන්ටි..." දේවින්දි විමසුවේ දෙගිඩියාවෙන් යුතුවය.

"දන්නෙ නෑ... ගිහින් බලන්න..."

මාජ් ඇය දෙස නොබලාම පිළිතුරු දුන්නාය. යම් කිසි දෙයක් වැරදී ඇතැයි දේවින්දිට සිතිණි. ඇය සෙමින් කෑම කාමරය දෙසට ගියාය. විසල් කෑම මේසයේ හිඳගෙන සිටි පස් දෙනා පමණක් නොව ගෘහ භාණ්ඩ පවා තමා දෙස බලා සිටින්නාක් මෙන් දේවින්දිට දැනිණි. ඇගේ දෙපා පැකිළෙන්නට විය. පුවත්පතේ සේවය කරද්දී ඇයට නොයෙකුත් තරාතිරම්වල නොයෙකුත් සමාජ මට්ටම්වල අය හමු වීමට අවස්ථාව ලැබිණි. එහෙත් ඒ කිසිම අවස්ථාවක ඇයට මෙවන් පසුබට හැඟීම් ඇති වී නොතිබිණි.

"මෙහාට එන්න දරුවා... බොහොම රස කෑම ටික.. මම කාලෙකට පස්සෙ කැව හොඳම කෑම වේලක්..."

ඇය දකිද්දීම ලෙව්කේ බණ්ඩාර මහතා ප්‍රශංසාත්මක හඬින් පැවසීය. එමොහොතේ ද මවගේත් දුවගේත් මුහුණු තරක් වී ගියේය. සූරියතැන්න මහතාගේ මුහුණ සිනාවකින් විකසිත වී තිබෙනු දේවින්දි දුටුවාය.

"දේවින්දිව පර්මනන්ට් කරන්න දැන් මට පුළුවනි.. ඇත්තටම රහයි.. මේ වගේ ඩෙසර්ට් එකක් මම කිසිම දවසක කාල නැහැ..."

ධනුෂ්ක කාපුවම ඇය දෙස බලාගෙන අර ගැඹුරු හඬින් පැවසුවේය. දේවින්දිගේ සිත ප්‍රීතියෙන් ඉපිල ගියේය. ඇගේ

www.sinhalaelibrary.com

මුව සිනාවකින් විවර විය.

"තැන්ක් යූ සර්..." ඇය මිමිණුවාය.

"මේ තරම් පුංචි වයසට මෙච්චර රස කෑම හදන්න පුළුවන් කියන එක ආඩම්බර වෙන්න තරම් දෙයක්නෙ... මේ අපෙත් ගෑණු දරුවෙක් ඉන්නවා. මේ වගේ කෑම වේලක් තියා හරියට කහට සීනි දාලා තේ එකක් හදා ගන්නවත් දන්නෙ නෑ..."

ලෙව්කේ බණ්ඩාර මහතා කී විට මාධවී ගේ මුහුණ අඹ දම්මත් පුපුරන තරමේ රෞද්‍ර වේගයක් ගත්තේය. මවගේ මුහුණ ද එයට නොදෙවෙනි විය. ඔවුන් එය අපහාසයක් වශයෙන් බාර ගන්නට ඇතැයි දේවින්දිට සිතිණි.

"ඒ දරුවට අතට පයට වැඩ කාරයො ඉද්දිදි කුස්සි අම්මලා කරන වැඩ කරන්නෙ මොනාවට ද...?"

ලෙව්කේ බණ්ඩාර මැතිණිය කතා කළේ වචනවලින් දමා ගසන්නාක් බඳුවය. තව දුරටත් එතැන ගැවසීම ගැටුමකට මුල පැදීමක් යයි දේවින්දි කල්පනා කළාය.

"එක්ස්කියුස් මී..."

සියලු දෙනාටම පොදුවේ පැවසූ දේවින්දි වහා කුස්සියට ගියේ සිනා ඉතිරෙන මුවින් යුතුවය.

"මං දිනුවා මාජ් ඇන්ටි..."

ඇය කුඩා දරියක මෙන් මාජ්ගේ දෙලරහිසට දෑත හබාගෙන උඩ පැන්නාය.



"මං දන්නවා කෙල්ලෙ... ඔයාට වරදින්න හේතුවක් ඇත්තෙම නැහැ..."

මාජ් ඇගේ හිස පිරිමැද්දේ අම්මා කෙනෙකු මෙන් සෙනෙහසිනි.

"ඇත්තටම මට වරදින්න හේතුවක් නැහැ තමයි..."

කණ්ණාඩි මේසය අසලින් නැගිට ගත් දේවින්දි දෑත දිග හැරගෙන වටයක් කැරකුණේ සැහැල්ලුවෙනි. ඇගේ සිනිඳු රැ ඇඳුම බෝලයක් මෙන් වටේට කැරකුණේය. ඇයට කෝසල සිහිපත් වී ඉබේටම සුසුමක් හෙලුණේය.

"අපි හනිමූන් එකට මේ වගේ හොටෙල් එකකට එමු..."

පුවත්පතේ සේවය කළ සියලුම දෙනා නුවරඑළියේ ගෝල්ෆ් හෝටලයට විනෝද ගමනක් ගියදා කෝසල පැවසූ අයුරු ඇයට මතක් විය. මේ වලව්ව ද තරු පහේ හෝටලයක් මෙන් සුඛෝපභෝගීය. ඇයට කෝසල සමගම නුවරඑළියේ ගෝල්ෆ් හෝටලය ද සිහිපත් වූයේ එබැවිනි.

"ඕකට ආයෙ නැකැත් බල බලා ඉන්න දෙයක්යැ... දැන් හොටෙල් එකටම ඇවිත් ඉන්න එකේ රූම් එකක් බුක් කරගෙන හනිමූන් පලයල්ලකො..."

කෝසලගේ කතාව ඇසූ කටකාර සගයෙක් පැවසුවේ දේවින්දිගේ මුහුණ ලැජ්ජාවෙන් රතු කරලමිනි.

"මම දේවින්දිව මගෙ ළඟට ගන්නෙ හත් දවසක් මඟුල් කාලා..."

www.sinhalaelibrary.com

කෝසල දේවින්දිගේ උරහිස වටා අත යවා ඇය තමා සමීපයට ගත්තේය. මිතුරෝ හූ කියමින් සිනාසුණහ.

ඒ දඟකාර අතීතය සිහිපත් වෙද්දී සිය දහස් වාරයක් ඔබ මට එපා යනුවෙන් දුව්ව සිතන්නට දේවින්දිට හැකියාවක් නොවීය. ඇය සුවිශේෂයේ වූ ජංගම දුරකථනය අතට ගත්තාය. එහෙත් ඇය එහි අංක එබුවේ දෙගිඩියාවෙන් යුතුවය. කෝසලගේ ජංගම දුරකථනය නාද විය.

"හලෝ..." ඔහුගේ කට හඬ ඇසෙද්දී ඇගේ සිත සැලිණි.

"කෝසල, මම දේවින්දි..."

"හායි දේවින්දි... මම මේ යාළුවෙකුගෙ පාර්ටි එකක ඉන්නෙ. මට ඔයා හිටිය නම් කියල හිතුණා. අපි හොඳට එන්ජෝයි කරනවා..."

ඔහු කතා කරන්නේ බීමතින් යයි ඇයට සිතිණි. කලකිරීමකට එකතු වූ වේදනාවක් ඇගේ දෙනෙතට කඳුළු පුරවාලුවේය. ඇය තවත් වදනකුදු නොදොඩා රිසීවරය තැබුවාය.

කෝසල පිළිබඳව දේවින්දි තව දුරටත් බලාපොරොත්තුවක් ඉතිරි වී තිබුණේ නම් එය ද මියැදී ගියේය. එහෙත් සිත පුරාම වූයේ හිස් බවකි. වේදනාවකි. දින කිහිපයක්ම ඇය සමඟම සිටි මාජ්ගේ වෙන්ව යාම ද ඇගේ සිතට අලුත් වේදනාවක් එක් කළේය.

"මම මේ දවස් දෙක තුන හිටියෙත් ඔයාට වැඩ ටික පුරුදු වෙනකම්... දැන් ඉතින් මං නැතුවට තනියම කර ගන්න පුළුවන්නෙ..." මාජ් පැවසුවාය.



"ඒ වුණාට මට හරි දුකයි මාජ් ඇන්ටි යන එක ගැන... මෙච්චර දවසක් මම පාළුවක් නැතුව හිටියෙ ඔයා හින්දා..." දේවින්දි දිගු සුසුමක් හෙළුවාය. තනිවම කරද්දී සිය වැඩ කොටස නිවැරදිව ඉටු කිරීමට හැකියාවක් නොමැති වනු ඇතිදැයි හැඟීම ද ඇගේ යටි සිත තුළ තිබිණි. මාජ් යන්තමින් සිනාසී දේවින්දිගේ හිස පිරිමැද්දාය.

"මං දන්නවා ඔයාට ජීවිතේ ඕනෑම අභියෝගයකට මුහුණ දෙන්න පුළුවන් කියලා.. මේ රස්සාවට ආව එකත් ලොකු අභියෝගයක් නෙ..." ඇය පැවසුවේ ඉංග්‍රීසියෙනි. එවදන් දේවින්දිගේ සිතට අමුතු ශක්තියක් එක් කළේය.

"ඔව්. මම ජීවිතේ හැම අභියෝගයකටම මුහුණ දෙනවා..." ඒ මොහොතේ ඇය තරයේ සිතා ගත්තාය.

මාජ්ගේ වෙන්ව යාම සූරියතැන්න මහතාට මෙන්ම ධනුෂ්කට ද වේදනාවක් වී තිබිණි. කිසිදු හැඟීමක් නොපෙන්වා සිටියේ පියතිලක පමණකි.

"මාජ්ට මොකක් හරි ප්‍රශ්නයක් කරදරයක් ඇති වුණොත් දෙසැරයක් හිත හිතා ඉන්නෙ නැතුව කෙළින්ම මෙහෙ එන්න..."

සූරියතැන්න මහතා මාජ්ට සමු දෙමින් දැඩි හැඟුම්බර හඬකින් පැවසීය.

මාජ් ගියාට පසුව වලව්වේ සම්පූර්ණ පාලනය දේවින්දි අතට පත් විණි. සැබැවින්ම ඇයට කරන්නට තිබුණේ ඉවීම කෑම බිම පිළි ගැන්වීම සහ මල් බඳුන් සකස් කිරීම ආදිය පමණකි. එයට අමතරව සතියකට වතාවක් සුජානි

www.sinhalaelibrary.com

සූරියතැන්නගේ කාමරයේ දූවිලි ගසා දමා පිරිසිදු කළ යුතු විය. නිවසේ අනෙක් හැම කාමරයක්ම පිරිසිදු කළේ හීන් බණ්ඩාගේ බිරිඳ විසිනි. එහෙත් මේ කාමරයට යන්නට ඇයටවත් අවසර තිබුණේ නැත. සුජාති සූරියතැන්න අතුරුදහන් වීමට පෙර භාවිතා කළ ඇඳුම් පැළඳුම් හැම එකක්ම එහි නොවෙනස්ව තිබිණි. සැබැවින්ම ඒවා දශක දෙකකටත් ආසන්න කාලයක සිට පැවත එන ඒවා වුවද පරණ පාට වී නොතිබුණේ බෙහෙවින් වටිනා ඒවා නිසා විය යුතුය.

"වලව්වේ හාමුදුරුවෝ යන කොට ඇඳුම් බෑග් දෙකක් අරන් ගියා කියනවනෙ... ඒ ඇඳුම් ඇරෙන්න එයාගෙ හැම ඇඳුමක්ම මේකෙ තියෙනවා..."

පළමු වන දවසේ දේවින්දි එම කාමරයට රැගෙන ගිය මාජ් පැවසුවාය. දේවින්දි වට පිට බැලුවේ පුදුමයෙන් මෙන්ම සිත තුළින් නැගී එන ශෝකයකින් ද යුතුවය. ආබාධිත වූ සැමියාත් පස් හැවිරිදි දරුවාත් දමා පලා යාමට තරම් සිත දැඩි වූ කාන්තාවක ලෙස සුජාති සූරියතැන්න පිළිබඳව සිතන්නට ඇයට හැකියාවක් නොවීය. ඇය තුළ සුජාති පිළිබඳව තිබුණේ අනුකම්පාවකි. සූරියතැන්න මහතා පැවසූ යම් යම් සිද්ධීන් ද එයට බල පාන්නට ඇතැයි ඇයට සිතිණි.

"ඉතින් මෙවා කවුරු හරි අඳින්න නැති කෙනෙකුට දෙන්න තිබුණනෙ..."

විශාල ඇඳුම් අල්මාරිය විවර කොට එතුළට එබී බලමින් දේවින්දි පැවසුවාය. එය තුළ වැඩි වශයෙන්ම තිබුණේ සාරිය. ඒවායේ වර්ණ හා මෝස්තර තමා විසින් ද තෝරා ගන්නට ඉඩ තිබිණැයි දේවින්දිට සිතිණි. සූරියතැන්න මැතිණියගේ හැඩ



රුව මෙන්ම ගති පැවතුම් ද තමාටම සමාන බව වලව්වේ සේවකයන්ගේ කතා බහ තුළින් ඇයට වැටහී තිබිණි. හීන් බණ්ඩා නම් ඇයට කතා කළේම එකල සූරියතැන්න මැතිණියට ඔහු කතා කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ගෞරවයකින් යුතුවය. ඇය කාලයේ ෂා සූරියතැන්න මහතාගේ කාමරය තුළදී දුටු පින්තූර මතකයේ තබාගෙන මේ එක් එක් සාරි හැඳ සිටින සූරියතැන්න මහත්මියගේ රුව සිතේ ඇඳ ගන්නට උත්සාහ දැරුවාය. ඒ හැම උත්සාහයකින්ම සිදු වූයේ ඇය තව තවත් සූරියතැන්න මැතිණිය කෙරෙහි බැඳීමය. ඇය සාරියක් රැගෙන සිය උරහිසට දමා බැලුවාය. එවිටම කාමරයේ අනෙක් කෙළවරේ සිට දිව ආ මාජ් වහා එය උදුරා ගත්තේ ඇය දෙස අවවාදාත්මක බැල්මක් ද හෙළමිනි. වරදක් කළ අයෙකුගේ පසුතැවිල්ලෙන් යුතුව දේවින්දි බලා සිටියාය.

"කිසිම දවසක ඔය වැඩේ කරන්න එපා... වලව්ව අතු ගාන්න ආව ගෑණියත් ඔය විදියට වලව්වෙ හාමුදුරුවන්ගෙ ඇඳුමක් අඳිනවා දැකල තමයි මේ කාමරේට හවුස් කීපර් ඇරෙන්න වෙන කිසිම කෙනෙක් එන එක තහනම් කෙරුවෙ.. මේ කාමරේ කිසිම දෙයක් වෙනස් කරන්නත් එපා..."

මාජ් පැවසුවේ දේවින්දි අතින් ගත් සාරිය තිබූ ආකාරයටම අල්මාරිය තුළ තැන්පත් කරමිනි.

"සොරි මාජ් ඇන්ටි..." ඇය මිමිණුවාය.

"වලව්වේ හාමුදුරුවො එයාව දාලා ගියා කියන එක බණ්ඩාර හාමුදුරුවො විශ්වාස කරන්නෙම නෑ... මට හිතෙන්නෙ කවදා හරි දවසක ආපහු එයි කියල එයා හිතනවා..."

www.sinhalaelibrary.com

මාජ් එවර වට පිට බලා රහසින් පැවසුවාය. දෙව්න්දිට ඔහු පිළිබඳව අනුකම්පාවක් දැනිණි.

මුල සිටම සූරියතැන්න මහතා දෙව්න්දිට දක්වූ හිතවත්කම දිනෙන් දින වැඩි වූවා මිස මඳකින් වත් අඩු වූයේ නැත. ඔහුට තේ හෝ කෝපි රැගෙන කාර්යාල කාමරයට ගිය හැම විටෙකම ඔහු සුහදව වදන් කීපයක් කතා කරන්නට අමතක කළේ නැත.

දිවා ආහාරයෙන් පසුව රාත්‍රී හත වෙන තුරුම දෙව්න්දිට කළ යුතු විශේෂ වැඩක් නොවිණි. ඉරිදා දිනයේ ද සම්පූර්ණයෙන්ම ඇයට නිවාඩු ලැබිණි. ඇය සෙනසුරාදා රාත්‍රියේ ඉරිදාට අවශ්‍ය කෑම බීම සකස් කොට ශීතකරණයෙහි තැබුවාය. මුලදී ඇය එයට එතරම් කැමැත්තක් දක්වූයේ නැත.

"සර්ට සීතල කෑම රත් කරල කන්න හොඳ ද මන්දා..."

නිවාඩු පිළිබඳව කතා බහ කරද්දී ඇය සූරියතැන්න මහතාට පැවසුවේ අදිමදියෙන් යුතුවය. ඔහු සිනාසී ඇගේ උරහිසට තට්ටු කළේය.

"ඒ ගැන හිතන්න එපා දෙව්න්දි... මාජ් වුණත් කළේ එහෙමයි... අනික් එක කෙනෙකුට සතියට එක දවසක්වත් නිවාඩු නැතුව වැඩ කරන්න අමාරුයි.. එතකොට රස්සාවල් එපා වෙනවා..." ඔහු පහදා දුන්නේය.

දෙව්න්දි වලව්වේ විශාල වත්තේ වැඩිපුරම ප්‍රිය කළ ස්ථානය වූයේ වත්ත කෙළවරක පිහිටි වැවය. එය ගස්වලින් වටවී තිබූ ඉතා නිසංසල ස්ථානයක් විය. බොහෝ හවස් කාලවලට පොතක් ද රැගෙන වැව අද්දරට යන දෙව්න්දි අඳුරු



වැටෙන තුරුම එහි වූ ගිම්හාන කුටියේ ගත කළාය. සූරියතැන්න මැතිණිය ද මෙතැන අතිශයින් ප්‍රිය කළ බව ඇයට හීන් බණ්ඩාගෙන් දැන ගන්නට ලැබිණි.

"අයියයි අක්කයි මෙහාට ආවොත් එහෙම මේ හරියෙත් ටුවරිස්ට් හොටෙල් එකක් හදන්න ලෑස්ති වේවි..."

එතැනට එන බොහෝ අවස්ථාවල දෙව්න්දිට සිතිණි. එහෙත් මෙවන් සුන්දර පරිසරයක් කෙලෙසී යනු ඇතැයි සිතීම ඇයට ප්‍රිය නොවීය.

ඇය හැම රාත්‍රියකම සිය ජංගම දුරකථනය තුළින් නිවසේ තොරතුරු දැන ගත්තාය. අප්පච්චි ඇගේ රැකියාව පිළිබඳ සෑහීමකට පත් වී සිටියේය. එහෙත් අම්මා නම් තව දුරටත් බලාපොරොත්තු වූයේ ඇය ආපසු ගෙන්වා ගැනීමටය.

"මම හරි සන්තෝසෙන් ඉන්නවා අම්මා..." දෙව්න්දි කොපමණ කීව ද අම්මා එයින් සෑහීමකට පත්වූ බවක් පෙනෙන්නට නොවීය.

"මගෙ හිතට කිසිම නිවනක් නෑ දරුවො... හැම තිස්සෙම ඔයාව මතක් වෙනවා..." ඇය පැවසුවේ සුසුමක් ද හෙළමිනි.

"මං ගැන එච්චර දුක් වෙන්න එපා අම්මා... මම බෝඩිම්වල ඉන්න කොටත් හිටියෙ තනියමනෙ..." දෙව්න්දි අම්මා අස්වසන්නට උත්සාහ කළාය.

"බෝඩිමක් වගේ නෙවෙයිනෙ..."

අම්මා කියන්නට ආ දෙය ගිල ගත්තාය. දෙව්න්දි ද ඒ පිළිබඳව හාරා අවුස්සන්නට උත්සාහ කළේ නැත.

www.sinhalaelibrary.com

ධනුෂ්ක නිවසට පැමිණියේ කෑම වේලාවට පමණකි. කෑම පිළිබඳව හෝ දේවින්ද්‍රි ගේ රැකියාව පිළිබඳව හෝ ඔහු තව දුරටත් සැකයෙන් යුතුව කතා කළේ නැත. එහෙත් සියතිලක නම් නිරන්තරයෙන්ම පසු වූයේ දේවින්ද්‍රි පිළිබඳව සෝදිසියෙනි. ඔහුට වරදක් අල්ලා ගැනීමට නොහැකි ආකාරයට කටයුතු කිරීමට ඇය හැම විටෙකම උත්සාහ කළාය.

පොතක් කියවන්නට කම්මැලි සිතුණු එක් සෙනසුරාදා සවස් වරුවක දේවින්ද්‍රි හීන් බණ්ඩා සොයා ගියාය. රෝස පාත්තියක් සඳහා බිම් සකස් කරමින් සිටි ඔහු උදල්ල පසෙක තබා බයාදු සිනාවක් පෑවේ හිස බැඳගෙන සිටි ජටාව ද අතට ගනිමිනි.

"මාත් උදව් කරන්න ද හීන් බණ්ඩා...?"

ඇය සිනාවක් මුවට නංවා ගනිමින් විමසුවාය. හීන් බණ්ඩා සිරුර පුරා ගලමින් තිබූ දාඩිය ජටාව සඳහා බැඳි රෙදි කෑබැල්ලෙන් පිසදා ගත්තේය.

"වලව්වෙ හාමුදුරුවෝ ඉන්න කොටත් ඔය වාගෙ තමයි... මම කොච්චර එපා කිව්වත් මට උදව් කරනවා ඇවිල්ලා..."

ඇය ඇසූ පැනයට පිළිතුරු දීම වෙනුවට එසේ පැවසූ හීන් බණ්ඩා බිම තිබූ පිහිය අහුලාගෙන එයින් පිට කසා ගත්තේය. ඔහු නිරන්තරයෙන්ම සූරියනැත්ත මැතිණිය හා තමන් සන්සන්දනය කර බලනවා විය යුතුයි දේවින්ද්‍රිට සිතිණි.



"මං කොයි විදියට ද හීන් බණ්ඩට උදව් කරන්න ඕන...?"

දේවින්ද්‍රි විමසුවේ එම කතාව දුර දිග ගෙන යාමට ඇය තුළ කැමැත්තක් නොවූ බැවිනි.

"මම වලවල් කපල දුන්නම නෝනා රෝස රිකිලි ටික හිටවන්නකො එහෙනම්..."

හීන් බණ්ඩා කළ යෝජනාවට දේවින්ද්‍රි සතුටින් එකඟ වූවාය. පොලිතීන් කවරවල පැළ කරන ලද රෝස රිකිලි තොගයක් පසෙක තිබිණි. ඇය එතැනට යද්දී ගේට්ටුවෙන් ඇතුළු වුණ යුවතියක් ගෙය දෙසට එනු දකින්නට ලැබිණි.

"කවුද හීන් බණ්ඩා අර...?"

"ඒ මගෙ ලොකු දුව... නෝනව බලන්ට එනවා වෙන්ටැති" හීන් බණ්ඩා පැවසුවේ සිනාසෙමිනි.

ඇය පැකිළෙමින් වටපිට බලමින් කෝල ගමනින් එන යුවතිය වෙත හීන් බණ්ඩාගේ අවධානය යොමු කරලුවාය.

හීන් බණ්ඩාගේ දියණිය බැලූ බැල්මටම සුන්දර නොවූව ද ඇගේ වතෙහි තිබුණේ ඕනෑම කෙනෙකු වශී කරගත හැකි කරමේ ආකර්ෂණයකි. දේවින්ද්‍රි ඇය සමග සුහදව දොඩමලු වූයේ එහෙයිනි. යෙහෙළියක නොමැති පාළුව ඇගෙන් පිරිමසා ගත හැකි වනු ඇතැයි දේවින්ද්‍රිට සිතිණි.

"අප්පච්චි හැමදාම ගෙදර ගිහින් නෝනා ගැන කියනවා... මට ඉතින් බලන්න ආසා හිතුණා... ඒකයි ආවෙ..." ඇය ඒ වයසේ යුවතියකට උරුම කෝල සිනාවෙන් යුතුව පැවසුවාය.

"මගෙ නම දෙව්න්දි..."

දෙව්න්දි වහා පැවසුවේ එවන් යුවතියක හෝනා වශයෙන් ඇය ඇමතීම නොඉවසූ බැවිනි.

"මට එහෙම කතා කරන්න හිතෙන්නෙ නැහැ..." ලක්මාලි පැවසුවේ අහිංසක හඬිනි. දෙව්න්දි සිනාසුණාය.

"එහෙම නම් ඔයා මට අක්කා කියල කතා කරන්න... මට නංගිලත් නැති නිසා මං ඔයාට නංගි කියන්නම්..."

"මට ඔයාගෙ නමත් අහල පුරුදුයි... කොහෙදි හරි දකලත් පුරුදුයි..."

ලක්මාලි යටි තොල මත ඇඟිල්ල තබාගෙන නලල රැළි කොටගෙන මොහොතක් කල්පනා කළාය.

"මම නුවරනෙ ඉගෙන ගත්තෙ. එහෙදි දකින්න ඇති..." දෙව්න්දි පැවසුවේ සේවය කළ පුවත්පත පිළිබඳ මතකය එසෙම සිටින්ම අමතක කොට දමමිනි.

"එහෙම මතකයක් නෙමෙයි තියෙන්නෙ..."

යුවතිය තවත් මොහොතක් කල්පනා කළාය. ඊළඟ මොහොතේ ඇගේ මුවග ජයග්‍රාහී සිනාවක් නැගිණි.

"හරි දැන් මට මතක් වුණා..."

ඇය පැවසුවේ අත් පොළසනක් ද ගසමිනි. දෙව්න්දි කුතුහලයෙන් යුතුව බලා සිටියාය.

"ඔයා තරුමල් පත්තරේ වැඩ කළා නේද...?"



දෙව්න්දිට තරමක අපහසුවක් දැනිණි. එහෙත් ලක්මාලිගේ අහිංසක මුහුණ දෙස බලාගෙන බොරුවක් කීමට ඇයට හිත හදා ගත නොහැකි විය.

"ඔව්..."

ඇය මිමිණුවාය. ලක්මාලි වහා දෙව්න්දිගේ අතකින් අල්ලා ගත්තේ බොහෝ කාලයක් සොයමින් සිටි යමක් නිටි හැටියේම ලැබුණු කලෙක මෙන් ප්‍රබෝධයෙන් යුතුවය.

"අපි ඒ පත්තරේට හරිම ආසයි... අක්කා ලිව්ව කතා අපි පොර කකා කියෙව්වෙ... අනේ ඇයි අක්කා ඒ පත්තරේ නැවැත්තුවෙ...?"

ලක්මාලි එවර කිසිදු පැකිලීමකින් තොරව අක්කා වශයෙන් ඇය ඇමතුවාය. පුවත්පත නිසාම මෙතෙක් නොදනුණ සමීප කමක් ඇයට දැනෙන්නට ඇතැයි දෙව්න්දිට සිතිණි. එතැන් සිට බොහෝ වේලාවක් ගත වෙන තුරු ඔවුන් දෙදෙනා පුවත්පත් හා නවකතා පිළිබඳව කතා බහ කළහ.

"තරු මල් පත්තරේ වර්ෂ පූර්ණ කලාපෙක ඔයාගෙ ෆොටෝ එකක් දාලා තිබ්බනෙ...? ඒකෙ මතකෙන් තමයි මම ඔයාව අඳුන ගත්තෙ..."

ලක්මාලි පැවසුවේ උද්දාමයෙනි. පුවත්පත නොමැති වීමත් සමගම මොන තරම් රසිකයන් පිරිසක් ගිලිහී යන්නට ඇද්දැයි දෙව්න්දිට සිතිණි.

"ඔයාගෙ නවකතා ආසාවෙන් කියවපු තවත් මගෙ හොඳ යාළුවෙක් ඉන්නවා... එයාට කිව්වම පුදුම වෙයි ඔයා

මෙහෙ ඉන්නවා කියලා... අනේ අක්කා ඔයාට නිවාඩු වෙලාවක අපේ ගෙදර එන්නකෝ.. මම ඔයාවත් එයාට අඳුන්නල දෙන්නම්..." ඇය දේවින්දිගේ අත තරමේ අල්ලා ගනිමින් පැවසුවේ බැගෑපත් හඬිනි.

"මං දන්නෙ නැහෙ ඔයාලගෙ ගෙදර..."

ඉල්ලීම පැහැර හැර ඇගේ සිත රිදවීමට ඇති වූ දුකටත් වඩා ගමේ ඇවිදින්නට යාමට සූරියතැන්න මහතාගෙන් අවසර නොලැබෙතැයි හැඟීම නිසා දේවින්දි එලෙස පැවසුවාය. හීන් බණ්ඩා හෝ සීලවතී සමග ඕනෑම මොහොතක ඔවුන්ගේ නිවසට යා හැකි බව ඇය අමතක කළේ සිතාමතාමය.

"අපෝ... අපේ ගෙදර හොයා ගන්න එච්චර අමාරු නෑ... මේ ගේට්ටුවෙන් එළියට බැහැලා. හීන් බණ්ඩලගෙ ගෙදර කොහෙද කියල ඇහුවම ඕනෑම කෙනෙක් ගේ පෙන්නයි... ඒ නැතත් අම්මා හරි අප්පච්චි හරි එක්ක එන්නත් පුළුවන්නෙ..."

"මට පොරොන්දු වෙන්නම බෑ. බලන්නම්..." දේවින්දි උත්සාහ කළේ ඇගේ සිත නොරිදවා යෝජනාව පිළිකෙව් කරන්නටය. තමා පිළිබඳව බොහෝ දෙනෙකු දැන ගන්නවාට ඇය තුළ කැමැත්තක් නොතිබිණි.

එහෙත් ඉරිදා දවස උදා වූයේ අතිශයින්ම හුදෙකලා ශෝකී හැඟීමක් සමගිනි. පොතක් කියවමින් හෝ යමක් ලියමින් කාලය ගෙවා ගන්නට නොහැකි ලෙසක් දේවින්දිට දැනිණි. කුමක්දැයි වෙන් කොට වටහා ගත නොහැකි නොසන්සුන් හැඟීමක් ඇගේ සිතට වද දෙමින් තිබිණි.

"සර් මම හීන් බණ්ඩලගෙ ගෙදර ගිහින් එන්න ද...?"



අවසානයේදී කෙළින්ම කාර්යාල කාමරයට ගිය දේවින්දි කුඩු කේඩු බැල්මකින් යුතුව තමා දෙස බලා හිඳින පියතිලක නොතකා හැර සූරියතැන්න මහතාගෙන් විමසුවාය. පියතිලක යමක් කියන්නට මෙන් කට හදා වහා නිහඬ වූයේය. පිළිතුරක් දෙන්නට පෙර සූරියතැන්න මහතා ඇය දෙස බලා මුව පුරා සිනාසුණේය.

"අද ඔයාගෙ නිවාඩු දවස... ඒක ඕනෑම විදියකට ගත කරන්න ඔයාට අවසර තියෙනවා දේවින්දි..."

ඔහු පැවසුවේ කරුණාවන්ත හඬිනි.

"ගමේ ඇවිදින්න යන එක නම් එච්චර හොඳ වැඩක් නෙමෙයි... මාජි කවදාවත් එහෙම ගෙවල් ගානෙ ඇවිදින්න ගියෙ නැහැ..." පියතිලක රළු හඬින් පැවසුවේය.

"මාජියි දේවින්දියි එක්කෙනෙක් නෙමෙයිනෙ පියතිලක... අනිත් එක මේ වගේ තරුණ කෙල්ලන්ට ගෙවල් ඇතුළෙම හිර වෙලා ඉන්න පුළුවන් කමක් නැහැ..."

සුපුරුදු ලෙසම සූරියතැන්න මහතා දේවින්දිගේ පැත්තට කතා කළේය.

"තරුණ කෙල්ලො තමයි ගෙවල් ඇතුළෙ තියාගෙන පරිස්සම් කරන්න තියෙන්නෙ... මය තැන් තැන්වල ඇවිදින්න ගිහින් මොනවා හරි වුණොත් අපි එපායැ වග කියන්න..."

ඔහුට පිළිතුරු වශයෙන් හොඳවායින් දෙකක් කීමේ වුවමනාව සිතට නැඟුණු නමුදු සූරියතැන්න මහතා ඉදිරියේ සිටි නිසා දේවින්දි අසීරුවෙන් හැඟීම් මැඩ පවත්වා ගත්තාය.

www.sinhalaelibrary.com

එහෙත් මේ කුඩු කේඩු මිනිසා පිළිබඳව ඇය තුළ හටගත් අප්‍රසාදය වඩාත් දැඩි විය.

"දේවින්ද්‍රි පුංචි ළමයෙක් නෙමෙයිනෙ පියතිලක.. එයාගෙ ආරක්ෂාව එයා බලා ගනියි... එන්න අපි අර ගණින් ටික බලල ඉවරයක් කරලා දාන්න... දේවින්ද්‍රි පරිස්සමට ගිහින් එන්න..." එක හුස්මටම කියාගෙන ගිය සූරියතැන්න මහතා රෝද පුටුව මේසය දෙසට හරවා ගත්තේය.

"තැන්ක් යූ සර්.."

දේවින්ද්‍රි පැවසුවේ පියතිලක දෙස නෙත් කොනින්වත් නොබලමිනි. එහෙත් ඔහුගේ බැල්ම තමා වෙතම රැඳී තිබෙන බව ඇයට දැනිණි. ඇය වහා කාමරයෙන් පිට වූවාය.

හීන් බණ්ඩාගේ ගෙය සොයා ගැනීම සිතූ තරම් අමාරු වූයේ නැත. කුඩා වුව ද සිරියාවන්ත පෙනුමකින් යුතු ගෙය අවට මලින් ගැවසුණු පාත්ති රැසක් විය.

"හීන් බණ්ඩා ගෙදරත් මල් වගාව වාගෙ..."

තමන් පිළි ගන්නට පුළුල් සිනාවකින් යුතුව ඉදිරියට පැමිණි හීන්බණ්ඩාගේ මුහුණ දෙස ද වටපිටාව ද බැලූ දේවින්ද්‍රි පැවසුවාය.

"මොන පිස්සු ද නෝනා, වඩුවගෙ ගෙදර පුටුවක් නෑ වාගෙ තමයි... මල් වවන්නෙ මෙයා නෙමෙයි අපේ කෙල්ල..."

රන් මැණිකා පැවසුවේ සැමියා වෙත හෝත්කාඩු බැල්මක් හෙළමිනි. දේවින්ද්‍රිට සිනා ගියේය. ඒ සිනාවත් සමගම මෙතෙක් වේලා සිත තුළ වූ නොසන්සුන් හැඟීම පලා



ගියේය. ඇය ගෙට ගොඩ නැඟුණේ සැහැල්ලු පියවරිනි.

දේවින්ද්‍රිගේ පැමිණීම තමන්ට කළ විශේෂ සැළකිල්ලක් ලෙස ඔවුන් සිතන බව ඇයට වැටහිණි. ලක්මාලි තොරතෝංචියක් නොමැතිව දේවින්ද්‍රි ලියූ නවකතා පිළිබඳවම කතා කළාය. ඒ කතාව කන් කරච්චලයක් ලෙස දැනුණ ද එයින් සිතට නැඟුණු ආඩම්බරය අසීමිතය. ප්‍රවීන යයි කියා ගන්නා ලේඛකයන් විසින් බොළඳ නවකතා බවට හංවඩු ගැසූව ද ඒවා ආදරයෙන් කියවන රසික පිරිසක් සිටින බව ඇය සිතුවේ එම ආඩම්බරයෙන්ම යුතුවය.

"දේවින්ද්‍රි අක්කා. අපි සාගරීලගෙ ගෙදර ගිහින් එමු ද..?"

තැඹිලි ගෙඩියක් ගෙනැවිත් දේවින්ද්‍රිට පිරිනමන ගමන් ලක්මාලි විමසුවාය.

"ඒ මොකටද එහෙ යන්නෙ...?"

හීන් බණ්ඩා වහා විමසුවේ කොහෙවත් යන්න ඕනෑ නෑ වැනි බැල්මක් දෙනෙත් වලට නගා ගනිමිනි.

"සාගරී දේවින්ද්‍රි අක්කව බලන්න හරි ආසාවෙන් ඉන්නෙ අප්පච්චි..."

"ඉතින් මෙහාට එන්ට කියපන්කො..."

"නෑ හීන් බණ්ඩා. අපි එහාටම ගිහින් ඉක්මනට එන්නම්"

දේවින්ද්‍රි වහා පැවසුවේ ලක්මාලිගේ මුහුණ අඳුරකට නැඹෙනු දුටු බැවිනි. අනෙක් අතට ගමේ මිනිසුන් දැන හැඳින ගැනීමේ වුවමනාව ද ඇයට බලපෑවේය.

www.sinhalaelibrary.com

සාගරීගේ නිවස ලක්මාලිගේ නිවසට වඩා විශාල විය. ඔවුන් ගමේ යමක් කමක් ඇති අය බව බැලූ බැල්මටම වටහා ගත හැකි විය.

"සාගරීගෙ තාත්තා තමයි ගමේ ඉන්න හොඳම වෙද මහත්තයා..."

ලක්මාලි මගදීම නිවැසියන් පිළිබඳව පවසා තිබිණි. ඔවුන්ගේ නිවසින් ද ඇයට ලැබුණේ උණුසුම් පිළිගැනීමකි. බෝට්ටුව අත් හැට්ටයකින් හා චීත්ත ඔසරියකින් සැරසුණු සාගරීගේ මව ඉතා ප්‍රිය මනාප කාන්තාවක් විය. දේවින්දිට මාජ් සිහිපත් වූයේ සැණෙකිනි.

"ඔය ළමයා පත්තරේකත් වැඩ කළාලු නේද...? ඉතින් මොකද මේ වාගෙ රස්සාවකට එන්න හිතුවෙ...?"

සාගරී හා ලක්මාලි සමඟ දේවින්දි කතා කරමින් සිටි තැනට ඔසරි පොට බඳ වටා ඔතා ගනිමින් පැමිණි සාගරීගේ මව විමසුවාය.

"ලේඛකයො ඉතින් එහෙම නේන්නම් අම්මා... එයාල රස්සාවල උස් පාත් බේදයක් හිතන්නෙ නෑ..."

සාගරී දේවින්දි වෙනුවෙන් එහා පිළිතුරු දුන්නාය. එවිදත් දේවින්දිම මොහොතකට පෙර පැවසූ ඒවාය.

"ඔව් ඒකත් ඇත්ත... උඹලා වාගෙ මෝඩයො තමයි එව්වා හොයන්නෙ..." මව පැවසුවේ ඇනුම් පදයක හඬිනි.

"ඒක නෙමෙයි දේවින්දි මං ඔයාට ආරාධනාවක් කරන්න පිළිගන්නව ද...?"



හිටි හැටියේම සාගරී විමසුවාය. ඇයත් තමාත් එකම වයසේ විය යුතු යයි දේවින්දිට සිතිණි.

"මොකක්ද අප්පේ ඔය ආරාධනාව...?" දේවින්දි විමසුවේ සිනාසෙමිනි.

"අපේ අයියා මෙඩිකල් කොලේජ් එකේනෙ ඉන්නෙ. ලබන සතියෙ එයා එනවා නිවාඩුවට... එයා ඔයාට අඳුන ගන්න ආසා වෙයි... ලබන ඉරිදත් මෙහෙ එන්නකො... අනේ ප්ලීස්..."

දේවින්දි මදක් කල්පනා කළාය. එම ආරාධනය පිළි ගන්නට හෝ එක් වරම ප්‍රතික්ෂේප කරන්නට ඇයට හැකියාවක් තිබුණේ නැත.

"අයියා ගෙදර ආවම කතා කරන්නවත් කවුරුවත් නැතුව හරිම කම්මැලිකමින් ඉන්නෙ... අපිට එකතු වෙලා බැඩ්මින්ටන් ගහන්නත් පුළුවන් වේවි... අනේ දේවින්දි ඔයා එනවද කියල කියන්නකො..."

සාගරී ඇගේ දෑතම අල්ලාගෙන බැගෑපත් ලෙස විමසුවාය. දේවින්දි සිනාසුණාය.

"ඒක ඉතින් දැන්මම කියන්න බෑ... එදාට බලමුකො..."

"අනේ ගණන් උස්සන්න එපා දේවින්දි..."

"ගණන් උස්සනවා නෙමෙයි ළමයො... හෙට සිද්ද වෙන දේවල් ගැන අද කොහොමද හරියටම කියන්නෙ...?"

"අසුබවාදී වෙන්න එපා..." සාගරී සිනාසුණාය.

"සාගරීගෙ අයියා හරිම හොඳයි..." ආපසු එද්දී ලක්මාලි පැවසුවාය.

"ආ... හා... ලක්මාලිගෙ හිත ගිහින් වගේ... මම කියන්නම් අම්මටයි අප්පච්චිටයි..."

"අපෝ... විහිළුවටවත් කියන්න එපා... මට ගෙදරවත් ඉන්න ලැබෙන එකක් නෑ..."

ලක්මාලි දෙඋර ගැස්සුවාය. දෙවින්දිගේ මුවට සිනාවක් නැගිණි.

සැබැවින්ම ලක්මාලිත් සාගරීත් සමග ගෙවූ සැහැල්ලු වූත් විනෝදකර වූත් කෙටි කාලය දෙවින්දිගේ සිතට සහනයක් ළඟා කළේය. ලබන ඉරිදා දවසක් ඔවුන් සමග එක්ව ගත කළ යුතු යයි අවසානයේදී ඇය තීරණය කළාය.



## 7

බඳුනකට මල් කිහිපයක් සහ කොළ අතු කිහිපයක් එක් කළ දෙවින්දි සිත්තරෙකු සිය අලුත්ම නිර්මාණය නරඹන්නාක් මෙන් මදක් පසු පසට වී හිස ඇළකොට ගෙන එදෙස බලා සිටියාය. පිටුපසින් සිටින අයෙකු දිගු සුසුමක් හෙළනු ඇසුණෙන් ඇය තිගැස්සී හැරී බැලුවාය. කිසිවෙකු ශාලයට ආ බවක්වත් ඇයට දැනී නොතිබිණි. සූරියතැන්න මහතා රෝද පුටුවේ හිඳගෙන මල් බඳුන දෙස බලා සිටියේය. ඔහුගේ මුහුණ ශෝකයෙන් පිරී තිබෙනු ඇයට පෙනිණි. දෙවින්දි සෙමින් සෙමින් ඔහු අසලට ගියාය.

"ඇයි සර්..."

ඇය විමසද්දී ඔහු නැවත ද සුසුමක් හෙලුවේය.

"මට සුජානිව මතක් වුණා දෙවින්දි. එයත් ඔය වගේම හරි ලස්සනට වාසන් ඇරේන්ජ් කරනවා... එයා මටයි පුතාටයි

වාගෙම මල්වලටයි සත්තුන්ටයි ආදරේ කෙරුවා... ඇයි එයා අපිව දාල ගියෙ කියල මට අදවත් හිතා ගන්න පුළුවන් කමක් නැහැ..."

දෙව්න්දි කම්පාවෙන් පුතුව බලා සිටියාය. සැබැවින්ම මේ වලව්වට පැමිණි දා සිටම කිසිම අයෙකු සූරියතැන්න මහත්මියගේ නුගුණයක් ගැන කතා කළේම නැත. එවන් කාරුණික කාන්තාවක් සැමියා ආබාධිත වූ පළියටම ඔහු දමා යනු ඇතැයි සිතන්නට ඇය මැළි වූයේ එබැවිනි.

"මට හිතෙන විදියට මෙතන මොකක්දෝ අබිරහසක් තියෙනවා..." ඇගේ සිත කීවේය.

"සර්ව මම ටිකක් එළියට එක්කරගෙන යන්න ද...?"

දෙව්න්දි විමසුවේ ඔහු වෙනුවෙන් කළ යුතු වෙනත් යමක් සිහියට නොනැඟුණු නිසාය.

"දෙව්න්දිට කරදරයක් නැත්නම්..."

ඔහු රෝද පුටුවේ ඇන්දට තැබූ වමතට හිස බර කොට ගෙන දෙනෙත් පියා ගත්තේ සිතට පිවිසි වේදනාව මැඩ ගැනීමට විය යුතු යයි ඇයට සිතිණි. ඇය රෝද පුටුව තල්ලු කරගෙන පුළුල් ආලින්දයට ගියාය. එය ගෙවත්තට ගන්නට හීන් බණ්ඩා ඇයට උදව් කළේය.

"හීන් බණ්ඩා දෙව්න්දිට හරි ආදරෙයි නේද...?"

ඇය පයිනස් ගස් යටින් වැටී ඇති සෙවනැති පාරේ රෝද පුටුව තල්ලු කොටගෙන ගේට්ටුව දෙසට යද්දී සූරියතැන්න මහතා විමසුවේය.



"අනේ ඔව් සර්... හීන් බණ්ඩා විතරක් නෙමෙයි මෙහෙ වැඩට එන කවුරුත් මට ආදරෙයි..." ඇය උද්යෝගිමත් හඬින් පැවසුවාය.

"හීන් බණ්ඩා පුංචි කාලෙ ඉඳලම හැදුණෙ මේ වලව්වෙ... ඒත් එයා සුජාතාට ඇරෙන්න වෙන කිසිම කෙනෙකුට ඔය වත්තෙ මලකට අත තියන්න දුන්නෙ නෑ..."

"මට මාජ් ඇන්ටින් කිව්වා."

"ඔව්. මාධවී දවසක් මල් පොකුරක් කඩා ගත්තා කියල එයාට හොඳටම බැනල මෙහෙන් යන්නත් ලෑස්ති වුණා..."

සූරියතැන්න මහතා පැවසුවේ මුවගට සිනාවක් ද නංවා ගනිමිනි. තමා මාධවීට කිසි සේත්ම දෙවැනි වන්නේ නැතැයි යන හැඟීම දෙව්න්දිගේ සිතට දැඩි සොම්නසක් ගෙනාවේය.

"මගෙ වයිෆ්ව දන්න හැමෝම එයාට පුදුම විදියට ආදරේ කළා. දෙව්න්දි දක්කමත් ඒ විදියට ආදරේ කරන්න හැමෝටම හිතෙනවා ඇති..."

සූරියතැන්න මහතා මහතා ඉවසිල්ලේ නැවතිල්ලේ කියාගෙන ගියේය. දෙව්න්දි මුහුණ රතු කොට ගෙන සිනාසුණාය.

"තැන්ක් යූ සර්..."

"ඇත්තටම මටත් මේ වලව්ව ගෙයක් වාගෙ දනෙන්න පටන් ගත්තෙ ඔයා ආවට පස්සෙයි දෙව්න්දි... කෙල්ලෙකුගෙ හිනාවක් නැතිව මේක පාළු වෙලා තිබුණෙ..."

www.sinhalaelibrary.com

සැබැවින්ම සූරියතැන්න මහතා ප්‍රිය මනාප පුද්ගලයෙකු විය. සිය අප්පච්චි සමග මෙන්ම ඔහු සමග ද ඕනෑම විෂයයක් පිළිබඳව විවෘතව කතා බහ කරන්නට හැකි බව ඇය ඉක්මනින් වටහා ගත්තාය. ඇයට ඔහුගේ සමාගමය වෙහෙසක් ඇති නොකළේ එහෙයිනි.

"අපි ඔය ගහ යටින් ටිකක් නවතිමු දේවින්දි..."

සූරියතැන්න මහතා අතු පතර විහිදුණු විසල් සියඹලා ගසක් දක්වමින් පැවසුවේය. සිහින් රතු සහ කහ පැහැයෙන් යුතු මල් ගස මත ද බිම ද විසිරී තිබිණි. දේවින්දි රෝද පුටුව නවත්වා සියඹලා ගසට පිටදී සිට ගත්තාය.

"දේවින්දිට ඊට පස්සෙ ධනුෂ්ක මොකුත් කිව්වෙ නෑ නේද...?"

ඈත බලාගෙන මොහොතක් කල්පනා කරමින් සිට සූරියතැන්න මහතා දේවින්දි දෙස නොබලාම විමසුවේය.

"නෑ සර්... ධනුෂ්ක සර් හැම වෙලාවට වීකෙන්ඩ් එකට ගෙදර එන්නෙත්..."

"එයා දන් ඔහොමවත් ගෙදර ඉන්නවා ඇති. ලංකාවෙ ඉන්න එයාගෙ කිසිම කැමැත්තක් නැහැ... මම හැම වෙලාවෙම කියනවා කසාදයක් බැඳල පිළිවෙලක් වෙලා මේ වතු පිටි බලාගෙන ඉන්න කියලා... ඒත් එයාගෙ කිසිම සැලකිල්ලක් නැහැ..."

ඔහු දිගු සුසුමක් හෙලුවේය.

"ඒවටත් වෙලාව එන්න ඕනනෙ සර්..."



දේවින්දි පැවසුවේ ඔහුගේ සිත සැනසෙනු පිණිස යමක් කිව යුතු බැවිනි.

"ඒකෙත් ඇත්තක් තියෙනවා තමයි දේවින්දි... කිසිම දෙයක් අපිට ඕන වෙලාවට අපිට ඕන විදියට සිද්ද වෙන්නෙ නෑ.. සුජානි මාව දාල ගියෙත් ඒ නිසා වෙන්නැති..."

ඔහු කතා කළේ සෝබරවය. දේවින්දි නිහඬව බලා සිටියාය. ඔහු සුජානිට කොපමණ ආදරය කරන්නට ඇද්දැයි දේවින්දි කල්පනා කළාය.

"සර් ඉතින් කවදාවත් එයාව හොයන්න ට්‍රයි කළේ නැද්ද..?" සිතේ නිරන්තරයෙන්ම තෙරපෙමින් තිබූ පැනය ඇය විමසුවාය. සූරියතැන්න මහතා හිස සැලුවේය.

"එයා ගියෙ එයාගෙ කැමැත්තෙන්. කවදා හරි දවසක ආවොත් එයාගෙම කැමැත්තෙන් ආවදෙන් කියල මම හිතුවා.. මාව එපා වෙලා ගියා නම් ඇයි මම ආයෙමත් එයාව බලෙන් ගෙන්න ගන්නෙ..."

"ආයෙමත් එයා ආපහු එයි කියල සර් හිතනවද...?"

දේවින්දි විමසුවේ මාජ් විසින් එවැන්නක් ඇයට පවසා තිබූ බැවිනි. ඔහු සුසුමක් හෙලුවේය.

"මම අවුරුදු විසි ගණනක්ම එයා ආපහු එයි කියන බලාපොරොත්තුවෙන් හිටියෙ... දනුත් මට එහෙම හිතෙනවා.. ඒත් සමහර වෙලාවට හිතෙනවා ඒක නිකම්ම නිකම් බලාපොරොත්තුවක් විතරයි කියලා... කොහොම වුණත් ඒ බලාපොරොත්තුවයි මගේ පුතයි තමයි මෙච්චර කල් මාව ජීවත් කෙරෙව්වෙ..."

www.sinhalaelibrary.com

"කවුද බණ්ඩාර හාමුදුරුවන්ව මෙහාට එක් කර ගෙන ආවෙ..."

එත්වරම ඇසුණු රළු කටහඬින් තිගැස්සුණු දේවින්දි හැරී බැලුවාය. කිසිදු හඬක් නොනගාම පියතිලක එතැනට පැමිණ සිටියේය. ඔහුගේ ද්වේෂයෙන් පිරුණු දෙනෙත කෙළින්ම එල්ල වී තිබුණේ දේවින්දි වෙතටය.

* * *

පියතිලක සවස් වරුවේ කොහේදෝ යනු දේවින්දි බලා සිටියාය. ඇගේ සිතට සැහැල්ලුවක් දැනිණි. ඔහුගේ උකුසු ඇස් නිරන්තරයෙන්ම ඇය ලුහු බඳිමින් තිබුණේ යම් කිසි වරදක් අල්ලා ගන්නට මෙනි. මාජ් කිරාක් මෙන් ඔහු මොනතරම් කුඩු කේඩු තැනැත්තෙක් දැයි ඇය කල්පනා කළාය.

වැව ළඟට ගොස් සිය නවකතා පොතේ තවත් පරිච්ඡේදයක් ලිවිය යුතු යයි සිතූ දේවින්දි සූරියතැන්න මහතාගේ සවස තේ කෝප්පය පිළියෙල කරන්නට සූදානම් වූවාය. කුස්සියේ බිත්තියේ තව වූ සංගීතමය සීනුව නාද වුණේ එවිටය. ඇය සූරියතැන්න මහතාගේ කාර්යාල කාමරයට ගියාය. මේසයට නැඹුරු වී යමක් ලියමින් සිටි ඔහු හිස එසවූයේය. ඔහුගේ මුහුණේ වෙහෙසකාරී බවක් රැඳී තිබිණි. ඔහු දේවින්දි දෙසට රෝද පුටුව හරවාගෙන අත්ලෙන් නළල පිරි මැද ගනිමින් මඳ සිනාවක් පෑවේය.

"මට අද හරි මහන්සියි දේවින්දි... අද දවසම මේ ඔෆිස් රූම් එකේ හිරවෙලා ඉඳලා ඇති වුණා..."



"සර්ව එළියට එක්කන් යන්න මට බයයි... එදා වගේ ලියන මහත්තයා බනී ද දන්නෙ නැහෙ"

"එයා කියන දේවල් එච්චර ගණන් ගන්න එපා... හිතවත් කම වැඩිකමට කරන සමහර දේවල් මට කරදරයක් වෙන වෙලාවලුත් තියෙනවා... අපි අද එළියෙ ඉඳගෙන තේ බොමු..." සූරියතැන්න මහතා යෝජනා කළේය.

දේවින්දිට තරමක පුදුමයක් දැනිණි. ඔහු හිතවත් බව දැන සිටිය ද ඔහු සමඟ තේ බොන්නට ඇයට ආරාධනා කරනු ඇතැයි ඇය කොහෙත්ම සිතුවේ නැත. නිරන්තරයෙන්ම සූරියතැන්න මහතාගේ සෙවනැල්ල මෙන් ගැවසෙන පියතිලක කරන කියන දේවල් ගණන් නොගන්නා ලෙස ඔහු පැවසීම ද ඇයට පුදුමයක් විය.

"ඔන්න ඔය මේසෙ උඩ තියෙන කොළ ටික නොම්මර පිළිවෙලට එකතු කරල කටුවක් ගහල අර නිල් පාට ෆයිල් එක ඇතුළට දාන්න දේවින්දි..."

මේසය පුරාම විසිරී තිබුණු ඉංග්‍රීසියෙන් ලියැවුණු තාප් සිට කොළ එකතු කරද්දී ඒවායේ වූ වාක්‍යයක් දෙකක් ඇයට කියැවුණේ ඉබේටමය. එය නවකතාවක් බව ඇයට වහා වැටහිණි. ඇය කොළ ටික අතේ තිබියදීම සූරියතැන්න මහතා දෙස මවිතයෙන් බැලුවාය.

"සර් මේ නවකතාවක් ද ලියන්නෙ...?"

ඇය විමසද්දී හිස ඔසවා බැලූ ඔහු පසුතැවිලි වන ආකාරයේ සිනාවක් පෑවේය.

"එහෙනම් ඒ රහස තවත් කෙනෙක් දැන ගත්තා..."

"මොකද්ද සර් රහස...?"

දේව්න්දි කොළ ටික එකතු කොට ප්‍රවේසමින් කවුවක් ගැසුවාය. එය කියවා ගෙන යන්නට සිතට ආ වුවමනාව ඇය මැඩ ගත්තේ ආයාසයෙනි.

"එක්සිඩන්ට් එකෙන් පස්සෙ මං හුඟාක් තනි වුණා.. සුජාතිත් මාව දාලා ගියාම මම දිවි නසා ගන්න හිතෙන තරමට මානසිකව වැටුණා. ඩොක්ටර් කිව්වා වෙන විනෝදාංශයක යෙදෙන්න බැරි නම් හිතට එන හැම සිතුවිල්ලක්ම කොළේක ලියන්න කියලා... ඉස්කෝලෙ යන කාලෙත් මම පුංචි පුංචි කෙටි කතා එහෙම ලියල තියෙනවා. ඉතින් මට හිතුණා නිකම්ම සිතුවිලි ලියනවට වැඩිය හොඳයි නිර්මාණාත්මක දෙයක් කරන එක කියලා... මම පොත් ලියන්න පටන් ගත්තෙ ඒ විදියටයි..."

"සර් පොත් ලියනවා...?"

දේව්න්දි වඩාත් මවිතයෙන් විමසුවාය. සූරියතැන්න මහතා සිනාසුණේය.

"ඔය රාක්කෙ ඔක්කොම තියෙන්නෙ මම ලියපු පොත් තමයි..."

සූරියතැන්න මහතා මේසය අසල වූ පොත් රාක්කය දක්වූයේය. එහි තිබුණේ හම් බැම්මෙන් බඳින ලද විද්‍යා ප්‍රබන්ධ රාශියකි. බෙහෙවින් කියවීමට ඇබ්බැහිව සිටි දේව්න්දි එම පොත් සියල්ලම කියවා තිබිණි. සැබැවින්ම සුජාන් සූරියබණ්ඩාර තරම් ඇය ප්‍රිය කළ දේශීය ඉංග්‍රීසි ලේඛකයෙක් සිටියේම නැත. නිරවුල් භාෂා ශෛලියත් පරිච්ඡේදයක් පාසාම



ඇති රසවත් බව හා කුතුහලයත් නිසා ඔහුගේ පොතක් කියවීමට ගත් කල එය අවසන් වන තුරුම සිත තුළ වූයේ බලවත් නොඉවසිල්ලකි. වරක් ඇය ඔහුගේ විද්‍යා ප්‍රබන්ධයක් සිංහලට පරිවර්තනය කොට කොටස් වශයෙන් තරු මල් පුවත් පතේ පළ කළාය. එය පාඨකයන් අතර බෙහෙවින් ජනප්‍රිය විය. සුජාන් සූරියබණ්ඩාරත් සූරියතැන්න මහතාත් එක් අයෙක් යයි අදහා ගැනීමට නොහැකිව ඇය බලා සිටියාය.

"මොනවද දේව්න්දි පොත් දිහාවෙ බලාගෙන කල්පනා කරන්නෙ..?"

සූරියතැන්න මහතා රෝද පුටුව පදවාගෙන පොත් රාක්කය ළඟට පැමිණියේය.

"මට හිතා ගන්න බෑ සර්..."

දේව්න්දි වාක්‍යය අතර මග නතර කළාය.

"මමයි සුජාන් සූරියබණ්ඩාරයි එක්කෙනෙක් කියලා.. එහෙමනෙ...?" සූරියතැන්න මහතා වාක්‍යය සම්පූර්ණ කළේය.

"ඔව් සර්.. ඇත්තටම මට ඒක අදහා ගන්න බෑ. මම සුජාන් සූරියබණ්ඩාර ලියපු හැම පොතක්ම කියවලා තියෙනවා... ඒ විතරක් නෙමෙයි එකක් ට්‍රාන්ස්ලේට් කරලත් තියෙනවා..."

එවර අදහා ගත නොහැකි දෙයක් කියවුණු කලෙක මෙන් බලා සිටියේ සූරියතැන්න මහතාය.

"මොනව දේව්න්දි...? ඔයා මගෙ පොතක් ට්‍රාන්ස්ලේට් කරල තියෙනවා..? ඒ කියන්නෙ ඔයත් ලියන එක්කෙනෙක්...?"

www.sinhalaelibrary.com

"ඔව් සර්... මම ඒ පොත ට්‍රාන්ස්ලේට් කරන්න අවසර ඉල්ලල ලියුමකුත් එව්වා... ඒත් පොත්වල දාල තියෙන්නෙ මෙමගෙ එඩ්රස් එක නෙමෙයිනෙ..."

"මම කැමති නෑ කවුරුවත් මාව අඳුන ගන්නවට... ඒක මගෙ නිදහසට බාධාවක්... ඒ හින්දා මම දාන්නෙ මගෙ පොත් ප්‍රින්ට් කරන තැන එඩ්රස් එක... දැන් මට දැන ගන්න ඕන දේවින්දි ඔයා ගැන... ඔයා කවද ද මගෙ පොතක් ට්‍රාන්ස්ලේට් කළේ...?"

ඔහු කුතුහලයෙන් ඇය දෙස බැලුවේය. ඔහු සිය රහස හෙළි කළාට පසු තමා තව දුරටත් පැකිලීමෙන් පලක් නැතැයි ඇයට සිතිණි. අනෙක් අතට සූරියනැන්න මහතාගේ අවංක දෑස් දෙස බලාගෙන බොරුවක් කීමට හිත හදා ගන්නට ද ඇයට නොහැකි විය.

"මම පත්තරේක වැඩ කළා සර්... ඒ පත්තරේට මම සර්ගෙ පොතක් කොටස් වශයෙන් ට්‍රාන්ස්ලේට් කළා..." ඇය වරදක් හසු වී නිදහසට කරුණු කියන දරුවෙකුගේ ස්වරයෙන් පැවසුවාය.

"දේවින්දි කියන නමින්...?"

"නෑ සර්... ඒ දවස්වල මගෙ නමින් නවකතාවක් පත්තරේ ගියා. ඒ හින්දා එඩිටර් කිව්වා වෙන නමකින් ලියන්න කියලා.."

සූරියනැන්න මහතා මහ හඬින් සිනාසී දේවින්දිගේ අතකින් අල්ලා ගත්තේය. ඇය තිගැස්සී ඔහු දෙස බැලුවාය.

"අයියෝ දේවින්දි අපි දෙන්නම එකම ෆීල්ඩ් එකේනෙ බලනකොට. මේක නම් හරිම පුදුම හමු වීමක්.. පොතක



පත්තරේක මේ වාගෙ කතාවක් තිබ්බ නම් එහෙම අපි ඒක විශ්වාස කරන්නෙත් නෑ... ඔය රාක්කෙ කෙළවරේ තියෙන පුංචි පාට පොත ගන්න..."

දේවින්දි එම පොත අතට ගත්තාය. එය ද නම් බැම්මෙන් බඳින ලද හාෆ්ෂීට් වලින් සකස් කළ පොතක් විය. ඇය එය සූරියනැන්න මහතා වෙත දිගු කළාය. ඔහු හිස සැලුවේ එපා යයි ඇඟවෙන පරිද්දෙනි.

"ඕක පෙරළලා බලන්න..."

දේවින්දි සෙමින් පොතේ පිටු හැරවූවාය. සැබැවින්ම එවන් පුදුම සහගත දෙයක් ඇය කිසිදු දිනෙක අත් විඳ නොතිබිණි. ඔහුගේ පොත පරිවර්තනය කිරීම සඳහා ඇය අවසර ඉල්ලා එවූ ලිපිය පුවත්පතේ ඒ පිළිබඳව පළ වූ දැන්වීම සමගම හැම කොටසක්ම පිරිසිදුව පිළිවෙලට එහි අලවා තිබිණි. දේවින්දිවත් එතරම් පිළිවෙලට එම කොටස් එකතු කොට නොතිබිණි. ඇය පොත දෑතින්ම ළයට තුරුළු කොටගෙන සූරියනැන්න මහතා දෙස බැලුවාය.

"සර්..." ඇයට කතා කර ගැනීමට වදන් සිහිපත් වූයේ නැත.

"ජීවිතේ අපි නොහිතන පුදුමාකාර දේවල් සිද්ද වෙනවා දේවින්දි... මුළු ජීවිතේම හැදිල තියෙන්නෙ හමුවීම වලිනුයි වෙන්වීම වලිනුයි."

සූරියනැන්න මහතා සුසුමක් හෙළමින් ඉංග්‍රීසියෙන් පැවසීය. ඔහුගේ දෙනෙත්වල වූයේ ගැඹුරු බැල්මකි. දේවින්දි තවමත් පොත ළමැදට තුරුළු කොට ගෙන බලා සිටියාය.

www.sinhalaelibrary.com

සූරියතැන්න මහතා පවසන්නේ සහායක් බව ඇයට පසක් වෙමින් තිබිණි. සුළු වේලාවකට පසුව මුහුණේ ඉරියව් වෙනස් කළ ඔහු සුපුරුදු සුහද සිනාව දෙතොලට නංවා ගත්තේය.

"මම සුජාන් සූරියබණ්ඩාර කියල මෙච්චර කල් දනගෙන හිටියෙ ධනුෂ්කයි පියතිලකයි පොත් ප්‍රින්ට් කරන එක්කෙනායි මාධවීලගෙ ෆැමිලි එකයි විතරයි... දැන් දේවින්දිත් ඒ රහස දන්නවා... හැබැයි ඔයා මට පොරොන්දු වෙන්න ඕන තව කෙනෙකුට ඒක යන්නෙ නෑ කියලා..."

"ප්‍රොමිස් සර්..."

ඇය අත දිගු කළාය. සූරියතැන්න මහතා මලක් අතට ගන්නා කරම් ආදරයෙන් හා පරිස්සමින් ඇගේ අත අල්ලා ගත්තේය. අප්පච්චීගේ අත අල්ලා ගත් කල දැනෙන රැකවරණය හා ආදරය මුසු හැඟීම ඇගේ සිත පුරා උතුරා යන්නට විය.

"මම දේවින්දිව විශ්වාස කරනවා..." ඔහු ලෙන්ගතු හඬින් පැවසුවේ සෘජුවම ඇගේ දෙනෙත දෙස බලාගෙනය.

එක්වරම පූර්ව දැනුම් දීමකින් තොරව කාර්යාල කාමරයේ දොර විවර විය. දේවින්දි තිගැස්සී එදෙස බැලුවාය. මහත් කොට ගත් දෙනෙතින් යුතුව දොරකඩ සිටගෙන සිටියේ මාධවීය. ඇයට පිටුපසින් ධනුෂ්ක සිටගෙන සිටියේය.

"මේ මොන කෝලමක් ද...?"

මාධවීගේ උස් කටහඬ කාමරය පුරා දෝංකාර දුන්නේය.

දේවින්දි පමණක් නොව සූරියතැන්න වලව්වේ



සේවකයන් කිසිම කෙනෙක් තුළ මාධවී පිළිබඳව පැහැදීමක් නොවීය. ඇගේ අම්මා මෙන්ම ඇය ද අනෙක් අයගේ ඕපාදූප සොයන්නට සමත්කම් දක්වන බව ඔවුහු දැන සිටියහ. හදිසියේම සූරියතැන්න මහතාගේ කාර්යාලයට කඩාගෙන බිඳගෙන පැමිණි මාධවී පිළිබඳව ඔහුගේ සිත තුළ පවා අපැහැදීමක් හටගත් බව දේවින්දිට වැටහිණි. ඔහු නොරිස්සුමින් මෙන් ඇය දෙස බැලුවේය.

"මොකද මේ හදිස්සියෙම කඩා බිඳගෙන...?" ඔහු ඒ අපැහැදීම වදන් වලට පෙරලමින් මාධවී දෙස ද ධනුෂ්ක දෙස ද මාරුවෙන් මාරුවට බැලීය.

"මාමා ගෙදර තනියෙන් ඇති කියල හිතා ගෙන අපි ආවෙ... ඒත් දැන් බලනකොට තනියක් නෑ වගේනෙ.."

මාධවී උපහාසාත්මක හඬින් කියමින් දේවින්දි දෙස බැලුවාය. දේවින්දි එමොහොතේ සිටියේ ද සූරියතැන්න මහතාට සමීපව සිටගෙන ඔහුගේ අත අල්ලා ගත්වනමය. ඇයට මාධවී කෙරෙහි කිසිදු බියක් සැකක් දැනුණේ නැත. එහෙත් ඇය අත මුදා හැර කාමරයෙන් පිට වෙන්නට ගියාය. ඇයට ධනුෂ්ක මුහුණට මුහුණ හමු වූයේ එවිටය. ඔහුගේ බැල්මේ වූයේ කෝපයක් නොවේ. එහෙත් සත් හැවිරිදි වියේදී තමා හැර දා ගිය මව වෙනුවෙන් ඔහුගේ සිතේ ඇති පිළිකුල හා නොරිස්සුම එහි හොඳින් පිළිබිඹු වී තිබිණි.

"දේවින්දි කොහෙද යන්නෙ...?"

මාධවී සැර කරන්නාක් මෙන් විමසුවාය. දේවින්දිගේ සිතට දැනුණේ කෝපයකි. ඇය මේ නිවසේ සේවිකාවක බව

www.sinhalaelibrary.com

සැබෑය. එහෙත් ඇය වග කිව යුතු වන්නේ සූරියතැන්න මහතාට සහ ධනුෂ්කට පමණකි. මාධවී පවුලට බැඳෙන්නට සිටින බව සැබෑවකි. එහෙත් දැන්ම පටන්ම ඇයගේ අණසකට කීකරු වීමට දේවින්දිට අවශ්‍ය නොවීය. එම නිසාම ඇය නැඹුරුව කාමරයේ දොරකඩට ගියාය. සාක්කු දෙකේ දෑත් රුවා ගෙන දුටි බවකින් මුහුණ වෙනස් කොට ගෙන සිටි ධනුෂ්ක ඇයට ඉඩ දී පසෙකට වූයේය.

"මොකද තමුසෙට කතා කරන්න බැරි කටේ පිට්ටු ද...?"

රළු හඬකින් විමසූ මාධවී අඩියට දෙකට පැමිණ දේවින්දිගේ බාහුවෙන් අල්ලා ගත්තේ වේගයෙනි. ඒ වේගයට දේවින්දි නොවැටී බේරුණේ ධනුෂ්කගේ බාහුවට අත තබා ගත් බැවිනි.

"සොරි..."

ධනුෂ්කට පැවසූ ඇය මාධවී දෙස රවා බැලුවාය.

"තමුසෙ කවුරු' කියල හිතාගෙන ද මට රවන්න එන්නෙ...?" මාධවී විමසුවේ දේවින්දිගේ අත සොලවාලමිනි.

"මාධවී...!"

සූරියතැන්න මහතා තර්ජනාත්මකව ඇය ඇමතුවේය.

"දේවින්දි යන්නෙ තේ හදන්න. එයාට යන්න දෙන්න..."

"එහෙම යන්න දෙන්න බෑ..."

"මෙයා වැඩකාරියෙක් ද මෙතන කුමාරිහාමි ද කියල ඉස්සර වෙලා දැනගෙන ඉන්න ඕන..."



ඇය සිය කෝපය සූරියතැන්න මහතා වෙත ද යොමු කළාය.

"මාධවී එයාට යන්න දෙන්න..." ධනුෂ්ක සන්සුන්ව පැවසුවේය.

එහෙත් මාධවී මෙල්ල වන පාටක් නොවිණි. මාධවී භාවිතා කළ වදන් දේවින්දිගේ සිත බෙහෙවින් රිදවූයේය. සූරියතැන්න මහතා කිසි විටෙකත් ඇය සේවිකාවක ලෙසින් සැළකුවේ නැත. දේවින්දිගේ සිතේ ද එවන් හැඟීමක් තිබුණේ නැත. ඇය මෙහි රැඳී සිටියේ ද සිය නිවසේ සිටින්නාක් මෙන්ම සතුටුවෙන් හා සැහැල්ලුවෙනි. එහෙත් මාධවීගේ වදන් සමඟම ඒ හැඟීම ඉරි තලා ගියේය.

"මිස් මාධවී, මම ඔයාගෙ වැඩ කාරියෙක් නෙමෙයි. ඒ හින්දා මම කැමති නැහැ ඔයාගෙන් ඕඩර්ස් ගන්න... ඒ හින්දා කරුණා කරල මට යන්න දෙන්න..."

පැහැදිලි වූත් දැඩි වූත් හඬකින් පැවසූ දේවින්දි වේගයෙන් ගස්සා සිය අත මුදා ගත්තාය. මාධවීගේ කෝපය ඉහ වහා ගිය බව ඇයට වැටහිණි.

"පේනවා නේද දැන්ම ඉදලම කතා කරන ලස්සන... ඔහොම තමයි වැඩකාරයන්ට ඒ විදියට සලකන්නෙ නැතුව කරට ගත්තම සිද්ද වෙන දේ..." මාධවී කෙළින්ම චෝදනා කළේ සූරියතැන්න මහතාටය.

"මාධවී දැන් ඇති ඔය කතාව නවත්වන්න..."

ධනුෂ්ක අණ කළේ ඔහු සිය පියාගේ සිත රිදෙනු දකින්නට අකමැති නිසා විය යුතු යයි දේවින්දිට සිතිණි.

www.sinhalaelibrary.com

"මාධවී මේ ගෙදර තවමත් පාලනය කරන්නෙ මම... ඒ හින්දා ඔයාට බැහැ මගෙ ළඟ වැඩ කරන අයට බලපෑම් කරන්න..."

සූරියතැන්න මහතා ඉංග්‍රීසියෙන් පැවසීය. මාධවීගේ මුහුණ මුකුලිත විය. ඇයට දරා ගන්නට නොහැකි වන්නට ඇත්තේ ඔහු එය දේවින්දි ඉදිරියේම පැවසීම නිසා විය යුතුය. දේවින්දිගේ මුවගට මඳ සිනාවක් නැඟිණි. එහෙත් මාධවී තවමත් පරදින්නට සූදානම් නැති බවක් පෙනිණි.

"ඒ කොහොම වුණත් මාමා වැඩකාරයන්ව තියා ගන්න ක්‍රමයක් තියෙනවා.. ඒ ක්‍රමේට තියා ගත්තෙ නැත්නම් පසු වෙනකොට කරදර වෙයි..."

මාධවී කියද්දී ඇගේ ළඳ බොළඳකමට සරදම් කරන්නාක් මෙන් සූරියතැන්න මහතා සිනාසුණේය.

"ඔයා දන්නවනෙ මාධවී මේ වලව්වේ වැඩ කරන අය දවසින් දෙකෙන් අස් වෙලා යන්නෙ නැහැ... අවුරුදු ගණන් එක දිගටම ඉන්නවා... ඒ ක්‍රමේ වෙනස් කරන්න මම කැමති නැහැ... අනික් එක දේවින්දි මෙතන වැඩ කාරියෙක් කියල හිතනවාටත් මම කැමති නැහැ..."

සූරියතැන්න මහතා කියද්දී මාධවී ධනුෂ්ක පමණක් නොව දේවින්දි පවා ඔහු දෙස බැලුවේ මවිතයෙනි. සැබැවින්ම දේවින්දිට එවදන් අදහා ගැනීමට නොහැකි විය. ඔහු සේවිකාවකට මෙන් තමාට නොසලකන බව දැන සිටියද සිය පුතා සහ ඔහුගේ අනාගත මනාලිය ඉදිරියේදී ප්‍රසිද්ධියේ එය ප්‍රකාශ කරනු ඇතැයි දේවින්දි නිකමටවත් සිතුවේ නැත. මාධවී සැකයෙන් මෙන් ධනුෂ්කගේ මුහුණ දෙසත්



සූරියතැන්න මහතාගේ මුහුණ දෙසත් මාරුවෙන් මාරුවට බැලුවාය.

"මොකද්ද අප්පච්චි ඒ කතාවෙ තේරුම...?" ධනුෂ්ක විමසුවේ දෙබැම රැලි කොට ගනිමිනි.

"දේවින්දි නිකම් නිකම් හවුස් කීපර් කෙනෙක් නෙමෙයි. එයා මගෙ හොඳ රසිකාවියක්... ඒ විතරක් නෙමෙයි මගෙ එක පොතක් දේවින්දි ට්‍රාන්ස්ලේට් කරලත් තියෙනවා... මේ තියෙන්නෙ ඒක..."

සූරියතැන්න මහතා මීට ටික වේලාවකට පෙර දේවින්දි විසින් රාක්කයේ තිබී ගන්නා ලද පොත ධනුෂ්ක වෙතට පෑවේය. ධනුෂ්ක එහි පිටු පෙරළා බැලුවේ කුතුහලයෙන් යුතුවය. මාධවී ද පොතට එබී බැලුවාය.

"බොරු කියන්න එපා මාමා... මේකෙ දේවින්දිගෙ නම නෙමෙයිනෙ තියෙන්නෙ..."

මාධවී පැවසුවේ 'මෙයාට පුළුවන්ද මේ වගේ දෙයක් කරන්න...' ඇඟවෙන බැල්මක් දෙනෙතින් රුවාගෙනය.

"දේවින්දි එතකොට පත්තරේකත් වැඩ කළා ද...?" ධනුෂ්ක විමසීය.

"ඔව් සර්... ටික කාලයක් වැඩ කළා..."

දේවින්දි සිය කටහඬට යටහත් පහත් බවක් ආරූඪ කර ගන්නට තැත් දරමින් පැවසුවාය.

"ඇයි එතනින් අස් වුණේ...?"

www.sinhalaelibrary.com

පන්තිය නැවතුණා යයි කිව්වොත් මාධවීගේ මුහුණට ජයග්‍රාහී බවක් එක්වෙනු ඇතැයි දෙව්න්දිට සිතිණි.

"පොඩි පුද්ගලික ප්‍රශ්නයක් නිසා..." යනුවෙන් ඇය පිළිතුරු දුන්නේ එබැවිනි.

"ඒ වුණාට මෙහාට එව්ව ඇප්ලිකේෂන් එකේ ඔයා එහෙම දෙයක් ගැන ලියල තිබුණෙ නැහැනෙ..."

ධනුෂ්ක පැවසුවේ ඇයට චෝදනා කරන්නාක් බඳුවය. මාධවී ද එය අනුමත කරමින් හිස සැලුවාය. දෙව්න්දිගේ සිතට අමනාපයක් ඇති වූයේ ඇගේ එම ක්‍රියාව නිසාය.

"මම ඒ ඇප්ලිකේෂන් එක එව්වෙ හවුස් කීපර් පෝස්ට් එකකට මිසක් පත්තර කන්තෝරුවකට නෙමෙයිනෙ... ඒකට අදාළ සුදුසුකම් විතරයි මම ඇප්ලිකේෂන් එකේ ලිව්වෙ..." දෙව්න්දි කියද්දී මාධවී යටි තොල සපා ගත්තාය.

"දැන් ඔය කතාව වැඩක් නෑ දෙව්න්දි... ඔයා ගිහින් තේ හදන්න..."

සුරියකාන්ත මහතා පැවසුවේය. "ඔයා අර උදේ තේ වලට හදල තිබුණු කේක් එක තව ඉතුරු වෙලා තියෙනව නම් ඒකෙනුත් කෑල්ලක් ගේන්න... ඒක හරි රසයි..."

වදයකින් ගැලවුණෙක් මෙන් සැනසුම් සුසුමක් හෙළූ දෙව්න්දි වහා කුස්සියට ගියාය. ඇය විදුලි කේතලය ක්‍රියාත්මක කොට සේප්පුවෙන් ගත් කේක් එක කැබලිවලට කපන්නට වූවාය.

"දෙව්න්දි..." ධනුෂ්කගේ කටහඬ ඇය සමීපයෙන්ම නැඟී ආවේය. තිගැස්සුණු ඇය අතින් පිහිය බිම අත හැරිණි.



ඇය තමා අබියසම සිටගෙන සිටින ධනුෂ්ක දෙස බැලුවේ විමතියෙනි. ඔහුගේ මුහුණේ වූයේ අර පුරුදු කෝපස් වී බව නොව සුහද බවකි. එවන් සුහද බැල්මක් ඇය ඔහුගෙන් බලාපොරොත්තු නොවූවා පමණක් නොව ඔහු කුස්සියට පැමිණීම ද ඇයට අදහාගත නොහැකි දෙයක් විය. යම් කිසිවක් අවශ්‍ය වූ විට සීනුව නාද කරනු විනා මෙසේ කුස්සියට පැමිණීමේ සිරිතක් ඔහු තුළ නොවීය. මාධවී කතා කළ විලාසය පිළිබඳව සිය කණගාටුව ප්‍රකාශ කිරීමට ඔහු පැමිණියේ යයි හැඟීම ඇයට දැනිණි.

"ඇයි සර්...?"

දෙව්න්දි සෙමින් විමසුවාය. ඔහු තවත් පියවරකින් දෙකකින් ඇය වෙතට ළං විය. දෙව්න්දිගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය. සිතට දැනුණු චකිතය සමනය කර ගනු රිසියෙන් ඇය බිමට නැඹුරු වී මොහොතකට පෙර අත හැරුණු පිහිය අතට ගත්තාය. ටිෂු කඩදාසියකින් පිහිය පිසදා ඇය නැවතත් කේක් එක කපන්නට පටන් ගත්තේ සැලෙන ඇඟිලි වලින් යුතුවය.

"අප්පච්චිට විතරක් නෙමෙයි මටත් කේක් කෑල්ලක් ඕන කියන්න මං ආවෙ..." ධනුෂ්ක සන්සුන් හඬින් පැවසුවේය.

"ඒකට ඉතින් කුස්සියට එන්න ඕන නෑනෙ... මම එතන ඉද්දිම කිව්ව නම් ඉවරනෙ..." කියන්නට සිතට නැඟුණ ද දෙව්න්දි එවදන් මුව තුළම ගුලි කර ගත්තාය.

"හොඳයි සර්..."

ඇය කැපූ කේක් කැබලි පිළිවෙලකට තබමින

www.sinhalaelibrary.com

ඇසිරුවාය. ඔහු තවත් යමක් කියන්නට මුව විවර කරද්දීම කුණාටුවක් මෙන් කුස්සිය තුළට කඩා වැදුණේ මාධවීය. ඇගේ මුහුණ පෙර තිබුණාටත් වඩා කෝපයකින් පුපුරු ගසමින් තිබෙනු දේවින්දිට පෙනිණි. එහෙත් ඇගේ සිතේ බියක් හෝ චකිතයක් ඇති වූයේ නැත.

"මොනවා කරනව ද ධනුෂ්ක ඔයා කුස්සියට වෙලා...?"

ඇගේ රළු නොඉවසිලිමත් කටහඬ කුස්සිය පුරා දෝංකාර දුන්නේය. දේවින්දි ඇය ගණනකටවත් නොගෙන තේ ට්‍රොලිය සකස් කරන්නට වූවාය.

"අපේ ගෙදර කුස්සියෙ ඉන්න මට තහනමක් නැහැනෙ..."

ධනුෂ්ක මාධවී දෙස බලා සිනාවක් පෑවේය. එහෙත් ඇගේ මුහුණ අසලකටවත් සිනාවක් නොවීය.

"මම මේ හැම තැනම හොයල බැරිම තැන කුස්සියට ආවෙ... මෙක පුදුම විදියෙ කෝළමක් වුණානෙ... හාම්පුත්තු එන්න ඕන වැඩකාරයන්ගෙ දෙපතුළට..."

ඇය වචන වලින් දමා ගැසුවේ දේවින්දිටය.

"බොරුවට කෑ නොගහ ඉන්න මාධවී... ඔයා මොනවට ද මාව හෙව්වෙ...?"

ධනුෂ්ක විමසුවේ උදහස් හඬිනි. මාධවී තවත් කෝප වූවාට කිසිදු සැකයක් නැත.

"මට ඕනකමකට හෙව්වා නෙමෙයි. මාමට ඕනෙලු අද එළියෙ ඉඳගෙන තේ බොන්න... එයාව එළියට එක්කරගෙන



යන්න කතා කළේ..."

ඇගේ කටහඬෙහි කිසිදු නෙහමනයක් නොවිණි. දේවින්දි ඇය දෙස නොබලාම සීනි බඳුන, කිරි බඳුන හා කෝප්ප ආදිය ට්‍රොලියේ තැන්පත් කළාය.

"ඒක හොඳයි... අප්පච්චිට වැඩිය එළි පහළියෙ ඇවිදෙන්න හම්බ වෙන්නෙත් නැහැනෙ... දේවින්දි එහෙනම් තේ අරගෙන එන්න මිදුලට..." ධනුෂ්ක එසේ කියමින් කුස්සියෙන් පිටතට ගියේය. දේවින්දිගේ මුවට සිනාවක් නැඟුණේ ධනුෂ්ක කළ ප්‍රකාශයටය. ඔහු සිතන්නේ සූරියතැන්න මහතා දිගින් දිගටම ඔහුගේ කාර්යාල කාමරය තුළම රැඳී සිටින බවකි. එහෙත් ගෙවුණු හැම දිනකදීම දේවින්දි ඔහු එළිමහනට කැඳවූව ගියාය. පියතිලක ඊට එරෙහිව කතා කළද සූරියතැන්න මහතා මෙන්ම දේවින්දි ද එය ගණනකට ගත්තේ නැත. ඔහු එළිමහනේ ගැවසීම පිළිබඳව වඩාත් සතුටු වූයේ හීන් බණ්ඩාය. ඔහු විසින් සිටුවන ලද අලුත්ම මල් පාත්තියක් හෝ අලුතින් මල් පිපුණු ගසක් සූරියතැන්න මහතාට පෙන්වීමෙන් හීන් බණ්ඩා ලද්දේ අපූරු සතුටකි. එහෙත් පියාගේ දින චරියාව වෙනස් වීම පිළිබඳව ධනුෂ්ක කිසිවක් නොදන සිටි බව ඔහුගේ වදන් වලින් ඇයට වැටහිණි.

මාධවී ධනුෂ්ක අනුව පිට වී නොයා කුස්සියේම රැඳුණාය. ඇය යම් කිසි ගැටුමකට අර අඳින බව දේවින්දිට දැනිණි.

"දේවින්දි මෙහෙ බලනවා..."

ඇය වතුර කේතලය උතුරන තුරු එදෙස බලා සිටියදී මාධවී අණ කළාය. එබඳු අණ කිරීම්වලට දේවින්දි කිසියේත්ම

www.sinhalalibrary.com

පුරුදුව සිටියේ නැත. අනෙක් අතට මාධවී වැනි අහංකාර කැහැත්තියකගේ අණ කිරීම් වලට කීකරු වෙන්නට ඇයට කිසිසේත්ම අවශ්‍ය වූයේත් නැත. දේවින්දි වගකට නැතිව සිටියදී එතැනට පැමිණි මාධවී ඇගේ දෙඋරහිස් අල්ලා තමා වෙතට හරවා ගත්තාය.

"දේවින්දි... මම තමුසෙට අවවාදයක් දෙන්නයි යන්නෙ..."

මාධවී කියද්දී දේවින්දි ඇගේ දෑත සිය දෙඋරහිසින් ගිලිහෙන ආකාරයට පසෙකට වූවාය. මාධවීගේ මුහුණ කෝපයෙන් කළු පැහැ ගැන්වී තිබිණි.

"මිස් මාධවී මම තේ අරගෙන එනකම් ඔයා කරුණා කරල එළියට යන්න... මට කාගෙවත් අවවාද ඕන වෙයි කියල මම හිතන්නෙ නෑ..."

දේවින්දි තේ කොළ දුඹු බඳුනට උතුරන වතුර එක් කොට හැන්දකින් කළවම් කළාය.

"දේවින්දි තමුසෙ කාට කියල හිතාගෙන ද කතා කරන්නෙ...?"

මාධවී විමසුවේ වඩාත් කෝපයෙනි.

"මෙතන වෙන කවුරුවත් නෑනෙ..." එය තමාටම එත්තු ගන්වා ගන්නට මෙන් දේවින්දි වටපිට බැලුවාය.

"දේවින්දි, මාව විහිළුවකට ගණින් ගන්න එපා... අපේ මාමට තමුසෙ වැඩ කාරියක් නෙමෙයි වුණාට තමන්ගෙ තත්වෙ මොකක්ද කියල තේරුම් ගන්නවා..."



"මම මගෙ තත්වෙ හොඳට තේරුම් අරගෙන ඉන්නෙ මිස් මාධවී... ඒ හින්දා ඒ අවවාදෙ හරියන්නෙ මට නෙමෙයි ඔයාටමයි..."

දේවින්දි කහට පෝච්චිය ට්‍රොලිය මතින් තබා ඝනකමැති පෝච්චි වැස්මෙන් එය වැසුවාය. තමාට පහර දීමට තරම් කෝපයක් මාධවී තුළ ඇති බවට ඇගේ මිට මෙළවෙන දෑත් දෙස හොරැසින් බැලූ දේවින්දිට සිතිණි.

"අපේ මාමා තමුසෙට කරුණාවෙන් සළකන කොට එක වැරදි විදියට හිතන්න එපා... එයා හැම වැඩකාරයටම සළකන්නෙ එක විදියට... තමුසෙ හිතනවා ඇති ටිකක් පොත්ත රතට තියෙන හින්දා හැමෝම රැවටිලා කියලා... මාමා එච්චර මෝඩ නෑ..."

"මිස් මාධවී මගෙත් ඉවසීමේ සීමාවක් තියෙනවා... ඒක පැන්නට පස්සෙ මං කොයි විදියට හැසිරෙයි ද කියල කියන්න බෑ... ඒ හින්දා ඔයාගෙ මහන්තත්තකම තියාගෙන කරුණා කරල එළියට යන්න..."

දේවින්දි එවර පැවසුවේ කෝපයෙනි. මාධවී දත්මිටි කමින් පියවරක් දෙකක් ඉදිරියට පැමිණියාය. එමොහොතේ දේවින්දි ගේ සිතේ තිබුණේ පහර දුන්නොත් පහර දෙන බවට හැඟීමකි.

"තමුසෙ කොහොමද මාව එළවන්නෙ...? හෙට අනිද්දා වෙනකොට මේ ගෙදර අයිතිකාරි වෙන්නෙ මම... එතකොට තමුසෙලාට ඕන ඕන විදියට හටින්න ලැබෙන එකක් නෑ... කොහොමටත් තමුසෙ වගෙ කෙනෙක්ව මම තියා ගන්නෙත් නෑ..."

"හැබැයි ඔයා මෙහෙ අයිතිකාරි වුණේ නැහැනෙ... අනිත් එක ඔයා වගේ කෙනෙක් එක්ක මම කොහොමවත්ම වැඩ කරන්නෙත් නැහැ..."

ඇය නොතකා හැර තේ ට්‍රොලිය එළියට තල්ලු කර ගෙන යමින් දෙවින්දි පැවසුවාය. තමාට පහර දීමේ නොඉවසිල්ලෙන් මාධවීගේ දැත් කකියනු ඇතැයි දෙවින්දිට සිතිණි.

"තමුසෙ පත්තරේක වැඩ කෙරුවා කිව්වටවත් මාමගෙ පොතක් ට්‍රාන්ස්ලේට් කළා කිව්වටවත් මාව රවට්ටන්න ලැබෙන්නෙ නැහැ... තේරුණා ද දෙවින්දි...? එච්චර දේවල් කරන්න පුළුවන්කමක් තියෙනවා නම් මොකටද ගෙදරක කුස්සියෙ වැඩට එන්නෙ...? අර පියතිලක කියනවා වාගෙ එක්කෝ තමුසෙ මහ බොරු කාරියෙක්... එහෙම නැත්නම් හොර කල්ලියක ඔත්තු කාරියෙක්... මම මාමට කියල දෙන්නම්කො ඔච්චර ජෝරම..."

මාධවී දෙවින්දි පියමං කොට අහංකාර ගමනින් යන්නට ගියාය. දෙවින්දිගේ සිතට කහස්සල්ලක් දනෙමින් තිබිණි. මෙතෙක් ඇය මෙහි ගෙවූයේ සාමකාමී ජීවිතයකි. කිසිවෙකු සමග ගැටුම් ඇති කර ගැනීම ඇයට ප්‍රිය නොවීය. එහෙත් ඇය මාධවී සමග එකටෙක කීවේ අසාධාරණ ලෙස කතා කිරීම නිසාය.

"මොන හිත්තක් අවුලවයි ද දන්නෙ නෑ..." දෙවින්දි එතැනම සිටගෙන කල්පනා කළාය.



8

මාධවී තමා පිළිබඳව සූරියතැන්න මහතාට සහ ධනුෂ්කට පැමිණිලි කර ඇද්දැයි බිය දෙවින්දිගේ සිතේ හට ගත්තේය. ඔවුන් කිසිදු වෙනසක් නොපෙන්වා කතා බහ කිරීම සිතට සැනසිල්ලක් උදා කළ ද කොයි මොහොතක හෝ ඇය පැමිණිලි නොකරනු ඇතැයි සිතන්නට තරම් සාධකයක් ඇයට නොවීය.

දෙවින්දි සූරියතැන්න මහතාට සහ ධනුෂ්කට කෑම මේසය සූදානම් කළේ උදැසනමය. එහෙත් කෑම මේසයට පැමිණියේ සූරියතැන්න මහතා පමණකි.

"සොරි දෙවින්දි... ඊයේ රෑ කියන්න බැරි වුණානෙ උදේ කෑම ඕනෙ මට විතරයි කියලා..."

කෑම මේසය හාත්පස සිසාරා බැලූ සූරියතැන්න මහතා මඳ සිනාවකින් යුතුව දෙවින්දි දෙස බැලුවේය.

www.sinhalaelibrary.com

"ඇයි සර්, ධනුෂ්ක සර් නැද්ද...?"

"එයා උදේම කොළඹ ගියා මාධවීත් එක්ක..."

ඔහු කියද්දී දේවින්දි තිගැස්සුණාය. සැබැවින්ම ඇයට එසේ තිගැස්සෙන්නට හේතුවක් තිබුණේ නැත. ධනුෂ්ක යනු ඇගේ හාම්පුතාය. මාධවී ඔහුගේ මනාලිය වීමට නියමිතව සිටින තැනැත්තියයි. එසේම දේවින්දිත් ධනුෂ්කත් අතර කිසිම දවසක ලෙන්ගතු කතා බහක් ඇති වී තිබුණේ නැත. එහෙත් ඔහු මාධවීත් සමග දකින්නට ඇය කැමති වූයේම නැත. මාධවීගේ කුරිරු හැසිරීම එයට එක් හේතුවක් වන්නට ඇතැයි දේවින්දි සිතුවාය.

පියතිලක ලියුම් කිහිපයක් ද රැගෙන කැම කාමරයට ඇතුළු විය. ඔහු දුටු විගසම සූරියතැන්න මහතාගේ මුහුණ වෙනස් විය.

"පියතිලකට මම හැමදාම කියල තියෙනවා නේද මං කැම කන වෙලාවට ලියුම් ගේන්න එපයි කියලා... ඔය ටික අරගෙන ගිහින් ඔෆිස් රූම් එකේ තියනවා... මම කාල ඉවර වෙලා ඇවිත් බලන්නම්..."

සූරියතැන්න මහතා කතා කළේ රළු හඬිනි. ඔහු එවන් ස්වරයකින් කතා කරනු දේවින්දි මින් පෙර කිසිදු දිනෙක අසා තිබුණේ නැත. ඇය ද ඔහු අබියසින් අඩියක් දෙකක් මෑතට වූණාය.

"මට සමාවෙන්න බණ්ඩාර හාමුදුරුවනේ... මං හිතුවා පුංචි බණ්ඩාර හාමුදුරුවොත් නැති නිසා කන ගමන් ලියුම් ටික බලන්න කැමති වෙයි කියලා... අනික් එක අර බණ්ඩාර හාමුදුරුවෝ කාලයක් තිස්සෙ බලාගෙන හිටපු ලියුමක් ඇවිල්ලා තියෙනවා..."

තව දුරටත් මෙතැන රැඳිය යුතු නැතැයි දේවින්දිගේ සිත කීවේය. විශේෂයෙන්ම පියතිලකගේ කුරිරු බැල්මට හසු වෙමින් සිටීමට ඇය කැමති වූයේ නැත.

"එක්ස්කියුස් මී සර්..." සූරියතැන්න මහතාට පැවසූ ඇය කාමරයෙන් එළියට ගියාය.

"ඇති යන්තම් ඒ ලියුම ආවා... කැම ටිකත් කනවා පියතිලක... දේවින්දි පුතා කොළඹ ගිය බව දන්නෙ නැතුව එයාටත් එක්කමයි කැම හදල තියෙන්නෙ..."

සූරියතැන්න මහතා පවසනු දේවින්දිට ඇසිණි. එවර ඔහුගේ කටහඬට සන්සුන් බවක් එක් වී තිබිණි. ඔහු එසේ පියතිලකගේ සිත සැනසවීම පිළිබඳව දේවින්දිට දැනුණේ සතුටකි. එසේ නොමැති නම් බුම්මා ගත් වනම සිටින පියතිලක නිවසේ සේවකයන්ගේ වැරදි වැඩියෙන් සොයන්නට පෙලඹෙයි. එය දේවින්දිගේ සිතට වදයකි.

ඇය උඩුමහලට නැගුණාය. කාමර පිරිසිදු කරමින් සිටි රන්මැණිකා ඇය දෙස බලා යටහත් පහත් අයුරින් සිනාසුණාය.

"උඩ කාමර ටික නම් අස්පස් කරල ඉවරයි නෝනා... පල්ලෙහා අස් කරන්ට බණ්ඩාර හාමුදුරුවෝ කෑම කාලා ඉවර වෙනකං ඉන්ට එපායැ නේද...?"

"ඔව්. රන්මැණිකත් කුස්සියට එන්නකො තේ ටිකක් බොන්න... කෝ සීලත් ආවද...?"

www.sinhalaelibrary.com

"ශීලා රෙදි හෝදනවා..."

නිවසේ සියලුම රෙදි සෝදන්නේත් හා මදින්නේත් ශීලා විසිනි. ඇය ද රන්මැණිකා මෙන්ම දිගු කාලයක් තිස්සේ සූරියතැන්න වලව්වට සේවය කරන ගමේ කාන්තාවකි. ඔවුන් දෙදෙනාම දේවින්දිට බෙහෙවින් ලෙන්ගතුය. සිය වැඩ කටයුතු අවසන් වූ පසු ඇයට උයන්නට උදව් කරන්නට ද ඔවුහු නොපැකිළව ඉදිරිපත් වූහ.

"ඇස්වහක් කටවහක් නෑ... දේවින්දි නෝනට හොඳට අත් ගුණේ තියෙනවා. මෙච්චර වයසට ගිය අපට බැහැ නෝනට තරම් රහට උයන්ට..."

ඇතැම් විටෙක ඔවුන් පැවසුවේ අවංකවමය. දේවින්දි නිහතමානීව එම ප්‍රශංසා පිළිගත්තාය. එහෙත් ඔවුන් ගම පුරාම එවන් කතා පතුරුවා ඇතැයි දේවින්දිට සිතුණේ ඇය ගමේ ඇවිදින විට බොහෝ දෙනෙකු ගෞරවයකින් මෙන්ම විස්මයකින් ද යුතුව ඇය දෙස බලන්නට වූ නිසාය.

දේවින්දි රන් මැණිකාත් සමග කුස්සියට යන විට කුස්සියට ඇල්ලූ කුඩා කාමරයේ තිබෙන රෙදි සෝදන යන්ත්‍රය ක්‍රියාත්මකව පැවතිණි. ශීලා පෙරදා සෝදන ලද රෙදි මදිමින් සිටියාය. එවන් කටයුතු තමා පිට නොපැවරීම මොන තරම් දෙයක්දැයි දේවින්දි සිතුවාය. රෙදි සේදීම මෙන්ම මැදීම ද ඇය ප්‍රිය කළේ නැත. බෝඩිම්වල සිටියදී අකමැත්තෙන් ඇඳුම් සෝදා ගත්ත ද ඒවා මැද දෙන ලද්දේ යෙහෙළියන් විසිනි. නිවසේදී නම් අයියා හෝ අප්පච්චි විසිනි. කලාතුරකින් අක්කා මැද්ද ද ඒවයේ අඩ තරම් පිළිවෙලක් නොවිණි.



"ඇවිත් තේ බීලා ඉන්න ශීලා..."

ඇය යන්ත්‍රයකින් මෙන් රෙදි මදින ආකාරය දෙස මොහොතක් බලා සිටි දේවින්දි පැවසුවාය.

"නෝනා තේ බිව්වයැ..." ශීලා විමසුවේ විදුලි ඉස්ත්‍රික්කය නිවා දමමිනි.

"එන්න... අපි තුන් දෙනාම එකට බොමුකෝ..."

"කාට හරි ඇහුණොත් එහෙම කියයි නෝනා අපිට කතා කරන්නෙ අරක්කු බොන්ට කියලා..."

රන්මැණිකා පැවසුවේ දේවින්දිගේ දෙතොලට ද සිනාවක් නංවමිනි.

"මට පෙන්නන්න බැරි ජරාවක් තමයි අරක්කු..." ඇය පැවසුවේ මුහුණ ඇඹුල් කොට ගෙනය.

"අපේ මිනිහගෙත් ඔය ගිනි වතුර බීම හින්දනෙ නෝනා අපිට වගතුවක් නැත්තෙ.. ඒ මිනිහා හම්බ කරන හැම සතයක්ම බීලා නාස්ති කරනවා.. යන්තං ඉහ ගහගෙන ඉන්නෙ වලව්වෙන් කීයක් හරි හම්බ වෙන හින්දා... නැත්තං ඉතින් මටයි කොලු පැටව් ටිකටයි හිගා කන්ට තමයි වෙන්නෙ..."

ශීලා ආවේගකාරී හඬකින් කියාගෙන ගියාය. ඇයට දරුවන් තිදෙනෙකි. සැමියා බීමතින් පැමිණිය ද කිසිම දිනයක ඇයටවත් දරුවන්ටවත් හිරිහැර නොකරන බව දේවින්දි දැන ගත්තේ ශීලාගෙන්මය. පුවත්පතේ සේවය කරද්දී ඇය පිරිමින්ගේ මත්පැන් පානය කාන්තාවන්ට බලපාන ආකාරය

www.sinhalaelibrary.com

පිළිබඳව කොතෙකුත් ලිපි ලිව්වාය. ඒ ගැන අධ්‍යයනය කළාය. මත් ද්‍රව්‍ය වලට එරෙහිව කටයුතු කරන සංවිධාන වලින් ඇයට ලොකු සහයෝගයක් ලැබිණි. අධිකව මත්පැන් පානයට පෙළඹී සිටි පිරිමි කිහිප දෙනෙක්ම පුනරුත්ථාපනය සඳහා එම ආයතන වලට යොමු කිරීමට දේවින්දි කටයුතු කළාය. ශීලාගේ සැමියා ද එසේ යැවිය හැකි නම් බොහෝ දුක් ගැහැට වලින් ශීලාට ගැලවුමක් ලැබෙතැයි දේවින්දිට සිතිණි.

"අද පුංචි බණ්ඩාර හාමුදුරුවො කොළඹ ගියාලු නේද නෝනා...?"

කුස්සියේ වූ දිග බංකුවේ වාඩි වන ගමන් රන් මැණිකා විමසුවේ වටපිට බලමිනි. දේවින්දිට පුදුම සිතිණි. නිවසේ සිටින තමාවත් නොදන්නා දේවල් ගමේ ගැහැණුන් සොයාගෙන ඇතැයි ඇය කල්පනා කළාය.

"කවුද රන්මැණිකට කිව්වෙ...? හීන් බණ්ඩ ද...?"

දේවින්දි සිනාසෙමින් ඇසුවත් ඇගේ සිත තුළ තිබුණේ කහටක් බඳු හැඟීමකි.

"අනේ නෑ. ඒ මනුස්සයා දන්නෙවත් නෑ. මට කිව්වෙ ලියන මහත්තයා..."

"එයාටත් මීන නැති කෙහෙම්මලක් නෑ..."

දේවින්දි කෙඳිරුවේ ඔහුනට නැගෙන ආකාරයටය.

"ඇයි බං උඹ දන්නෙ නැද්ද...? පුංචි බණ්ඩාර හාමුදුරුවො කොළඹ ගියෙ ඩිංගිරි හාමුදුරුවොත් එක්කනෙ... මං හිතන්නෙ මුදු හදවන්ට දෙන්ට යන්ට ඇති..."



ශීලා පැවසුවාය. දේවින්දිට දැනුණේ සිය හද ගැස්ම එක් වරම නැවතුණාක් මෙනි. ශීලාටත් රන්මැණිකාටත් තේ සාදමින් සිටි ඇය වහා එය නතර කොට ශීලා දෙස බැලුවාය.

"මුදු හදවන්න...? ඒ කාටද...?"

ඇය ඇසුවේ සිය කට හඬෙහි වෙනස සඟවාලන්නට වෑයම් කරමිනි.

"ඇයි නෝනා දන්නෙ නැද්ද...? ඒ දෙන්නනෙ බඳින්ට ඉන්නෙ... ඩිංගිරි හාමුදුරුවන්ගෙ පැත්තෙන් වද කරනවලු ඉක්මනටම මඟුල ගන්ට කියලා... පුංචි බණ්ඩාර හාමුදුරුවන්ගෙ නම් එච්චර ඕනකමක් නෑ වාගෙ පේන්නෙ..."

"අපිට මීන නෑ ශීලා අනුන්ගෙ දේවල්... අපි අපේ පාඩුවෙ රස්සාව කරගෙන ඉමු..."

දේවින්දි පැවසුවේ ඒ කතාව තව දුරටත් අසාගෙන ඉන්නට තිබූ අකැමැත්ත නිසාය. තමා වැරදි යමක් කීවේදැයි හැඟීම නිසා ශීලාගේ මුහුණ වෙනස් වී යනු ඇයට පෙනිණි.

"හැබැයි ඉතින් ඒ මඟුලෙන් පස්සෙ නම් අපට පාඩුවෙ රස්සාව කරන්න ලැබෙන එකක් නෑ නෝනා..."

රන්මැණිකා පැවසුවේ ශීලා අස්වසනු රිසියෙන් විය යුතුය. එහෙත් මාධවී සමඟ මෙහි සිටීම පහසු නොවන බව දේවින්දි ද දැන සිටියාය.

"එතකොට නම් මමත් මෙහෙ ඉන්නෙ නෑ තමයි..." දේවින්දි තමාටම මුමුණා ගත්තාය.

www.sinhalaelibrary.com

දේවින්දි උදෑසන වැඩ කොටස අවසන් කළේ වෙනදා මෙන් උනන්දුවෙන් හේ ආශාවෙන් නොවේ. තමා මෙතරම් කැලඹී සිටින්නේ කුමන හේතුවකට දැයි විටෙක ඇයටම පැහැදිලි නොවීය. එහෙත් මඳක් ගැඹුරින් කල්පනා කොට බලද්දී ධනුෂ්ක මාධවීත් සමග මුදු සාදවන්නට ගිය පුවත විසින් සිය සිත සසල කොට ඇතැයි ඇයට වැටහිණි.

"ධනුෂ්ක කියන්නෙ මගෙ හාමි පුතා... එයා එන්ගේජ් වෙන්න යනවා කියන එක මම මොනවට ද ප්‍රශ්නයක් කර ගන්නෙ..? අනික් එක මෙතන ඉන්න අනික් සර්වන්ට්ස්ලා මට සර්වන්ට් කෙනෙකුට වගේ සලකන්නෙ නැති එක ඇත්ත. ඒත් හාම්පුතාලා කවදාවත් හිතන්නෙ නෑ එහෙම රජ්ජාව කරන්න බෑ කියලා ගිහුණ වෙලාවට ආපහු යන එකයි තියෙන්නෙ බොරුවට දුක් වෙවී ඉන්නෙ නැතුව..." දේවින්දි තමාටම අවවාද රැසක් දී ගත්තාය. එහෙත් කෝසලගෙන් වෙන්වූ දිනයේවත් නොදැනුණු අන්දමේ හුදෙකලා බවක් සිතේ අඩුවක්, වේදනාවක් ඇයට දැනෙන්නට විය. ඇයට සාගරීගෙන් දුරකථන ඇමතුමක් ලැබුණේ එලෙස නොසන්සුන්තාවෙන් පසු වෙද්දීය.

"අපිම ඉතින් ඔයාලට කතා කරන්න ඕන..."

සාගරී කතාව ඇරඹුවේ නෝක්කාඩුවකිනි.

"ගෙවල්වල ඉන්න ඔයාලට වගේ අනුන්ගෙ ගෙවල්වල ඉන්න අපිට නිදහසක් නැහෙ සාගරී..."

"හරි හරි ඉතින්... ඔක ඔය තරම් සිරා ගන්න එපා... මම කිව්වෙ විහිළුවට... ඒක නෙමෙයි අද ඔයාගෙ දෙබොස් ගෙදර නෑ නේද...?"



"දෙබොස්...?" දේවින්දි විමසුවේ කුතුහලයෙනි.

"ඔව්, ධනුෂ්ක..." සාගරී සිනාසුණාය.

"ඉතින් එයාට මොකද දෙබොස් කියලා කියන්නෙ...?"

"කොළඹ හිටිය මිනිස්සුන්ටත් ඔච්චර තේරෙන්නෙ නැද්ද...? බොස්ගෙ පුතා ඒ කියන්නෙ ඔයාගෙ දෙවෙනි බොස් කියනවට වඩා දෙබොස් කියන එක ලේසිනෙ..." සාගරී හඬ නගා සිනාසුණාය.

"මේ කෙල්ල කියන පිස්සු කතා..."

දේවින්දි ද ඇය හා එක්ව සිනාසුණාය. ඇගේ සිතේ තිබුණු බර ගතියෙන් හරි අඩක්ම ඒ සිනාවත් සමගම අඩු වී ගියේය.

"ඉතින් මොකද මේ හදිස්සියෙම මට කතා කළේ...?"

"දෙබොස් ගෙදර නැති හින්දා අද හවස් වරුව ඔයාට නිවාඩු ද කියලා අහන්න..."

දේවින්දිට පුදුම සිතුණේ වලව්වේ වැඩට එන රන්මැණිකා, සීලා පමණක් නොව ගමේ මිනිසුන් පවා වලව්වේ සිදුවන දේවල් පිළිබඳව ඇස ගසාගෙන සිටීමය. ගම්වල ස්වභාවය එය බව පසුව ඇයට වැටහිණ. ගම් වැසියන් එකිනෙකාට ලෙන්ගතුය. එහෙත් ඊර්ෂ්‍යාව, වෛරය වැනි සිතුවිලින් ඒ ලෙන්ගතුකම සමගම වැඩෙයි. එකිනෙකා පිළිබඳව ඕපා දූප පතුරුවන්නේ රණ්ඩු දබර කරන්නේ ඒ නිසාය. ඇසුරු නොකොට ඔවුන් තේරුම් ගැනීම පහසු නොවේ යැයි දේවින්දි සිතුවාය.

www.sinhalaelibrary.com

"ඇයි දේවින්දි කල්පනා කරන්නෙ...?"

"මං විශේෂ දෙයක් නම් කල්පනා කෙරුවෙ නෑ... ඒත් මට අදත් නිවාඩු තියෙන්නෙ පුරුදු පැය දෙක විතරයි.."

"ඒ කියන්නෙ ලන්ච්වල ඉඳල ටී ටයිම වෙනකම්..."

"ඔව්..."

"මෙකයි දේවින්දි... අපේ අයියා නිවාඩුවට ගෙදර ආවනෙ... මේ සැරේ එයාගෙ යාළුවෙකුත් ඇවිත් ඉන්නවා... එයාල ආසයි ඔයාව බලන්න... ඒත් අපිට ඔහෙ එන්න පුළුවන් කමක් නැනෙ..."

"තොකියා කියන්නෙ මට ඔයාලගෙ ගෙදර එන්න කියලනෙ..." දේවින්දි සැහැල්ලු හඬින් සිනාසුණාය.

"අනේ ඔව් දේවින්දි අයියයි මායි වලව්ව ළඟට එන්නම් ඔයාව එක්කන් යන්න..."

සාගරී යෝජනා කළේ බලවත් උනන්දුවෙනි.

"අනේ මේ, මං එහෙම ඔච්චර සම්බන්ධ කරගන්න එපා..." සාගරීගේ පසුබිමින් ගැඹුරු පිරිමි කටහඬක් ඇසිණි.

"ඔයා දන්නවද දේවින්දි, වලව්වට ඇවිත් ඉන්න අලුත් හවුස් කීපර් හරිම ලස්සන කෙල්ලෙක් කියල අම්මා කිව්ව වෙලාවෙ ඉඳලම මෙයා නහින්න හැදුවා ඔයාව බලන්න ඕන කියලා... දැන් මේ බොරුවට ගණන් උස්සන්න හදනවා..." සාගරී පැවසුවේ සිනාසෙමිනි.



"බොරු තොකියා ඉන්නවා ඔයි..." නැවත ද අර ගැඹුරු කටහඬ ඇසිණි.

සාගරීගේ අයියා සාගරී මෙන්ම සැහැල්ලු පැවතුම් ඇති අයෙක් යයි දේවින්දිට සිතිණි. තෝන්තුවාවෙන් ගත කොට නිකම් කාලය කා දමනවාට වඩා ඔවුන්ගේ ඇසුර ප්‍රයෝජනවත් විය හැකිය. ඇයට මේ වලව්වේ කතා කරන්නටවත් හැකි සම වයසේ අයෙක් නොවීය.

"එහෙනම් මම එනවා කියලා අයියලට කියන්නකො..." අවසානයේදී ඇය පැවසුවේ එබැවිනි.

"තැන්ක් යූ වෙරි මච් දේවින්දි... අපි එක හමාරට විතර ඔය හරියට එන්නම්... ඔයා ගේට්ටුව ළඟ ඉන්න..." සාගරී පැවසුවේ අපමණ සතුටිනි.

සාගරීගේ අයියාට තමා දකින්නට වුවමනා වී ඇත්තේ අසාමාන්‍ය අයෙකු ලෙස ඔවුන් ඇයව හඳුන්වා දී ඇති නිසා විය යුතු යයි දේවින්දි සිතුවාය. ගෘහ පාලිකා තනතුර වැනි රැකියාවක් කරන්නට, ඉංග්‍රීසියෙන් කතා බහ කළ හැකි පුවත්පතක උප කතුවරියක වශයෙන් ද සේවය කළ තමා වැනි යුවතියක ඉදිරිපත් වීම ඔවුන්ට අදහා ගන්නට නොහැකි වන්නට ඇත.

"සර් මම තව ටිකකින් සාගරීලගෙ ගෙදර ගිහින් එන්න යනවා..."

ඇය සූරියනැන්න මහතාට දිවා ආහාරය පිළි ගන්වන අතර පැවසුවාය. සූරියනැන්න මහතා ඇය දෙස බැලුවේ දෙබැම රැළි කොටගෙනය.

www.sinhalaelibrary.com

"කවුද සාගරී කියන්නෙ...?"

ඔහු විමසුවේ කල්පනාකාරී ස්වරයෙනි.

"එයාලගෙ අප්පච්චියි මේ ගමේ ඉන්න හොඳම වෙද මහත්තයා.."

සාගරී කවුදැයි හැඳින ගැනීමට දෙව්න්දි සූරියතැන්න මහතාට ඉඟියක් දුන්නාය.

"ආ... ඔය කියන්නෙ අර තෙන්නකෝන් වෙද මහත්තයගෙ දුව වෙන්න ඇති.."

"ඔව් සර්... එයාගෙ නම සාගරී තෙන්නකෝන් තමයි..."

"තෙන්නකෝන්ගෙ පුතෙකුත් හිටියා කැලුම් ද මොකක්ද කියලා.. ඉස්සර නිතර මෙහෙ ආව ගියා.. එයා අපේ පුතාගෙ හොඳ යාළුවෙක්..."

"දැන් එයා ඉන්නෙ මෙඩිකල් කොලේජ් එකේ කියලා කිව්ව සර්..."

"බලන කොට දෙව්න්දි අපටත් වැඩිය ගමේ අයගෙ තොරතුරු දන්නවනෙ..."

සූරියතැන්න මහතා සිනාසී පවසද්දී දෙව්න්දිගේ සිතට ලැජ්ජාවක් දැනිණි. ඇය බිම බලා ගත්තාය.

"ආ... මම වරදකට කිව්වා නෙමෙයි..."

සූරියතැන්න මහතා ඇගේ පිටට තට්ටු කළේය.



"තෙන්නකෝන්ල ගමේ බොහොම වැදගත් පවුලක්.. ආස්සරේට හුඟාක් හොඳයි. දෙව්න්දි ගිහින් එන්න..."

"මම තේ හදන්න එනවා සර්..."

"ඒ ගැන කරදර වෙන්න එපා. මම පියතිලකට කියන්නම් තේ හදන්න."

"නෑ... නෑ... සර් කාටවත් කරදර කරන්න ඕන නෑ. මම වෙලාවට එන්නම්කො..." දෙව්න්දි පැවසුවේ ස්ථිර හඬිනි.

සූරියතැන්න මහතාගේ මුහුණ සිනාවකින් විකසිත විය. ඔහු අන් අයෙකු විසින් සාදන ලද තේ බොන්නට ප්‍රිය කළේ නැත.

විස්කෝස් රෙද්දෙන් නිම කරන ලද සැහැල්ලු කලිසමකින් සහ කමිසයකින් සැරසුණු දෙව්න්දි හරියටම එක හමාර වෙද්දී ගේට්ටුවෙන් පිටතට පැමිණියාය. සාගරී සහ කැලුම් එතැනට පැමිණියේ ඒ සමගමය.

"අපි වෙලාව නොවරදවා වැඩ කරන මිනිස්සු..."

සාගරී පැවසුවේ සිනාසෙමිනි. ඇය හා සිනාසුණු දෙව්න්දි කැලුම් දෙස හොඳින් බැලුවාය. ඔහු සාගරීට වඩා මඳක් පැහැයෙන් අඩුය. එහෙත් කඩවසම්ය. ඕනෑම යුවතියකගේ නෙත් සිත් සැණෙකින් බැඳ ගන්නට තරම් පෞරුෂයක් ඔහුගේ මුහුණේ තිබිණි. ඔහු ඇය හා සිනාසුණේ දිගු කාලයක සිට හඳුනන අයෙකු දුටු විට මෙනි.

"අයි සේ නංගි මෙයා ද දෙව්න්දි...?"

www.sinhalaelibrary.com

කැලුම් විමසුවේ හිස මත අත තබාගෙනය. සාගරි මෙන්ම දෙව්න්දි ද ඔහු දෙස බැලුවේ විස්මයෙන් යුතුවය.

"දෙව්න්දිට මාව මතක නෑ නේද ?"

ඔහු මනැකමින් ඇය දෙස බලා විමසුවේය. එහෙත් දුටු පුරුදු බවක් නොවීය.

"මනු... මට මතක නෑ..." ඇය හිස සැලුවාය.

"මෙයා කියන දේවල් නියපොත්තෙන් උඩට ගණින් ගන්න එපා දෙව්න්දි. මොකක් හරි බොරුවක් කියල කෙල්ලන්ගෙ හිත් දිනා ගන්න මෙයා හරිම දක්ෂයි..."

සාගරි පැවසුවේ සොහොයුරාගේ පිටට ද පහරක් ගසමිනි.

"මේක නම් බොරුවක් නෙමෙයි. අමුලික ඇත්ත. මෙයාලා ඔය වලව්වත් සල්ලිවලට ගන්න පුළුවන් තරම් සල්ලි කාරයො නංගි... මට පුදුම මොකද මෙයා මේ වගේ රස්සාවකට ආවෙ කියන එක..."

"විහිළු කරන්න එපා කැලුම්... අපි සල්ලි කාරයො නම් ආස්සාවල් කරනවයෑ..."

දෙව්න්දි පැවසුවේ සාගරිගේ මුහුණේ සැකයක් හා විස්මයක් උදා වෙනු දුටු බැවිනි.

"හරි ඔයා කවුද කියන එක මම තව ටිකකින් නංගිටත් ඔප්පු කරලා පෙන්නන්නම්කො. මට හිතෙන්නෙ මෙයා ගෙදරින් තරහ වෙලයි මෙහාට ආවෙ කියලා..."



"මිස්සු... මම මොනවට ද ගෙදරින් තරහ වෙන්නෙ...? මාව ගෙනත් ඇරලුවෙත් අප්පච්චිනෙ..."

දෙව්න්දි එවර නවත් හොඳින් කැලුම් දෙස බලමින් සැවසුවාය. එහෙත් ඔහු දුන පුරුදු මතකයක් ඇයට නොවීය. හෝටලයේදීත් කලින් සේවය කළ පුවත්පත් ආයතනයේදීත් මග තොටදීත් ඇයට නොයෙකුත් අය හමු වී තිබිණි. එහෙත් ඒ සියල්ලන්ගේම මුහුණු දුන් ඇයට සිහිපත් කර ගැනීමට අසීරුය.

"මම කොළඹ ගිය ගමනේ දුමින්දුගෙන් අහන්නම්කො මොකටද නංගි මෙහෙ ආවෙ කියලා..."

කැලුම් කියද්දී දෙව්න්දි තොල සපා ගත්තාය. කැලුම් තම සොහොයුරාගේ මිතුරෙකු විය යුතු යයි ඇයට සිතිණි.

ඔහු තමා හඳුනන්නේ කෙසේදැයි දැන ගන්නට දෙව්න්දි කොහෙතුත් උත්සාහ දැරුවාය. එහෙත් ඔහු තුමක් හෝ විහිළුවක් කරමින් මග හැරියේය. ඔවුන් සාගරිගේ නිවසට ඇතුළු වෙද්දීම ඉදිරිපස කාමරයේ සිටි අයෙක් කමිසයේ බොත්තම් පියවමින් ඉදිරියට පැමිණියේය. දෙව්න්දි දකිත්ම ඔහුගේ මුහුණෙහි විස්මයක ලකුණු උදා විය. අඩියට දෙකට පැමිණි ඔහු දෙව්න්දි ගේ දෙඋරහිසට දෑත් තැබීය.

"චූටි නංගී, ඔයා කොහෙද මෙහෙ...?"

"බුද්ධි අයියා..."

මවිතයට පත් දෙව්න්දි කෑ ගසමින් ඔහුගේ අතින් අල්ලා ගත්තාය. සාගරි පමණක් නොව ඇගේ මව්පියන් ද එදෙස බලා සිටියේ මවිතයෙනි. එහෙත් කැලුම් ගේ මුහුණ පමණක්

වෙනස් නොවී එලෙසම තිබිණි. ඒ ඔහු මෙවැන්නක් බලාපොරොත්තු වූ නිසා විය යුතුය.

"බුද්ධි අයියා මෙහෙ කොහෙද...?"

දේවින්දි විමසුවේ සතුටින් සිනාසෙමිනි. සිය පෙම්වතා වන බුද්ධික සමඟ දේවින්දි මෙතරම් නිදහසේ හැසිරීම සාගරීගේ සිතට දැනුණේ නොමනාපයකි. ඇගේ මුහුණ වෙනස් වී ගියේය.

"මං අහපු ප්‍රශ්නෙම මේ පිස්සු කෙල්ල මගෙන් අහනවා.."

ඔහු දේවින්දිගේ හිස කෙස් අවුල් කළේය. ඇය සිනාසෙමින් කැලුම් දෙස බැලුවාය. ඔහුගේ මුවග ජයග්‍රාහී සිනාවක් විය.

"කොහොමද බුද්ධි ඔයා දේවින්දිව අඳුනන්නෙ...? ඒ විතරක්යැ අපේ අයියත් එයාව දන්නවනෙ..."

සාගරී විමසුවේ අඳුරු කර ගත් මුහුණින් යුතුවය. ඇගේ මවගේ මුහුණේ ද වූයේ නොවිස්සුමකි.

"මෙයා මගෙ නංගී... මගෙ පුංචි අම්මගෙ දුව... පුංචි කාලෙ මගෙත් එක්ක කාල ඇති සිය ගණනක්..."

බුද්ධික සිනාසෙමින් දේවින්දිගේ උරහිස් වටා අත යවා ගත්තේය.

"එකනෙ මම කිව්වෙ... අපේ ගෙදර ආවට පස්සෙ මම ඔයාව අඳුනන විදිය කියන්නම් කියලා... ඒත් බලපන් බුද්ධි,



මෙයා මාව අඳුනන්නෙ නෑ කියනවනෙ..." කැලුම් පැවසුවේ හෝස්කාඩු හඬිනි.

"ඇයි චූටි, ඔයාට කැලුම් මතක නැද්ද...? දවස් ගණනක්ම මගෙත් එක්ක ඔයාලගෙ ගෙදර ගියානෙ... ඔයා ඒ දවස්වල රැවුලා කියල නමකුත් දාල තිබ්බෙ..."

"අයි...සේ... එයා ද මේ...? දැන් කොහෙ අඳුනන්න ද...? රැවුල කපලා... මහත් වෙලා..."

දේවින්දි තරමක් හඬ නගා සිනාසුණාය. සාගරීගේ මවගේත් පියාගේත් මුහුණුවල වූ කුතුහලය තවමත් තුනී වී ගොස් නොතිබිණි.

"අප්පච්චි, මේ අත්තනායක මාමගෙ බාල දුව..." ඒ වූවු කැලුම් ඇය සියල්ලන්ටම හඳුන්වා දුන්නේය.

"අත්තනායක මාමා කිව්වෙ...?"

වෙද මහතා කල්පනා කාරී ලෙස දෙබැම රැළි කොට ගත්තේය.

"අර කච්චේරියෙ වැඩ කෙරුවෙ..."

"මොනවා...? මේ අත්තනායක මහත්තයගෙ බාල දුව ද...?" සාගරීගේ මවගේ දෑස් විසල් විය.

"ඇයි දෙයියනේ, මේ කෙල්ල පුංචි කාලෙ මම වඩාගෙන ඉඳලත් තියෙනවනෙ..."

වෙද මහතා එවර බොහෝ සැළකිල්ලෙන් දේවින්දි දෙස බැලුවේය.

www.sinhalaelibrary.com

"ඇයි දරුවෝ, අර සාගරයක් වාගෙ දේපොළ තියෙද්දි මේ ගෙවල්වල වැඩට ඇවිත් දුක් විඳින්නෙ...?"

සාගරීගේ මව විමසුවේ කම්මුලේ අත තබා ගනිමිනි. දෙවින්දි සිනාසෙමින් බුද්ධික දෙස බැලුවාය.

"අප්පච්චිට දේපොළ තිබ්බට මට නැහැනෙ ආන්ටි..."

"අප්පච්චිට තියෙන දේපොළ කවදා හරි දරුවන්ට මිසක් පිට කාටවත්යැ..."

වෙද මහතා ද පැවසුවේය. සාගරී කිසිවක් අඳහා ගත නොහැකි ලෙසින් බලා සිටියාය. දෙවින්දි අසාමාන්‍ය චරිතයක් බව ඇය දැන සිටියාය. එහෙත් මෙතරම් ධනවත් නැනැත්තියක බව දැන සිටියේ නැත.

"මෙයා පුංචි කාලෙ ඉඳලම හරි අමුතු විදියකට හිතන කෙනෙක් ආන්ටි... මෙයා කියන කියන විදියට නටන්න බාප්පත් ලෑස්ති වෙලා ඉන්නවා කියල පුංචි අම්මා හැම වෙලාවෙම බනිනවා..."

බුද්ධික පැවසුවේ දෙවින්දිගේ හිස පිරිමදිමිනි. කිසිදු සොයුරියක නැති බුද්ධික හැම විටම සොයුරියන් ලෙස සැලකුවේ නිමන්ති හා දෙවින්දිය. ඔහු දෙවින්දිට වඩාත් ඇලුම් කළේ ඇගේ අසාමාන්‍ය ගති ගුණ නිසාමය.

"අත්තනායක මාමා තමයි මෙයාව මෙහෙ ගෙනත් ඇරලලත් තියෙන්නෙ..." කැලුම් පැවසීය.

"ඇයි ඔයා මට කිව්වෙවත් නැත්තෙ මේ වාගෙ රස්සාවකට එනවා කියලා..." බුද්ධික විමසුවේ ඇගේ උරහිස



එවා වූ පුරන ඉවත් කොටගෙන ළඟම වූ පුටුවකට බර දෙමිනි. දෙවින්දි ද කැලුම් ද ඔහු අනුවම වාඩි වුවද අනෙක් තිදෙනා සිටියේ සිටගෙනමය.

"ඉතින් ඔයා සිංගප්පූරුවෙනෙ හිටියෙ මං එනකොට..."

"මම ආවෙ පෙරේදා... ඒ ගමන්මයි මෙහෙ ආවෙ..."

බුද්ධික සිනාසෙමින් සාගරී දෙස බැලුවේය. එම බැල්මෙන් ද සාගරීගේ මුහුණේ ඉහිරුණු රතෙන් ද දෙවින්දි සියල්ල වටහා ගත්තාය. ඇය සාගරී දෙස බැලුවේ සිනාසෙමිනි.

"ආ... මෙයා ද අපේ නැනා එනකොට...? මේ... හරි පුදුම හමුවීමක්නෙ..."

ඇය කියද්දී සාගරී ගෙතුළට දිව ගියාය. සියලු දෙනාගේම මුහුණු සිනාවෙන් විවර විය.

"ඇයි මං ඔයාට සාගරී ගැන කියල තිබුණෙ..." බුද්ධික සිහිපත් කළේය.

"කියල තිබුණ නම් තමයි... ඒත් මෙයා කියල කවුද දන්නෙ...? සාගරීල කී දෙනෙක් ලංකාවෙ ඉන්නව ද...?"

"මම හිතුවෙ දෙවින්දි මෙච්චර දුර මේ වගේ රස්සාවකට ආවෙ ගෙදරින් තරහ වෙලා කියල..." කැලුම් පැවසුවේය.

"අපෝ මෙයා එහෙම එන්නෙ නෑ... පුංචි අම්මා නම් කොහොමවත් කැමති නෑ මෙයා ජොබ් එකක් කරනවට... අඬලා අඬලා තමයි ඔය පත්තරේ රස්සාවට ගියෙත්..." බුද්ධික

www.sinhalaelibrary.com

පැහැදිලි කොට දුන්නේය.

"ඔය දුක් විඳින්නෙ නැතුව ගෙදර යන්න දරුවෝ..."

සාගරීගේ මව අවවාදයක හඬින් පැවසුවාය.

"කිසිම දුකක් නෑ ආන්ටි... මම හරි සන්තෝසෙන් ඉන්නෙ..."

"මුවර් එකටම මෙයා පොතක් ලියන්න කරුණු හොයනවා ඇති..." බුද්ධික කියද්දී දේවින්දි සිනාසුණාය.

"හරියටම හරි... බුද්ධි අයියා කොහොමද ගෙස් කළේ...?"

"මම දන්නෙ නැද්ද මගෙ නංගිගෙ හැටි..."

"ඔය ළමයා පොතුත් ලියනව ද...?" සාගරීගේ පියා විමසුවේ මවිතයෙනි.

"අපෝ ඔව්. මෙයා පොත් දෙක තුනක්ම ලියල තියෙනවා. මෙයාගෙ වැඩේම ලියන එකයි කියවන එකයි තමයි..."

දේවින්දිගේ පවුලේ තොරතුරු හොඳ හැටි දන සිටි කැලුම් වහා පැවසුවේය.

"ඒකටත් එක්ක අපේ ළමයි... මැල්ලුම් ලියන්නවත් බෑ."

සාගරීගේ මව පැවසුවේ සිතේ ඇතිවුණු හදිසි ඊර්ෂ්‍යාවකින් යුතුව යයි දේවින්දිට සිතිණි. 'හැමෝටම හැම දේම බැහැ' යනුවෙන් කියන්නට සිතට නැගුණු සිතුවිල්ල ඇය හිල ගත්තාය.



"අපේ පවුලෙ හැමෝටම වැඩිය රහට උයන්න පුරුවන් චූටි නංගිට තමයි..." බුද්ධික තරමක ආඩම්බරයෙන් යුතුව පැවසුවේය.

දිගු කලක් මිතුරු ඇසුරින් වෙන්ව සිටිය ද දේවින්දිට ඒ පිළිබඳව හැඟීමක් තිබුණේ නැත. එහෙත් සාගරිලා සමග ගත කළ කාලය අතිශයින් රසවත් විය. විශේෂයෙන්ම පවුලේ අයෙකු හමු වීමට ලැබීම තුළින් ඇය ඉමහත් සතුටක් වින්දාය. උදේ සිටම සිතේ වූ බර ගතිය අතුරුදන් වී යාමට ගත වූයේ සුළු වේලාවකි. එකිනෙකා සමග විහිළු කර ගනිමින් සිනාසෙමින් සිටි ඇයට කාලය ගත වී යනවා දැනුණේ නැත.

"ඇත්තටම චූටි නංගි ඔයාට ඔය වලව්වෙ කිසිම කරදරයක් නැද්ද...?"

බුද්ධික ඇසුවේ ඔවුන් වැට අයිනේ අරලිය ගස් යටට වී කතා කරමින් සිටියදීය. හැබැවින්ම දේවින්දිට ආපසු යා යුතු බව සිහිපත් වූයේ එමොහොතේය. ඇය වහා ඔරලෝසුව දෙස බැලුවාය. ඇය වලව්වේ සිටිය යුතු වේලාව පැයකින් ප්‍රමාද වී තිබිණි.

"දෙවියනේ, හතර හමාරයි වෙලාව..." දේවින්දි පැවසුවේ කලබලයෙනි.

"අනේ මාව බිහින් ඇරලලා එන්න"

"ඇයි ඔයා කීයට ද ආපහු එනව කිව්වෙ...?" කැලුම් විමසුවේය.

"තුන හමාරට..."

www.sinhalaelibrary.com

"ආ... පැයමෙ ලේට් වෙලා තියෙන්නෙ... මං ඔයාව කාර් එකේ ගිහින් දාන්නම්..."

බුද්ධික පැවසුවේය. එහෙත් තමා පොරොන්දුවක් කැඩුවේ යයි හැඟීම දේවින්දිගේ සිතට බරක් විය.

"මටත් ධනුෂ්ක මීට වෙන්න ඕනෙ... නුග දවසකින් දැක්කෙ නෑ... යමු මමත් එන්නම්..."

කැලුම් ද කාරයට නැඟුණේය. එහෙත් දේවින්දි ගමනට අදි මදි කළේ කට කතා හැදෙනු ඇතැයි බියෙන් විය යුතුය.

"අද එයා ගෙදර නෑ... කොළඹ ගිහිල්ලා... හැබැයි කැලුම් අයියෙ ආවට කමක් නෑ... අපේ දන හැඳුනුම්කම ගැන එහෙම කියනවා නෙමෙයි..." දේවින්දි අනතුරු ඇඟවූවාය.

"හරි. හරි. මම ඔයාව අඳුනන්නෙ නෑ වාගෙ ඉන්නම්කො..."

දේවින්දි වලව්වේ දොරකඩටම පැමිණි කාරයෙන් බසිද්දී සුපුරුදු නොපහන් බැල්ම මුහුණේ රඳවා ගත් පියතිලක මිදුලේ ඒ මේ අත සක්මන් කරමින් සිටියේය. දේවින්දි දුටු විගසම ඒ බැල්මට කෝපයක් ද එක් විය. දේවින්දි ඔහු දෙස නොබලාම ඔහු පසු කර ගියාය.

"කොහෙද ගියේ...?"

පියතිලක විමසුවේ වේගයෙනි. දේවින්දි සන්සුන්ව හැරී බැලුවාය.

"මගෙන් ද ඇහැව්වෙ...?"



"නැත්තං වෙන කාගෙන් ද...? ඔය විකාර ඇඳුම් ඇඳගෙන එක එකාගෙ කාර්වල ගම පුරාම ඇවිදින්නෙ වලව්වෙ හාමුදුරුවො කියල හිතුව ද...?"

ඔහු විමසුවේ ද්වේෂයෙනි. එවිට ඔහුගේ මුහුණ දිස් වූයේ තිඹෙනවාටත් වඩා විසූළ බවකින් යුතුවය. දේවින්දිට සිනා යන්නට පවා ආවේය. ඇය කිසිවක් නොකියා ඔහු දෙස බලාගත් වනම සිටියාය.

"දන් මොකක්ද ප්‍රශ්නෙ...?"

මඳ වේලාවකට පසු ඇය විමසුවේ ඔහු ගණනකට නොගත් අයුරිනි.

"ප්‍රශ්නෙ...? වැඩකාරකමට ආව නම් ඒ විදිහට ඉන්න පුරුදු වෙනවා... බණ්ඩාර හාමුදුරුවන්ට හවස තේ එක හදලා දුන්නෙ මම... ඒ මදිවට බණ්ඩාර හාමුදුරුවො අසනීපෙන්... ගෙදර වැඩ කාරියො රෝන්දෙ ගිහින්..."

පියතිලක වැඩ කාරියෝ යනුවෙන් පැවසුවේ අවධාරණයෙනි. ඔහු තුළ පවතින තමා හෙළා දකිමේ චුවමනාව කොපමණදැයි ඇය එයින්ම වටහා ගත්තාය. එහෙත් මවිතයකට මෙන් ඇයට කෝපයක් දැනුණේ නැත.

"මේ මිස්ට පියතිලක. ඔයා අනුන්ගෙ දේවල් හොය හොයා ඉන්නෙ නැතුව ගිහින් තමන්ගෙ වැඩක් බලා ගන්න. මම කිසිම දේකදි ඔයාට වග කියන්න බැඳිල නෑ..."

දේවින්දි පැවසුවේ තරමක අහංකාර ස්වරයෙනි. එයින් ඔහු තිගැස්සුණු බවක් පෙනිණි. තැනි තැන දී කුමක් කීව ද

www.sinhalaelibrary.com

ඔහුගේ මුහුණටම කිසිවක් කියන අයෙකු වලව්වේ සිටියේ නැත. ඔහු ගේ ඒ තත්ත්වයට අභියෝගයක් කිරීමත් සමගම ඔහු වඩාත් සතුරු වූ බව දේවින්දිට වැටහිණි. ඔහු දැන් ඇය පිළිබඳව වඩාත් සැලකිලිමත් වනු ඇත. එහෙත් ඒ ගැන සුළු අවධානයක්වත් යොමු නොකළ ඇය වහා ගෙතුළට ගියේ සූරියතැන්න මහතා අසනීපයෙන් සිටින බව පියතිලක පැවසූ හෙයිනි.

"හදිස්සියෙම මොකද වුණේ..? මං යනකොට හොඳට හිටියනෙ..."

අඩියට දෙකට සූරියතැන්න මහතාගේ කාමරයට යමින් දේවින්දි සිතුවාය. ඔහු ඇඳේ වැතිර කෙඳිරි ගාමින් සිටියේය. දේවින්දි කලබල වූවාය. ඇගේ පා හඬ ඇසී හිස හරවා බැලූ සූරියතැන්න මහතා අමාරුවෙන් මඳ සිනාවක් පෑවේය.

"ඇයි සර් මොකද වුණේ..?" දේවින්දි ඇඳ ළඟ දණ ගසා ගනිමින් විමසුවාය.

"මට ටිකක් උණ වගේ දේවින්දි..."

දේවින්දි ඔහුගේ හිසටත් ගෙලටත් අත තබා බැලුවාය. සිරුර ගිනි කබලක් සේ රත් වී තිබිණි. දේවින්දිට බියක් දැනිණි.

"සොරි සර්. මම එන්න ටිකක් පරක්කු වුණා..."

ඇය පැවසුවේ සැබෑම පසුතැවිල්ලකින් යුතුවය. ඇය සිටියේ නම් සූරියතැන්න මහතාට මෙතරම් තදින් උණ ගැනෙන්නට පෙර ප්‍රතිකාරයක් කිරීමට හැකියාවක් තිබිණි.

"ආ... ඒක ගණන් ගන්න එපා දේවින්දි.. ඔයා හොඳට එන්ජෝයි කළා ද...?"



සූරියතැන්න මහතා විමසුවේ සිය අසනීපය පිළිබඳව හැඟීමක් නැති අයෙකු මෙනි. සර් අපි කොහේටත් ඩොක්ටර් කෙනෙක් ළඟට යමු..."

ඒ යෝජනාවට සූරියතැන්න මහතාගෙන් පිළිතුරක් ලැබෙන්නට පෙරම ඇඳ අසළට සෙවනැල්ලක් වැටිණි. දේවින්දි හැරී බැලුවාය. ඇය දෙස නොබලා සූරියතැන්න මහතා දෙසම බලාගෙන පියතිලක කාමරයට ඇතුළු විය.

"මම ඩොක්ටර් හේරත්ට කෝල් එකක් දුන්නා... ඩොක්ටර් කියනවා බණ්ඩාර හාමුදුරුවන්ව එක්ක එන්නලු... අද ඩොක්ටර්ට ලෙඩ්ඩු වැඩියි කියලා මෙහාට එන්න බෑ කිව්වා..."

ඔහු කතා කළේ කිසිවෙකුට චෝදනා කරන්නාක් මෙනි. ඒ චෝදනාවට අසු වූයේ කවුරුන්දැයි දේවින්දි දැන සිටියේ නැත. එහෙත් සූරියතැන්න මහතා අසනීප වූයේ ඇය නිවසෙහි නොසිටීම නිසා බව අඟවන්නට ඔහු වෑයම් කරන බව ඇයට දැනිණි. සමහර විට ඔහු මේ සියල්ල දෙගුණ තෙගුණ කොට ධනුෂ්කගේ කනේ තබනු ඇත. ධනුෂ්ක ඇයට රැකියාව දුන්නේ ඕනෑම අවස්ථාවක ඇය රැකියාවෙන් පහ කිරීමේ බල තල ඔහු අතේ තබාගෙනය. මේ රැකියාවට ඇය ප්‍රිය කළාය. රැකියාවෙන් ඉවත්ව යන්නට සිදු වෙනු ඇතැයි බිය ඇගේ සිතට දැනිණි.

"එහෙම නම් අපි යමු සර් ඩොක්ටර් ළඟට..." දේවින්දි නැගී සිටියේ එසේ කියමිනි.

"ඩොක්ටර් ඉන්නෙ එහා වත්තෙ නෙමෙයි නුවර ටවුන් එකේ... බණ්ඩාර හාමුදුරුවන්ට පයින් යන්න ද කියන්නෙ...?"

www.sinhalaelibrary.com

පියතිලක විමසුවේ කෝපයෙනි.

"පුතා නැතුව කාර් එක ගෙනියන්න කෙනෙක් නැහැ දේවින්දි..." පියතිලකගේ වදන්වල සැර බාල කරන්නට මෙන් සූරියතැන්න මහතා පැවසුවේය.

"සර් ලැස්ති වෙන්න... මට පුළුවන් කාරෙක ගෙනියන්න..."

පියතිලකගේ මුහුණේ වූ කෝපයට විස්මයක් ද එක් විය. එහෙත් සූරියතැන්න මහතා මඳ සිනාවක් පහළ කළේ දේවින්දි රිය පැදවීම දන්නා බව කලින් දැන සිටියාක් මෙනි.

"මේක විහිළු කරන්න වෙලාවක් නෙමෙයි..." පියතිලක සැර කළේය.

"සර්, ඉස්සර වෙලා මොනවා හරි කීල හිටියොත් හොඳයි නේද...?"

දේවින්දි පියතිලකගේ හඬ නෑසුණාක් මෙන් විමසුවාය.

"කෝපි ටිකක් තියෙනවා නම් හොඳයි"

වහා මුළුතැන් ගෙයට පිවිසි දේවින්දි කෝපි කෝප්පයක් පිළියෙල කළාය. රාත්‍රී කෑම සකස් කරන්නට ප්‍රමාද වූවිට කම් නැත. යනුන්න කෑමට නොඑන්නේ නම් රාත්‍රී කෑම පිළියෙල කිරීම ද අවශ්‍ය නොවනු ඇත. පියතිලක වලව්වෙන් කෑම කෑවේ ඉතාමත් කලාතුරකිනි. ඔහුට වලව්වේ කාමරයක් තිබුණ ද ඔහු එහි සිටිනවා ද මොනවා කරනවා දැයි දේවින්දි හරියටම දැන සිටියේ නැත. එහෙත් ඔහුගේ උකුසු ඇස්වලට හසු නොවූ කිසිවක් වලව්වේ තිබුණේ නැත.



සිය කාමරයට ගිය දේවින්දි රියැදුරු බලපත්‍රය ද හැඳුනුම්පත ද සාක්කුවේ දමා ගත්තාය. ජංගම දුරකථනය මිතුරෙකු තරමටම ඇයට හුරුය. එහෙත් මේ ගමනට එය අනවශ්‍ය යයි ඇයට සිතිණි. කෝපි කෝප්පය ද රැගෙන සූරියතැන්න මහතාගේ කාමරයට යද්දී අත් දිග කමිසයකින් හා කළු කලිසමකින් සැරසුණු ඔහු රෝද පුටුවේ වාඩි වී සිටියේය. පියතිලක ඒ පිටුපස සිටගෙන සිටියේය. ඔහුගේ මුහුණෙහි වූයේ සැකයක් අවිශ්වාසයක් මුසු බැල්මකි. එය නොතැකූ ඇය සූරියතැන්න මහතාට කෝපි කෝප්පය පිළිගැන්වූවාය. ඔහුගේ දෑත වෙව්ලුවේ උණ නිසා විය යුතුය.

"සර් මම පොවන්න ද...?" දේවින්දි ඔහු දෙසට නැඹුරු වෙමින් විමසුවාය.

"ඕනෙ නෑ මම පොවන්නම්..."

පියතිලක පුටුව පිටුපසින් මෑත් වුණේ රළු හඬින් එසේ කියමිනි. ඔහු සිය අයිතිවාසිකම් රැක ගැනීමට දරන උත්සාහය දේවින්දිගේ මුවට සිනාවක් නැංවීමට සමත් විය. ඇය ඔහුට ඉඩ දී පසෙකට වූවාය.

"මෙන්න දේවින්දි යතුර..."

සූරියතැන්න මහතා රන්වන් පැහැති හදවතක හැඩය ගත් කී ටැග් එකක් සහිත මෝටර් රියේ යතුර ඇය වෙතට දිගු කළේය. එය සූරියතැන්න මැතිණිය විසින් තෑගි දෙන ලද්දකැයි එක වරම දේවින්දිට සිතිණි.

"මිස්ටර් පියතිලක එහෙනම් සර්වත් අරගෙන එන්න. මම පෝටිකෝව යටට කාරෙක ගේන්නම්..."

එසේ පවසමින් ඇය කාමරයෙන් පිටතට ගියාය.

"එයා මෙතන වලව්වෙ හාමුදුරුවො කියල හිතාගෙන වෙන්න ඇති මට අණ දෙන්නෙ..." පියතිලක නොපහන් හඬින් කියනු ඇයට ඇසිණි.

"දේවින්දි කිව්වෙ පියතිලක මේ වෙලාවෙ කරන්න ඕන දේ... ඒක අණ දීමක් නෙමෙයි..." සූරියතැන්න මහතා පැවසුවේ ඔහු අස්වසන රිසියෙන් විය යුතුය.

"වැඩ කාරියෙකුට වලව්වෙ කාර් එකත් පාවිච්චි කරන්න දුන්නම උන් අන්තිමට කරෙත් නැගලයි නවතින්නෙ... බණ්ඩාර හාමුදුරුවන්ට තේරෙන්නෙ නෑ මුන්ගෙ මායම්. මට නම් හිතෙන්නෙම ඕකි ඔන්න කාරියක් කියලයි."

"පියතිලකට ගැණු පේන්න බැරි බව මම දන්නවා. කොහොම වුණත් දේවින්දි කියන්නෙ දක්ෂ කෙල්ලෙක්. එයා එක්ක පැටලිලි හදා ගන්න එපා... අනිත් එක දේවින්දි විතරක් නෙමෙයි පියතිලකත් මේ වලව්වෙ සේවකයෙක් කියල අමතක කරන්න එපා..."

සූරියතැන්න මහතා තදින් පැවසුවේ ඔහුගේ කන්දොස් කිරියාව ඉවසන්නටම නොහැකි නිසා විය යුතුය. දේවින්දිගේ මුවට සිනාවක් නැගිණි. ඇය ගරාජය වෙත පිය නැගුවේ එම සිනාවෙන්ම යුතුවය.

දේවින්දි විශාල මෝටර් රථ ප්‍රිය කළේම නැත. එහෙත් ඇගේ නිවසේ තිබූ මෝටර් රථ දෙක මෙන්ම මෙම මෝටර් රථය ද විශාල විය. එහෙත් ධනුෂ්ක සතුව තිබුණේ කුඩා රථයකි. කෙදිනක හෝ එවැන්නක් තමන්ගේම මුදලකින් මිල දී



ගැනීමේ ආශාවක් ඇය තුළ තිබිණි.

"පුංචි පොඩි කාරෙකක් ඕන නම් ගන්න..." මෝටර් රියේ විශාලත්වය පිළිබඳව ඇය මැසිවිලි නගන බොහෝ අවස්ථාවල අප්පච්චි හෝ අයියා පැවසුවේය.

"එපා. මං කවදාහරි කාරෙකක් ගන්නෙ මගේම සල්ලි වලින්..." එවන් අවස්ථාවල ඇය පැවසුවේ අවධාරණයෙනි.

"එහෙම නම් ඉතින් ඔය පත්තරේ කුරුටු ගාල හරියන එකක් නෑ... බිස්නස් එකක් කරන්නවත් බැරි නම් අඩුම ගානෙ ලොතරැයියක්වත් ගන්න වෙයි."

ඔවුහු සරදම් කළහ. එහෙත් ඇගේ අධිෂ්ඨානය බිඳින්නට ඒ සරදම්වලට හැකියාවක් නොවිණි.

"බලන්නකො කවදා හරි මම මට ඕන විදිහෙ කාරෙකක් ගන්නෙ නැද්ද කියලා..."

දේවින්දි රිය පදවාගෙන පෝටිකෝව යටට ළඳී පියතිලක සූරියතැන්න මහතාගේ රෝද පුටුව තල්ලු කොටගෙන පැමිණියේය. ඔහුගේ මුහුණේ වූ අවිශ්වාසය හා රළු බව මඳකින්දු වෙනස් වී නොතිබිණි.

'මිනිහට තාමත් පුවර් නැතුව ඇති මට ඩ්‍රයිවින් පුළුවන් කියලා..." දේවින්දි මඳ සිනාවකින් යුතුව තමාටම කියා ගත්තාය.

ඇය දක්ෂ මෙන්ම ප්‍රවේසම්කාරී රියැදුරු වරියක බවට පවුලේ අය අතර නැගීමක් විය.

"හූටින් එක්ක ගියාම බය නෑ..."

අම්මා නිරන්තරයෙන් කියන්නට පුරුදුව සිටියාය.

"හූටි කාරෙක අතට ගත්තම හරියට එයාගෙ පාර වගේ.. අපිටත් වැඩිය වේගෙන් යනවා... අම්මට ඒත් ඉතින් එයා තමයි හොඳ..."

අයියා කියන්නේ කෝපයෙන් නොව නැගණිය කෙරෙහි උපන් ආඩම්බරයෙන් සහ ආදරයෙන් යුතුවය.

දෙව්න්දිට රියැදුරු බලපත් තිබේ ද ? ප්‍රවේසමින් රිය පැදවිය හැකි ද යන කිසිදු පැනයක් සූරියනැන්න මහතා නැඟුවේ නැත. ඔහු කළේ ඇය කී විගසම වෛද්‍යවරයා වෙතට යාමට සූදානම් වීම පමණකි. ඔහු තුළ ඇය කෙරෙහි වූ විශ්වාසයේ තරම කොපමණදැයි දෙව්න්දි කල්පනා කළාය.

රියැදුරු ආසනයට වම්පස අසුන ඇඳක් මෙන් පිටුපසට දිග හැරිය හැකි විය. හීන් බණ්ඩාගේ ද උදව් ඇතිව සූරියනැන්න මහතා එම අසුනට නැංවූ පියතිලක රෝද පුටුව ඩිකියට දැමීය.

"හීන් බණ්ඩාවත් එක්ක යමු දෙව්න්දි..."

සූරියනැන්න මහතා අසුනේ ඇළ වුණේ කෙඳිරියක හඬින් එසේ කියාගෙනය. තමාට කාරුණික බවක් නොපාන පියතිලක කෙරෙහි දෙව්න්දිගේ සිතේ කිසිදු විශ්වාසයක් තිබුණේ නැත. එම නිසාම හීන් බණ්ඩා කැටුව යාමේ අදහසට ඇය වහා එකඟ වූවාය. හීන් බණ්ඩා ද කාරයට නැඟුණේ ප්‍රීතියෙනි.



"මේ වලව්වට ආවට පස්සෙ ගෑණු ඩ්‍රයිවර් කෙනෙක් එක්ක ගමනක් යනවමයි..." ඔහු පැවසුවේ සිනාසෙමිනි.

සූරියනැන්න මහතා එය අනුමත කරන්නට මෙන් මඳ සිනාවක් පා හිස සැලුවේය. තැන්පත් හා විනීත ගති ගුණවලින් යුතු වූ සූරියනැන්න මැතිණිය රිය පැදවීම පිරිමින්ට පමණක් හිමි කටයුත්තකැයි සිතන්නට ඇත. මාධවී තනිවම මේ නිවසට නොඑන බැවින් හෝ ඇය සේවකයන් සමග සමීප සබඳතාවයක් නොපවත්වන බැවින් ඔවුන්ට ඇය පදවන රියක යාමට අවස්ථාව උදා වන්නේ නැත. එම නිසාම තමාගේ විශේෂිත බව තවත් වැඩි වනු ඇතැයි දෙව්න්දිට සිතිණි. මඟ දෙපසේ හමු වූ ගමේ මිනිසුන් බොහෝ දෙනෙකු කාරය දෙස බැලූ ආකාරයෙන්ම ඇයට ඒ බව සනාථ විණි.

"ඉඳල හිටලවත් මෙහෙම ටිකක් එහාට මෙහාට යන එක හිතට පැහැල්ලුවක් දෙව්න්දි. ගේ ඇතුළටම හිර වෙලා ඉඳල දුක් මට ඇති වෙලා තියෙන්නෙ..."

සූරියනැන්න මහතා පැවසුවේය. එවර ඔහුගේ කට හඬෙහි පෙර තිබූ රෝගී බව රැඳී තිබුණේ නැත.

"සර්ව වත්තේ ඇවිද්දනවටත් සමහරු කැමති නැහැ.. නැත්නම් මම සර්ව ගේ ඇතුළෙ තියන්නෙ නැහැ..."

දෙව්න්දි පැවසුවේ පියතිලකට ඇනුම් පදයක් වශයෙනි. හීන් බණ්ඩාගේ මුවට සිනාවක් නැංවෙන අන්දමත් පියතිලක යටි තොල සපා ගන්නා අන්දමත් දෙව්න්දි කණ්ණාඩිය තුළින් දුටුවාය. ඇයට සිනා නැඟිණි.

මහනුවර නගරය දෙව්න්දිට ආගන්තුක තැනක්

www.sinhalaebooks.com

නොවිණි. පාසැල් වියේ නොයෙකුත් සමරු සටහන් කැටි වුණ නගරය දකිද්දී ඇයට ශෝකයකුත් සතුටකුත් එකවරම දැනිණි. ඒ කාලයේ ඔවුන් පදිංචිව සිටි නිවස දකීමට යාමේ වුවමනාවක් ද ඇය තුළ ඇති විය. ඇය වටපිටාව නැරඹුවේ ආශාවෙනි.

"දේවින්දිට මෙහෙ පාරවල් හොඳට හුරුයි වගේනෙ..."

කිසිවෙකුගෙන් නොවිමසා ඇය හුරුපුරුදු ආකාරයට රිය පදවාගෙන යද්දී සූරියතැන්න මහතා පැවසුවේ ප්‍රශංසාත්මක හඬිනි.

"ඒක තමයි මාත් කියන්න හැදුවෙ... මෙච්චර ටවුමට යන එන අපිවත් දේවින්දි තරම් පාරවල් දන්නෙ නැනෙ..." හීන් බණ්ඩා ද එය අනුමත කළේය.

"අපි ඉස්සර පදිංචි වෙලා හිටියෙ මෙහෙ... මම ඉගෙන ගත්තෙත් හයි ස්කූල් එකේ..." දේවින්දි පහදා දුන්නාය.

"අයි...සේ... මම කලින් ඒක දැනගෙන හිටියෙ නැනෙ..."

සූරියතැන්න මහතා පැවසුවේ තරමක් මවිතයෙන් මෙනි. දේවින්දිගේ සිතට පසුතැවිල්ලක් බඳු හැඟීමක් දැනිණි. තමා නොයෙකුත් තොරතුරු වසන් කරන බවක් ඔහුට සිතෙන්නට ඇතැයි දේවින්දි කල්පනා කළාය.

"මාධවීත් කාලයක් හයි ස්කූල් එකට ගියා..."

සූරියතැන්න මහතා කුළුපග ලෙස පැවසූ විට දේවින්දිගේ හිතේ වූ චකිතය පහ වී ගියේය.



"මං හිතන්නෙ එනකොට දේවින්දි හුගක් පුංචි ඇති... ඕ ලෙවල් කරල ඉවර වෙන කොටම එයාලට එංගලන්තෙ පදිංචියට යන්න වුණානෙ..."

මාධවී එතරම් අහංකාරකම් පාන්නේ එංගලන්තයේ පදිංචිව සිටි බැවිනැයි දේවින්දිට සිතිණි. 'මෝඩ අම්මණ්ඩියෙක්' ඇගේ සිත කීවේය.

"මාධවීගේ හිත තවමත් තියෙන්නෙ එංගලන්තෙ.. බැන්දට පස්සෙ ධනුෂ්කත් එක්ක එහෙ පදිංචියට යන්නයි හිතාගෙන ඉන්නෙ... ඒත් මට පේන්නෙ ධනුෂ්ක ඒකට එච්චර කැමති නෑ වගේ..."

සූරියතැන්න මහතා හදිසියේ දොඩමළු වී සිටියේය. එහෙත් ඔහු කතා කළේ දේවින්දි අකමැති මාතෘකාවකි. ධනුෂ්ක ධනුෂ්කගේ විවාහයේ පුවත මෙතරම් සිත සසල කරන්නේ මන්දයි පැහැදිලිව වටහා ගැනීමට දේවින්දිට හැකියාවක් නොවීය. ඇය එම මාතෘකාව පිළිබඳව දිගින් දිගටම කතා කිරීමට අනුබල දුන්නේ නැත.

සූරියතැන්න මහතාගේ වෛද්‍යවරයා පදිංචිව සිටියේ ලේවැල්ල පාරේය. බෙහෙත් ශාලාවේ ආලින්දයේ රෝගීන් කීප දෙනෙක්ම රැඳී සිටිය ද සේවකයා වහාම සූරියතැන්න මහතා ඇතුළට කැඳවීය. පියතිලක රෝද පුටුව තල්ලු කරගෙන ඇතුළට යද්දී දේවින්දි ද ඒ සමඟම යන්නට ගියාය.

"මං විතරක් ගියාම ඇති..." පියතිලක පැවසුවේ දැඩි හඬිනි.

"නෑ දේවින්දිත් ආවාවෙ..." සූරියතැන්න මහතා කියද්දී

www.sinhalaelibrary.com

පියතිලක බුම්මා ගත්තේය.

"මේක ගණන් ගන්න තරම් අසනීපයක් නෙමෙයි.. කෙහෙට්ටුවටයි උණ හැදිල තියෙන්නෙ... ටිකක් විවේකයෙන් හිටියම හරි යයි..."

මැදිවියේ වූ කාරුණික වෛද්‍යවරයා පැවසුවේ සිනාසෙමිනි. දේවින්දි සූරියතැන්න මහතා දෙස බැලුවේ වේතයෙනි. ඔහු කෙහෙට්ටු වී වැඩක් කළ බව ඇය දන සිටියේ නැත.

"මේ ධනුෂ්කගෙ මනමාලි වෙන්න ඇති නේද...? හරිම ලස්සනයිනෙ..."

වෛද්‍යවරයා සිනාසෙමින් පැවසුවේ ඔවුන් කාමරයෙන් පිටතට එද්දීය. දේවින්දිගේ මුහුණ ලජ්ජාවෙන් රතු විය. පියතිලකගේ දෙනෙතින් ගිනි පුපුරු විසි වෙනු ඇයට පෙනිණි. සූරියතැන්න මහතා කිසිවක් නොපවසා සිනාසෙමින් වෛද්‍යවරයා දෙස බැලීය.

"මේ මගෙ හවුස් කීපර්..."

ඔහු කියනු ඇතැයි දේවින්දි සිතුවාය. එහෙත් ඔහු එසේ පැවසුවේ නැත.

"අපි වැව රවුමේ ටිකක් ඉඳල යමු දේවින්දි..." ආපසු එද්දී ඔහු යෝජනා කළේය.

"මේ වෙලාවෙ හුළඟත් සීතලයිනෙ සර්... අපි වෙන දවසක එමු... ධනුෂ්ක සර් ඇවිල්ල නම් එහෙම කලබල වෙයි අපි ලේට් වෙනකොට..."



වැව රවුමේ මඳ වේලාවක් රැඳී සිටීමේ ආශාව දනුණත් දේවින්දි පැවසුවාය. පියතිලක සිටින තැනක සූරියතැන්න මහතා සමග නිදහසේ කතා බහ කරන්නටවත් අවස්ථාවක් නොලැබෙන බව ඇය දන සිටියාය. ඔහු ඇය සමග සුහදව කතා බහ කිරීමට ප්‍රිය කළේය. ඇය වැව රවුමේදී කාරයේ වේගය බොහෝ සෙයින් අඩු කළාය. සූරියතැන්න මහතා ආශාවෙන් වටපිට බලනු දුටු ඇගේ සිතේ දුකක් ද උපන්නේය.

ඔවුන් ආපසු වලව්වට එද්දී සැඳෑ අඳුර ගලා එමින් පැවතිණි. පෝටිකෝව යටට වී නොඉවසිල්ලෙන් මෙන් මග බලා සිටි ධනුෂ්ක හා මාධවී කාරය වෙතට පැමිණියහ. මාධවීගේ මුහුණෙහි ද පියතිලකගේ මෙන්ම තුට්රු බවක් කැටි වී තිබෙනු දේවින්දිට පෙනිණි.

"අප්පච්චිට මොකද වුණේ...?"

ධනුෂ්ක වහාම කාරයේ දොර විවර කරමින් ප්‍රශ්න කළේය. පිළිතුරක් දෙන්නට පෙර සූරියතැන්න මහතා සිනාසුණේය.

"එච්චර අමාරුවක් නෑ. හිටිය ගමන් උණ හැදුණා..."

"වෙනදට ඩොක්ටර්ව ගෙදරට ගෙන්න ගන්නවා... අද මොකද ඩොක්ටර් ළඟට ගියෙ..?"

දේවින්දි දෙස නපුරු බැල්මක් හෙලූ මාධවී විමසුවාය. දේවින්දි පිළිතුරක් දුන්නේ නැත.

"මේක දැන් හරි කෝලමක් වුණානෙ... මං වත් අඳින්නෙ නැති විදිහෙ ඇඳුමුත් ඇඳගෙන වලව්වෙ කාරෙකත් අරගෙන

www.sinhalaelibrary.com

වැඩ කාරියො රවුම් ගහන්න ගියාම මිනිස්සු මොනවා නොකියයි ද...?"

මාධවී පුපුරා හැලුණාය. දේවින්දිගේ සිතට කෝපයක් මෙන්ම වේදනාවක් ද දැනිණි. පියතිලක සරදමට මෙන් සිනාසුණේය. හීන් බණ්ඩාගේ මුහුණේ රැඳුණේ නොරිස්සුමකි. ඔහු පියතිලක පමණක් නොව මාධවී ද ප්‍රිය නොකරන බව දේවින්දි දැන සිටියාය.

"බොරුවට කැගහන්න එපා මාධවී... දේවින්දි රවුම් ගහන්න ගියා නෙමෙයිනෙ.."

ධනුෂ්ක දේවින්දිගෙ පැත්තට කතා කළේ ඇය පවිත්‍ර කරවාලමිනි.



## 9

**දේවින්දිගේ** සිතට දැනෙමින් තිබුණේ අත් කවරදාකවත් නොදැනුණු තරමේ සැහැල්ලු බවකි. බුද්ධික අයියා හමුවීම ද සැහැල්ලු සැඳෑ කාලයක් ගෙවීම ද ඒ සියල්ලටම වඩා ධනුෂ්ක මාධවීට එරෙහිව ඇගේ පැත්තට කතා කිරීම ද ඒ සැහැල්ලු බවට හේතුවක් විය යුතු යයි ඇයට සිතිණි. ධනුෂ්ක ඇය වෙනුවෙන් කතා කළ මොහොතෙහි පියතිලකත් මාධවීත් එකිනෙකාගේ මුහුණු බලා ගනු දේවින්දිට පෙනිණි. එම බැල්මෙන් ප්‍රකාශ වුණේ අවවාදයක් හෝ තර්ජනයක් යයි ඇයට සිතිණි.

"අද ඩිනර් ලැස්ති කරන්න කරදර වෙන්න එපා දේවින්දි... අප්පච්චිට සුප් එකක් හදල දෙන්න... මම මාධවී ඩ්‍රොප් කරන්න යනවා. එහෙන් කාලා එන්න පුළුවන්..."

www.sinhalaelibrary.com

ගීයක් ද මුමුණමින් සුප් සඳහා එළවළු කපමින් සිටි දෙව්න්දි සමීපයටම පැමිණි ධනුෂ්ක පැවසුවේය. ඇය හිස ඔසවා ඔහු දෙස බැලුවාය. ඔහුගේ දෙනෙතෙහි වූයේ අර හුරු පුරුදු ගැඹුරු බැල්ම නොව ඇය මෙතෙක් කවරදාවත් දැක පුරුදු නොමැති කැළඹිලි සහගත බැල්මකි. දෙව්න්දිගේ සිත සසල විය.

"දෙව්න්දි..."

ඔහු යමක් කියන්නට මෙන් තවත් පියවරකින් ඇයට සමීප විය. ඇය පිහියත් කපමින් සිටි කැරට් අලයත් එලෙසම ලෑල්ල මත තබා යටි තොල දඩිව සපා ගත්තාය. හුස්ම ගන්නට අසීරු බවක් ඇයට දැනිණි. ඔහු කියන්නට සූදානම් වන්නේ සාමාන්‍ය දෙයක් නොවන බව ඇයගේ සිත කීවේය.

"ධනුෂ්ක..."

එක්වරම දොර අසලින් මාධවීගේ කට හඬ ඇසිණි. එහි වූයේ නොමනාපයක් බව දෙව්න්දිට වහා වැටහිණි. ධනුෂ්ක ඉදිරියට තැබූ පය ආපසු ගත්තේය. දෙව්න්දිට නැවතත් පහසුවෙන් හුස්ම වැටිණි. කිසිවක් සිදු නොවූවාක් මෙන් ඇය කැරට් අලය කපන්නට පටන් ගත්තාය.

"ඔයා මොනවද කුස්සියෙ කරන්නෙ...?" මාධවී විමසුවේ සැක මුසු හඬකිනි.

"මම ඩිනර්වලට එන්නෙ නෑ කියල දෙව්න්දිට කියන්න ආවා..."

ධනුෂ්ක සාමාන්‍ය ස්වරයෙන් කියන්නට උත්සාහ කළත් එහි යම් කැළඹිලි සහගත බවක් ඇතැයි දෙව්න්දිට සිතිණි.



"හාම්පුත්තු වැඩ කාරියන්ගෙ දොපතුල ළඟට ඇවිත් කරන්න ඕන දේවල් කියන්න ඕනැ. මේ නාඩගම් ඔක්කොම තියෙන්නෙ මේ වලව්වෙ... වැඩ කාරියො ඒ විදියට තියා ගන්නෙ නැති එකේ රගේ කාට කාටත් ළඟදිම තේරෙයි..."

මාධවී උස් හඬින් ඉංග්‍රීසියෙන් පැවසුවාය. ඇය හැමවිටම 'වැඩකාරි' වශයෙන් අවධාරණයෙන්ම තමා හඳුන්වන්නේ හෙළා දැකීමේ අරමුණින් බව දෙව්න්දිට රහසක් නොවීය. සූරියනැන්න මහතා ඇයට නෑදෑයෙකුට මෙන් සැලකීම එයට හේතුවක් වන්නට ඇත. එහෙත් සැහැල්ලු හා සන්සුන් මනසින් යුතුව සිටි ඇයට කෝපයක් දැනුණේ නැත.

"කොරුවට නෑ නොගන යමු මාධවී..." ධනුෂ්ක පැවසුවේය.

"ඔයාටත් වැඩ කාරි ලොකු වෙලා වගෙයි මට පේන්නෙ..."

"ඔයා මොනව කියනව ද කියල මට තේරෙන්නෙ නෑ..."

ධනුෂ්ක ඇගේ අතින් අල්ලාගෙන කුස්සියෙන් පිටතට ගියේය.

"ඔයාට තේරෙන කොට වෙන්න ඕන හැම දේම වෙලා ඉවර වෙයි..."

මාධවී මොනවා කීවත් දෙව්න්දි එදෙස හැරී බැලුවේවත් නැත.

"එයාලගෙ රණ්ඩු එයාල දෙන්නම බලා ගන්නාවෙ..." ඇය සිතුවාය.

ඇය සුප් එක සකස් කොට සූරියතැන්න මහතා වෙනුවෙන් පාන් පෙති දෙකක් ද කර කළාය. ඔහුට කෑම මේසයට එන්නට තරම් සුවයක් නොමැති බැවින් ඇය සියල්ල බන්දේසියක අසුක් කොටගෙන ඔහුගේ කාමරයට ගියාය. එහෙත් දොරකඩ සිටි පියතිලක බන්දේසිය අතට ගත්තේ ඇගෙන් උදුරාගෙන මෙනි. දෙව්නිදිගේ සිතට කෝපයක් දනෙනු වෙනුවට මුවගට සිනාවක් නැංවිණි.

"මාධවීයි පියතිලකයි දෙන්නම එයාලගෙ අයිතිවාසිකම් රැකගන්න සටන් කරනවා වාගේ මට නම් පෙනෙන්නෙ..." ඇය ඒ සිනාවෙන් පුහුවම මුහුණ ගත්තාය.

"දෙව්නිදි..."

සූරියතැන්න මහතාගේ කටහඬ කාමරය තුළින් ඇසිණි. දොරකඩ හරස් කරගෙන මෙන් සිටගෙන සිටි පියතිලකගේ ඇඟේ ගැව්ගෙනම දෙව්නිදි කාමරය තුළට ගියාය. පියතිලක තොල මතුරමින් යමක් කී නමුදු ඇය එයට අවධානයක් යොමු කළේ නැත. පිජාමා ඇඳුමකින් සැරසුණු සූරියතැන්න මහතා කොට්ට දෙකක් ඇඳ විට්ටමට හේත්තු කොට ඒ මත ඇළ වී සිටියේය.

"දැන් සනීපයි නේද සර්..."

ඇඳට ළං වූ දෙව්නිදි ඔහුගේ ගෙලටත් නළලටත් සුරත තබා බැලුවාය. සවස දුනුණු රස්නය ඒ වේලාවේ ඇයට දැනුණේ නැත. ඔහු කෘතඥතාපූර්වක බැල්මකින් ඇය දෙස බැලීය.

"මෙහෙත් එක වෙලක් තිබ්බ ගමන්ම උණ බැස්සා..."



ඔහු පැවසුවේ මඳ සිනාවක් පාමිනි.

"ඒක නමයි... සර්ට උණ හැදුණේ නොහොට්ටුව වැඩිකමට කියල ඩොක්ටර් කිව්වනෙ... මම දන්නෙ නෑ සර් මහන්සි වෙලා වැඩ කරපු බවක්..."

ඇය චෝදනා කරන්නාක් මෙන් මෘදු හඬකින් පැවසුවාය. ඔහු අරුත්බර සිනාවක් පෑවේය.

"බණ්ඩාර හාමුදුරුවෝ නිවෙන්න ඉස්සර සුප් ටික බිල හිටිය නම් හොඳයි..."

පියතිලක බන්දේසිය රැගෙන ඇඳ වෙතට ආවේ 'මය කතාව නවත්තන්න' යයි සූරියතැන්න මහතාට නොකියා කියමින් බව දෙව්නිදිට වැටහිණි.

"අපි හෙට කතා කරමු දෙව්නිදි..."

ඔහු කියද්දී පියතිලකගේ මුහුණ අඳුරකට හැරිණි.

"හොඳයි සර්... මොනවා හරි ඕන වුණොත් බෙල් එක රිංග් කරන්න..."

"නෑ දෙව්නිදි ඔයා කරදර වෙන්න ඕනෙ නෑ... ඔයා කාමරේට යන්න... පුතා එනකම් පියතිලක ඉන්නවනෙ..."

"එහෙනම් මිස්ටර් පියතිලක ට්‍රේ එක කුස්සියෙන් ගෙනත් තියන්න..."

දෙව්නිදි පියතිලක දෙස නොබලාම පවසා කාමරයෙන් පිට වූවාය. ඔහු නැවත ද වරක් යමක් තොල මැතිරීය. ඇගෙන් අණක් පිළි ගැනීමට ඔහු අකැමැති බව දැන සිටි දෙව්නිදි එසේ

www.sinhalaelibrary.com

පැවසුවේ සිනාමුසුව ඔහු විදවීම අරමුණු කොටගෙනය.

'මිනිහට දැන් මාව කන්න කේන්ති ඇති..' ඇය සිය කාමරයට ගියේ එසේ සිතමින් සිනාසෙමිනි. ඇඳුම් මුදවා ඇඟ සෝදාගෙන නයිටිය හැඳ ගත් ඇය ඇඳේ සුව පහසුව ඇළ වූවාය. වෙනදා මෙන් රූපවාහිනිය නැරඹීමේ වුවමනාවක් ඇයට නොවීය. ඇය ජංගම දුරකථනය ක්‍රියාත්මක කොට නිවසට ඇමතුමක් ගත්තාය. අප්පච්චිගේ ගැඹුරු කටහඬ දුරකථනයේ අනෙක් පසින් ඇසිණි.

"අප්පච්චි..." ඇය පැවසුවේ උතුරා යන සතුටින් යුතුවය.

"ආ පුතා... අපි දැන් ඔයාව මතක් කළා විතරයි..."

"අපි කිව්වෙ කවුද අප්පච්චි...?"

"අම්මයි මායි... දැන් ටිකකට ඉස්සර වෙලා බුද්ධික පුතා කෝල් එකක් දුන්නා ඔයාව මීට වුණා කියලා..."

"ඒක නම් හරිම පුදුම හමු වීමක් තමයි අප්පච්චි..."

"ඔයාට බිල යනවනෙ පුතා... ඔයා තියන්න... මම ඔයාගෙ සෙල් එකට කෝල් එකක් ගන්නම්.." ඇය විස්තර පවසන්නට යද්දීම අප්පච්චි බාධා කළේය.

"කොහොමත් ඉතින් බිල් ගෙවන්නෙ මම නෙමෙයි අප්පච්චිනෙ..." දෙව්නදී කිකිණි හඬින් සිනාසුණාය.

"ඒකත් ඇත්ත තමයි... ඉතින් පුතා ඔයා සන්තෝසෙන් නේද ඉන්නෙ...? අම්මා හැම වෙලාවෙම ඔයා ගැනම තමයි කියවන්නෙ..."



"අම්මට කිංගක්වත් වෙරි වෙන්න එපා කියන්න අප්පච්චි... මම හරිම සන්තෝසෙන් ඉන්නෙ... දැන් පොත ලියන්නත් පටන් ගත්තා..."

"වෙරි ගුඩ් පුතා... ඔයාට මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවා නම් තෙන්නකෝන් වෙද මහත්තයට කිව්වට කමක් නෑ... එයා මගෙ හොඳ යාළුවෙක්.. ඒ වාගෙමයි හුගක් හොඳ මනුස්සයෙක්..."

"කාටවත් කියන්න ප්‍රශ්නයක් ඇතිවෙයි කියල මම හිතන්නෙ නෑ අප්පච්චි.. මිස්ටර් සූරියතැන්නල හරි හොඳයි.. ඒත් මෙහෙ ඉන්න ලියන මහත්තයට තමයි මාව පේන්නන්න බැරි..."

එසේ ඇරඹූ ඇය පියතිලකගේ ස්වභාවය පිළිබඳව අප්පච්චිට පැවසුවේ සිනාසෙමිනි. එහෙත් ඔහු සිනාසුණේ නැත.

"කිසි කෙනෙක් එක්ක ප්‍රශ්න ඇති කර ගන්න එපා පුතා... ඒක අනාගතේට හොඳ වෙන එකක් නැහැ... ඔයා ඔයාගෙ පාඩුවේ වැඩ ටික කරගෙන ඉන්න..."

"එහෙම තමයි අප්පච්චි මං ඉන්නෙ..."

දුරකථන සංවාදය නිම කොට දුරකථනය ක්‍රියා විරහිත කරද්දීම දෙව්නදීට දොර දෙසින් හඬක් ඇසිණි. මීට පෙර ද මේ හඬ ඇසී තිබෙන බව ඇයට සිහිපත් විය. ඇගේ සිත තිගැස්සී ගියේය.

"ඔය පරණ වලව්වල හොල්මන් තියෙනවා..." තමා බය කරන්නට මෙන් අත්තා කියූ ආකාරය ඇය සිහිපත් කළාය.

www.sinhalaelibrary.com

හඬක් නොනගා පුටුව මසවා දොර අසලට ගත් දේවින්දි දොරට ඉහළින් ඇති කැටයම් මල් ලැල්ල අතරින් පිටත බැලුවාය. හොරෙකු මෙන් වටපිට බලමින් කොරිඩෝරය දිගේ යන පියතිලක ඇගේ නෙත ගැටිණි.

පියතිලකගේ උකුසු ඇස් නිරන්තරයෙන්ම තමා ලුහු බඳින බව දැන සිටියත් දේවින්දි සිය පිළිවෙත වෙනස් කළේ නැත. ඇය සුපුරුදු ලෙස එදිනෙදා කටයුතුවල නිරත වූණාය. නිවාඩු වේලාවට ගමේ ඇවිද්දාය. වත්ත මැද වූ ජලාශය අබියසට වී සිටීමට ඇය බෙහෙවින් ප්‍රිය කළාය. එහෙත් කුමක්දෝ සවැනි ඥානයක් බඳු හැඟීමක් ඇය නිතර නිතර එබී යැමෙන් වළකාලීය.

පියතිලක කොපමණ අකැමැති වුවත් ඇය කාලගුණය ප්‍රසන්නව පැවති හැම සැඳෑ කාලයකදීම සූරියතැන්න මහතා එළිමහනට රැගෙන ආවාය. එහෙත් පියතිලක ඔවුන් පෙනෙන මානයෙන් ඉවතට ගියේ නැත. මාටවිත් පියතිලකත් එක් පසෙක බව බැලූ බැල්මටම පෙනෙන්නට තිබිණි. ඇය පැමිණි හැම විටෙකම පියතිලක සමග පහත් හඬින් කතා බහ කරන ආකාරය දේවින්දි දුටුවාය. සූරියතැන්න මහතාත් වලව්වේ සේවකයනුත් ඕනෑම අවස්ථාවක කතා කළේ දේවින්දිගේ පැත්තටය. පියතිලකගේ සිත රිදෙන්නට එය ද හේතුවක් වන්නට ඇත.

දේවින්දිගේ කාමරයේ සැඟවිය යුතු යමක් තිබුණේ නැත. එහෙත් පියතිලක සෝදිසියෙන් පසු වන බව දන්නා නිසා ඇය නිතරම දොර අගුළු ලා තැබුවාය.

"දේවින්දි මට ආසයි වැව රවුමෙ ටිකක් ඇවිදල එන්න..."



උණ සනීප වී දින දෙක තුනකට පසුව සූරියතැන්න මහතා පැවසීය. ඔහු එය පැවසුවේ කුඩා දරුවෙකු චොකලට් එකක් අවශ්‍ය යයි කියන්නාක් මෙන් ආශාවකින් යුතුවය.

"ඉතින් අපි යමුකො සර්... මේ දවස්වල වැව රවුම හරි ලස්සනයි... පාට පාට මල් පිපිලා..."

"ඒක තමයි. මෙහෙම එක තැනකට කොටු වෙලා ඉන්නකොට හැම දේ ගැනම කලකිරීමක් ඇති වෙනවා..."

සූරියතැන්න මහතා සුසුමක් හෙළීය. සැනසුම් බසක් දොඩා ඔහුගේ සිත සැහැල්ලු කිරීමට අවශ්‍ය වුව ද දේවින්දි නිහඬව බලා සිටියාය. කිව යුතු කුමක්දැයි එක් වරම ඇයට සිහිපත් වූයේ නැත.

"සර් ධනුෂ්ක සර්ගෙන් අහල බලන්න ඩිනර් එකට එනව ද කියලා. එහෙම නැත්නම් අපට අද හවසට යන්න පුළුවන්..." දේවින්දි යෝජනා කළාය.

"ඩිනර් ගැන කරදර වෙන්න දෙයක් නෑ දේවින්දි... අපි එක දවසකට කඩෙන් කමු"

"එහෙම හරි නෑ සර්... මට පුළුවන් ටක් ගාලා කෑම ලෑස්ති කරන්න"

"ඔව්... දේවින්දි දක්ෂයි කියලා මම දන්නවනෙ..."

සූරියතැන්න මහතා සිනාසුණේය. මෙතෙක් ඔහුගේ මුහුණේ පැවති අඳුරු වළාකුළු ඒ සිනාවත් සමගම පහ වී ගියේය.

www.sinhalaelibrary.com

"ඇත්ත ද.. ඔයාලා හවස ඇවිදින්න යනව කිව්වෙ දේවින්දි...?"

එදින දිවා ආහාරයෙන් පසුව දේවින්දි කුස්සිය අස් පස් කරමින් සිටියදී පැමිණි ධනුෂ්ක විමසීය. මෑතක සිට ඇයට යම් පණිවිඩයක් කීමට අවශ්‍ය වූ විට ඇය තමා ළඟට කැඳවනවා වෙනුවට ඇය සිටින තැනකට පැමිණීමට ධනුෂ්ක පුරුදුව සිටියේය. එම නිසාම ඔහු කිහිප වතාවකම මාධවීගෙන් දොස් ඇසූ බව දේවින්දිට මතක තිබිණි.

"සර්ට ගේ ඇතුළටම වෙලා ඉඳල එපා වෙලාලු. ඉතින් වැව රවුමෙ පොඩ්ඩක් ඇවිදල එමු ද කියලා ඇහුවා. මම කිව්වා ධනුෂ්ක සර් අවසර දුන්නොත් යමු කියලා..." දේවින්දි සිනාසුණාය.

"මගෙන් අමුතු අවසරයක් ඕන නෑ දේවින්දි... අප්පච්චිට කොහෙ හරි යන්න ඕන වුණාම ඔයා එක් කරගෙන යන්න. කාරෙක ගෙදර තියෙනවනෙ. පියතිලකත් ඉන්නවනෙ..." ධනුෂ්ක පැවසීය.

පියතිලක පිළිබඳව පවසද්දී දේවින්දිගේ මුහුණ වෙනස් වී ගියේය. ඇය යටි තොල සපාගෙන මේසය පිස දැමුවාය. ධනුෂ්ක ඕනෑකමින් ඇයගේ මුහුණ දෙස බැලීය.

"ඇයි දේවින්දි...?" ඔහු විමසුවේ පියවරක් දෙකක් ඇය සමීපයට තබමිනි.

"ඔයා පියතිලකට එච්චර කැමති නෑ වගේ නේද...?"

ඔහු විමසද්දී දේවින්දි වහා දොර දෙස බැලුවාය. ඇය



ඕනෑම අයෙකු සමග කතා බහ කරද්දී පියතිලක ඇසෙන මානයක ගැවසෙන බව දේවින්දි අත් දැකීමෙන්ම දැන සිටියාය.

"එහෙම විශේෂ අකමැත්තක් නෑ සර්..." ඇය මිමිණුවාය.

"නැත්තෙ මොකද ? ඔයා දැනුත් දොර දිහාවෙ බැලුවෙ පියතිලක එනව ද කියලනෙ..."

ඔහු සරදම් හඬින් පවසද්දී දේවින්දිගේ සිතට ලැජ්ජාවක් දැනිණි. ඇය බිම බලාගෙන දිගටම මේසය පිස දැමුවාය. ඔහු සිය හැඟීම් හඳින ගැනීම මෙන්ම දොඩමළු බවක් පෑම ද ඇයට විස්මයක් විය.

"පියතිලක අනුන්ගෙ දේවල් හොයන්න ටිකක් දක්ෂයි තමයි... ඒ වුණාට මිනිහා අප්පච්චිට හරි හිතවත්..."

ඇය ඒ ප්‍රකාශයට එකඟව හෝ එරෙහිව කිසිවක් පැවසුවේ නැත. සැබැවින්ම ඔහු කෙබඳු පුද්ගලයෙකු වුව ද දේවින්දි ඒ පිළිබඳව අවධානයක් යොමු කරන්නේ නැත. විවිධ ගතිගුණැති පුද්ගලයන් ඇසුරු කොට ලබා ගත් අත්දැකීම් ඕනෑ තරම් ඇයට තිබිණි. එහෙත් ඇයට දරා ගන්නට නොහැකි වූයේ ඔහු තමා යම් කිසි සංවිධානයක හෝ හොර කල්ලියක ඔත්තු කාරියක ලෙස සැලකීමය.

"එච්චර කල්පනා කරන්න දෙයක් නෑ දේවින්දි. පියතිලක එක්ක යන්න ඕන නෑ. අද අපි දෙන්නා අප්පච්චි එක්කරගෙන යන්නෙ..."

"අපි දෙන්නා...?"

ඇය ප්‍රශ්නාර්ථය රඳවා ගත් දෑසින් ඔහු දෙස බැලුවාය.

ඔහු අදහස් කළේ මාධවී සමඟ යන බව විය යුතු යයි දේවින්දිට සිතිණි. ඇගේ සිතට බලාපොරොත්තු සුන් වූ බවක් දැනෙන්නට විය. මාධවී කැටුව යන ගමනකින් සූරියනැන්න මහතාට අපේක්ෂිත චිත්ත විවේකය ලබා ගැනීමට හැකියාවක් නොමැති බව දේවින්දි දැන සිටියාය. එහෙත් එයට එරෙහි වන්නට හැකියාවක් හෝ අවසරයක් නොවීය. ඇයට ඇත්තේ ඔවුන් කියන ඕනෑම දෙයක් නිහඬව පිළිගැනීම හා විධානයක් දුනහොත් එය ඉටු කිරීම පමණකි. දේවින්දිට ඉබේටම සුසුමක් හෙළිණි. සැබැවින්ම ඒ මොහොතේ ඇයට පළමු වතාවට ය. කියාව පිළිබඳව සියුම් කළකිරීමක් දැනිණි.

ඇය අතේ තිබූ පිස්නාකඩ රාක්කයේ එල්ලීම පිණිස ධනුෂ්ක පසු කොට යන ගමන් ඔහුගේ මුහුණ දෙස බැලුවාය. ඔහු සිටියේ සිනාසෙමිනි. ඇයගේ සිතට නොරිස්සුමක් දැනිණි. ඔහු ද තමා සරදමකට ගෙන ඇතැයි ඇයට සිතිණි.

"මොකද දේවින්දි අප්පච්චි එක්කරගෙන යන්නෙ අපි දෙන්නා කියල කිව්ව ගමන් ඩිම් වුණේ...? ඔයා ආස නැද්ද මං එනවට...?"

දේවින්දි එක් වරම හිස ඔසවා ධනුෂ්ක දෙස බැලුවාය. එවර ඔහුගේ මුහුණේ වූයේ මෙතෙක් වේලා තිබූ සැහැල්ලු බව නොව ඇය බියපත් කරවන ඇර ගැඹුරු බැල්මය. ඇය තරයේ යටි තොල සපා ගත්තාය.

"බිස්නස් වැඩයි අර වැඩයි මේ වැඩයි එක්ක මගෙ ඔළුවත් හිර වෙලා තියෙන්නෙ මේ දවස්වල. ලංකාවට ආවෙ අපරාදෙ කියලා හිතුණ දවසුත් මට තිබුණා. ඒකයි මටත් හිතුණෙ එක දවසක් හරි සැහැල්ලුවෙන් ඇවිදලා එන්න..."



ඔහු නිරන්තරයෙන්ම මාධවී සමඟ එහෙ මෙහෙ ඇවිදින බව දේවින්දි දැන සිටියාය. එම ගමන් වලින් ලැබෙන්නේ සතුටක් සැහැල්ලුවක් නොවේදැයි අසන්නට සිත් වුව ද එය නොතරම් කමකැයි ඇයට වැටහිණි.

"මාධවී මිසුත් එනව ද...?"

ඇය ඒ වෙනුවට විමසුවාය. ධනුෂ්කගේ මුහුණ වෙනස් විය.

"ඇයි දේවින්දි මගෙත් එක්ක තනියම යන්න බය ද...? අප්පච්චි යන නිසා බය වෙන්න දෙයක් නෑ..."

ඇහුම් පදයක හඬින් පැවසූ ඔහු අඩියට දෙකට කුස්සියෙන් පිට වී ගියේය. දේවින්දිගේ සිතට පසුතැවිල්ලක් මෙන්ම පාළුවක් ද දැනිණි. ඇය මොහොතක් ඔහු ගිය දෙස බලාගෙන නිසලව සිටියේ එහෙයිනි.

ධනුෂ්කත් ගමනට එකතු වීම පිළිබඳව සූරියනැන්න මහතා බෙහෙවින් සතුටු වූයේය. ඔහු පුතාට මොන තරම් ආදරය කරන්නේ ද ඔහුගේ සමාගමය මොන තරම් ප්‍රිය කරන්නේ ද යන්න දේවින්දි දැන සිටියාය. එහෙත් ව්‍යාපාරික කටයුතු බහුල වීම හා මාධවී සමග ගැවසෙන්නට සිදු වීම නිසා ධනුෂ්කට තිබුණේ අල්ප විවේකයකි. පියාත් පුතාත් බොහෝ විට හමු වූයේ කෑම මේසයේදී පමණකි. ධනුෂ්කත් සමග ගමනක් බිමනක් යාමට පවා සූරියනැන්න මහතාට ඉඩක් ලැබෙන්නේ කලාතුරකිනි. සූරියනැන්න මහතා හුදෙකලා බවින් මොන තරම් පීඩා විඳිනු ඇද්දැයි දේවින්දි සිතුවාය. ඔහුගේ එම හුදෙකලා බව මඳක් හෝ තුරන් වෙන්නට ඇත්තේ දේවින්දි පැමිණි පසුවය.

www.sinhalaelibrary.com

වෙනිම් ජීන්සයක් හා ටී ෂර්ටයකින් සැරසුණු දේවින්දි සවස් වරුවේ දිය නෑම නිසා තෙත බරිතව තිබූ කොණ්ඩය පිට දිගේ හෙළා ගත්තාය. දණහිස දක්වාම දිගු වූ තද කළු කොණ්ඩය නිසා ඇගේ මුහුණේ ප්‍රභාපත් බව වඩාත් කැපී පෙනිණි. එහෙත් සූරියතැන්න මහතාගේ රෝද පුටුව තල්ලු කරගෙන පෝටිකෝව යටට පැමිණෙමින් සිටි පියතිලකගේ මුහුණ කෝපයෙන් මෙන් අඳුරු වූවේය.

"ගෙදරත් කවුරුවත් නැති හින්දා පියතිලක එන්න ඕනෙ නෑ. අපි හීන් බණ්ඩව එක්කරගෙන යන්නම්..."

සූරියතැන්න මහතා කියද්දී පියතිලක තදින් යටි තොල සපා ගත්තේය. ඔහුගේ කෝපය එල්ල වෙන්නේ තමා වෙතට බව දේවින්දි පැහැදිලිවම දුන සිටියාය.

"දේවින්දි ඉස්සරහින් නගින්න මටයි හීන් බණ්ඩවටයි පිට පස්සෙ සීට් එකේ යන්න පුළුවන්..."

සූරියතැන්න මහතා කියද්දී දේවින්දිගේ දෑස ඉබේටම යොමු වූයේ පියතිලක වෙතය. ඔහුගේ දෑසෙහි වූයේ ඇය දවා හළු කරන තරම් සැර බැල්මකි. ඇයට සිනා යන්නට පවා ආවේය. ඇය ආයාසයෙන් සිනුව්ලි පාලනය කොට ගෙන කාරයට ගොඩ නැගුණාය. ධනුෂ්ක යටි තොල තරයේ සපාගෙන ඇය දෙස බලා සිටියේය. ඇය ඔහු දෙස නොබලා සිටීමට ප්‍රවේසම් වූවාය. නැතිවින්ම එමොහොතේ කුමක්දෝ ආගන්තුක හැඟීමකින් ඇගේ සිත සැලෙමින් තිබිණි.

කාරය ගම මැදින් යද්දී බොහෝ දෙනෙක් දේවින්දි හා සිනාසුණහ. ඇයට අත වැනුහ. ධනුෂ්ක මෙන්ම සූරියතැන්න මහතා ද ඇය දෙස බැලුවේ මවිතයෙනි.



"ඉපදුණ දා ඉඳන් මේ ගමේ හිටිය අපිවත් අඳුනන්නෙ නැති තරම් කට්ටිය දේවින්දිව අඳුනනවනෙ..."

සූරියතැන්න මහතා පැවසුවේ සිනාසෙමිනි. දේවින්දිගේ සිතට සියුම් ලැජ්ජාවක් දැනිණි. ඇය කාරයේ කවුළුවෙන් පිටත බලා ගත්තාය.

"දේවින්දි නෝනට ගමේ අය හරි කැමතියි බණ්ඩාර හාමුදුරුවනේ..."

හීන් බණ්ඩා ඇල් බුරුල් හැර පැවසුවේය. දේවින්දිගේ සිතට දැනුණු ලැජ්ජාව වඩාත් දැඩි විය. එහෙත් හීන් බණ්ඩා දෙස අනතුරු අඟවන බැල්මක්වත් හෙළන්නට ඇයට හැකියාවක් නොවූයේ සූරියතැන්න මහතාත් ධනුෂ්කත් දෙපසින් සිටි බැවිනි.

"දේවින්දි කොහොමද මේ තරමට ගමේ මිනිස්සු අඳුනන්නෙ...?"

ධනුෂ්ක විමසුවේ ඉදිරිපස බලාගෙන රිය පදවන අතරමය. දේවින්දි කෙළ බිඳක් ගිල්ලාය. ගමේ ඇවිදින්නට යාම පිළිබඳව ඔහු දොස් පවරනු ඇතැයි ඇයට සිතිණි. ඇය සෙමින් හිස හරවා ඔහු දෙස බැලුවාය. ඔහු ද ඒ සමගම යන්තමින් හිස හරවා ඇය දෙස බැලුවේය. ඔවුන් දෙදෙනාගේ බැල්ම මොහොතකට පැටලී තිබිණි. පළමුවෙන්ම ඉවත බැලුවේ දේවින්දිය.

"දේවින්දි ඉඳල හිටල ගමේ ඇවිදින්න යනවනෙ.. එතකොට යාළු වුණ අය වෙන්න ඇති..."

www.sinhalaelibrary.com

සූරියතැන්න මහතා පැවසුවේ දේවින්දි නිහඬ වූ බැවිනි.

"අපිත් ඉඳල හිටල ගමේ ඇවිදිනවනෙ... ඒත් අපිව මය තරම් අඳුනන අය නැහැනේ..."

ධනුෂ්ක ඇනුම් පදයක් කීවේ යයි දේවින්දිට සිතිණි. ඇගේ සිතට සියුම් කෝපයක් දැනිණි.

"මිනිස්සු ආශ්‍රය කරන්නෙ එයාලගෙ තත්වෙට ගැලපෙන අය විතරයි..."

සිතට දැනුණු සියුම් කෝපය නිසාම දේවින්දි ද ඇනුම් පදයක් කීවාය. එහෙත් එයින් සිත රිදවා ගන්නවා වෙනුවට ධනුෂ්ක සිනාවක් පෑවේය.

"අපි ගමේ මිනිස්සුන්ගෙ තත්වෙට ගැලපෙන්නෙ නැද්ද දේවින්දි..?"

"සර්ල වලව් කාරයොනෙ... මම වලව්වෙ සර්වන්ට් කෙනෙක් විතරයි. ඒ හින්දා මිනිස්සු දන්නවා මමත් එයාලගෙම පැළැන්තියෙ කෙනෙක් කියලා.. ඉතින් එයාල මගෙත්තෙක්ක කතා බහ කරන්න, මාව ආශ්‍රය කරන්න බය වෙන්නෙ නැහැ..."

දේවින්දි කියාගෙන ගියාය. එම වදන්වල මතු පිට මුදු බවක් තිබුණද ඇතුළාන්තයෙහි වූ ද්වේෂ සහගත බව ධනුෂ්කට දැනෙන්නට ඇතැයි දේවින්දිට සිතිණි. ඔහු තරයේ යටි තොල සපා ගත්තේය. මාටවී නිරන්තරයෙන්ම තමා හෙළා දකිමින් කතා කිරීමේ පළිය ගන්නට මෙන් තමා ධනුෂ්ක හමුවේ මෙසේ කතා කරන්නට ඇතැයි ඇය කල්පනා කළාය.



සැබැවින්ම මේ මොහොතේ එවදන් කටින් පිට වීම පිළිබඳව ඇයට පසුතැවිල්ලක් දැනෙමින් තිබිණි. සූරියතැන්න මහතා කිසි විටෙකත් ඇය වලව්වේ සේවිකාවක ලෙස සැලකුවේ නැත. එම නිසාම සිය වදන්වලින් ඔහුගේ සිත රිදෙන්නට ඇතැයි ඇයට සිතිණි. කාරය තුළ හිටි හැටියේම පැතිර ගිය නිහඬ බව එයට දෙස් දුන්නේය. සතුටින් හා සැහැල්ලුවෙන් ඇරඹුණු ගමනකට මෙසේ බාධක එල්ල කිරීම පිළිබඳව දේවින්දි තමාටම දොස් පවරා ගත්තාය.

ඔවුන්ට නැවත වරක් සැහැල්ලු හැඟීම් දැනෙන්නට වූයේ මහනුවර නගරයට ළඟා වූවාට පසුවය.

"සර් දළදා මාළිගාවටත් යනවද...?" දේවින්දි පසු පස හැරී සූරියතැන්න මහතාගෙන් විමසුවාය.

"මේ එක්සිඩන්ට් එකෙන් පස්සෙ ම මම මාළිගාවට ගිහින් නැහැ... ඒත් කොහොමද යන්නෙ...? වීල් චෙයාර් එක පඩි පෙළ දිගේ තල්ලු කරගෙන යන්න බැනෙ..."

ඔහු දුක්බර මදහසක් පෑවේය. අවසන් වතාවට ඔහු මාළිගාවට පැමිණෙන්නට ඇත්තේ සුජානි සමඟ විය යුතු යයි දේවින්දි අනුමාන කළාය.

"අපිට පුළුවන්නෙ අප්පච්චිව උස්සගෙන යන්න... නේද හීන් බණ්ඩා...?" ධනුෂ්ක විමසුවේය.

"එහෙමයි... අපිම මොකද බැරි බණ්ඩාර හාමුදුරුවන්ව එක්කර ගෙන යන්න..."

හීන් බණ්ඩා ද එම යෝජනාවට කැමැත්තෙන්ම එකඟ විය. සූරියතැන්න මහතා එයට එරෙහිව වදනක්වත් නොපැවසූ

www.sinhalaelibrary.com

බැවින් ඔහු දළදා මාළිගාවට යාමට කොතරම් ආශාවෙන් සිටින්නේ දැයි දේවින්දි වටහා ගත්තාය.

"කාර් පාර්ක් එකේ ඉඳල මාළිගාව ළඟට සෑහෙන දුරක් යන්න තියෙනවනෙ... ඒ නිසා වීල් චෙයාර් එක ගෙනියමු..."

දේවින්දි පැවසුවාය.

"එතකොට කොහෙද ඒක තියන්නෙ...?" ධනුෂ්ක තළල රැළි ගන්වමින් ඇය දෙස බැලීය.

"අර සපත්තු තියෙන තැන තියෙන්න පුළුවන් වෙයි..."

රෝද පුටුවට ජීවිතය සීමා වුව ද සූරියතැන්න මහතා උසට සරිලන මහතින් යුතු වූ ශක්තිමත් තැනැත්තෙකු විය. එනිසාම ඔහු ඔසවාගෙන සෑහෙන දුරක් යාම පහසු කටයුත්තක් නොවීය. ධනුෂ්ක දේවින්දිගේ යෝජනාවට එකඟ වූයේ එහෙයිනි. එහෙත් සපත්තු ප්‍රවේසම් කරන ස්ථානය කරා ගිය විට ඔවුනට මුහුණ දෙන්නට සිදු වූයේ නොසිතූ විරූ අකරතැබ්බයකටය.

"රෝද පුටුව සපත්තු දාන රාක්කෙක තියන්න බැහැ... එළියෙ තිබ්බම අපිට වගකීමක් ගන්නත් බෑ.." එහි සිටි තරුණයෝ පැවසූහ.

"දැන් මොකද කරන්නෙ...?" අසන්නාක් මෙන් තිදෙනා මුහුණින් මුහුණ බලා ගත්හ.

"සර්ල ඇතුළට ගිහින් එන්න. මම එතකම් වීල් චෙයාර් එක බලාගෙන මෙතන ඉන්නම්..."

දේවින්දි කියද්දී සූරියතැන්න මහතා වහා එයට විරුද්ධ වූයේය.



"නෑ... නෑ... දේවින්දි තනියෙන් ඉන්න ඕන නෑ... අපි ආපහු යමු..."

"මට කනි නෑ සර්... මාළිගාව මට පුරුදු තැනක් නැතක්යැ. සර්ල ගිහින් එන්න..."

සූරියතැන්න මහතා මාළිගාව තුළට යන්නට එකඟ වූයේ දේවින්දිගේ පෙරැත්තය නිසාමය. ධනුෂ්ක සහ ගීන් බණ්ඩා ඔහු ඔසවා ගත්හ. දේවින්දි මල් වට්ටියක් ඔහුගේ අතට දුන්නාය. ඔහුගේ මුහුණ හරහා දුක්බර බවක් පාවී යනු ඇයට පෙනිණි. අවසන් වතාවට මාළිගාවට පැමිණි දිනය පිළිබඳව මතක ඔහුගේ සිතට නැගෙන්නට ඇතැයි ඇය සිතුවාය.

ඔවුන් ආපසු පැමිණියේ පැය බාගයකට පමණ පසුවය. එවර සූරියතැන්න මහතාගේ මුහුණෙහි අර අඳුරු බව පහ වී ගොස් සිනා රැල්ලක් නැවරී තිබිණි.

"කොයි තරම් කාලෙකින් ද මාළිගාවට ගියෙ... හැබැයි ඉතින් හැම දේම පුදුම විදියට වෙනස් වෙලා..."

ඔහු දේවින්දිට පැවසුවේය. ඇය සිනාසුණාය. සැබැවින්ම සූරියතැන්න මහතා සතුටින් සිටීම ඇගේ සිතට ද දැනවූයේ සතුටකි.

"මාත් මාළිගාව ඇතුළට ගිහින් එන්නම් සර්..."

දේවින්දි මල් වට්ටිය ද දෝත දරාගෙන පැවසුවේ සූරියතැන්න මහතාටත් ධනුෂ්කටත් දෙදෙනාටමය.

"දේවින්දිට තනියම යන්න බෑ. ඉන්න මාත් එන්නම්..." ධනුෂ්ක පවසද්දී දේවින්දි මවිතයෙන් ඔහු දෙස බැලුවාය.

www.sinhalalibrary.com

"එහෙම නම් ඔයාල ගිහින් එන්න. මමයි හීන් බණ්ඩයි වැට ලඟමෙ ඉන්නම්..." සූරියතැන්න මහතා ද එය අනුමත කළේය.

එහෙත් ධනුෂ්කත් සමග දළදා මාළිගාවේ පඩි පෙළ නගිද්දී දේවින්දිගේ සිත වේගයෙන් ගැහෙමින් තිබිණි. එයට හේතුව බිය ද ආසාවදැයි ඇය දන සිටියේ නැත.

"හායි ධනුෂ්ක..." එක්වරම පඩි පෙළ බැස එමින් සිටි තරුණයෙකු ධනුෂ්කගේ දැතින් අල්ලා ගත්තේ මුව පුරා සිනාසෙමිනි.

"මිලාන්... උඹ කවදද ලංකාවට ආවෙ...?"

ධනුෂ්ක විමසුවේ දැඩි උද්යෝගයෙන් හා මවිතයෙන් යුතුවය. ඔහුට පිළිතුරු දෙනු වෙනුවට ආගන්තුකයාගේ දෑස රැඳුණේ දේවින්දි වෙතය. දේවින්දි මුහුණ රතු කොට ගෙන බිම බලාගත්තාය.

"ෂෙහ්... මලක් වගේ ලස්සන ගර්ල් ෆ්‍රෙන්ඩ් කෙනෙක්නෙ උඹට ඉන්නෙ... ඒක තමයි උඹ ඉක්මනට පැනගෙන ලංකාවට ආවෙ..."

මිලාන් කියද්දී ධනුෂ්ක සිනාසෙමින් දේවින්දි දෙස බැලීය.



## 10

උදෑසනින්ම අවදි වී මල් බඳුන් සකස් කිරීම දේවින්දි පුරුද්දක් වශයෙන් කළාය. ඒ සමගම සූරියතැන්න මහත්මියගේ සේයා රුව දෙස මොහොතක් බලා සිටීමට ද ඇය ප්‍රිය කළාය. සැබැවින්ම සුජාති සියලු ස්ත්‍රී ලක්ෂණවලින් අනූන කාන්තාවක් වන්නට ඇත. ඇය සැමියා හා දරුවා දමා යාම පසුපස කුමක්දෝ දුක්බර කතාන්දරයක් ඇතැයි දේවින්දිට සිතුණේ වරක් දෙවරක් නොවේ. එය සොයා ගන්නට ඇත්නම් ඇය ලියමින් සිටින පොතට හොඳ අවසානයක් නිර්මාණයක් කළ හැකිය.

සූරියතැන්න මහතා ඇය සමග මොන තරම් සතුටින් ගත කරන්නට ඇද්දැයි සිතේ මවා ගන්නට දේවින්දි වෑයම් කළාය. ඇයගේ හදිසි අතුරුදන් වීමත් සමගම ඔහු කටුවට

www.sinhalaelibrary.com

වැලුණු ඉදිබුවෙකු මෙන් ගෙතුලටම සීමා වූ ජීවිතයක් ගත කළේය. එම ඒකාකාරී දිවියට විරාමයක් ලැබුණේ දේවින්දි මෙ නිවසේ සේවයට පැමිණියාත් සමඟමය.

"ජීවත් වෙනවා කියල මට හරියටම දැනෙන්නෙ දැනුයි දේවින්දි..."

ඔහු කිහිප වරක්ම පැවසුවේය. ධනුෂ්කත් ඇයත් සමඟ දළදා මාලිගාවට ගිය ගමනින් ද ඔහු මහත් ආස්වාදයක් ලැබූ බව ඇය දැන සිටියාය. ඔහු වැව් රවුමේ හිඳගෙන අවට පරිසරය නැරඹුවේ බලවත් ආශාවෙනි.

"මෙච්චර කල් මට මේවයෙ අමුතු ලස්සනක් පෙනුණෙ නැත්තෙ ඇයි කියල හිතෙනවා..."

ඔහු දේවින්දිට පැවසුවේ සිනාසෙමිනි. එහෙත් ඒ සිනාව යටින් දුක්බර බවක් තැවරී තිබෙනු ඇයට හැඳින ගත හැකි විය.

සූරියහැන්න මහතා පමණක් නොව ධනුෂ්ක ද එම ගමනින් සතුටු වූ බව දේවින්දි දැන සිටියාය. මුලදී ඇය සේවයට ගන්නටවත් අකැමැති වූ ඔහු එදා ඇය සමඟ දළදා මාලිගාවට යන්නට කැමැත්තෙන්ම ඉදිරිපත් වූයේය. එහිදී හමු වූ මිතුරා සිතුවේ දේවින්දි ඔහුගේ පෙම්වතිය බවය. එහෙත් ධනුෂ්ක මිතුරාගේ සිතුවිල්ල නිවැරදි කරන්නටවත් ගියේ නැත. එය ද අමුත්තක් ලෙසින් දේවින්දිට දැනිණි.

"ආව ගමන් වැඩි ගොඩක හිර වුණා මචං... ඒකයි උඹලගෙ ගෙදර ආවෙ නැත්තෙ... දවස් දෙක තුනක් නතර වෙලා ඉන්න අපි තීප දෙනෙක් එනවා... කමක් නැතෙ.."



මිතුරා විමසුවේ දේවින්දි දෙස ද බලමිනි. ඇය ඔහුගේ බැල්ම මඟ හැරියාය.

"අපෝ කමක් නෑ මන වෙලාවක වරෙන්... අපේ ගෙදර ඉඩ තියෙනවා..." ධනුෂ්ක පැවසීය.

"මව.. ඉතින් වලව්වලත් ඉඩ නැත්නම් අපේ ගෙවල්වලයැ ඉඩ තියෙන්නෙ..." එසේ පැවසූ ඔහු නික්ම ගියේ ළඟදීම එන බවට පොරොන්දු වෙමිනි.

"මිනිහා මගෙත් එක්ක එංගලන්තෙ හිටියෙ... හොඳ සල්ලි කාරයා... හැබැයි හරිම පිස්සු වැඩ තමයි කරන්නෙ..."

ධනුෂ්ක පැවසුව ද දේවින්දි ඒ පිළිබඳව අදහසක් පළ කළේ නැත. සැබැවින්ම අදහසක් පළ කරන්නට නොහැකි තරම් ඇය මවිතයට පත් වී සිටියාය.

"මොනවද දේවින්දි මල් පූජා කරල ප්‍රාර්ථනා කළේ...?"

ඇය මල් පූජා කරන තුරු පසෙකට වී බලාගෙන සිටි ධනුෂ්ක විමසුවේ ආපසු එන අතුරතුරය. දේවින්දිගේ සිතේ වූ මවිතය වඩාත් දැඩි විය. ඇය ඔහු හැඳිනගෙන සිටියේ දැඩි සිතැත්තෙකු ලෙසින් මිස මෙතරම් සමීප විය හැකි අයෙකු ලෙසින් නොවේ.

"කිසිම විශේෂ ප්‍රාර්ථනාවක් කළේ නැහැ..."

ඇය පැවසුවේ කට කොනකට සිනාවක් නගා ගනිමිනි. ධනුෂ්ක ඇය දෙස බැලුවේ එවදන් විශ්වාස නොකරන බවක් අඟවමිනි.

www.sinhalaelibrary.com

"පුදුමයි ඔය වයසෙ ලස්සන කෙල්ලෙකුට ප්‍රාර්ථනා කරන්න දේවල් නැහැයි කීවම..."

"ප්‍රාර්ථනා කරන්න දේවල් තිබුණට මල් පූජා කළා කියල ඒවා ඉටු වෙන්නෙ නැහැ... මම එහෙම බලාපොරොත්තු වෙන්නෙත් නැහැ..."

දේවින්දි පැවසූ විට ධනුෂ්කගේ මුහුණින් සිනාව පලා ගියේය. ඔහු යමක් පිළිබඳව ගැඹුරින් සිතන බවක් පෙනෙන්නට තිබුණි. කල්පනා කරන්නේ මොනවාදැයි අසන්නට සිත් වුව ද එය නොමනා කමක් යයි එකෙණෙහිම ඇයට සිතිණි. ඔහුගේ සේවිකාවක වූ තමා ඕනෑවට වඩා ඔහුට ඇඟිලුම්කම් පෑ යුතු නැත. ඇය නිහඬවම ගමන් කළේ එහෙයිනි.

නුවර ගොස් පැමිණ දින ගණනාවක් ගත වුව ද ධනුෂ්කත් ඇයත් මුහුණට මුහුණ හමු වූයේ උදෑසන තේ මේසයේදී පමණකි. පසු ගිය දින කිහිපයේම ඔහු අතිශයින් කාර්ය බහුල වී සිටින බව පෙනෙන්නට තිබිණි. සමහර දිනවල රාත්‍රී කෑමට ද ඔහු සිටියේ නැත. විවාහය වෙනුවෙන් ඔහු වෙහෙසෙන්නේදැයි ඇතැම් අවස්ථාවක ඇයට සිතිණි. එහෙත් එය එතරම් ප්‍රියජනක සිතුවිල්ලක් නොවූ බැවින් ඇය කිසිවෙකුගෙන් ඒ පිළිබඳව විමසුවේ නැත.

"දේවින්දි..."

සුජානි ගේ පින්තූරය දෙසම බලා සිටි දේවින්දි තිගැස්සී හැරී බැලුවේ ධනුෂ්කගේ කට හඬටය. බනීස් සරමකින් හා අත් කොට කමිසයකින් සැරසුණු ඔහු දෑත ළය මත බැඳගෙන ඇයට පිටුපසින් සිටගෙන සිටියේය. ඔහු එම ඉරියව්වෙන්



තරමක් වෙලා සිටින්නට ඇතැයි ඇය සිතුවේ සිතට නැඟුණු ලැජ්ජාවක් ද සමගිනි.

"ගුඩ් මෝර්නින් සර්..."

ඇය සිතට නැඟුණු චකිතය මැඩ පවත්වා ගනිමින් මිමිණුවාය.

"ගුඩ් මෝර්නින්... මට මේ ටිකේම දේවින්දි එක්ක කතා කරන්නවත් බැරිව ගියානෙ..."

"සර් ඉතින් ගෙදර හිටියෙ නැනෙ කතා කරන්න..." ඇය මදහසක් නගමින් පැවසුවාය.

"මේ දවස්වල මම හරියට බිසි දේවින්දි... එස්ටේට් එකේ ප්‍රශ්න වගයක් එහෙන්... මාධවීගෙ ප්‍රශ්න එහෙන්..."

ඔහු කීවේ දෙබැම පිරිමැද ගනිමිනි. ඒවා මොනවාදැයි ඇසීමට සිත් වුව ද ඇයට අදාළ නොවන බැවින් දේවින්දි නිහඬ වූවාය. සැබැවින්ම ඇයට දැන ගැනීමට අවශ්‍යව තිබුණේ මාධවී සමග ඇති ප්‍රශ්න පිළිබඳවය.

"එක නෙවෙයි දේවින්දි... ඔයාට මතකද එදා දළදා මාළිගාවේදී මීට් වුණ මගෙ යාළුවා මිලාන්...?"

"ඔව් මතකයි..."

"මිනිහයි තව මගෙ යාළුවො දෙතුන් දෙනෙකුයි මෙහෙ එනවා කියල තියෙනවා... උන් එන්නෙ දවස් දෙක තුනක් නවතින්න... දේවින්දිට කරදරයක් වෙයි ද..?"

ඔහු විමසද්දී දේවින්දි මවිතයට පත් වූවාය.

"කරදරයක්...? මට මොනවා වෙන්න ද...?"

"නෑ නෑ බය වෙන්න එපා... ඔයා මෙහෙ ඉන්නකම් ඔයාට කිසිම කෙනෙකුගෙන් කරදරයක් වෙන්න මම ඉඩ තියන්නෙ නැහැ. මං ඇහැව්වෙ වැඩි පුර උයන එක ඔයාට කරදරයක් වෙයිද කියලයි.

ධනුෂ්ක පැවසුවේ සිනාසෙමිනි. 'ඔයාට කරදරයක් වෙන්න මම ඉඩ තියන්නෙ නැහැ' යනුවෙන් ඔහු පැවසූ හැඟුම්බර ආකාරය ඇගේ සිත සසල කළේය.

"උයන එක නම් එච්චර දෙයක්යැ..."

ඇය පැවසුවේ ඔහුගේ දෙනෙත් මඟ හැර මොහොතකට පෙර ඇය සකස් කළ මල් බඳුන දෙස බලාගෙනය.

"ගමේ කෑමවලට තමයි උන් හුගක් කැමති.. හුගක් දෙනෙකුට උයන්න තියෙන නිසා ඔය සීලල රන්මැණිකට උදව්වට අඩ ගහ ගන්න පුළුවන් වේවිනෙ..."

ධනුෂ්ක යෝජනා කළේය. දේවින්දි නැගෙන්නට ආ සිනාව ආයාසයෙන් මැඩ පවත්වා ගත්තාය. ඇය හෝටලයේදී මොන තරම් පිරිසකට කෑම ඉව්වේදැයි ඔහු දැන සිටියේ නැත.

"කොහොමත් එයාල මට උදව් කරනවා සර්"

"ඔව්... දේවින්දිට උදව් නොකර ඉන්න කාටවත් හිතෙන එකක් නෑ..."

ධනුෂ්ක පැවසුවේ දිගු සුසුමක් හෙළමිනි. මීට පෙර ද ඇය හා කතාවේ යෙදී සිටි දිනෙක ඔහු මෙවැනිම ආකාරයෙන්



සුසුමක් හෙළූ බව ඇයට මතක තිබිණි. එහෙත් එහි අරුත කිමෙක්දැයි ඇයට වැටහුණේ නැත.

"බණ්ඩාර හාමුදුරුවන්ගෙ කෝපි එක තවම හැදුවෙ නැද්ද..?"

කිසිම පූර්ව දැනුම් දීමකින් තොරව සාලයට පැමිණි පියතිලක විමසුවේ සුපුරුදු ගරු සරු විරහිත ස්වරයෙනි. ධනුෂ්කගේ මුහුණේ ඇඳුණේ අමනාපයකි.

"පියතිලක මැනර්ස් කියන දේවල් දන්නෙ නැද්ද...?"

ඔහු විමසුවත් පියතිලක එය කනකටවත් ගත් බවක් නොපෙනුණි.

"බණ්ඩාර හාමුදුරුවන්ට හොඳටම කේන්ති ගිහින් තියෙන්නෙ කෝපි එක පරක්කුයි කියලා..."

ඔහු අර සුපුරුදු පිළිකුල් සහගත බැල්මෙන් දේවින්දි දෙස බලා පැවසීය.

"සර්ට කෝපි එක දෙන්න ඕන වෙලාව මම දන්නවා.."

තදින් පැවසූ දේවින්දි කුස්සියට ගියාය. ඇය කෝපි කෝප්පය රැගෙන සූරියතැන්න මහතාගේ කාර්යාල කාමරයට යද්දී ඔහු සිටියේ මේසය අසල හිඳගෙනය. පියතිලක වහා මේසය මත වූ කොළ ගොන්නක් රැගෙන ලාච්චුවට දමා වැසුවේය. එය සූරියතැන්න මහතා ලියමින් සිටි විද්‍යා ප්‍රබන්ධය බව දේවින්දිට වැටහිණි. පියතිලක සඟවන්නට වෑයම් කළත් සූරියතැන්න මහතා ඒ පිළිබඳ සියලු විස්තර ඇයට කියා තිබිණි. ඇය සිනාව සඟවාගෙන කෝපි කෝප්පය

සූරියතැන්න මහතාට පිළිගැන්වූවාය. සුපුරුදු උපශාන්ත බව මිස කෝපයක සලකුණක්වත් ඒ මුහුණෙහි නොවීය.

"පියතිලක ගිහින් අර ලියුම රෙජිස්ටර් කරල යවන්න..."

පියතිලක කාමරයේම කැරකෙමින් සිටින දුටු සූරියතැන්න මහතා පැවසීය. පියතිලකගේ මුහුණෙහි ඇඳුණේ නොරිස්සුමකි.



## 11

මිලාන්, ප්‍රගීත් හා අයේෂ් සූරියතැන්න වලව්වට පැමිණියේ සවස් වරුවකය. ඔවුන් එදින එන බවක් දැන නොසිටි බැවින් ධනුෂ්ක නිවසේ සිටියේ නැත. සූරියතැන්න මහතා ද සුපුරුදු පරිදි සැන්දෑවේ කෙටි නින්දකට වැටී සිටියේය. ඔවුනට දොර විවර කළේ දේවින්දි විසිනි.

"හලෝ මිසිස් සූරියතැන්න... කෝ ධනුෂ්ක නැද්ද ?"

මිලාන් අනවශ්‍ය ආචාරශීලී බවකින් යුතුව විමසද්දී දේවින්දිගේ දෙකොපුල විළියෙන් රතු වී ගියේය. ඔහුගේ ඇමතුම කිසිවෙකුට ඇසුණේ දැයි බියෙන් ඈය වට පිට බැලුවාය. එහෙත් ජේන හෙෝ මානයක කිසිවෙකු සිටියේ නැත.

"ඔයා මාව නම් දන්නවනෙ... මේ ප්‍රගීත්, මේ අයේෂ්..."

මිලාන් මිතුරන් දෙදෙනා හඳුන්වා දුන්නේය. ඔවුන් දිගු කළ අත් පිළි නොගත් දෙව්න්දි දෑත එකතු කර ආචාර කළාය. ඔවුහු මුහුණින් මුහුණ බලා ගත්හ.

"එන්න ඇවිත් වාඩි වෙන්න.." ඇය ඔවුනට ඇරයුම් කළාය.

"මෙච්චර ලස්සන කෙල්ලෙක් බැන්ද නින්දා වෙන්නැති ධනුෂ්ක අපිට වෙඩින් එකවත් නොකීවෙ..."

අයේෂ් පැවසුවේ දෙව්න්දි වෙතින් දෙනෙත් ඉවතට නොගෙනමය. ඇය වඩාත් රතු වූවාය.

"උඹලගෙ හැටි ධනුෂ්කයා දන්නවනෙ. ඒ නින්දා වෙන්නැති කියන්න නැත්තෙ... ඒක නෙමෙයි මිසිස් සූරියතැන්න ධනුෂ්ක කීයට ද එන්නෙ...?"

මිලාන් විමසුවේය. ඔවුනට යථාර්ථය පහදා දීමට වේලාව පැමිණ ඇතැයි දෙව්න්දිට සිතිණි.

"මගෙ නම දෙව්න්දි... මම මෙහෙ හවුස් කීපර්..."

දෙව්න්දි සිනාසෙමින් කියද්දී ඔවුන් තිදෙනා මුහුණින් මුහුණ බලා ගත්හ. ඔවුන්ගේ මුහුණු වලින් පල වුණේ එවදන් විශ්වාස නොකරන බවකි.

"ඔහොම ගෑණියෙක් හවුස් කීපර් කෙනෙකුත් නමයි." ප්‍රවීන් පැවසුවේය.

"ධනුෂ්ක සර් එනකොට නම් ටිකක් ලේට් වෙයි... සර්ලා අද එන බව එයා දන්නෙ නැහැනෙ. ලොකු සර් නිදි..."



දෙව්න්දි වැඩි දුරටත් පැවසුවේ තමා ගෘහ පාලිකාව බව ඔවුනට වඩාත් ඒත්තු යන ආකාරයෙනි.

"විහිළු කරන්න එපා දෙව්න්දි... ඔයා වගේ කෙනෙක් හවුස් කීපර් වෙන්නෙ කොහොමද...? නෝ මාජ්...?" අයේෂ් විමසුවේය.

"මාජ් නියා. ඒ වෙනුවට තමයි මම ආවෙ... සර්ලට බොන්න මොනවා හරි හදාගෙන එන්නම්..."

දෙව්න්දි කුස්සිය දෙසට ගියේ මේ කතාව කෙටි කිරීමෙ අරමුණින් පමණක් නොව කුතුහලයෙන් යුතුව එල්ල වන බැලුම් වලින් ද මිදීමේ අරමුණිනි.

ඔවුන් නිවසට අමුත්තන් නොවන බව දෙව්න්දි දැන ගත්තේ සූරියතැන්න මහතාගේ කතා බහිනි.

"පුතාගෙ යාළුවෝ කට්ටියක් දවස් දෙක තුනක් නවතින්න එනවා කියලා දෙව්න්දි දන්නව ද...?"

ලියුමක් රෙජිස්ටර් කිරීම පිණිස පියතිලක කාමරයෙන් එළියට යැවූ සූරියතැන්න මහතා විමසීය.

"ඔව් සර්... මට දැනුයි ධනුෂ්ක සර් කිව්වෙ..."

දෙව්න්දි පැවසුවේ ධනුෂ්ක හා ඇය කතා බහ කරමින් සිටි බව පියතිලක විසින් සූරියතැන්න මහතාට කේළමක් වශයෙන් කියා ඇතැයි සිතුණු නිසාය. ඇය ධනුෂ්ක සමග කතා බහ කරනු දකිම පියතිලක නොරුස්සන බව දෙව්න්දි දැන සිටියාය. ඔහු ඒ කේළම මාධවීට ද කියනු ඇත. එවිට මාධවී ඇය සමග වඩාත් වෛර බැඳ ගනු නොඅනුමානය. එහෙත්

www.sinhalaelibrary.com

කිසිදු වරදක් නොකළ බැවිනුත් සූරියතැන්න මහතා තමාගේ පැත්ත ගන්නා බව දැන සිටි බැවිනුත් බිය වීමට හේතුවක් නැතැයි ඇය සිතුවාය.

"අර කැලුම් වගේම මය එනවා කියන ළමයිනුත් පුතාගෙ හොඳ යාළුවො.. මේ ගෙදර දවස් ගණන් ඉඳල ගිහින් තියෙනවා... ඒත් දේවින්දි ටිකක් පරිස්සමට ඉන්න..."

සූරියතැන්න මහතා කෝපි කෝප්පය පානය කරන අතරතුර සන්සුන් හඬින් පැවසුවත් ඉන් දේවින්දි තිගැස්සී ගියාය. ඇය ඔහු දෙස බැලුවේ විඳහා ගත් දෑස් වලින් යුතුවය.

"ඇයි සර් එහෙම කිව්වෙ...?"

"නෑ... නෑ දේවින්දිට බය වෙන්න දෙයක් නෑ... ඒත් ඉතින් තරුණ වයසෙ ළමයිනෙ... හිත් කියන ඒවා කොයි කොයි අතට දුවනව ද කියලා අපිට කියන්න බෑනෙ... ඒ නිසා පරිස්සම් වෙන එක කොහොමටත් හොඳයි..."

"මං ඉන්නකම් දේවින්දිට කරදරයක් වෙන්න ඉඩ දෙන්නෙ නැහැ"

ධනුෂ්ක පැවසූ ආකාරය ඇයට සිහිපත් විය. එවදන් වලින් ඇගේ සිතට දැනුණේ ශක්තියක් සමග එක් වූ අමුතුම හැඟීමකි. මේ මොහොතෙහි ද ඇයට ඒ හැඟීම දැනිණි.

"මම පරිස්සම් වෙලා ඉන්නම් සර්..." ඇය මිමිණුවාය.

ධනුෂ්කගේ මිතුරන් ඔහු මෙන් නොව සැහැල්ලු විනෝදකාමී පැවතුම් ඇත්තවුන් බව දේවින්දිට වැටහිණි. එවැන්නවුන් සමග කල් ගත කිරීම අසීරු නොවනු ඇතැයි



ඇයට සිතිණි. එහෙත් සූරියතැන්න මහතා පැවසූවාක් මෙන් ඔවුන්ට වඩාත් සමීප වීමෙන් වැළකී සිටීම නුවණට හුරුය.

"මචං මට නම් ඒ කතාව විශ්වාස කරන්න බෑ. මෙච්චර ලස්සන කෙල්ලෙක් කොහෙද හවුස් කීපර් වෙන්නෙ...? ඊටත් බලපන් ඉංගිලිෂ් වලින් කතා කරපු ලස්සන..."

දොඩම් වීදුරු තුනක් ද සහිත බන්දේසිය රැගෙන සාලයට එද්දී පුහින් කියනු දේවින්දිට ඇසිණි. ඔවුන්ගේ කතා බහට තව දුරටත් සවන් දෙනු රිසියෙන් ඇය කුළුණකට මුවා වී එලෙසම නැවතුණාය.

"ඒක නම් එච්චර දෙයක් නෙමෙයි. ඉස්සර මෙහෙ හිටිය මාලින් හොඳට ඉංග්ලිෂ් කතා කළේ. ඒත් හැබැයි මේ වගේ ගර්ල් කෙනෙක් හවුස් කීපින් වාගෙ ජොබ් එකක් කරනවා කිව්වම හරි පුදුමයිනෙ..." අයේෂ් පැවසුවේ කල්පනාකාරී හඬකිනි.

"ලංකාවේ ඒ වගේ දෙයක් සිද්ධ වුණ එකට තමයි මටත් පුදුම හිතෙන්නෙ..." පැවසුවේ මිලාන්ය.

"අපේ මැන්ගේ පින තමයි මචං. බලපන් අපිට ඉන්න සෙකට්‍රිලවත් මෙච්චර ලස්සන නැහැනෙ... මේකි නම් සුරංගනාවියක් වගේ..."

"අපි පැණි පෙරුවට වැඩක් නෑ මචං... ධනුෂ්කයා ගානට කොක්ක දාගෙන ඇති..."

"මං හිතන්නෙ නෑ අර මාධවී ද කවුද ඉන්නවනෙ උගෙ කරේ එල්ලෙන්න බලාගෙන. හැබැයි විශ්වාස කරපල්ල මචං.

මම එදා මාළිගාවෙදි ධනුෂ්කයි දේවින්දියි දක්කෙ... මැචින් කපල්... මාධවී මොන මල හෝන්තුවක් ද මේ කෙල්ලත් එක්ක බලනකොට... මං හරි සන්තෝස වුණා ධනුෂ්ක වෙන කෙනෙක් මැරි කරල කියලා..." මිලාන් පැවසීය.

ඔවුන් තමා පිළිබඳව කතා බහ කරන දේවල් ඇසීමෙන් දේවින්දි තුළ ලජ්ජාවක් මෙන්ම ආඩම්බරයක් ද ඇති විය. ඔවුන් මාධවී හෙළා දක කතා කිරීම ඇගේ සතුටට ද හේතු විය.

"හැබැයි ආයෙ දෙකක් නෑ... දේවින්දිට කොල්ලෙක් නැත්නම් කවුරු හරි එපා කිව්වත් මම ජීවිත බඳිනවා බඳිනවාමයි..."

එය පැවසුවේ ප්‍රගීත් ද අයේෂ් දැයි දේවින්දිට වෙන් කොට හැඳින ගත නොහැකි විය. ඇයට සිනා යන්නට ආවේය. ඇය ආයාසයෙන් සිනාව මැඩ පවත්වා ගෙන ආපසු හැරුණේ අඩි ශබ්දයක් ඇසුණු බැවිනි. පියතිලක ඇය අසලම සිටගෙන සිටියේ සුපුරුදු ලෙසම මුහුණ පුළුටු කරගෙනය.

"මෙතෙන්ට වෙලා හොර ගල් අහුලන්නෙ නවත් පිම්මක් පනින්න වෙන්නැති..."

ඔහු පැවසුවේ කට කොන ඇද කරමිනි. එයින් ඔහුගේ මුහුණට වඩාත් විරූපී බවක් එක් විය.

"අපිට නම් පුරුදු නෑ ඒවා... අනුන්ගෙ කාමර ළඟට වෙලා හොර ගල් අහුලල පුරුදු අය තමයි ඔවා කියන්නෙ..."

දේවින්දි පැවසුවේ ඔහුගේ මුහුණට දැඩි බැල්මක් හෙළමිනි. නිමේෂයෙකින් ඔහුගේ මුහුණ වෙනස් වී ගියේය.



"කෝ මෙහෙ දෙනවා මං වත් ඕක ගිහිල්ලා දෙන්න..."

ඔහු ඇයට දෑත පෑවේ සිතේ ඇති වූ චකිතය මැඩ පවත්වා ගන්නට මෙනි.

"නෑ මහත්සි වෙන්න ඕන නෑ. මට පුළුවන්..." ඇය පැවසුවේ සරදම් හඬිනි.

"තමුසෙ උඩ පනිනවා බොහොම වැඩියි. උඩ පැන්නොත් ඉක්මනට බිම වැටෙනවා කියලා හොඳට මතක තියා ගන්නවා..."

දත් මිටි කමින් පැවසූ පියතිලක එතැනින් නික්ම ගියේ දේවින්දි දෙස රවා බලමිනි. ඒ බැල්මෙන් ඇය සසල නොවූවත් ඔහුගෙ වදන් තදින් ඇගේ සිතට වැදිණි. ඔහු තමාගෙන් පළි ගන්නට කුමක් හෝ උපායක් යොදනු නිසැකය. එයට මාධවීගෙන් ද නොමඳ සහයෝගයක් ලැබෙනු ඇත.

"මුහුද හත් ගව්වක් තියෙද්දී නාන්න ලෑස්ති වෙන්න ඕන නෑ... එන එන විදියට හැම දේටම මූණ දෙනවා"

අධිෂ්ඨාන පූර්වකව සිතූ ඇය බිම වීදුරු සහිත බන්දේසිය ද දෑත දරාගෙන ධනුෂ්කගේ මිතුරන් වෙත ගියාය.

මුලදී දේවින්දිගේ සිතේ නොසන්සුන් බවක් ඇති කළ නමුත් ධනුෂ්කගේ මිතුරන් පිරිස සුහදශීලී අය වූහ. ඔවුන්ගේ විහිළු, තහළු, ප්‍රිය සංවාද ආදිය නිසා සූරියතැන්න මහතා සිටියේ ද වෙනදාට වඩා ප්‍රබෝධයෙනි. නිවසේ වැඩ බහුල වූ බැවින් දේවින්දිට වෙනදා මෙන් මිතුරියන් හමුවන්නට ගමේ ඇවිදින්නට ද නොහැකි විය. එහෙත් ඇයට පාළුවක් දැනුණේ නැත.

www.sinhalalibrary.com

"අනේ දේවින්දි වදින්නම්... අපිට සර් කියල නම් කතා කරන්න එපා. එතකොට හිතෙන්නෙ අපිත් අන්කල්ගෙ වයසෙ කියලා... ඊටත් වැඩිය එතකොට අපි හරි ඇතයි."

මුල්ම දිනයේ ඔවුහු දේවින්දිට පැවසූහ. ඔවුන්ගේ සුහදශීලි බව හමුවේ එවන් දුරස්තර බවක් තබා ගැනීමට ඇය කැමති වූයේ ද නැත. එම නිසාම ඇය කැමැත්තෙන්ම ඔවුන්ට නම්වලින් පමණක් ඇමතුවාය.

ඔවුහු මේසය සකස් කරන්නට මෙන්ම මේසය අස් පස් කරන්නට ද ඇයට සහාය වූහ. ඇතැම් විටෙක ඇය උයන තුරු කුස්සියට වී කතා බහ කරමින් සිටියහ. වැඩිපුරම ඇය සමග ගැවසෙන්නට ප්‍රිය කළේ අයේෂ්ය.

"අයේෂ්... උඹ මොකාට ද එන්න හදන්නෙ...?"

ඇතැම් විටෙක අනෙක් මිතුරන් ඔහුට විහිළු කරනු දේවින්දිට ඇසිණි.

"උඹල හිතන්නෙ මොකාට කියල ද...?"

"හැබැයි මම එකක් කියන්නම්. දේවින්දිට කොත්ත දා ගන්න උඹට හම්බ වෙන එකක් නැ මචං..."

"අමාරුවෙන් දිනා ගන්න දේවල්නෙ මචං වටින්නෙ..."

"ඒ වටින්නෙත් දිනා ගන්න කම් විතරයි... ඒ හින්දා හැමදාම ට්‍රයි කර කර හිටපන්. එතකොට හුඟක් වටිනවා..."

"දේවින්දි වගේ ගර්ල් කෙනෙක් මම ලෝකෙ මොන රටකදිවත් දැකල නැ මචං... බලපන් ඒකිට ගෑණියෙකුට තියෙන්න ඕන හැම සුදුසු කමක්ම තියෙනවා..."



"ඒක නම් ඇත්ත... මමත් දැකල තියෙන්නෙ ලස්සන තියෙනවා නම් ඒ ගත්තන් ඒකත්වත් හදා ගන්න දන්නෙ නැති, උයන්න දන්නව නම් මූණ බලන්න බැරි තරම් කැත උන්ම තමයි... කොහොම වුණත් දේවින්දි නම් ලේසියෙන් කාටවත් වැටෙන කෙනෙක් නෙමෙයි වගේ..."

අහම්බෙන් කන වැකෙන මෙවන් කතා බහ දේවින්දිගේ සිත තුළ ආඩම්බරයක් මෙන්ම බියක් ද ඇති කරලීමට සමත් විය. කෙසේ වුව ද මේ නිවස තුළ සිටින තාක් කල් තමා ආරක්ෂිතයයි හැඟීම ඇයට දැනවූයේ සැනසීමකි. මිතුරන් සීමා ඉක්මවා ඇයට විහිළු කළහොත් ධනුෂ්ක පමණක් නොව සූරියකාන්ත මහතා ද ඔවුන් වෙත අවවාදාත්මක බැල්මක් හෙළීය.

"අපි අද පික්නික් එකක් යන්නයි ලෑස්ති වෙලා ඉන්නෙ දේවින්දි... ඔයත් එනව ද අපිත් එක්ක යන්න...?"

ඉරිදා උදේ දේවින්දි කෑම මේසය සකස් කරමින් සිටියදී එතැනට පැමිණි ධනුෂ්ක විමසුවේය. දේවින්දි මොහොතක් කල්පනා කළාය. ඇය විනෝද චාරිකා යාමට කැමති බව සැබෑවකි. එහෙත් කිසිදු යුවතියක සහභාගි නොවන ගමනකට ඇය පමණක් එක් වීම නොමනා යයි ඇයට සිතිණි. ඇය පිළිතුරක් දීමට පෙර ධනුෂ්කගේ මුහුණ දෙස බලා සියුමැලි සිනාවක් පෑවාය. ධනුෂ්ක එදෙස බලා සිටියේ වශී වූ කලෙක මෙනි. එහෙත් ඊළඟ මොහොතේ වරදක් කළ විටෙක මෙන් තිගැස්සුණු ඔහු වහා සිය දෑස් ඇය වෙතින් ඉවතට ගත්තේය.

"ලොකු සර් විතරක් තනියෙම දාල යන එක හරි නැහැනෙ... ඒ හින්දා මං ඉන්නම්... උයන්නත් තියෙනවනෙ..."

"නෑ නෑ අප්පච්චිව දාල යන්නෙ නෑ... අනිත් එක හුඟක් දුරකටත් නෙමෙයි යන්නෙ... පේරාදෙණිය ගාඩින්ස්..."

දෙව්න්දිගේ දෙනෙත් පුබුදු විය. ඇය බොහෝ කලෙකින් පේරාදෙණිය මල්වත්තට ගොස් තිබුණේ නැත. පාසල් අවධියේදී නම් සති දෙකකට වතාවක්වත් මිතුරියන් සමග ගොස් විනෝද වී එමට ඇය පුරුදුව සිටියාය. සැබැවින්ම එවන් ගමන්වලින් ලත් ආස්වාදය ඇගේ බොහෝ තවකත්ත තුළ පිළිබිඹු වී තිබිණි.

වරක් ඇය කෝකිල සමග ද පේරාදෙණි මල් වත්තට ගියාය. කොළඹ සිට ඔහුගේ මෝටර් බයිසිකලයෙන් පැමිණි සතුටත් බියත් මිර ක්‍රියාවක් කිරීමේ ආස්වාදයත් මුසු වූ ඒ ගමන කිසිදාක ඇගේ මතකයෙන් ඈත් නොවන්නකි. ඔහුගේ ඉග ඇතින් බදා තුරුළු වීගෙන ආ ගිය ගමන් අමතක වූයේ ඔහුට මිස තමාට නොවේ. කුඩා සිදු වීමක් පාදක කොට ගෙන මුළු අතීතයක්ම අමතක කරන්නට තරම් ශක්තියක් ඔහුට තිබිණි. එසේ නම් ඔහු තුළ ඇය වෙනුවෙන් සැබෑ ආදරයක් පැවතිණැයි අනුමාන කිරීමටත් නුපුළුවන. දෙව්න්දිට නොදැනුවත්වම දිගු සුසුමක් හෙළිණි. සිය මුහුණේ වෙනස් වූ ඉරියව් ධනුෂ්කට නොපෙනෙන සේ මුහුණ ඉවතට හරවා ගත් ඇය මේසය මත වූ ආහාර බඳුන් එහා මෙහා කරන්නට වූවාය. එහෙත් ඕනෑකමින් ඇය දෙස බලා සිටි ධනුෂ්ක එම වෙනස පැහැදිලිවම දිටිය.

"ඇයි දෙව්න්දි පේරාදෙණිය ගාඩින්ස් ගැන කියනකොට බොයි ෆ්‍රෙන්ඩ් මතක් වුණා ද...?"

ධනුෂ්ක විමසුවේ සරදමට මෙනෙමේ. ඇය තදින් යටිතොල සපා ගත්තාය.



"මතක් වෙන්න එහෙම කෙනෙක් ඉන්න එපායැ..." ඇය පැවසුවේ මඳ නිහැඩියාවකට පසුවය.

"හිටියෙත් නැද්ද...?"

ඔහු ඕනෑකමින් ඇගේ මුහුණ දෙස බලාගෙන විමසුවේය.

"හිටියා... ඒත් දැන් නැහැ..."

දෙව්න්දි පැවසුවේ ඇසෙන නෑසෙන තරම් හීන් හඬිනි. සැබැවින්ම ඇය ඕනෑකමින් අමතක කරන්නට උත්සාහ දරන අතීත සෙනෙහසේ මතකය නැවත සිහිපත් කිරීම සිතට වේදනාවක්ම විය.

"අයි ඈම් වෙරි සොරි දෙව්න්දි... මං ඒක ඇහුවෙ ඔයාගෙ හිත රිදවන්න හිතාගෙන නෙමෙයි..."

ධනුෂ්ක පැවසුවේ සැබෑම පසුතැවිල්ලකින් යුතුවය. ඇය සියල්ල අමතක කළ නියායෙන් මඳ සිනාවක් පෑවාය.

"නෑ... සර්... මගෙ හිත රිදුනෙ නැහැ."

"ඒ වුණාට ඔයා අහල ඇතිනෙ මුණ හදවතේ කැඩපතයි කියල කියමනක් තියෙනවා..."

ධනුෂ්ක පැවසුවේ ඉංග්‍රීසියෙනි. දෙව්න්දිට ලැජ්ජාවක් දැනුණේ තමා බොරුවක් කී බව ඔහුට වැටහෙන්නට ඇතැයි සිතුණු නිසාය.

"ධනුෂ්ක දෙව්න්දිට පික්නික් එක ගැන කිව්ව ද මචං...?"

www.sinhalaelibrary.com

අසාගෙන මිලාන් පැමිණි බැවින් එම කතාව එතැනින් නැවතිණි. එය දෙව්න්දිගේ සිතට දැනවූයේ සතුටකි.

"මේ මං කිය කියා හිටියෙ ඒක තමයි මචං..."

"ආ ඒක ද...? මං හිතුවෙ වෙන දෙයක් කියලා..." මිලාන් සැහැල්ලුවෙන් සිනාසුණේය. "ඒක නෙමෙයි දෙව්න්දි ඔයා එනව නේද යන්න...?"

"මං ගියොත් ලන්ච් හදන්න කවුරුවත් නැනෙ... මං ඉන්නම්..."

දෙව්න්දි පවසද්දී මිලාන් වහා එයට හරස් විය.

"නෑ නෑ දෙව්න්දි අපි ඔක්කොම එකතුවෙලා ලන්ච් හදාගෙන යමු..."

"ඊට වැඩිය හොඳයි අපි හොටෙල් එකකින් ලන්ච් ගනිමු..." ධනුෂ්ක පැවසීය.

"අපෝ... එහෙම කළාම පික්නික් එකේ ජොලිය එහෙම පිටින්ම නැති වෙනවා... අර ගඟ අයිනෙ ගහක් යට ඉඳගෙන බත් එක දිගෑරගෙන කනකොට තමයි පික්නික් එකක් ආවා කියල දැනෙන්නෙ..."

"හරි... හරි.. එහෙම නම් ඉක්මනට කාල ඉවර වෙලා අපි දෙව්න්දිට උයන්න උදව් කරමු... කෝ අරුන් දෙන්නටත් කතා කරපන්... දෙව්න්දි අප්පච්චිටත් එන්න කියන්න..." කියාගෙන ධනුෂ්ක මේසයට වාඩි විය. මිලාන්ගේ මුහුණේ සිනාවක් ඇඳිණි.

"අන්න එහෙම වරෙන් මචං..."



ධනුෂ්කගේ පිටට පහරක් ගැසූ මිලාන් එතැනින් ඉවත් වී ගියේය. පොරොන්දු වූ පරිදිම දිවා ආහාර සැකසීමට උදව් වීම පිණිස ඔවුහු කුස්සියට පැමිණියහ. එය දෙව්න්දිට උදව්වකට වඩා අපහසුවක් විය. රත්මැණිකා හා ගීලා ද එම දසුන නැරඹුවේ පුදුමයෙන් මෙනි. ධනුෂ්ක කිසිම දිනයෙක කුස්සියේ වැඩකට උදව් වෙනවා ඔවුන් දැක තිබුණේ නැත.

"අද රත් මැණිකටයි ගීලටයි නිවාඩු... ඔයාල වෙනුවට අපියි දෙව්න්දිට උදව් වෙන්නෙ..."

ප්‍රගීත් පවසද්දී එයට එරෙහිව හෝ එකඟව යමක් කීමට තරම් දිරියක් නොමැති වූ රත්මැණිකා ගෙල පසෙකට ඇළ කොට හිස කසමින් බෑගෑපත් සිනාවක් පෑවාය.

"කෝ දෙන්න දෙව්න්දි මම පොල් ගාල දෙන්නම්..." අයේෂ් ඉදිරිපත් විය.

"උඹ ඉතින් මෙච්චර කල් කළෙත් පොල් ගාන එකම තේන්නම්.." ධනුෂ්ක සිනාසුණේය.

"දෙව්න්දි අපි අද කැකුළු හාල් බත් උයල කරවල බැදල පොල් සම්බෝලයක් හදල පරිප්පු උයලා ගනිමු. එතකොට නියමයි..." මිලාන් යෝජනා කළේය.

"වට් අ ග්‍රේට් අයිඩියා මචං කෙසෙල් කොළේක එහෙම බත් එකක් කන්න තියෙනවා නම් දිව්‍ය භෝජන පරදයිනෙ..."

"මට ලේසියි එහෙම හදන එක..." දෙව්න්දි සිනාසී ඔවුන්ගේ අදහසට එකඟ වූවාය.

"මේක හරියට නාඩගම් මඩුවක් වගේනෙ... මෙච්චර

කාලෙකට වලව්වෙ නොතිබ්බ දේවල්නෙ දැන් බලන්න තියෙන්නෙ..."

එක්වරම දොරකඩින් ඇසුණේ මාධවීගේ කර්ණ කටුක හඬය.

සියලු දෙනාම දොර දෙස හැරී බැලුවේ එකට කතා කරගත්තා මෙනි. කලවා වලින් අඩකටත් වඩා නිරාවරණය වන තරමේ කෙටිම කෙටි කලිසමකින් හා අත් නැති කර පළල් ටී ෂර්ටයකින් සැරසුණු මාධවී දොරකඩ අසල සිටගෙන ඔවුන් දෙස බලා සිටියේ ගිනි පුපුරු විසි වෙන දෑසිනි. ඇය හැඳ සිටි ඇඳුම දුටු විට ලජ්ජා සිතුණේ දේවින්දිටය. මාධවී රූමත් බව සැබෑවකි. එහෙත් එම රූමත් බව වටින්නේ නිරාවරණය වූ කල නොව සැඟවූ කල යයි දේවින්දිට සිතිණි.

මාධවී දුටු විගසම ප්‍රතීත්ගේ මුවින් සිනුරුහන් හඬක් නික්මිණි.

"මචං මේ පැත්තට ගං වතුර ද...?" මිලාන් විමසීය.

ධනුෂ්කගේ මුහුණ පුරා නොරිස්සුමක් ඇඳෙනු දේවින්දිට පෙනිණි. එය සිය මිතුරන් වෙනුවෙන් නොව මාධවී වෙනුවෙන් බව දේවින්දිට වැටහිණි.

"මචං ධනුෂ්ක උඹට නම් මාධවීගෙ ඇඳුම්වලට යන වියදම එහෙමම ඉතුරු වෙයි. රෙදි මීටර් බාගයක් හොඳටම ඇතිනෙ මේ වගේ ඇඳුමක් මහන්න..."

අයේෂ්ගේ කතාවෙන් මුවට නැඟුණු සිනාව දේවින්දි පාලනය කර ගත්තේ අසීරුවෙනි. එහෙත් ධනුෂ්ක හැර



අනෙක් අය හඬ නගා සිනාසුණහ. සියලු දෙනාටම එක වර පහර දීමට තරම් කෝපයක් මාධවී තුළ ඇති බව ඇගේ ඉරියව්වලින්ම පෙනිණි. එහෙත් ඇය එතැනින් ඉවත්ව ගියේවත් ධනුෂ්ක ඇය වෙත ගියේවත් නැත. දේවින්දිගේ සිතට අවිනීත සතුටක් දැනිණි.

"එන්න මාධවී ඔයත් අපිට හවුල් වෙන්න..." මිලාන් ආරාධනාත්මක ස්වරයෙන් පැවසීය.

"මම හවුලේ වැඩට කැමති නෑ... අනික් එක මම කුස්සි අම්මා කෙනෙක් නෙමෙයිනෙ..."

ඇය කෝපයෙන් පුපුරා හැලෙමින් පැවසුවේ දේවින්දි දෙස බලාගෙනය.

"හැම ගැණියෙක්ම උයන්න පිහන්න දැනගෙන ඉන්න ඕන මාධවී... ඒකට කුස්සි අම්මා කෙනෙක්ම වෙන්න ඕනෙ නැහැ.."

මෙතෙක් නිහඬව සිටි ධනුෂ්ක පැවසුවේ දේවින්දි ආරක්ෂා කර ගන්නට මෙනි. මාධවී අඩියක් දෙකක් කුස්සිය තුළට ආවාය. දැන් දැන් බරපතල ගැටුමක් ඇති වෙතැයි හැඟීම දේවින්දිගේ සිත තුළ පිළිසිඳිණි.

"සර්ල එළියට යන්න... මම තනියම උයා ගන්නම්..." ඇය පැවසුවේ එනිසාය.

"කට්ටියත් එක්ක නාඩගම් නටල නටල මේවට කුස්සියටත් ගෙන්න ගත්තා... මං උඹේ හැටි දන්නෙ නැ කියල ද හිතේ...?"

www.sinhalaelibrary.com

දේවින්දි ඉදිරියට ගිය මාධවී දේඅත් මිට මොලවාගෙන දත් මිටි සපමින් විමසුවාය. දේවින්දි ගැටුම් ප්‍රිය කළේ නැත. එහෙත් අසාධාරණය හමුවේ කට පියාගෙන සිටීම ද ඇගේ පිළිවෙත නොවීය.

"මිස් මාධවී ශීලාචාර විදිහට කතා කරන්න ඉගෙන ගන්න..."

දේවින්දි පහත් වූත් දැඩි වූත් හඬකින් අණ කළාය. එයින් වූයේ මාධවීගේ කෝපය වඩාත් වැඩි වීමය.

"මට කතා කරන්න උගන්නන්න උඹ කවුද...?" ඇය විමසුවේ අමිහිරි ස්වරයකිනි.

"දේවින්දි කවුද කියන එක නෙමෙයි.. ඔයා කවුද කියන එක නම් අපි දැන් හොඳට අඳුන ගත්තා මාධවී. ධනුෂ්ක උඹ මාධවී එක්ක එළියට පලයන්... අපි උයා ගන්නම්..."

මිලාන් පැවසුවේ කළකිරුණු හඬිනි. සැබැවින්ම මාධවීගේ හැසිරීම ඔවුන් තිදෙනාගේම සිත් කළකිරීමට පත් කරවා තිබිණි. ධනුෂ්ක ඔවුන් ඉදිරියේ අසරණ බවට පත් වී සිටිනු දුටු දේවින්දිගේ සිතට ඇති වූයේ වේදනාවකි. ඔහු කිසිම දිනෙක එබඳු අසරණ බවකින් සුතුව දුටු බවක් ඇයට මතක නැත. ඔහු සුසුමක් හෙළා කුස්සියෙන් පිට වී ගියේ මාධවී දෙසවත් නොබලාය. මාධවී තවමත් පොරයකට සූදානම් වන බැළලියක් මෙන් දේවින්දි දෙසම බලාගෙන සිටියාය. ඇය සිය පරාජය පිළි ගන්නට සූදානම් නැති සෙයකි.

"මාධවී, දැන් ඔයා නාඩගම් ගැන කතා කළා නේද...?"



හිටි හැටියේම ප්‍රවීන් විමසද්දී මාධවී ඔහු දෙස බැලුවේ තිගැස්සමිනි.

"නාඩගම් කියන්නෙ මොනවද කියලා ඔයා දන්නව ද..?"

මාධවී නිරුත්තරව ප්‍රවීන් දෙස බලා සිටියේ ඔහු සරදම් කරන්නේ ද යන්න වටහා ගැනීමට නොහැකි වූ බැවිනි.

"නාඩගම් කියන්නෙ අපේ සංස්කෘතියේ එක අංගයක්"

ප්‍රවීන් පැවසුවේ දැනුම් තේරුම් ඇති අයෙකු මෙනි.

"මම දන්න සංස්කෘතියක් නෑ..." මාධවී ප්‍රවීන්ට කඩා පැන්නාය.

"හැබැයි ඒක නම් අපි හොඳට තේරුම් ගත්තා මාධවී. මොකද උඩරට කුමාරිහාමිලා කිසිම දවසක ඔය විදිහට බාගෙට ඇඳුම් ඇන්දෙ නෑ..." යනුවෙන් පැවසුවේ අයේෂ්ය. මාධවී තදින් යටි තොල සපා ගත්තාය.

"උඩරට මැණිකේ මනහර කඳුරට තිලකේ

ඔසරි මාල වළලු කුරු හවරි ඔබට හරි අගේ...

කියලා සිංදුවකුත් තියෙනවනේ..."

"ඒක තමයි... දැන් ඔයාම ටිකකට ඉස්සර වෙලා කිව්වනෙ මේ වලව්වෙ කවදාවත් තිබුණෙ නැති දේවල් දැන් තියෙන්නෙ කියලා... අපි ඉස්සරත් මෙහෙ ආවනෙ... කවදාවත් කවුරුවත් ඔය විදිහට නම් හිටියෙ නෑ..."

ඔවුන් තිදෙනා මාරුවෙන් මාරුවට කියද්දී නව ඉරටත්

www.sinhalaelibrary.com

කුස්සියේ රැඳී නොසිටි මාධවී කෝපයෙන් යුතුව ඉග ගස්සාගෙන පිට වී ගියාය. ඔවුන් තිදෙනාගේ සිනාවට එක් නොවී සිටින්නට දේවින්දිට හැකියාවක් නොවිණි. මාධවී එය දුටුවේ නම් නිසැකයෙන්ම ඇයත් සමග තවත් අමනාප වෙනවා ඇත.

"මාධවී මොකද දේවින්දි එක්ක තරහින් ඉන්නෙ...?" අයේෂ් විමසීය.

"අනේ මන්දා..." දේවින්දි දෙළරමීස් සැලුවාය.

"තරගයක් ඇති වෙයි කියල බයට වෙන්න ඇති.." ප්‍රගීත් සිනාසුණේය.

"මගෙත් එක්ක එයාට මොන තරගයක් ද ප්‍රගීත්...? මේ වලව්වෙ අයිති කාරී වෙන්න ඉන්නෙ එයා. මම සර්වන්ට කෙනෙක් විතරයි..."

දේවින්දි පැවසුවේ සුසුමක් ද හෙළමිනි. සිය රැකියාව පිළිබඳව ඇය තුළ කලකිරීමක් තිබුණාම නොවේ. එහෙත් මෙමොහොතේ කුමක්දෝ මදි පුංචි කමක් පිළිබඳ හැඟීමක් ඇයට දැනිණි. සැබැවින්ම ඇය මාධවීට කිසිසේත්ම දෙවැනි විය යුතු අයෙකු නොවේ.

"හැබැයි තරගයක් තිබ්බොත් නම් වැඩි ලකුණු ගණනකින් දේවින්දි දිනනවා..." ප්‍රගීත් පැවසුවේ අයේෂ් දෙස ද නෙතු කොනින් බලමිනි.

"ඒ තරගයක් තිබ්බොත්නෙ... මම දේවින්දිව පත් කරගන්නෙ නිතරගයෙන්මයි..."



ඔහුගේ බැල්ම හැඳින ගත් අයේෂ් එසේ පැවසීය. දේවින්දිගේ සිතට සිහින් තිගැස්මක් දැනිණි. එහෙත් ඇය එය පිටතට පෑවේ නැත.

"අනේ මිචං, උඹත් ඉඳල හිටල මාර හීන දකිනවනෙ..." මිලාන් සිනාසුණේය.

දේවින්දි බත් එතීම සඳහා කෙසෙල් කොළ කැපීමට ගියේ රන්මැණිකා ද සමගිනි. රන්මැණිකා වටපිට බලා රහසක් කියන්නට මෙන් දේවින්දිගේ කනට මුව ළං කළාය.

"ඩිංගිරි හාමුදුරුවන්ට හොඳටම කේන්ති ගොහින්... දේවින්දි නෝනා රස්සාවෙන් අස් කරල දාන්ට කියලා පුංචි බණ්ඩාර හාමුදුරුවන්ට කියනවා ඇහුණා..."

රන්මැණිකා පැවසුවේ මහා විපතක් සිදු වෙන්නට ආසන්න යැයි අඟවන හඬකිනි. එහෙත් දේවින්දි කළේ සැහැල්ලු සිනාවක් පෑම පමණකි. මාධවී මොන බලපෑමක් කළ ද දේවින්දි රැකියාවෙන් ඉවත් කරන්නට සූරියතැන්න මහතා කැමති නොවන බව ඇය හොඳ හැටි දැන සිටියාය.

"එක රස්සාවක් නැති වුණාට තව කොච්චර රස්සාවල් හොයා ගන්න පුළුවන් ද රන්මැණිකා...?"

"ඒක නම් ඇත්ත නෝනා... රස්සාවල උප් පාත් කං හොයන්ට ගියහම තමයි. අපේ කෙල්ලන්ට වාගෙ රස්සාවක් නෑ කියලා හුල්ල හුල්ල ඉන්ට වෙන්නෙ..."

ඔවුන් කෙසෙල් කොළ කපාගෙන එන විට මිතුරන් තිදෙනා කුස්සියේ සිටියේ නැත. බත් පාර්සල් කීයක් බැඳිය යුතු දැයි ඇසීමට දේවින්දිට අවශ්‍ය විය.

www.sinhalaelibrary.com

"මම බත් පාර්සල් කීයක් හදන්න ද කියල අහගෙන එනකම් රන්මැණිකා කෙසෙල් කොළ ටික තවන්නනෙ..."

සාලය දෙසට යද්දී මාධවීගේ උස් කටහඬ සවන් වැකුණු බැවින් දේවින්ද්‍රි එලෙසම නැවතුණාය.

"මම ඔයාට කීප සැරයක්ම කිව්වා ධනුෂ්ක... වැඩ කාරියො වැඩ කාරියො විදිහට තියා ගන්න. එහෙම නැත්නම් උන් කරේ නගින්න එනවා..."

"දේවින්ද්‍රි ඒ වගේ කෙනෙක් නෙමෙයි මාධවී.."

"මට දැනට මේ ගෙදර දේවල් ගැන කතා කරන්න බලයක් නෑ කියලනෙ ඔයාලා හිතාගෙන ඉන්නෙ... අපේ වෙඩින් එක ඉක්මනටම ගනිමු... ඊට පස්සෙ කරන දේවල් මම බලා ගන්නම්..."

මාධවී පැවසුවේ අධිරාජිනියකගේ ස්වරයෙනි. දේවින්ද්‍රිගේ සිතට නොදන්නා වේදනාවක් පිවිසිණි. ඇය සාලයට නොගොසින්ම ආපසු හැරුණාය.



## 12

විනෝද ගමන එහෙම පිටින්ම කඩාකප්පල් වීම පිළිබඳව සියලු දෙනාගේම සිත්වල තිබුණේ කනස්සල්ලකි. දේවින්ද්‍රිගේ සිතේ කනස්සල්ලට අමතරව වේදනාවක් ද විය. ඒ වේදනාව ඇති වූයේ සූරියතැන්න මහතා වෙනුවෙනි. ඔහුට එළි පහළියේ ඇවිදීමට අවස්ථාවක් ලැබුණේ කලාතුරකිනි. ඔහු ඒ අවස්ථාව ආශාවෙන් වැළඳ ගත්තේ එහෙයිනි. එත් තැන් වීමෙන් හා බිරිඳගේ අතුරුදහන් වීමෙන් වේදනාවට පත් සූරියතැන්න මහතා මිතුරු ඇසුර හා විනෝදාංශ ද සීමා කොට තිබුණේය. එහෙත් දැන් ඔහු ඇවිදීමට ප්‍රිය කරයි. පේරාදෙණිය උද්‍යානයට ද ඔහු අවසානයට ගොස් තිබුණේ සුජානිත් සමඟය. එම නිසා මෙම විනෝද ගමන පිළිබඳව ඔහු තුළ ලොකු බලාපොරොත්තුවක් තිබිණි.

www.sinhalaelibrary.com

"දැන් මට පේරාදෙනිය ගාඩින් එක හිතෙන් මවා ගන්නවත් බැහැ දෙව්න්දි... අවුරුදු විස්සකට විතර ඉස්සර වෙලානෙ ගියෙ..."

සූරියනැන්න මහතා පැවසුවේ රදින උදේ කෑම මේසයේදීය. ඔහුගේ මුහුණේ සංවේගයක සලකුණු තිබිණි. ඒ පුරාණ සිහිපත් වීමෙන් විය යුතු යයි දෙව්න්දි සිතුවාය.

"ඔයාල ලෑස්ති වෙලා මටත් කතා කරන්නකො එහෙනම්..."

ඔහු සිය කාමරය වෙත රෝද පුටුව පදවාගෙන ගියේ එසේ කියමිනි. එහෙත් මාධවී විසින් වරදවා තේරුම් ගැනීම නිසා සියල්ල වෙනස් වී ගියේය. දෙව්න්දි බත් පාර්සල් සහ විනෝද ගමනට අවශ්‍ය අනෙකුත් කෑම බීම කූඩයකට දමමින් සිටියදී ධනුෂ්ක එතැනට පැමිණියේ පරාජිත මුහුණින් යුතුවය. කුස්සියේ රවුම් මේසය වටා වාඩි වී සිටි මිතුරෝ තිදෙනා එක් වරම හිස හරවා බැලූහ. ගමන නොයැවෙන බව දෙව්න්දි කලින්ම දැන සිටියේ මාධවීගේත් ධනුෂ්කගේත් කතා බහ සවන් වැකුණු බැවිනි. එහෙත් ඇය එය ඔවුන්ට පැවසීමට ඉක්මන් නොවූවාය.

"මොකද මචං උඹේ මූණ හරියට එම්බාම් එක වැරදිච්ච මළ මිනියක් වාගෙ...?" මිලාන් විමසුවේය.

ධනුෂ්ක දෙව්න්දි දෙස බලා සිනාසෙන්නට උත්සාහ කළේය. එහෙත් දෙතොල් අග යන්තම් ඇත් වුණා මිස සිනාවක් නැඟුණේ නැත. දෙව්න්දිගේ සිතට දුකක් දැනිණි. ඔහුට මාධවී සමග ගැටුම් ඇති කර ගන්නට සිදු වූයේ තමා නිසාය. ඔහු වෙනුවෙන් සිතේ කුමක්දෝ පහන් හැඟීමක්



තිබුණ ද ඔහු හිමි කර ගැනීම පිණිස මාධවී සමග තරඟ කිරීමේ බලාපොරොත්තුවක් ඇගේ තුන් සිතකවත් තිබුණේ නැත. එහෙත් මාධවී හැම විටම දෙව්න්දි පහත් කොට සලකමින් කතා කළේ එසේ සැක කළ නිසා විය යුතුය.

"මොකද උඹේ ප්‍රියම්බිකාව කිව්වෙ...? එපා කිව්ව ද අපිත් එක්ක පික්නික් එක යන්න...?" ප්‍රගීත් සාවද්‍ය හඬින් විමසුවේය.

"උඹ දැන්ම ඉඳලම එයා ගහන පදේට ද නටන්නෙ...?" ඇනුම් පදය එවදන් තුළ තිබිණි. ඉන් ධනුෂ්ක වඩාත් අසරණ වෙනු ඇයට පෙනිණි.

"උඹල ගිහින් වරෙල්ලා මචං... මට මාධවීත් එක්ක පොඩි ගමනක් යන්න තියෙනවා..."

ඔහුගේ කටහඬෙහි වූ පරාජිත බව සඟවා ගන්නට උත්සාහ කරමින් පැවසුවේය. මිතුරෝ මුහුණින් මුහුණ බලා ගත්හ.

"උඹ එන්නෙ නැත්නම් අපිත් මේ ගමන යන එකේ තේරුමක් නැහැ... දැන් ඉතින් කැන්සල් කරල දාමු..." අයේෂ් පැවසුවේ තීරණාත්මක හඬිනි.

"කැන්සල් කරන්න එපා මචං... අප්පච්චිත් හරි ආසාවෙන් යන්න හිටිය ගමනක්නෙ..."

"ඒ වුණාට උඹ යන්නෙ නැති වුණොත් අප්පච්චිව එක්කරන් යන්නෙ කොහොමද..? අනික් එක මේ ගමන කිසිම ජොලියක් තියෙන එකක් නෑ... අල්ලල දාමු මචං. වරෙල්ලා අපි ටිකක් වත්ත පහළ ඇවිදල එන්න..."

ප්‍රගීත් මේසය අසලින් නැගී සිටියේ නැවත වරක් ධනුෂ්ක දෙසවත් නොබලමිනි.

"සර් එනකොට මේ හදපු කෑම...?"

මිතුරන් තිදෙනා කුස්සියෙන් පිට වී යන ආකාරය බලාගෙන සිටි දේවින්දි ධනුෂ්ක දෙස බැලුවාය. ඔහු යටි තොල පෙරලා දෙඋරහිස් ගැස්සීය. ඉන්පසු මිතුරන් අනුගමනය කරමින් කුස්සියෙන් පිට වී ගියේය. දේවින්දි දිගු සුසුමක් හෙළා සූරියතැන්න මහතාගේ කාර්යාල කාමරයට ගියාය. පිටතට යන්නට සූදානම් ඇඳුමකින් සැරසුණු ඔහු මේසයට වාඩි වී යමක් ලියමින් සිටියේය. පළමුව හිස ඔසවා බැලුවේ ඒ අසළම පුටුවක වාඩි වී සිටි පියතිලකය.

"සර්... ගමන යැවෙන එකක් නෑ"

දේවින්දි පැවසුවේ සමාව අයදින ආකාරයේ හඬකිනි. සූරියතැන්න මහතා ලියවිල්ල මතම පෑන තබා ඇය දෙස බලා සිනාසුණේය.

"ඔව් දේවින්දි... පියතිලක මට කිව්වා"

පියතිලක ඇය දෙස බලා සාවඥ සිනාවක් පෑවේය. ඔහු කොතැනක හෝ සැඟවී සිට සියල්ල අසා ගන්නට ඇතැයි දේවින්දිට සිතිණි. ඇය ඔහු දෙස නොසතුටු බැල්මක් හෙළුවාය. ඔහු එය ගණනකට ගත්තේ නැත.

"සර් හදිස්සි වැඩක් ද...?"

"නෑ දේවින්දි ඇයි...?"



"දැන් පික්නික් එකත් යන්නෙ නැතෙ. කෑමත් උයල පාර්සල් කරල තියෙන්නෙ..."

"ඉතින් දේවින්දි කොහෙ හරි යන්න ඕන කියල ද කියන්නෙ..? එහෙනම් ගිහින් එන්න."

ඇය යමක් කියන්නට පෙරම සූරියතැන්න මහතා පැවසුවේය.

"නෑ සර්... මං තනියම කොහෙවත් යන්න නෙමෙයි... අපි දෙන්නම යමු ද කියල අහන්නයි ලෑස්ති වුණේ..."

දේවින්දි යටිගත් පහත් හඬින් කියද්දී සූරියතැන්න මහතාගේ දෙනෙත් ප්‍රීතියෙනුත් පියතිලකගේ දෙනෙත් කෝපයෙනුත් දිලිසෙනු දේවින්දිට පෙනිණි.

"අපි දෙන්නා විතරක් ගාඩන්ස් යන්න ද...?"

"නෑ සර්. අපි අර වත්ත මැද්දෙ තියෙන වැව ළඟට යමු කෑමත් අරගෙන... සර්ට ඕන නම් එතන ඉඳගෙන පොතක් කියවන්නත් බැරියැ..." දේවින්දි යෝජනා කළාය.

"නෑ නෑ බණ්ඩාර හාමුදුරුවන්ම ඔය කැලෑවල් ගානෙ අරගෙන යන්න ඕන නෑ... අනිත් අයට ඕන නම් ගිහින් එන එකයි තියෙන්නෙ..." පියතිලක වහා විරුද්ධත්වය ප්‍රකාශ කළේය.

"ඒ අයිඩියා එක හොඳයි තමයි දේවින්දි..."

සූරියතැන්න මහතා පැවසුවේ පියතිලක කී දෙය නොසුණු ගණනටය.

පියතිලකගේ මුහුණ අඳුරු විය. ඔහු දේවින්දි දෙස රවා බලා කාමරයෙන් එළියට ගියේය.

"ලියන මහත්තයත් එයි ද දන්නෙ නෑ අපිත් එක්ක යන්න...?"

දේවින්දි විමසුවේ ඔහු නොඑන්නේ නම් හොඳ යැයි හැඟීම සිත යට දරාගෙනය.

"මං හිතන්නෙ නෑ... පියතිලක නිකමටවත් ඔය වැව පැත්තට යන්න කැමති නෑ..."

දේවින්දිගේ සිතට දැනුණු සතුටට නිම හිම නොවීය. පියතිලක ද මාධවී මෙන්ම තමාගේ වැරදීම සොයන්නට මාන බලන අයෙක් නිසා ඔහු ගැවසෙන තැනක සිටීමටවත් ඇය ප්‍රිය කළේ නැත. කේලාම් කියමින් මාධවීගේ සිත ඇය කෙරෙහි බිඳුවන්නේ ඔහුම බව ඇය දැන සිටියාය.

දේවින්දි ඇයටත් සූරියතැන්න මහතාටත් අවශ්‍ය කෑම බීම කුඩයක අසුරද්දී අයේෂ් කුස්සියට පැමිණියේය. ඔහු දේවින්දි දෙස බැලුවේ කුතුහලයෙනි.

"දේවින්දි කොහෙ යන්න ද...?"

"මමයි ලොකු සර්රුයි අර වැව ළඟට යනවා... ඔන්න අයේෂ්ලට බැඳපු බත් පාර්සල්..."

ඇය ඊට පෙර අසුරන ලද කුඩය ඔහුට දක්වූවාය. ඔහු එදෙස බලාගෙන මොහොතක් කල්පනා කළේය.

"අපිත් ඔයාලට ජොයින්ට් වුණොත් කමක් නැද්ද...?"



අයේෂ් විමසුවේ හදිසියේම අදහසක් පහළ වූ කලෙක මෙනි.

"කොච්චර එකක් ද...?" දේවින්දි සිනාසුණාය.

"හරි එහෙම නම් අපි ඔක්කොමලා යමු. කෑම ඔක්කොම එක කුඩෙකට දාන්න. මම මිලාන්ටයි ප්‍රශාන්ටයි කියල එන්නම්..."

මේ අතුරින් හෝ සූරියතැන්න මහතා නිවසින් පිටතට ගෙන යාමට ලැබීම දේවින්දිට සතුටක් විය. කෑම කුඩය රැගත් අයේෂ් ඇතුළු පිරිස ඉදිරියෙන් යද්දී දේවින්දි සූරියතැන්න මහතාගේ රෝද පුටුව තල්ලු කරගෙන පිටුපසින් ගියාය. පියතිලක ඉස්තෝප්පුවට වී උකුසු දෑසින් ඔවුන් දෙස බලා සිටියේය.

"කොහෙද ඔය යන්නෙ...?"

මිදුලට වී මාධවී සමඟ යමක් පිළිබඳව කතා බහ කරමින් සිටි ධනුෂ්ක විමසීය. ඔවුන් කතා කරන්නේ විවාහය පිළිබඳව විය යුතු යැයි දේවින්දිට සිතිණි. ඇය ඔවුන් දෙස හැරී බැලුවේවත් නැත.

"අපි යනවා වැව ළඟට..." සූරියතැන්න මහතා පිළිතුරු දුන්නේය.

"ආ... නියමයිනෙ... අපිත් යමු ද මාධවී...?"

ධනුෂ්ක බලාපොරොත්තු සහගතව මාධවී දෙස බැලීය. ඇය ඔහු දෙස නොසතුටු බැල්මක් හෙළුවාය.

www.sinhalaelibrary.com

"මට බෑ ඔය කැලෑවල් ගානෙ යන්න..."

"උඹට දැන් කොහෙද යන්න තියෙනවා කිව්ව මන්ද...?"

ප්‍රගීත් ආපසු හැරී විමසුවේ ඔහු පෙර පැවසුවේ බොරුවක් බව ධනුෂ්කට ඒත්තු ගන්වන්නට මෙනි.

"ඒක හවසටත් යන්න පුළුවන්." ධනුෂ්ක අපහසුවෙන් පිළිතුරු දුන්නේය.

"නෑ නෑ මචං. උඹ ඒ ගමනම පලයං. මොකද මාධවිත් එක්ක කැලේට ගියොත් සත්තුත් බය වෙලා දුවන්න බැරි නැතෑ..."

ඔවුනු හඬ නගා සිනාසුණහ. සූරියතැන්න මහතා ද ඒ සිනාවට එක් වීම මාධවීට දරා ගත නොහැකි වන්නට ඇත. ඇගේ දෑත කිවි කිවියේ මිට මෙළවෙනු දේවින්දි හොරැහින් දුටුවාය.

"මගෙ නංගිගෙ දුව තමයි... ඒත් කිසිම වාරයක් ඇතුව හැදෙන ළමයෙක් නෙමෙයි. පුංචිත් අවුරුදු ගණනාවක් පිටරට ඉඳල ආවෙ. බැන්දට පස්සෙ ගෙදරටවත් ගවුමක් ඇන්දෙ නෑ. ඒකටත් එක්ක දැන් හැදෙන ළමයි..."

සූරියතැන්න මහතා ඔවුනට නෑසෙන මානයකට යන තුරු සිට කතා කළේ කලකිරීමකින් මෙනි. දේවින්දි එයට එරෙහිව හෝ එකඟව පිළිතුරක් නොදී නිහඬ වූවාය. මාධවී ඇයට විරුද්ධකම් පාන බව සැබැවකි. එහෙත් ඇය සූරියතැන්න මහතාගේ නැගණියගේ දියණියයි. එපමණක් නොව ඔහුගේ පුතාගේ අනාගත මනමාලියයි. කුමන දේ සිදු



වුව ද අවසානයේ දී ඔවුන් එකට එක් වනු ඇත. අවසානයට එක් වනු ඇත්තේ තමා බැවින් නිහඬ වීම සුදුසු යැයි දේවින්දි සිතුවාය.

"මට දැන් පේන විදියට මේ දෙන්නට කසාද බැඳල කවදාවත් සන්තෝසෙන් ඉන්න ලැබෙන එකක් නෑ..." සූරියතැන්න මහතා පැවසුවේ පසුතැවිලි හඬකිනි.

"බැඳල ටික කාලයක් යනකොට ඕවා හරි යයි සර්..." දේවින්දි පැවසුවේ නිහඬවම ගමන් කිරීම සුදුසු නැති හෙයිනි.

"පුංචිපියයි මායි හිටිය විදියට සන්තෝසෙන් ආදරෙන් ඒ දෙන්නා ඉන්නෙ නැති බව මං දන්නවා. මේ මඟුලට කැමති වෙලා මං කළේ ලොකු මෝඩ කමක්..." සූරියතැන්න මහතා මිමිණුවේය.

* * *

ධනුෂ්කගේ මිතුරන් පිරිස නික්ම ගියේ නිවස පුරාම හුදෙකලා බවක් ශේෂ කරලමිනි. පාළුව වැඩි පුරම දැනුණේ දේවින්දිටය. ඔවුනු නිවසේ සිටි හැම මොහොතකම දේවින්දිගේ වැඩවලට කවුල් පූහ. ඇය සමඟ විහිළු තහළු කළහ. අයේෂ්ගේ දෙනෙත් නිරතුරුවම තමා ලුහු බැඳීම ඇතැම් විටෙක කරදරයක් වුවත් දේවින්දි ඔවුන්ගේ සමාගමය ප්‍රිය කළාය.

අයේෂ් සිය සිත තුළ දේවින්දි පිළිබඳව වූ හැඟීම ඇයට අඟවන්නට බොහෝ සෙයින් වෑයම් කළේය. එහෙත් දේවින්දි එය නොවැටහුණාක් මෙන් සිටියාය. එදා වැව අසල විනෝදයෙන් ගත කළ දිනයේදී මිතුරන්ගේ උදව්ව මත

www.sinhalaelibrary.com

දේවින්දි තනි කොට ගත් අයේෂ් කෙළින්ම ඇගෙන් ඒ පිළිබඳව විමසුවේය. එමොහොතේ ඇය සිටියේ ජලාශය අයිනේ වැවී තිබුණු ගසකට පිට දී ජලය මත නටන තුරු සෙවනැලි දෙස බලාගෙනය. ලියමින් සිටි නවකතාවේ පරිච්ඡේද කිහිපයක්ම ඇගේ සිතේ ගොඩ නැගෙන්නට විය. අයේෂ් අසලට එන තුරුම ඇය ඔහු නුදුටුවේ එහෙයිනි.

"දේවින්දි..."

ඔහු අමතද්දී ඇය තිගැස්සී හැරී බැලුවාය. කලිසම් සාක්කු දෙකේ දෑත් රුවා ගත් ඔහු ගැඹුරු ගැල්මකින් යුතුව ඇය සමීපයටම විත් නතර වූයේය. ඇය තිගැස්ම වසාගෙන මඳ සිනාවක් මුවගට නංවා ගත්තාය. එහෙත් ඔහු සිනාසුණේ නැත. කුමක් වුවත් ඔහු කියන්නට සූදානම් වන්නේ සාමාන්‍ය දෙයක් නොවන බව නම් ඇයට ඉවෙන් මෙන් දැනිණි.

"දේවින්දි මං ආවෙ ඔයත් එක්ක වැදගත් දෙයක් කතා කරන්න..."

ඔහු පැවසුවේ කෙළින්ම ඇගේ දෑස දෙස බලාගෙනය.

"කාට වැදගත් දෙයක් ද...?"

ඇගේ සිතේ වූ වකිතය වසාගෙන සිනාසෙන්නට තැත් දැරුවාය.

"මං හිතන්නෙ අපි දෙන්නටම වැදගත් දෙයක්..."

ඔහු බැරෑරුම් හඬකින් පවසද්දී ඇගේ දෙනෙත ඉබේටම යොමු වූයේ සූරියනැන්න මහතා වෙතය. ඔහු ප්‍රභීත් සහ මිලාන් සමග බර කතාවක පැටී සිටියේය.



"පුතාගෙ යාළුවො නරක නෑ... ඒත් ඉතින් තරුණ ළමයිනෙ... හිත්වල මොනවා තියෙනව ද කියල අපිට කියන්න බෑ... දේවින්දි ටිකක් පරිස්සම් වෙලා ඉන්න..."

ඔවුන් පැමිණෙන්නට දින කිහිපයකට පෙර සූරියනැන්න මහතා අවවාද වශයෙන් පැවසූ අයුරු දේවින්දිට සිහිපත් විය. තමා අයේෂ් සමග මෙසේ කතා බහ කරමින් සිටිනු දකිම ඔහුගේ සිතේ සැකයක් ඇති වෙන්නට හේතුවකි.

"ලොකු සර් දැක්කොත් මොනව හරි හිතන්න බැරි නෑ අයේෂ්... ඒ නිසා කියන්න තියෙන දෙයක් ඉක්මනට කියන්න..."

"මං එහෙම නම් වටේ කරකෝ නැතුව කෙළින්ම කියන්නම්... කමක් නැද්ද ?"

"කමක් නෑ... මං කැමතියි කෙළින් කතා කරන අයට..."

"මං ඔයාව බඳින්න කැමතියි... දේවින්දි මොකද කියන්නෙ ඒ ගැන...?"

ඔහු එක් වරම විමසීය. ඔහුගෙන් මෙවන් යෝජනාවක් ලැබිය හැකි බවට සැකයක් සිතේ තිබුණත් ඔහු එය ඉදිරිපත් කළ සෘජු විලාසය ඇගේ සිත සසල කරන්නට සමත් විය. ඇයට කෝසල සිහිපත් විය. කොතරම් ළඟින් ඇසුරු කළ ද ඔහු පවා මෙතරම් සෘජුව කතා කළේ නැත. ඇය යටි තොල තදින් විකා ගත්තාය.

"මොකද දේවින්දි කියන්නෙ...?"

ඔහු එවර විමසුවේ නොඉවසිල්ලෙනි.

www.sinhalaelibrary.com

"කසාද බදිනවා කියන්නෙ කියන පරත්තුවෙන් ගන්න පුළුවන් තීරණයක් නෙමෙයිනෙ අයේෂ්..."

ඇය පැවසුවේ ඔහුගේ මොළොදකමට සරදම් කරන්නාක් මෙනි. අයේෂ්ගේ මුහුණ විළියෙන් රතු විය. විවාහය සනු සදාකාලික බැඳීමකි. විවාපත් වන යුවළ තුළ එකිනෙකා කෙරෙහි දැඩි අවබෝධයක් තිබීම අත්‍යවශ්‍යය. එසේ නොවුණහොත් හැමදාම කල් ගෙවන්නට සිදු වන්නේ ගැටුම් මැදය. ඇතැමුනු ලෝකාපවාදයට බියෙන් විවාහ ජීවිතය තුළ තිබෙන ගැටුම් පිටතට අනාවරණය නොකරන්නට වග බලා ගනිති. එහෙත් එතරම් ඉවසිල්ලක් නැති අයගේ විවාහ ජීවිතය කෙළවර වන්නේ දික්කසාදයෙනි. නවත් සමහරු සිය දිවි නසා ගන්නට පවා පෙළඹෙති. රට රටවල සංචාරය කරන අයේෂ් මෙවන් දේවල් නොදන්නවාක් මෙන් දින ගණනාවක් පමණක් ඇසුරු කළ ඇයට විවාහ යෝජනා කිරීම එක් අතෙකින් විහිළුවක් බඳු විය.

"මං කිව්ව ගමන්ම මම කැමතියි කියල කියන්න ඔයාට පුළුවන් කමක් නැති බව මම දන්නවා. මම ඕන තරම් කාලයක් ඉන්නම්. ඔයා කල්පනා කරල මට උත්තරයක් දෙන්න..."

අයේෂ් පැවසුවේ අය නැවතත් ඇනුම් පදයක් කියනු ඇතැයි බියෙන් මෙනි.

"කල්පනා කරන්න දෙයක් නෑ අයේෂ්. මම දැන්මම ඔයාට උත්තරයක් දෙන්නම්... ඒ යෝජනාවට මම කැමති නැහැ..."

දෙව්න්දි කියද්දී බලාපොරොත්තුවෙන් විකසිත වී තිබූ අයේෂ්ගේ මුහුණ මළානික වී ගියේය. එදෙස බලා සිටීමෙන්



සිය සිත ලිහිල් වනු ඇතැයි සිතූ ඇය නැවතත් දිලිසෙන දිය රැළි දෙස සිය බැල්ම රඳවූවාය.

"ඇයි ඔයා කැමති නැත්තෙ කියලා විතරක් මට කියන්න පුළුවන් ද ?"

"අයේෂ් අපි දෙන්නා දන අඳුනගෙන දවස් කීයද ? මම ඔයා ගැන දන්නෙත් නෑ... ඔයා මං ගැන දන්නෙත් නෑ. ඉතින් කොහොමද අපි දෙන්නට දෙන්නා ගැලපෙනවා කියලා තීරණය කරන්නෙ...?"

දෙව්න්දි කාරුණිකව විමසද්දී අයේෂ් නිරුත්තර වූයේය. ඔහු මඳ වේලාවක් ඈත බලාගෙන කල්පනා කළේය. දෙව්න්දිගේ සිතට ජයග්‍රාහී හැඟීමක් දැනිණි.

"ගැලපෙන නොගැලපෙන බව තීරණය කරන්න එච්චර කල් ආශ්‍රය කරන්න ඕන නැහැ දෙව්න්දි..."

ඔහු මඳ වේලාවකට පසුව පැවසුවේ පෙර තරම් ස්ථිර හඬකින් නොවේ. දෙව්න්දි සරදම් සිනාවක් පෑවාය.

"ඕවා කවට ආ පළියට කියන කතා විතරක් හිතට එකඟව ඒවා නෙමෙයි අයේෂ්... තව ටික දවසකින් මට මේ වාගෙ යෝජනාවක් කළා ද කියන එකත් ඔයාට අමතක වෙලා යාවි..." ඒ නිසා අපි ආයෙ ඔය ගැන කතා නොකර ඉඳිමු.. මං කැමතියි ඔයාව යාළුවෙක් වගේ දිගටම ආශ්‍රය කරන්න..."

දෙව්න්දි කියද්දී අයේෂ්ගේ දෑසට නැඟුණේ ඇයට කිසිම දවසක අමතක කළ නොහැකි ආකාරයේ පරාජිත බැල්මකි. ඇගේ සිත සසල නොවූවා නොවේ. එහෙත් හැඟීම්වලට වහල්

www.sinhalaelibrary.com

වීම යනු අනාගත ව්‍යසනයකට මුල පිරීම බව ඇය පසක් කොටගෙන සිටියාය. ඔහුට එලෙසම සිටින්නට හැර ඇය සූරියතැන්න මහතා ළඟට ගියාය.

"දේවින්ඳි මාත් එක්ක තරහ ද...?"

ඔවුන් නික්ම යන්නට සූදානම් වෙමින් සිටි දිනයේ අවසරයක් බලා කුස්සියට පැමිණ අයේෂ් විමසුවේය.

"නෑ අයේෂ්... කවදාවත් නෑ... "දේවින්ඳි පැවසුවේ අවංකවමය.

"මං කළේ මෝඩ යෝජනාවක් වෙන්න ඇති. ඒත් හැමදාම ඔයා මගේ හිතේ ජීවත් වේවි කියලා මට හිතෙනවා. මං ඔයාගෙ හොඳ යාළුවෙක් කියලා මතක තියා ගන්න දේවින්ඳි..."

ඔහු පැවසුවේ නැඹුරු වී ඇගේ කම්මුලක් මුදුව සිප ගනිමිනි. ඇගේම අයියා සිප ගනිද්දී දනෙන දයාබර හැඟීමට වැඩි යමක් දේවින්ඳිට දැනුණේ නැත. එහෙත් ඇගේ දෙනෙතට කඳුළු පිරිගෙන ආවේය.

"තෑන්ක් යූ අයේෂ්..."

මිම්ණු ඇය දොර දෙස බැලුවේ දෑසට ඉනු කඳුළු ඔහුගෙන් සඟවා ගන්නටය. එකෙණෙහිම සෙවනැල්ලක් මෙන් කෙනෙකු එතැනින් ඉවත්ව යන ආකාරය ඇයට පෙනිණි. පියතිලක වෙන්නට ඇතැයි ඇය සිතුවාය.

"ගෙදර හොඳටම පාළු වෙලා ගියා නේද දේවින්ඳි..."



ඔවුන් නික්ම ගිය දාට පසු දා උදේ දේවින්ඳි මල් පෝච්චි පසක් කරමින් සිටියදී සාලයට පැමිණි ධනුෂ්ක විමසුවේය. ඇය සිනාවකින් එයට එකඟ වූවාය. එදා විනෝද ගමන කඩාකප්පල් වූ දා පටන්ම ධනුෂ්ක ඇය සමග කතා බහ කළේ අවශ්‍යම දෙයකට පමණි.

"දේවින්ඳිට මැඩිපුර පාළුව දනෙනවා ඇති නේද...?"

"එයාල මගෙ යාළුවෝ නෙමෙයිනෙ... ඉතින් මට මොකද විශේෂ පාළුවක් දනෙන්නෙ...?"

දේවින්ඳි විමසුවේ ධනුෂ්ක ඇනුම් පදයක් කී බව ප්‍රත්‍යක්ෂ වශයෙන්ම දනගෙනය.

"අනිත් අය විශේෂ නොවුණට ඔයාට අයේෂ් විශේෂයිනෙ..."

ධනුෂ්ක සිනාසෙන්නට තැත් දරුවේය. එහෙත් ඒ උත්සාහය ද්වේෂයකින් වැසී යනු දේවින්ඳි දුටුවාය. එයට හේතුව කුමක්දැයි ඇයට වටහා ගත නොහැකි විය.

"නෑ මට කිසිම කෙනෙක් විශේෂ නැහැ. ගෙදරට එන කෙනෙකුට සළකන එක මගෙ ඩියුටි එකනෙ. මම ඒක හරියට කළා. ඊට එහා දෙයක් නෑ..." ඇය රළු වූත් ස්ථිර වූත් හඬකින් පැවසුවාය. ඔහුගේ හිතේ කිසියේත්ම සැකයක් ශේෂ කරලන්නට ඇයට අවශ්‍ය නොවිණි.

"ඒ කියන්නෙ අයේෂ් ඔයාගෙන් මොනවත් ඇහැව්වෙ නැද්ද...?"

"ඇහැව්වා... ඒත් මම කැමති වුණේ නෑ"

"එහෙම නම් මොකද අයේෂ් ඔයාව කිස් කළේ...?"

ධනුෂ්ක විමසුමේ පියවරකින් දෙකකින් ඇය වෙතට ළං වෙමිනි. එදා දොරකඩ සිට ඇය හා අයේෂ් දෙස බලා සිටින්නට ඇත්තේ ධනුෂ්ක විය යුතු යයි හැඟීම වහා ඇගේ සිතට දැනිණි.



## 13

වැස්ස එක සීරුවට ඇද හැළෙමින් තිබිණි. දෙව්න්දි සිය කාමරයේ ජනේලය තුළින් මිදුමින් වැසුණු කඳු යාය දෙස බලා සිටියේ සීතල වළක්වා ගන්නට දෑත ද පොරවාගෙනය. පහළ මාලයට ගොස් කෝපි කෝප්පයක් සාදා ගැනීමේ වුවමනාව තිබුණ ද සිත පුරා ශෝකී කාන්සියක් ජනිත කරවන මේ පරිසරයෙන් දෑස් මුදවා ගැනීමට ඇයට නොහැකිණි. කඳුකරයට වසින වැස්සේ ඇති අපූර්ව චමත්කාරයට ඇය සවදත් ඇලුම් කළාය.

සෙලියුලර් දුරකථනය නාද වන්නට විය. බොහෝ වේලාවක් එය නාද වන තුරුම ඒ දෙස හැරී බලන්නටවත් ඇය උනන්දුවක් නොගත්තේ පරිසරය කෙරෙහි ඇගේ දෑස එතරම්ම ආසක්තව පැවති බැවිනි.

www.sinhalaelibrary.com

"ෆෝන් එක ඔය තරම් රිංග් වෙනකම් ඇහෙන්නෙ නැද්ද...?"

අයියා කතාව ඇරඹුවේ දෝෂාරෝපණයකිනි. එහෙත් දෙව්නිදිගේ මුවට නැගුණේ සිනාවකි.

"මං වැස්ස දිහාවෙ බලාගෙන හිටියා..."

"ආයෙ මොනවද මෙයාට වැස්ස කියල කිව්වොත්.. මිදුලට බැහැල තෙමෙන්න හිතුණෙ නැද්ද...?"

සැබැවින්ම දෙව්නිදි වැස්සට තෙමෙන්නට බොහෝ ප්‍රිය කළාය. නිවසේදී වැස්සට තෙමීම නිසා අයියාගෙන් මෙන්ම අම්මාගෙන් ද බැනුම් ඇසූ අවස්ථා නිමක් නැත. ඇගේ දඟකාරකම්වලට අනුබලයක් ලැබුණේ අප්පච්චිගෙන් පමණකි.

"අප්පච්චි හින්දා තමයි මේ කෙල්ල හදා ගන්න බැරි..." අම්මා නිතරම දෝෂාරෝපණය කළාය.

"තෙමෙන්න නම් හිතුණා. ඒත් බෑ. නින්ද වෙන කොට ගේ හදන්න යන්න තියෙනවනෙ..." දෙව්නිදි අයියාට පිළිතුරු දුන්නේ සිනාසෙමිනි.

"පුදුමයි වෙලාවට වැඩක් කරනවා කිවම... ඒක නෙමෙයි ඔයා ගෙදර එන්න එහෙම අදහසක් නැද්ද...? අම්මා මටයි අප්පච්චිටයි දෙන්නටම බනිනවා ඔයාව එක්කරගෙන එන්නෙ නෑ කියලා..."

"ඒ දවස්වල මම බෝඩිමවල ඉද්දි අම්මට මං ආවත් එකයි නාවත් එකයි.. දැන් මොකද ඔච්චර මං ගැන හොයන්නෙ...?"



"ඉගෙන ගන්න බෝඩිමක ඉන්න එකයි රස්සාවක් කරන එකයි දෙකක්නෙ... බුද්ධික් ඇවිල්ල කිව්වා ඔයා හුඟක් සන්තෝසෙන් ඉන්නවා කියලා. ඒත් අම්මගෙන් බේරුමක් නෑ..." අයියා සිනාසුණේය.

"ඇත්තටම මම සන්තෝසෙන් ඉන්නවා අයියා.. අක්කා එහෙම සනීපෙන් ද ?"

"ඔව් සනීපෙන් ඉන්නවා. කොහොමත් ඔයාට හෙට අනිද්දා ගෙදර එන්න වෙයි. ලොකු නංගී බලන්න මහත්මයෙක් එනවා."

දෙව්නිදිගේ සිත ක්ෂණිකව තිගැස්සිණි. කවදා හෝ අක්කා පමණක් නොව තමා ද විවාහ වී නිවසින් පිට යා යුතු බව ඇයට සිතුණේ එමොහොතේය. ඇය සුසුමක් හෙළුවාය.

"කොච්චර කෙල්ලො හැදුවත් වැඩක් ඇතෑ.. කවදා හරි පිටට දෙන්නම එපායැ."

අම්මා අක්කාත් ඇයත් දෙස බලාගෙන නැදෑ කාන්තාවකට හෝ මිතුරියකට කියූ අන්දම දෙව්නිදිට සිහිපත් විය.

"කියන්න චූටි නංගි මම කවද්ද ඔයාව එක්කන් යන්න එන්න ඕනෙ...?"

ඇගේ නිහඬතාවය නොඉවසූ අයියා විමසුවේ නොඉවසිල්ලෙනි.

"බැරි වෙලාවත් අක්කා බලන්න එන මහත්තයා එයාට කැමති නොවී මට කැමති වුණොත් එහෙම...? ඒ හින්දා එයා

www.sinhalaelibrary.com

ඇවිත් ගියාට පස්සෙ මම එන්නම්..."

දේවින්දි පැවසුවේ මඳ හඬින් සිනාසෙමිනි. අයියා දුරකථනය තැබුවේ එතරම් සතුටකින් නොවේ. සැබැවින්ම නිවසට යාමටත් නිවසේ අය සමග විනෝදයෙන් ගත කිරීමටත් ආශාවක් ඇය තුළ නොතිබුණා නොවේ. එහෙත් මේ ගත කරන සැහැල්ලු නිස්කලංක දිවි පෙවෙතින් දින කිහිපයකට හෝ අත් මිදෙන්නට ඇය අකමැති වූවාය. අනෙක් අතට සූරියකාන්ත මහතා තනි කොට යාමට ද ඇයට හිත හදා ගත නොහැකි විය. ඔහු දිනෙන් දින වැඩි වැඩියෙන් ඇගේ සමාගම පැතුවේය. ඔවුන් දෙදෙනාට කතා බහ කරන්නට පොදු දේවල් රැසක්ම තිබිණි. ඔහු සිය අතීතය පිළිබඳව පැවසූ බොහෝ දේවල් දේවින්දිට සිය නව කතාව සඳහා යොදා ගැනීමට හැකි විය. සිය විද්‍යා ප්‍රබන්ධ සිංහලයට පරිවර්තනය කිරීමට ද ඔහු ඇය උනන්දු කළේය.

"දේවින්දි මගේ ඔහම පොතක් ට්‍රාන්ස්ලේට් කරන්න. මගෙ වියදමින් මම පොත ප්‍රින්ට් කරන්නම්."

ඔහු පැවසුවේ පොරොන්දුවක හඬිනි. පොතක් මුද්‍රණය කර ගැනීම දේවින්දිට එතරම් දෙයක් නොවේ. එහෙත් ඒ බව අඟවා සූරියකාන්ත මහතාගේ අභිංසක ආශාවට අකුල් හෙළීමට ඇයට අවශ්‍ය නොවිය. සැබැවින්ම ඔහු අප්පච්චි තරමම තමාට ළෙන්ගතු බව ඇය දැන සිටියාය.

තවමත් වැස්ස පායා තිබුණේ නැත. වේලාව සවස හතට ආසන්නව තිබිණි. තේ පිළියෙල කිරීම සඳහා යාමට දේවින්දි කාමරයෙන් නික්මුණාය. වැහි අඳුර නිසා කොරිඩෝවෙහි වූයේ පාළු බවකි. කොරිඩෝව කෙළවර විසල්



කුළුණකට මුවා වී සිටි තැනැත්තා දකිත්ම දේවින්දි තිගැස්සී ගියේ එහෙයිනි. එහෙත් සිතට දිරි වඩා ගත් ඇය සිටි වනම සිටගෙන එදෙස බලා සිටියාය. ඇයට සැනසුම් සුසුමක් හෙලුණේ ඒ ප්‍රියතිලක බව හැඳින ගත් කලය.

"ඔබ්බාකද හැංගිමුත්තන් සෙල්ලම් කරනව ද ?"

ඔහු වෙතට සෙමින් පියවරින් ගමන් ගත් දේවින්දි විමසුවාය. ඇගේ කටහඬෙහි වූයේ නොපහන් බවකි. ප්‍රියතිලක මුහුණට නැඟුණු ලජ්ජාශීලී බව සුපුරුදු කුරිරු බවින් වසා ගන්නට සමත් විය.

"මම නම් හැංගිමුත්තන් සෙල්ලම් කරන්නෙ නැ. ඒත් කාගෙ කාගෙත් සෙල්ලම් අපි දන්නවා..."

ඔහු කුළුණ අසළින් නික්ම පඩි පෙළ වෙතට යමින් පැවසීය. දේවින්දිගේ දෙබැම හැකිළිණි. ඔහු කීවේ කුමන හරුපයක්දැයි ඇය කල්පනා කළාය.

"අනුන්ගෙ කාමර අස්සෙ හැංගිලා ඉඳගෙන ඔත්තු බලන්නෙ කවුද කියලා අපිත් දන්නවා..."

දේවින්දි පඩි පෙළ දිගේ බසිමින් සිටි ප්‍රියතිලකට ඇසෙන සේ උස් හඬින් පැවසුවාය. ඔහු යමක් පැවසූ නමුදු වැස්සේ හඬ නිසා ඇයට එය පැහැදිලිව ශ්‍රවණය වූයේ නැත.

දේවින්දි තේ පිළියෙල කරමින් සිටියදී කුස්සියේ සීනුව නාද විය. එය නාද වෙන්නේ සූරියකාන්ත මහතාට යම් දෙයක් අවශ්‍ය වූ විටය. තමාට යමක් අවශ්‍ය වූ විට කුස්සියටම පැමිණ දේවින්දිට එය දන්වීමට ධනුෂ්ක පුරුදුව සිටියේය. දේවින්දි

ඉක්මන් ගමනින් සාලයට ගියාය. සූරියතැන්න මහතා සමග කතා බහ කරමින් සිටි ලෙව්කේ බණ්ඩාර පවුල දුටු දෙවින්දිගේ ගමන බාල වූයේය. මාධවීත් ඇගේ මවත් සුපුරුදු අහංකාරකමින් යුතුවම ඇය දෙස බැලුවත් ලෙව්කේ බණ්ඩාර මහතා ලෙන්ගතු ලෙස ඇය සමග සිනාසුණේය.

"කොහොමද දෙවින්දි..?"

"සන්තෝසෙන් ඉන්නවා සර්..."

"සර්වන්ට්ස්ලටත් ගෙදර අයට වාගෙ සළකන මේ වගේ වලව්වක සන්තෝසෙන් හිටියෙ නැත්තම්නෙ පුදුමෙ..."

ලෙව්කේ බණ්ඩාර මැතිණිය සිනාසෙමින් වුවද ඇනුම් පදයක හඬින් පැවසුවාය. දෙවින්දිගේ මුහුණින් සිනාව වහා පලා ගියේය. ලෙව්කේ බණ්ඩාර මහතා සිය මැතිණිය දෙස අවවාදාත්මක බැල්මක් හෙළීය.

"දෙවින්දි වැඩිපුර තේ ටිකක් හදන්න පුළුවන්නෙ නේද..?"

සූරියතැන්න මහතා කරුණාවෙන් විමසීය.

"පුළුවන් සර්..."

"අපි නම් සර්වන්ට්ස්ලට ඔච්චර නළවන්නෙ නෑ අයියා..."

ලෙව්කේ බණ්ඩාර මැතිණිය නොරිස්සුම් සහගත හඬින් කියනු පිටු පා යන දෙවින්දිට ඇසිණි.



"ඒ නිසා තමයි සර්වන්ට් කෙනෙක්ට මාසයක්වත් තියා ගන්න බැරි... බලන්නකො මෙහෙ ඉන්නෙ මේ වලව්වටම නෑකම් වුණ සර්වන්ට්ස්ල"

ලෙව්කේ බණ්ඩාර මහතා කිව්වේ ඇයට තව දුරටත් කතා කරන්නට ඉඩ නොතබමිනි. දෙවින්දිට සිනා ගියේය.

"නංගිලා මේ වැස්සෙ තකහනියෙම ආවෙ ඇයි කියලා කිව්වෙ නැනෙ..."

දෙවින්දි තේ ට්‍රොලිය තල්ලු කරගෙන එද්දී සූරියතැන්න මහතා විමසන හඬ ඇසිණි.

"අපට හදිස්සියෙම එංගලන්තෙ යන්න වෙලා අයියෙ..."

ලෙව්කේ බණ්ඩාර මැතිණිය පැවසුවාය.

"ඒ මොකටද...?"

"මෙයාගෙ එංගලන්තෙ ඉන්න අයියට ඔපරේෂන් එකක් කරලා හුගක් අමාරුයිලු. එයාව බලල එන්න යන්නෙ. මාධවීට යන්න බෑ කියලා කියනවනෙ..."

දෙවින්දි තේ ට්‍රොලිය ඔවුන් අසල නතර කළාය. ඒ සමගම කතාව ද අතරමග නතර විය.

"මම මාමගෙ තේ එක හදන්නම්..."

දෙවින්දි සූරියතැන්න මහතාගේ කෝප්පය අතට ගනිද්දී මාධවී වහා ඉදිරිපත් වූවාය. ඇයට තේ කෝප්පයක්වත් සාදා ගැනීමට නොහැකි බවට ඇගේම පියා වරක් චෝදනා කළ අන්දම දෙවින්දිට සිහිපත් විය.

www.sinhalaelibrary.com

"නෑ... නෑ මාධවී. දේවින්දිම හැදුවාවෙ. මට ඕන තරමට කිරි, සීනි දාන්න දන්නෙ එයාතෙ..."

සූරියනැන්න මහතා පැවසුවේය. එහෙත් මාධවී රවා බැලුවේ දේවින්දි දෙසය.

"මමත් ඒවා පුරුදු වෙලා ඉන්න එකු හොඳයිනෙ..." ඇය පැවසුවේ අමිහිරි හඬිනි.

"අපි සති දෙකකින් තුනකින් ආපහු එන්නම් මාධවීව මෙහෙ නවත්තල යන්නයි හිතුවෙ අයියා.."

ලෙව්කේ බණ්ඩාර මැතිණිය කියද්දී දේවින්දිට ඉබේම බැලුණේ සූරියනැන්න මහතා දෙසය. ඔහු තදින් යටි තොල සපා ගනු ඇයට පෙනිණි.

සූරියනැන්න මහතා එක්වරම අදහසක් ප්‍රකාශ නොකළත් ඔහුගේ බැල්මෙන් ඇඟවුණේ මාධවී පැමිණෙනවාට ඔහු තුළ කිසිදු කැමැත්තක් නැති බවය. දේවින්දිට නම් දනුණේ වසංගත රෝගියෙකු පැමිණෙන බවක් කී විටෙක මෙන් පිළිකුලක් හා තැති ගැන්මකි. දනටමත් දේවින්දි දෙස වපරැසින් බලන්නට පුරුදුව සිටින මාධවී මෙහි නැවතීමට පැමිණි පසුව සියතිලක සමඟ එක් වී කෙළින්ම ඇයට එරෙහිව යුද ප්‍රකාශ කරනු නිසැකය.

"දන් මාධවීට හොඳට ලියන්නත් පුළුවන්.."

ලෙව්කේ බණ්ඩාර මැතිණිය ආඩම්බරයෙන් කී අයුරු දේවින්දිට සිහිපත් විය. දේවින්දි පවුලේ කෙනෙකු මෙන් සැලකුම් ලැබීම ලෙව්කේ බණ්ඩාර මැතිණිය කොහෙත්ම



ඉවසුවේ නැත. එම නිසාම ඇය මාධවීට ඉවීමට හැකි බව ඇඟවූයේ දේවින්දි පිටු දකීමේ අරමුණින් විය යුතුය.

'ඉවිල්ල කුස්සි අම්මලගෙ වැඩක් කියල කිව්වොත් ඔය අම්මයි දුවයි තමයි.. මොකද දන්නෙ නෑ ලියන්න ඉගෙන ගන්න හිතුණෙ...' දේවින්දි සාවඥ සිනාවකින් යුතුව තමාටම කියා ගත්තාය. මාධවී පැමිණියාට පසුව සතියක් නිවාඩු ගෙන ගෙදර යා යුතු යයි දේවින්දි තීරණය කළාය. ඇයට වේදනාවක් වූයේ සූරියනැන්න මහතා තනි කොට දමා යාම පමණකි.

ඉරිදා දිනයේ දේවින්දි සාගරිගේ නිවසට ගියාය. දින කිහිපයක් තිස්සේ ඇද හැලුණු වර්ෂාව නිසා පාරවල් මඩ වී තිබිණි. එහෙත් පරිසරයේ වූයේ ප්‍රබෝධමත් බවකි.

"අප්පේ දූනී මේ ළමයා දකින්න තියෙන අමාරුවක්..."

තෙන්නකෝන් මැතිනිය ඇය පිළි ගත්තේ නෝක්කාඩු වක් ද කියමිනි.

"එන්න වෙලාවක් තිබුණෙ නැහැ ආන්ටි. පහුගිය දවස්වල ටනුජ්න සර්ගෙ යාළුවො වගයක් ඇවිත් හිටියනෙ. ඒ නිසා වැඩ වැඩි වුණා.." දේවින්දි සිනාසුණාය.

"අතට පයට වැඩකාරයො තියාගෙන මහවර සැපට ඉන්න පුළුවන්කම තියෙද්දී ඔය ළමයා මොනාවට දුක් විඳිනව ද කියල මට නම් හිතා ගන්නවත් බැහැ..."

ඇය කම්පාවට පත් වූ ලෙසින් තම්මුලට අත තබා ගත්තාය.

"මම හරිම සන්තෝසෙන් ඉන්නෙ ආන්ටි..."

www.sinhalaelibrary.com

"ඔව් ඒ බව නම් පේනවා... ඒකනෙ පහු ගිය ටිකේම අපිව අමතක කරලා හිටියෙ..." කියාගෙන ඔවුනතරට පැමිණි සාගරී දෙව්න්දිගේ දෑතින් අල්ලා ගත්තාය.

"බුද්ධි එයාගෙන් කතා කරපු වෙලාවෙ ඇහුවා ඔයා ආවෙ එහෙම නැද්ද කියලා... අයියත් ඔයාව මතක් කළා කියන්න කිව්වා..."

"මට හැලුම්ට කෝල් එකක්වත් දෙන්න වෙලාවක් තිබුණෙ නෑ සාගරී..."

"වාඩි වෙලා කතා කරන්න ළමයො... මම බොන්න මොකුත් හදාගෙන එන්නම්..."

තෙන්නකෝන් මැතිණිය ගෙතුළට යාමට හැරුණාය. දෙව්න්දි වහා ඇය වැළැක්වූවාය.

"අනේ එපා ඇන්ටි. මම කෑව ගමන්ම වගේ ආවෙ..."

"එහෙනම් තව ටික වෙලාවක් ඉඳලම බොමුකො..." ඇය ද ඔවුන් අසලම වාඩි වූවාය.

"මං ගොඩක් වෙලා ඉන්නෙ නෑ ආන්ටි... වැස්සකට ඉස්සර වෙලා යා ගන්න ඕන..."

"ඔව්... මේ ටිකේම හවස් වෙනකොට වැස්සනෙ... ඒක නෙමෙයි දෙව්න්දි මාධවී එහෙ නවතින්න එනවා කියන්නෙ ඇත්තද...?"

දෙව්න්දි සාගරී දෙස බැලුවේ මවිතයෙනි. මෙතරම් ඉක්මනින් ගමවල ආරංචි පැතිර යන්නේ කෙසේදැයි ඇයට සිතා ගැනීමට පවා නොහැකි විය.



"ඔයා පුදුම වෙලා බලාගෙන ඉන්නෙ මං කොහොමද මේවා දන්නෙ කියල නේද...?"

සාගරී සිනාසෙමින් විමසුව ද දෙව්න්දි පිළිතුරක් දුන්නේ නැත.

"ගම්වල ටවුන්වල වගේ නෙමෙයිනෙ දුවේ. ඕනෑම දෙයක් ඉක්මනටම පැතිරිලා යනවා..." තෙන්නකෝන් මැතිණිය දෙව්න්දිගේ කුතුහල දුරු කළාය.

"මාධවීගේ අම්මයි තාත්තයි එංගලන්තෙ යනවලු සති දෙකකට... එයාල ආපහු එනකම් මාධවී මෙහෙ ඉන්නවා කියලා කිව්වෙ..."

දෙව්න්දි අකමැත්තෙන් පුතුව පිළිතුරු දුන්නාය. හැබැවින්ම මාධවී පිළිබඳව කතා කරන්නට ඇය කවදාවත් කැමති වූයේ නැත.

"මට නම් පේන්නෙ මාධවී බලෙන්ම ධනුෂ්කගේ කරේ එල්ලෙන්න යනවා වාගෙ. මාධවී කොහොමටවත්ම වලව්වකට ගැලපෙන්නෙ නෑ. පේන්නෙ නැද්ද කොටට කොටේ කලිසම් ඇඳගෙන ගෙඩි පුද්දියෙක් වාගෙ යන එන හැටි..."

සාගරී පැවසුවාය. මාධවී කිසිම කෙනෙකු තුළ ප්‍රසන්න හැඟීම් ඇති නොකරන තැනැත්තියක් බව දෙව්න්දිට වැටහුණේ වරක් දෙවරක් නොවේ. එහෙත් කෙනෙකු නොමැති තැන විවේචනය කිරීම ඇය ප්‍රිය කළේ නැත. යහළු යෙහෙළියන් හා හැඳිනින් අතර දෙව්න්දි ප්‍රසිද්ධව සිටියේ කිව යුතු ඕනෑම දෙයක් මුහුණටම කියන තැනැත්තියක වශයෙනි.

www.sinhalaelibrary.com

"අපිට අනුන්ගෙ දේවල් වැඩක් නෑ. හැබැයි ඉතින් අපේ කාලෙ නම් බඳින්න ඉන්න ගෑණු ළමයෙක් කවදාවත් මනමාලයගෙ ගෙදර ඇවිත් නැවතුණේ නෑ... දැන් ඔක්කොම වෙනස් වෙලානෙ..."

තෙන්නකෝන් මැතිනිය පැවසුවේ සුසුමක් ද හෙළමිනි. දේවින්දිට සිය මව සිහිපත් විය. ඇය ද දරන්නේ මේ අදහස්මය. ඒ ඔවුන් දෙදෙනාම එකම කාලයකට අයිති අය නිසා යයි ඇයට සිතිනි.

"ඔව මොනවද ආන්ටි දැන් හුගක් රටවල්වල ජෝඩුව එක ගෙදරක ජීවත් වෙලා දරුවොත් ලැබුණට පස්සෙනෙ කසාද බඳින්නෙ..."

"මොනව දුවේ...? ඒවා මේ රටෙත් තියෙනව ද...?"

තෙන්නකෝන් මැතිනිය විමසුවේ ඇස උඩ තබාගෙනය. ඇගේ ඉරියව්ව දේවින්දි සිනා ගන්වන්නට සමත් වුව ද ඇය අසීරුවෙන් එය වළක්වා ගත්තාය. සිය මවට සමාන වූ වැඩිහිටි කාන්තාවකට සිනාසීම නොහොබිනාකමකැයි ඇයට සිතිණි.

"අනේ ඔව්... ආන්ටි දැන් අපේ රටෙත් එක කාමරේ ජීවත් වෙන අය ඕන තරම් ඉන්නවා..."

"අනේ... සංසාරේ..."

තෙන්නකෝන් මැතිනිය කම්මුලේ අත තබා ගත්තාය. සිය දූ දරුවන්ගේ අනාගතය පිළිබඳව ද ඇය තුළ බියක් හට ගන්නට ඇත.



"හැබැයි දේවින්දි මාධවී එක්ක ඉන්න එක ඔයාට ලේසි වෙන්නෙ නෑ... අපි දන්න විදියට නම් එයා ඕනම කෙනෙකුගෙ නැති වැරදිත් හොයන කෙනෙක්. ටිකක් පරිස්සම් වෙලා ඉන්න..."

පැය දෙකක් පමණ ඔවුන්ගේ නිවසේ ගත කොට ආපසු එද්දී සාගරී පැවසුවේ අවවාදයක හඬිනි.

ඇය වලව්වට පැමිණෙද්දීම ධනුෂ්කගේ කාරය පැමිණියේය. එය තුළ සිටි මාධවී පාර අද්දරට වී කාරය නවා පිය මං වෙන තුරු බලා සිටි දේවින්දි දෙස නොපහන් බැල්මක් හෙළුවාය. ධනුෂ්ක නම් සිනාසී ඇයට අත වැනීය. මාධවී ධනුෂ්ක දෙසට හැරී යමක් පැවසුවාය. ඔහු අත වැනීම පිළිබඳව ඇය දොස් පවරන්නට ඇතැයි දේවින්දිට සිතිණි.

දේවින්දි එන විට කාරය පෝටිකෝව යට නවතා තිබිණි. ඉනට දෑත් ගසාගත් මාධවී කාරය අසළ සිටගෙන දේවින්දි එන පෙර මග බලා සිටියාය. සුපුරුදු ලෙසම ඇය හැඳ සිටියේ කෙටිම කෙටි කලිසමකින් සහ අත් නැති ටී ෂර්ටයකි. ධනුෂ්ක පෙනෙන්නට සිටියේ නැත.

"දේවින්දි කොහෙද ගියේ...?"

ඇය බැල්මට සරිලන රළු හඬකින් යුතුව විමසුවාය. දේවින්දිගේ සිතට කෝපයක් දැනිණි. තමා යන එන ගමන් බිමන් පිළිබඳව හෝ කරන කියන දේවල් පිළිබඳව ඇයට හේතු දක්වන්නට බැඳී නැති බව දේවින්දි මීට පෙර වතාවක් ද මාධවීට පවසා තිබිණි. නැවත වරක් එයම පැවසීමේ තේරුමක් නැත. එම නිසාම ඇය මාධවී දෙස නොබලාම ගෙතුළට යන්නට හැරුණාය.

"දෙව්න්දිට කන් ඇහෙන්නෙ නැද්ද...? මේ බෑග් ටික අරගෙන යනවා ගේ ඇතුළට..." මාධවී කෑගැසුවාය.

දෙව්න්දි සිටි වනම නැවතී ආපසු හැරී බැලුවාය. හීන් බණ්ඩා ද මිදුලේ සිට මේ දර්ශනය දෙස බලා සිටියේය. දෙව්න්දිගේ දෑස කෝපයෙන් පුපුරු ගසමින් තිබිණි.

"තමන්ටත් අත් දෙකක් තියෙනවනෙ. අරගෙන එන එකයි තියෙන්නෙ. මම මෙහෙ ඉන්නෙ එක එක්කෙනාගෙ බෑග් උස්සන්න නෙමෙයි..."

ඇය වේගයෙන් පවසා යන්නට හැරුණාය. හීන් බණ්ඩාගේ මුහුණ සිනාවකින් විකසිත විය.

"ඔව් මොනවට ද ඉන්නෙ කියන එක මට දැන් තේරෙනවා... මම ඒක බලා ගන්නම්කො..."

තර්ජනාත්මකව පැවසූ මාධවී හීන් බණ්ඩා දෙසට හැරුණාය.

"හීන් බණ්ඩා ගිහින් දානවා මේ බෑග් ටික ගේ ඇතුළට..."

ඇය අණ කළාය. හීන් බණ්ඩා එය නෑසුණාක් මෙන් මල් පාත්තියක් දෙසට හැරුණේය. සියලු දෙනාටම එක්වර පහර දීමට තරම් නොන්තියකින් මාධවී පිපිරුණාය. කිසිදු මෙහෙකාරයෙකු තමා ගණනකට නොගන්නේ යයි හැඟීම ඇයට ප්‍රණීත නොවීය. ඇයට අවශ්‍ය වූයේ කෙදින හෝ මෙහි අධිපතිනිය වන්නේ තමා බවත් සියලු දෙනාම ඇගේ අණට කීකරු විය යුතු බවත් ඔවුනට ඇඟවීමටය. එහෙත් එය



සාර්ථක නොවීය. කෝපයෙන් හා පරාජිත හැඟීමෙන් ද වියරු වැටුණු මාධවීට ඉස්තෝප්පුව දෙස බලද්දී දෑත මත බැඳ ගෙන සිනාසෙමින් සිටින ධනුෂ්ක දිස් විය. ඇගේ කෝපයට නිශ්චිත ඉලක්කයක් ලැබිණි.

"මේ ගෙදර ඉන්න වැඩකාරයො කවුද අයිතිකාරයො කවුද කියලයි මට හිතාගන්න බැරි... එකෙකුටවත් කියල වැඩක් කරව ගන්න පුළුවන් කමක් නෑ..."

මාධවී පුපුරා හැලුණාය. ධනුෂ්ක කාර්ය අසලට පැමිණ ඇගේ උරහිස මත අත තැබීය.

"මාධවී මයාලගෙ ගෙදර වැඩ කාරයො වාගේ නෙමෙයි මෙහෙ ඉන්න අය... ඒ හින්දා ඔයා ටිකක් කට පරිස්සම් කරගෙන ඉන්න..."

ඔහු හැකි තාක් සන්සුන් ස්වරයෙන් පැවසීය. එහෙත් මාධවීගේ කෝපය මදකින් වත් අඩු වූයේ නැත.

"එතකොට මම මෙහෙ ඉන්න ඕන වැඩකාරයන්ටත් යටත් වෙලා. එකනෙ ඔයා ඔය කියන්නෙ...?"

"වැඩකාරයන්ට යටත් වෙලා ඉන්න ඕනෙත් නෑ. එයාලව යටත් කරගන්න ඕනෙත් නෑ. එයාලා එක්ක සහයෝගයෙන් ඉන්න. එච්චරයි..."

ධනුෂ්ක පවසද්දී මාධවී ගස්සාගෙන ගෙතුළට ගියාය.

මාධවී නිවසේ හැම කටයුත්තකටම ඇඟිලි ගසන්නට පැමිණීම දෙව්න්දිට හිසරදයක් විය. නොදන්නා දෙවල් දන්නා බව පෙන්වන්නට යාම නිසා මාධවී බොහෝ අවස්ථාවල

www.sinhalaelibrary.com

අමාරුවේ වැටුණාය. එහෙත් එවන් විටෙකදී වරද අන් අයෙකු පිට පටවා නිදොස් වීමට තරම් ඇය ආත්මාර්ථකාමී වූවාය. ඇගේ හැම හැසිරීමකටම පියතිලකගෙන් ලැබුණේ අනුබලයකි. ඔවුන් දෙදෙනා බොහෝ අවස්ථාවලදී පහත් හඬින් සාකච්ඡා පවත්වන අන්දම දෙව්නිදි දුටුවාය.

"අපේ ඩිංගිරි හාමුදුරුවොත් හරියන්නෙ ලියන මහත්තයටම තමයි... හොයන්නෙම අනුන්ගෙ ඇද කුද..."

රත් මැණිකා පැවසුවේ ඉවසන්නටම නොහැකි නිසා විය යුතුයි. දෙව්නිදි එසා දූප ඇසීමට හෝ කීමට කැමැත්තක් නොදක්වන නිසා ඔවුන් ඇය ඉදිරියේ කිසිවක් පවසන්නට මැලි වූහ.

"අනුන්ගෙ ඇද හොයන්නෙ තමන් ළඟ අඩු පාඩු තියෙන අය... ඒ හින්දා අපි ඔවා ගැන හිතන්නෙ නැතිව ඉදිමු..."

දෙව්නිදි පැවසුවේ ඇය අස්වසන්නට මෙනි. එහෙත් දෙව්නිදිගේ සිතේ ද මාධවී පිළිබඳව ඇති වී තිබුණේ නරකකි. මාධවීට සියල්ල බාර දී පිට වී යන්නට ඇයට සිතුණේ වරක් දෙවරක් නොවේ. සූරියතැන්න මහතා පිළිබඳව සිතා ඇය ඉවසුවාය. සූරියතැන්න මහතා සමඟ ළං වී කතා කිරීම ද මාධවී නුරුස්සන බව පෙනෙන්නට තිබිණි.

"මොකවද දෙව්නිදිට මාමත් එක්ක ඔච්චර තියෙන කතාව...? කොයි වෙලාවෙ බැලුවත් එයත් එක්ක කියවනවා... ගෙදර වැඩ නැද්ද...?"

මාධවී විමසුවේ ද්වේෂයෙන් පුපුරු ගසමිනි. දෙව්නිදි



සිතට දැනුණු කෝපය ආයාසයෙන් පාලනය කොට ගත්තාය. මාධවී පැමිණි දින සිටම තමා මිනැවටත් වඩා කෝප වෙන බව දෙව්නිදිට හැඟී ගොස් තිබිණි.

"මීට පස්සෙ දෙව්නිදි ඉස්සරහ පැත්තෙ වැඩ කරන්න ඕනෙ නැහැ. වාසස් ඇරේන්ජ් කරන ඒවා එහෙම මට කරන්න පුළුවනි. ඔයා කුස්සියේ වැඩ විතරක් බලා ගන්න..."

වසාප් කරුණාවක් විදහා පාමින් කතා කළ මාධවීගේ සැබෑ අදහස දෙව්නිදි වහා හැඳින ගත්තාය. සූරියතැන්න මහතාගේ දයාවටත් ආදරයටත් පාත්‍ර වන දෙව්නිදි කුස්සියටම සිර කොට තැබීමට ඇයට අවශ්‍ය වන්නට ඇත.

"කුස්සියෙ වැඩත් මිස් මාධවීම බලාගන්න. මම සති දෙකක් නිවාඩු දාලා ගෙදර යන්නයි හිතාගෙන ඉන්නෙ.." දෙව්නිදි පවසද්දී මාධවී නපුරු බැල්මක් හෙළුවාය.

"එහෙම කොහොමද ඔයාට ඕන ඕන විදියට නිවාඩු ගන්නෙ...? මේක ආණ්ඩුවෙ කන්තෝරුවක්යැ..."

"මොන ජොබ් එකක වුණත් නිවාඩු නැති වෙන්නෙ නැහැනෙ... අනිත් එක මම මෙහෙ වැඩට ආවට පස්සෙ නිවාඩු ගත්තෙත් නැහැ.. මම දන්මම අහන්න ඕන ලොකු සර්ගෙන්..."

දෙව්නිදි සූරියතැන්න මහතා වෙත යන්නට හැරෙද්දීම එතැනට පැමිණියේ රත්නායකය. ඔහු යුවතියන් දෙදෙනාගේ මුහුණු දෙස ඕනෑකමින් බැලීය. කුමක් හෝ බරපතල සංවාදයක නිරත වූ ලකුණු එහි පෙනෙන්නට තිබිණි.

www.sinhalaelibrary.com

"දේවින්දි මොනවද අද ලන්ච් වලට හදන්න හිතාගෙන ඉන්නෙ...?"

"අද ඉඳල් සති දෙකක් මම නිවාඩු සර්... මිස් මාධවී තමයි උයන්නෙ..."

දේවින්දි සිනාසෙමින් එහෙත් සිත තුළින් පුපුරමින් පැවසුවාය. මාධවීගේ මුහුණ වෙනස් වී ගියේය. තමාට පහර දිය හැකි නම් ඇය එය ද කරනු නිසැක යයි ඇගේ මුහුණ දෙස බැලූ දේවින්දිට සිතිණි. ධනුෂ්කගේ මුහුණ හරඟා ද අඳුරක් පාවී ගියේය.

"මාධවීට උයන්න පුළුවන් ද...? ධනුෂ්ක විමසුවේ සැක සහිත ස්වරයෙනි.

"මොකද මට බැරි...?" මාධවී පෙරළා විමසුවාය.

"මට කුස්සි අම්මා කෙනෙක් වෙන්න ඕන කමක් නැහැ..."

යනුවෙන් පෙර දිනෙක පැවසුවේ ද මාධවීම බව දේවින්දිට සිහිපත් විය.

"මම කියන්න ආවෙ දේවින්දිට දවල්ට කිරි කොස් හදල කරවල බදින්න කියලා... මම දන්නෙ නෑ ඒ වගේ දේවල් හදන්න මාධවීට පුළුවන් වෙයි ද කියලා..."

ධනුෂ්ක සැක සහිත ස්වරයකින් විමසමින් ඔවුන් දෙදෙනාගේ මුහුණු දෙස මාරුවෙන් මාරුවට බැලීය.

"බලමුකො ට්‍රයි කරලා..." මාධවී අභියෝගය භාර ගත්තාය.



"දේවින්දිට මොකද හදිස්සියෙම නිවාඩු ඕන වුණේ...?"

ධනුෂ්ක විමසුවේ හේතුව අනුමාන කළ හැකි බව නොදන්න නොවේ. දේවින්දි පිළිතුරක් නොදී සිනාසුණාය.

"ධනුෂ්ක ඔයත් එන්නකො කුස්සියට... අද අපි දෙන්නම එකතු වෙලා උයමු..."

මාධවී ධනුෂ්කගේ අතකින් අල්ලා ගනිමින් පැවසුවාය.

"මට බෑ... මට වැඩ වගයක් තියෙනවා... ඔය දේවින්දිව අඩ ගහගන්න උදව්වට..."

"ඕව අපි කතා කළාම තමයි බැරි..."

මාධවී නොන්නාඩු කීවේ ධනුෂ්කගේ මිතුරන් පැමිණ සිටි කාලයේදී ඔහු ද ඔවුන් සමග කුස්සියට පැමිණ දේවින්දිට උදව් කළ ආකාරය සිහිපත් කරමින් විය යුතුය.

"එක්ස්කියුස් මී..."

ඔවුන් දෙදෙනාට ඕනෑ දෙයක් කතා කිරීමට ඉඩ හළ දේවින්දි සිය කාමරයට ගියාය. සැබැවින්ම දේවින්දි මෙවන් අවේලාවක කාමරයේ සිටින්නේ නැත. බොහෝ අවස්ථාවල ඇය කාමරයට ගියේ රාත්‍රී නින්දට පමණකි. අනෙක් හැම වේලාවකම වලව්ව තුළ කිරීමට කුමක් හෝ වැඩක් ඇයට තිබිණි. එසේ නැත්නම් ඇය වැව අද්දර හෝ ගමේ ඇවිදිමින් විවේක කාලය ගෙව්වාය. එම නිසාම කාමරයේ සිටීම නුහුරු බවක් ඇයට දැනිණි. අනෙක් අතට ඉවුම් පිහුම් කිරීම අතිශයින් ප්‍රිය කළ ඇයට එයින් වෙන්වී සිටීම අසීරු විය. මෙතෙක් දිනක් කුස්සියේ රැජිණ වගයෙන් සිටියේ ඇයයි. එයින් වෙන්

www.sinhalaelibrary.com

වෙන්නට සිදුවීම නිසාත් ඇගේ සිතට නුදෙකලා බවක් හා සාංකාවක් දනෙන්නට විය. සිහින් සිරි පොදත් ද වැටෙමින් තිබූ එමොහොතේ ඒ නුදෙකලා බව වඩාත් තදින් සිත තෙරපන්නට විය. ඇය ඇඳේ දිගා වී දෑස පියා ගත්තාය.

"දේවින්දි නෝනා... දේවින්දි නෝනා..."

දේවින්දි දෙනෙත් විවර කළේ කිසිවෙකු ඇගේ උරහිසින් අල්ලා සොලවද්දීය. මුහුණට නැඹුරු වී සිටි ශීලා දුටු සැණෙකින්ම තිගැස්සුණු ඇය වහා ඇඳ මත වාඩි වූවාය. මොහොතක් ගත වෙන තුරු ඇයට කිසිවක් පැහැදිලිව සිතා ගැනීමට නොහැකි විය.

"මම දේවින්දි නෝනව හැම තැනම හෙව්වා... මේ වෙලාවෙ නිදා ගත්තෙ මොකක් හරි අසනීපයක්වත් ද...?"

ශීලා ඕනෑකමින් දේවින්දි දෙස බලා විමසුවාය.

"නෑ... ශීලා අසනීපයක් නෑ. මම කම්මැලිකමට ඇඳේ ඇළ වුණා... දන්නෙම නැතුව නින්ද ගියා... කීයද දැන් වෙලාව...?"

"දෙකටත් කිට්ටුයි..."

"දෙයියනේ... පුංචි නෑ මං නිදාගෙන තියෙන වෙලාව..." දේවින්දි කලබලයෙන් ඇඳෙන් නැගී සිටියාය.

"මම මේ දේවින්දි නෝනව හෙව්වෙ අන්න අරහෙ ඩිංගිරි හාමුදුරුවො උයන්නට ගිහිල්ල ගිනි තුන්දම්..."

ශීලා බරපතල දෙයක් කියන්නාක් මෙන් කීව ද ඇගේ මුහුණේ සිනාවක් රැඳී තිබිණි.



"ඇයි මොකද වෙලා තියෙන්නෙ...?"

"පුංචි බණ්ඩාර හාමුදුරුවන්ට කිරි කොස් උයලා කරවල බැදල ඕන කිව්වලු..."

"ඉතින්...?"

"එයා උයන්න දන්න එකක් යැ. මම කොසුත් කපලා දුන්නා... කොස් ඔක්කොම ඇතිලියෙ අඩියට අල්ලලා... කරවල ටික අඟුරු වෙලා..."

ශීලා අතෙකින් කට වසාගෙන සිනාසුණාය. එහෙත් දේවින්දිට එය සිනාවට කරුණක් නොවීය. ඇයට එක්වරම මතක් වූයේ සුරියතැන්න මහතාය. හරියටම දහවල් එකට ඔහුට දිවා ආහාරය සැපයීම දේවින්දි පුරුද්දක් වශයෙන් කළාය. ඔහු මේ වන විට කුසගින්නේ පසු වෙනවා නිසැකය. ඇය වහා පහත මාලයට දිව ගියාය. කුස්සියේ කිසිවෙකු නොවීය. කරවල පුළුටු ගඳ කුස්සිය පුරාම පැතිරී තිබිණි. ඇය අතිගයින් පිළිවෙලට තබාගෙන සිටි කුස්සිය පුරාම වූයේ අපිළිවෙලකි. දේවින්දි බඳුන්වල වැසුම් ඇර බැලුවාය. ශීලා පවසා තිබුණේ සත්‍යයකි.

කුස්සියේ විදුලි සීනුව නැඩවිණි. දේවින්දි වහා සාලයට ගියාය. ධනුෂ්ක බලාපොරොත්තු සුන් වූ විලසින් සාලයේ වාඩි වී සිටියේය. මාධවී පෙනෙන්නට නොවීය.

"දේවින්දි අප්පච්චි බඩගින්නෙ..."

ධනුෂ්ක දේවින්දිගේ මුහුණ දෙසවත් නොබලා පැවසුවේ එපමණකි. දේවින්දිගේ සිත හෝස් ගා දැවී ගියේය.

www.sinhalaelibrary.com

"මම ඉක්මනට මොනව හරි හදන්නම්..."

දෙව්න්දි පැවසුවේ වරද තමා පිට පටවා ගන්නාක් මෙනි. සැබැවින්ම ඇයට වරදකාරී හැඟීමක් දැනෙමින් තිබුණේ සූරියතැන්න මහතා කුසගින්නෙන් පසු වීම පිළිබඳවය.

මාධවී නිවැරදිව උයා තිබුණේ බත පමණකි. එය ද රයිස් කුකරයේ ඉදූ බැවින් විය යුතුයයි දෙව්න්දිට සිතිණි. පොල් සම්බෝලයක් සාදා කලින් ඇඹුල් තියලට පසස් කොට තිබූ මාළු ද සමඟින් දෙව්න්දි ලහිලහියේ කෑම මේසය පිළියෙල කළාය.

"මොකද දෙව්න්දි අද ලන්ච් එක මෙච්චර පරක්කු වුණේ..? අනිත් එක ඇයි අද මේ වෙනස් කෑම වේලක්..?"

සූරියතැන්න මහතා කෑම මේසය වෙතට රෝද පුටුව පදවාගෙන එමින් විමසුවේය. දෙව්න්දි කිසිම දිනෙක දිවා කෑම වේලට ව්‍යංජන දෙකක් පමණක් පිළියෙල කරන්නේ නැත. ඔහු වෙනසක් වශයෙන් දකින්නට ඇත්තේ එය බව ඇයට වැටහිණි. ඇය කිසිවක් නොපවසා සිනාසී ඒ වන විටත් මේසයට වාඩිගෙන සිටි ධනුෂ්ක දෙස බැලුවාය. ඔහු සිටියේ බිම බලාගෙනය. මාධවී කෑම මේසයට පැමිණියේ නැත. සූරියතැන්න මහතාට යමක් තේරුම් යන්නට ඇත.

"කෝ මාධවී එන්නෙ නැද්ද ලන්ච් එකට..?" ඔහු විමසුවේ ධනුෂ්කගෙනි.

"මං කතා කළාම පස්සෙ කන්නම් කියල කිව්වෙ.." ධනුෂ්ක පැවසුවේ නොසැලකිල්ලෙනි.

"දෙව්න්දි වැඩ පැත්තකට දාලා නිදා ගත්තයින් බණ්ඩාර



හාමුදුරුවන්ට මේ කොහොටවත් නැති වෙලාවකනෙ දවල්ට කන්න වුණේ..."

කොහේදෝ සිට එතැනට පැමිණි පියතිලක චෝදනාවක හඬින් පැවසුවේය. දෙව්න්දි ඔහු දෙස බැලුවේ කෝපයෙනි. කිසිම දවසක ඔහු කෑම මේසය අසලට ඒමේ පුරුද්දක් නොවීය. මෙමොහොතේ පැමිණෙන්නට ඇත්තේ දෙව්න්දිට චෝදනා කොට මාධවී බේරා ගැනීමේ අරමුණින් විය යුතුය.

"දෙව්න්දිට අසනීපයක් ද..?"

සූරියතැන්න මහතා ඔහැකමින් ඇය දෙස බලා විමසීය. ඇය පියතිලක දෙස රවා බැලුවාය.

"පියතිලක තමුසෙ නොදන්න දේවල්වලට කට නොදා ඉන්නවා..."

දෙව්න්දි පත්වූ අසරණ තත්ත්වය වටහා ගැනීමෙන්දෝ ධනුෂ්ක නොරිස්සුම් හඬින් කීවේය. පියතිලකගේ මුහුණ වෙනස් වී ගිය ද ඔහු පසු බෑ බවක් පෙනෙන්නට නොවිණි.

"මම හොඳට දන්නවා දෙව්න්දි අද උයන්නෙ නැතුව ගිහින් නිදා ගත්ත බව.. අන්තිමට කුස්සියට යන්න වුණේ ඩිංගිරි හාමුදුරුවන්ට.."

"පියතිලක..!"

ධනුෂ්ක පුටුව වේගයෙන් පස්සට කොට නැඟී සිටියේ තර්ජනාත්මක හඬින් පියතිලක අමතමිනි. ඔහු අඩි ගණනාවක් පසුපසට විසි වූවාක් මෙන් විය. ඔහු එවර ධනුෂ්ක දෙස බැලුවේ බිය රැඳි දෙනෙතිනි. සූරියතැන්න මහතා පවා ධනුෂ්ක

www.sinhalaelibrary.com

දෙස විමතියෙන් බැලුවේ ඔහුට මෙතරම් කෝප ගන්නට හේතුව කුමක්දැයි අසන්නාක් මෙනි.

"පියතිලක නැති දේවල් මවන්නෙ නැතුව ගිහින් තමුන්ගෙ වැඩක් බලා ගන්නවා... සිද්ද වුණ දේ හොඳටම දන්න මට උගන්නන්න එන්න එපා..."

පියතිලක පැ බියපත් බව හමුවේ සිය ආවේගශීලී හැඟීම් මැඩ පවත්වා ගන්නාක් මෙන් ධනුෂ්ක එසේ කියමින් නැවතත් පුටුවේ වාඩි වූයේය. අඩි දෙක තුනක් පස්සෙන් පස්සට ගිය පියතිලක එහා කෑම කාමරයෙන් පිට වූයේය. දේවින්දි තවමත් ගල් ගැසුණාක් මෙන් බලා සිටියාය.

"මොකක්ද පුතා ඇත්තටම සිද්ද වුණේ...?"

සූරියතැන්න මහතා විමසුවේ සන්සුන්වය.

"මාධවීට තනියම උයන්න පුළුවන් කියලා කුස්සියට ගියා... දේවින්දි ඒකට ඉඩ දුන්නා... අන්තිමට බලනකොට එළවළු මාළු ඔක්කොම ඇතිලිවලම කර වෙලා..."

එවර ධනුෂ්කගේ මුවට සිහින් සිනාවක් ද නැඟී තිබිණි. එම සරදම් සහගත සිනාව දුටුවේ නම් මාධවී බෙහෙවින් කෝප වෙනවා නිසැකය.

"මාධවීට මම එදත් කිව්වනෙ දේවින්දිට පාඩුවේ වැඩ කරන්න ඉඩ දීලා එයාගෙ වැඩක් බලා ගන්න කියලා... එහෙම නැත්නම් දේවින්දිත් එක්ක හවුලෙ වැඩ කරන්න ඕන..."

"හවුල් වැඩවලට මම කැමති නැහැ සර්..."



දේවින්දි සිනාසෙමින් පැවසුව ද ඒ සිනාවට යටින් වූයේ ද්වේෂ සහගත බවකි. සූරියතැන්න මහතාත් ධනුෂ්කත් මුහුණින් මුහුණ බලාගත්හ. නිවාඩුවක් ගත කිරීම සඳහා ගෙදර යාමේ අදහස පිළිබඳව කතා කරන්නට සිතුණත් නෑම වෙලාව බැවින් දේවින්දි එම අදහස මැඩ ගත්තාය. අනෙක් අතට ඇය ආපසු ගියහොත් සූරියතැන්න මහතාට කුසගින්නේ සිටින්නට සිදුවනු නියතය.

ඒ අතරතුරුබමයෙන් පසුව මාධවී නිවසේ වැඩවලට ඇඟිලි ගසන්නට නොපැමිණීම දේවින්දිට සහනයක් සේ දැනුණ ද ඇය නිතරම පියතිලක සමග පහත් හඬින් කරන කසු කුසු දේවින්දිට එතරම් ඇල්ලුවේ නැත. එහෙත් එයට එරෙහි වීමට හෝ එම කුමන්ත්‍රණය කුමක්දැයි දැන ගැනීමට හැකියාවක් ඇයට නොවීය.

"ඩිංගිරි හාමුදුරුවන්ගෙයි ලියන මහත්තයාගෙයි වැඩේම මුණු මුණු ගාන එක... කාට ගිනි ගෙඩියක් දෙන්ට ද දන්නෙ නෑ."

දේවින්දි මල් කඩන්නට ගිය විට ගීන් කණ්වා පැවසුවේය. ඔහු ද දේවින්දි මෙන්ම අනුන්ගේ ඕපාදූප කතා කිරීමට කැමැත්තක් දක්වූ තැනැත්තෙකු නොවීය. ඔහු යමක් පැවසුවේ නොකියාම බැරි තැනකදී පමණකි. දේවින්දි උනන්දුවෙන් ඔහු දෙස බැලුවේ එබැවිනි.

"දේවින්දි නෝනා ටිකක් පරිස්සම් වෙලා ඉන්ට... ඕය දෙන්නම දිය යටින් ගින්දර ගෙනියන්ට පුළුවන් ජාතියෙ අය."

ඔහු පැවසුවේ අනතුරු ඇඟවීමක් වශයෙනි.

www.sinhalaelibrary.com

"මං කාටවත් වැරැද්දක් කරන්නෙ නැතෙ හීන් බණ්ඩා..." දේවින්දි මඳහසක් පෑවාය.

"දේවින්දි නෝනා කාටවත් වැරැද්දක් කරන්නෙ නැති නින්දම තමයි පරිස්සම් වෙන්ට කියල කියන්නෙත්... එහෙම වැරදි කරන අයට නම් මොන දේ වුණත් කමක් නෑ..." මහු පැවසුවේ ලෙන්ගතු හඬිනි. දේවින්දි එවදන් මහත් ඕනෑකමින් සිතට ගත්තාය.

"දේවින්දි ඔහොම නවතිනවා පොඩ්ඩක්..."

ඇය මල් මිටිය ද රැගෙන ගෙතුළට පැමිණෙද්දී දොරකඩ රැඳී සිටි මාධවී අණ කළාය. පියතිලක ද අර අවඥා සහගත සිනාවෙන් යුතුව ඇය පිටුපසට වී සිටින ආකාරය දේවින්දි දුටුවාය. ඇය නතර වුණේ බියකට නොවේ. මාධවී දොරකඩ හරස් කොටගෙන නැවතී සිටි බැවිනි.

"තමුසෙ නටන්න යන නාඩගම අපි දන්නෙ නෑ කියල ද හිතේ...?"

මාධවී දේවින්දිව රිදෙන තරම් තදින් බාහුවෙන් අල්ලා ගත්තාය.

"මාව අතෑරල කතා කරන්න..."

දේවින්දි මාධවීගේ අත ගිලිහෙන පරිදි අඩියක් දෙකක් පසුපසට ගියාය.

"ඇයි කුමාරිහාමිව ගෙවෙයි ද පොඩ්ඩක් ඇල්ලුවම...? පියතිලක විමසුවේ ඇය කෝප කරලමිනි.



"මේ... මට ඔහෙත් එක්ක ඇති කතාවක් නෑ... මිස් මාධවී කියන්න මොකද්ද ඔයා දන්න මං නටන නාඩගම කියලා...?"

ඇය අභියෝගයකට මෙන් කෙළින්ම මාධවීගේ මුහුණ දෙස බැලුවාය. ඇගේ මුහුණ කෝපයෙන් පුපුරු ගසමින් තිබිණි.

"තමුසෙ හිතාගෙන ඉන්නෙ මාමණ්ඩිව රවට්ටලා එයාව කසාද බැඳගෙන මේ දේපොළ ඔක්කොම තමුසෙට අයිති කර ගන්න නේද...? මං ඉන්නකම් තමුසෙට ඒ වගේ දෙයක් කරන්න ඉඩ දෙන්නෙ නෑ... අන්න ඒක දැන ගන්නවා. මං ධනුෂ්කටත් කියන්නම්කො තමුසෙගෙ හපන්කම්..."

රතිඤ්ඤා වැලක් පුපුරා හැලෙන්නාක් මෙන් එක දිගටම කියාගෙන කියාගෙන ගිය මාධවී ආපසු හැරී ගෙතුළට ගියේ වේගවත් පියවරිනි. පියතිලක ද ඇය පසුපසම ඇදී ගියේය. දේවින්දි ඔවුන් දෙස බලා සිටියේ සිය දෙපා අබියස අකුණක් පිපිරුණ කලෙක මෙන් කම්පනයෙනි.

දේවින්දි සිහි එළවා ගත නොහැක්කාක් මෙන් මොහොතක් එතැනම සිටගෙන බලා සිටියාය. ඇයට මාධවී පැවසූ වදන්වල අරුත පසක් වූයේ මඳ වෙලාවක් ගත වූ පසුවය. ඒවා එපමණටම කර්ණ කටුක සහ පිළිකුල් සහගත විය.

"හිතේ ඇති මාමණ්ඩිව රවට්ටලා කසාද බැඳගෙන මේ දේපොළ අයිති කර ගන්න..."

මාධවීගේ අමිහිරි වදන් සිහිපත් වෙද්දී දේවින්දිට දුනුමෙන් නිඩිවෙකු සිය හිසට වේගවත් පොලු පහරක් එල්ල

www.sinhalaelibrary.com

කළාක් මෙන් වේදනාවකි. ඇයට වැඩිපුරම වේදනාව දුනුණේ සූරියනැත්ත මිහකා පිළිබඳවය. ඇයත් ඔහුත් අතර සුවිශේෂි බැඳීමක් තිබෙන බව ඇත්තය. එහෙත් පියෙකු හා දුවෙකු අතර ඇති බැඳීමට එහා දෙයක් එතැන නොවීය. මාධවී පැවසුවේ ඇය සිහිනෙකින් පවා ප්‍රාර්ථනා නොකළ දෙයකි. එය කෙතරම් ජුගුප්සාජනකදැයි දේවින්දි කල්පනා කළාය.

"මොනවද දේවින්දි මේ මාධවී කියන්නෙ...?"

දේවින්දි එතැනින් ඉවත්ව යාමට සූදානම් වෙත්ම වේගයෙන් පැමිණි ධනුෂ්ක ඇගේ මග හරස් කොට ගනිමින් සිට ගත්තේය. සිය උගුරේ සිට උදරය දක්වා දුවිල්ලක් පැතිරී යනු ඇයට දැනිණි. ඇය ධනුෂ්කගේ මුහුණ බැලුවාය. එය කිසිම දිනයෙක නොවූ ආකාරයට අඳුරු වී තිබිණි. එහි ඉහළින්ම සටහන් වී තිබුණේ කෝපය බව ඇය හැඳින ගත්තාය.

"මාධවී කියන්නෙ මොනවද කියල එයාගෙන්ම අහගත්ත නම් හොඳ නැද්ද...?"

දේවින්දි ගරුසරුවක් නොමැතිව විමසුවාය. ධනුෂ්ක දත් මිටි කාගෙන ඇගේ දෙළරහිසින් අල්ලා ගත්තේ ඇයට 'ඌයි' කියැවෙන තරම් වේගයෙනි.

"දේවින්දි මං හිතුවෙ නැහැ තමුසෙ ඔය වගේ ජරා හිතක් තියෙන ගෑණියක් කියලා... තමුසෙ ගැන මම ලොකු විශ්වාසයක් තියාගෙනයි හිටියෙ... ඒත් තමුසෙ මගෙ අප්පච්චිව රවට්ට ගත්තා..."

දේවින්දි අසන්නට අප්‍රිය කළ වදන් ධනුෂ්කගේ මුවින්



නික්මෙද්දී ඇයට උන් හිටි තැන් අමතක විය. මාධවීට හෝ පියතිලකට පාන්නට නොහැකි වූ කෝපය ධනුෂ්ක කෙරෙහි එල්ල විය. ඔහුගේ දැත ගිලිහෙන සේ මදක් පසුපසට වූ ඇය අත දිග හැර ඔහුගේ කම්මුලට පහරක් එල්ල කළාය. මුවින් අව්‍යක්ත රාවයක් නංවා කම්මුල අල්ලා ගත් ඔහු ඇයට ගසන්නට මෙන් අත දිග හැරියේය. දේවින්දිගේ කෝපය ශෝකයකට හා බියකට පරිවර්තනය විය. ඇය දෝතින්ම මුව වසාගෙන ඔහු දෙස බලා සිටියාය. ඔහු එසවූ අත පහතට දමා පුපුරු ගසන දෑසින් මොහොතක් ඇය දෙස බලා සිටියේය.

"මාධවී කියනවා වගේ මට තමුසෙ වගේ කුඩම්මා කෙනෙක් හැතුවට කමක් නෑ. තමුසෙ මේ දැන්මම මෙහෙන් අප් වෙලා යන්න ඕන..."

පාලනය කර ගත නොහැකි කෝපයත් වේදනාවත් නිසා දේවින්දිට හැඬිණි. දෙනෙතින් ගලා හැලෙන කඳුළු වැල් අතරින් ඇය ඔහු දුටුවේ බොඳ වූ දසුනක් පරිද්දෙනි.

"ලොකු සර් මට තාත්තා කෙනෙක් වාගෙ. ඒ මනුස්සයට ඔය කතාව ඇහුණොත් එහෙම පපුව පැලිල මැරේවි. ඇයි සර්, මාධවී මිස් කියන එක විතරක් අහන්නෙ...? ඇයි මගෙ පැත්තෙනුත් බලන්නෙ නැත්තෙ...?"

දේවින්දිට ඉකි බිඳුම අතරින් කැඩි කැඩී වචන පිට කළාය. ධනුෂ්කගේ කෝප වේගය නිවී ගියාක් මෙන් විය. මොහොතක් කල්පනා කළ ඔහු දිග සුසුමක් හෙළුවේය.

"මාධවීයි මායි ඉක්මනටම බඳිනවා.. දේවින්දිටයි මාධවීටයි එක ගෙදර ඉන්න බෑ. ඒ නිසා දේවින්දි යන්න ඕන..."

www.sinhalaelibrary.com

එවර ඔහු පැවසුවේ තරමක් තිවුණු හඬිනි.

"ඔය වගේ ජරා කතාවක් කිව්වට පස්සෙ මම කොහොමටවත් මේ ගෙදර ඉන්නෙ නැහැ... අනිත් එක මට කවුරුවත් රවට්ටලා කසාද බැඳගෙන දේපොළ අයිති කර ගන්න ඕන කමකුත් නැහැ..."

දෙවින්දි පැවසුවේ දත් මිටි කමිනි. මාධවීත් පියතිලකත් දවා හළු කරන්නට තරම් ඒ කෝපය ප්‍රබල විය.

"තමුසෙට එහෙම ඕනකමක් නැති වුණත් තමුසෙගෙ කල්ලියට එහෙම වෙන්න ඕනෙ ඇති... තමුසෙ කවිද කියල අපි දන් හොයාගෙන ඉවරයි..."

කියාගෙන එතැනට කඩා වැදුණේ මාධවිය. දෙවින්දි අඩියකින් දෙකකින් ඇය වෙතට ළං වූවාය. ධනුෂ්ක ඔවුන් දෙදෙනා අතර සිට ගත්තේය.

"මම කවුද කියල අමුතුවෙන් කාටවත් අඳුන්වල දෙන්න දෙයක් නෑ. අපහාසවලත් සීමාවක් තියෙනවා. මගෙ ඉවසීමෙත් සීමාවක් තියෙනවා කියල මතක තියා ගන්න මිස් මාධවී..."

දෙවින්දි පැවසුවේ තර්ජනාත්මකවය. මීට පෙර ඇය මාධවී සමග ගැටුම් ඇති කර ගත් හැම විටෙකම ධනුෂ්ක ගත්තේ දෙවින්දිගේ පැත්තය. අද නම් එසේ නොවන බව දෙවින්දි දැන සිටියාය. එහෙත් මාධවි ඉදිරියේ පසු බහින්නට දෙවින්දිගේ අහංකාර සිත ඇයට ඉඩ දුන්නේ නැත.

"මේ තමුසෙ කට ගහගෙන ආවට මම බය නෑ... මෙයා මොකක් හරි හොර කල්ලියක ඔත්තු කාරියෙක් කියල



පියතිලක මුල ඉඳලම කිව්වනෙ.. නැත්නම් මොකටද මේ වාගෙ කෙනෙක් ගෙදර කුස්සි අම්මා වැඩට එන්නෙ...? කුස්සි අම්මෙකුට මොකටද සෙල්ෆෝන්...? අනිත් එක හැම වෙලාවෙම වැඩේ ලියන එක.. කවුද දන්නෙ මොන මොන ප්ලෑන්ස් හදනව ද කියලා...?"

කතුරක් ක්‍රියා කරන්නාක් මෙන් මාධවී කියාගෙන කියාගෙන ගියාය. පියතිලක පමණක් නොව මාධවී ද තමා පිළිබඳව බොහෝ දේවල් දැනගෙන සිටින බව දෙවින්දිට වැටහිණි. ඔවුන් ඇගේ හැම ඉරියව්වක් පිළිබඳවම සුපරීක්ෂාකාරීව සිට ඇති බව සහතිකය.

"ප්ලෑන්ස් හදන්නෙ කවුද ඔත්තු බලන්නෙ කවුද කියන එක මම හොඳට දන්නවා මාධවී... ඒ හින්දා ඔයා කට වහගෙන ඉන්න... මම ඒක පර් එක්ක බලා ගන්නම්..."

දෙවින්දි කෝපයෙන් පැවසුවාය. මාධවී කෝපයට පත් වූයේ ඇයට නමින් පමණක් ආමන්ත්‍රණය කිරීම පිළිබඳවය.

"ජේනවද වැඩ කාරියෙක් කතා කරන හැටි...? මම නිකම්ම නිකම් මාධවී... කොහොම වුණත් උඹට තවත් බල බලා ඉන්න දෙයක් නෑ... මේ දැන්ම... මේ දැන්ම මෙතනින් පිට වෙලා යන්න ඕන..."

මාධවී ගිගිරුවාය. ධනුෂ්ක ඇගේ කට අතින් වැසුවේය.

"මාධවී නෑ ගහන්න එපා. මෙච්චර අප්පච්චිට ඇහෙන්න දෙන්න හොඳ නෑ..."

"එයාට අලුතෙන් ඇහෙන්න දෙයක් නෑ... මෙකී ගිහින් ඔක්කොම කගේ තියාවී..." මාධවී පැවසුවේ කටුක හඬිනි.

www.sinhalaelibrary.com

"ඔව්... මම හැමදේම ලොකු සර්ට කියල තමයි යන්නෙ... ලොකු සර් දන්නවා මම වරදක් කෙරුවෙ නැ කියලා..."

දේවින්ද්‍රි තවත් වරක් ඔවුන් දෙස නොබලාම ගෙතුළට වැදුණාය. ඇයට කුස්සියට යාමට සිතුණේ නැත. එම නිසා ඇය සිය කාමරයට ගියාය. කාමරයේ දොර ඉදිරියේ පුටුවක් මත නැගීගෙන දොරට ඉහළින් ඇති කැටයම් මල් ලෑල්ල තුළින් ඇතුළත බලමින් සිටි පියතිලක දුටු විගස දේවින්ද්‍රිගේ කෝපය ඇයට පාලනය කරගන්නට නොහැකි තරම් ඉහවහ ගියේය.

"ඇයි ඇතුළෙ පෙරහැරක් යනව ද...?"

දේවින්ද්‍රි උස් හඬින් විමසුවාය. කලබල වුණ පියතිලක පුටුවත් පෙරලාගෙන බිම ඇද වැටුණේය.

"නමුසෙගෙ මහ ලොකු ඩිංගිරි හාමුදුරුවො ඇවිත් නැගිට්ට වත්නෙ නැහැ. ඔහොමම ඉන්නවා..." දේවින්ද්‍රි පැවසුවේ අවඥා සහගතවය.

ඇය පියතිලකගේ මුහුණට දමා ගසන්නාක් මෙන් වේගයෙන් දොර වසා දමා ඇඳට වැටුණාය. ඇගේ සිතුවිලි දසත විසිරෙමින් තිබිණි. ඇය දෑතේ ඇඟිලි තරයේ මිරිකා ගනිමින් ඒ විසිරෙන සිතුවිලි එක්තැන් කර ගැනීමට වෑයම් කළාය.

පියතිලකටවත් මාධවීටවත් ඇය කිසිදු වරදක් කළේ නැත. එහෙත් ඔවුන් ඇයට සතුරුකම් කළේ හුදු ඊර්ෂ්‍යාවෙන්ම විය යුතුය. මාධවීට නම් ඊට හේතුවක් තිබිණි. ඇයට හිමි ආධිපත්‍යය දේවින්ද්‍රි විසින් පැහැර ගනු ඇතැයි ඇය බිය



වෙන්නට ඇත. එහෙත් පියතිලකට දේවින්ද්‍රි සමග අමනාප වෙන්නට කිසිදු හේතුවක් නොතිබිණි. ඔහු ක්‍රියා කරන්නට ඇත්තේ මාධවීගේ ඉගැන්වුම් බස් අනුව විය යුතුය.

ඔවුන් දෙදෙනා කෙරෙහි ඇති වුණ අමනාපය කොතරම් ද ඒ හා සමානම අනුකම්පාවක් ඇය තුළ ඇති වූයේ සූරියතැන්න මහතා හා ධනුෂ්ක වෙනුවෙනි. දේවින්ද්‍රිට මේ නිවසින් පිට වී යන ලෙස ධනුෂ්ක කෙළින්ම අණ කළේය. එසේ නොකීව ද අර තරම් දරුණු චෝදනාවකට ලක් වූවාට පසුව මොහොතක්වත් මෙහි රැඳී සිටින්නට ඇයට හිත හදා ගත නොහැකි විය.

ඇය ධනුෂ්කගේ කම්මුලට පහර දුන් සිය අත්ල විදහා එදෙස බලා සිටියේ වේදනාවෙන් යුතුවය. කෝසලගෙන් හිස් වූ සිතෙහි යළිදු ආදරණීය හැඟීම් පිළිසිඳ ගත්තේ ධනුෂ්ක වෙනුවෙනි. ධනුෂ්කගේ සිතේ ද තමා වෙනුවෙන් යම් නෙනමනයක් පවතින බව ඇය සිතාගෙන සිටියාය. එහෙත් මීට මඳ වේලාවකට පෙර ඔහු ක්‍රියා කළේ සම්පූර්ණයෙන්ම වෙනස් ආකාරයෙනි. ඇය කෝපයටත් වේදනාවටත් පත් වූයේ එහෙයිනි.

"ගහන්න තිබුණෙ පියතිලකට හරි මාධවීට හරි... ඒත් ගුටි කෑවෙ අහක හිටපු ධනුෂ්ක... අපරාදෙ ඒ වෙලාවෙ මම ටිකක් ඉවසුවා නම් කොච්චර හොඳ ද...?"

දේවින්ද්‍රි අත්ල දෙස බලාගෙන පසුතැවිල්ලෙන් යුතුව සිතුවාය. බොහෝ වේලාවක් ඇඳේ වැතිරී කල්පනා කරමින් සිටි ඇය නැගී සිටියේ විශාල බරක් දරාගෙන සිටින කලෙක මෙන් අසීරුවෙනි. ඇඳුම් පැළඳුම් බෑගය තුළ අසුරද්දී ඇයට

www.sinhalaelibrary.com

මහා හිස් බවක් දැනෙමින් තිබිණි. මෙම රැකියාව සඳහා සිටන්ව ඒමට ඇඳුම් පැළඳුම් අසුරද්දී මෙවැනිම හිස් බවක් දැනුණේ නොසිතූ අයුරින් කෝසල වෙනස් වීම නිසාය. එහෙත් ඇගේ සිත පුරාම බලාපොරොත්තු පෙළ ගැසී තිබිණි. ඇය දැන් ආපසු යාමට සූදානම් වන්නේ සියල්ල අහිමි වූ අසරණියක පරිද්දෙනි.

"පියතිලකටයි මාධවීටයි නම් කවදාවත් හොඳක් සිද්ද වෙන්නෙ නෑ..." ඇය ද්වේෂයෙන් යුතුව සිතුවාය. සැබැවින්ම එවන් ද්වේෂ සහගත හැඟීමක් කෙදිනකවත් ඇගේ සිතේ ඇති වී නොතිබිණි.

"බැගය අසුරා අවසන් කළ දේවින්ද්‍රි දොර වසා දමා කාමරයෙන් පිට වූයේ අරමුණකින් තොරවය. ඇය මෙම රැකියාවෙන් සමු ගන්නා බව සූරියනැන්න මහතාට දැනුම් දිය යුතුය. ඒ සමගම ඇය මෙතෙක් ජීවිතයේදී අසා ඇති අප්‍රසන්නම වෝදනාව පිළිබඳ තොරතුරු ද ඔහුට කියන්නට සිදු වෙනවා නොඅනුමානය. එසේ කී කල ඔහු එයට කෙසේ ප්‍රතිචාර දක්වනු ඇද්දැයි සිතන්නට දේවින්ද්‍රිට හැකියාවක් නොවීය. මේ වන විට ඔහුට යථාර්ථයෙන් එහා යමක් දැන ගන්නට සිදු වී තිබුණහොත් එය ද පුදුමයක් නොවේ.

සූරියනැන්න මහතාට සියල්ල පැවසිය යුත්තේ කුමන ආකාරයෙන් දැයි සිතමින් මිදුලට බැස්ස දේවින්ද්‍රි ඉබේම හැරුණේ වැව වෙතට යොමු වූ පාරටය. සිහින් පොද වැස්සක් වැටෙමින් තිබිණි. එහෙත් කැළඹුණු සිතින් යුතුව සිටි ඇයට ඒ වැස්ස ගණනක් නොවීය.

දේවින්ද්‍රි වැව අද්දර ගල් තලාව මත වාඩි වූවාය. මේ ගල්



තලාවට ඇය බෙහෙවින් ප්‍රිය කළාය. විවේක තිබූ බොහෝ අවස්ථාවල මෙතැනට වී ගමන් ලිවීමෙන් ඇය ලද්දේ වචනින් විස්තර කළ නොහැකි තෘප්තියකි.

"අදින් පස්සෙ ආයෙ කිසිම දවසක මට මෙහෙන්ට එන්න ඉඩ ලැබෙන එකක් නෑ..." ඇය සිතුවේ වේදනාවෙන් යුතුවය.

වැව අවට වූ විසල් ගස් කොළන් නිසා එහි වූයේ අඳුරු ස්වභාවයකි. එය ඇගේ සිතේ වේදනාව වැඩි කළේය. අයේෂ් ඇතුළු ධනුෂ්ක ගේ මිතුරන් පිරිස සමග මෙහි පැමිණි දිනයෙහි මතකය අතර ඇගේ සිත මොහොතකට අතරමං විය.

"එදා අයේෂ් කරනු යෝජනාවට කැමති වුණා නම් මේවා මේ විදියට නොවෙන්නත් ඉඩ තිබුණා..."

ඇයට වරෙන එසේ ද සිතිණි. සිහින් පොදක්ව තිබූ වැස්ස වැඩි වෙන්නට විය. කෙළින්ම ඇගේ සිරුරට නොවැටුණේ ගස් කොළන් වලින් ගල් තලාව වට වී තිබූ බැවිනි. වැස්සට නොව අවට තිබූ අඳුරට බිය වූ දේවින්ද්‍රි එතැනින් ඉවත්ව යන්නට නැඟී සිටියාය.

"ඔහොම හිටපන් කුමාරිහාමි..."

ඒ සමගම ඇසුණු කටහඬකින් තිගැස්සුණු දේවින්ද්‍රි හැරී බැලුවාය. අර ඉබු මුහුණ අප්‍රියකර සිනාවකින් සරසා ගත් පියතිලක ඇය හුන් ගල්තලාව මතට පැමිණියේ වේගවත් පියවරින් යුතුවය.

"තමුසෙ මෙහෙත් ආව ද මං ගැන මත්තු බලන්න...?"

www.sinhalaelibrary.com

දේවින්දි සිතට නැගුණු බිය යටපත් කරන්නට උත්සාහ කරමින් විමසුවාය. එහෙත් ඇගේ කට හඬ සැලෙමින් තිබිණි. සිත දිරිමත් කර ගන්නට කොතරම් උත්සාහ කළත් මේ කැලෑ රොද මැද වැසි වැටෙන හෝරාවක තමා මොන තරම් අසරණ දැයි ඇයට සිතෙන්නට විය.

"මන්තු බලන්න නෙමෙයි මම ආවෙ උඹව ඉවරයක් කරල දාන්න"

දේවින්දිට එතැනින් පැන යන්නට තබා සිතන්නටවත් ඉඩක් නොදී පියතිලක ඇය තරයේ අල්ලා ගත්තේය.

"අතෑරපන් මාව අතෑරපන්..."

දේවින්දි ඔහුගෙන් ගැලවෙන්නට වෑයම් කරමින් කෑ ගැසුවාය. එහෙත් ඔහුගේ ග්‍රහණය ඇය අපේක්ෂා නොකළ තරමටම ශක්තිමත් විය. කෝපයෙන් හා පළි ගැනීමේ චේතනාවෙන් වියරු වැටුණු ඔහුගෙන් මිදෙන්නට පහසු නොවන බව දේවින්දිට වැටහිණි.

"උඹ වගේම මේ වලව්වේ හිටිය මහ කුමාරිහාමිත් මය විදියටම කෑ ගැහැව්ව දවසක් තිබුණා... දන් වැව පතුලේ ඉඳගෙන උඹ කෑ ගහන හැටිත් අහගෙන ඇති... තව ටිකකින් මං උඹවත් එතෙන්ටම යවන්නම්කො..."

ඔහු වෑයම් කළේ දේවින්දිගේ මුහුණ සිප ගන්නටය. කෝපයත් පිළිකුලත් බියත් නිසා දේවින්දිට කොහේදෝ නැති දිරියක් පහළ වූයේය.

"එහෙකොට උඹ ද මිනිහො ඒ අහිංසක ගෑනිව අතුරුදහන් කෙරුවෙ...?"



කෑ ගසා විමසූ දේවින්දි දණ තමා ඔහුගේ යටි බඩට වේගවත් පහරක් එල්ල කළාය. එහෙත් දේවින්දිගේ දෑත තර කොට අල්ලා ගත් වනම පසු පසට පැන ගත් ඔහු ඒ පහර වළකා ගත්තේය. ඒ සමගම සමතුලිතතාවය බිඳී ගියෙන් ඔවුන් දෙදෙනාම ගල් තලාව මත ඇද වැටිණි. දේවින්දිගේ දෙදණ ගල් තලාවේ වැදුණේ දැඩි වේදනාවක් ගෙන දෙමිනි.

"පර බැල්ලී..." පියතිලක උඟුර යටින් හඬ නැගුවේය.

"මම ඒ ගෑනිව අතුරුදහන් කෙරුවෙ නිකම්ම නෙමෙයි. කරන්න ඕන හැම දේම කෙරුවට පස්සෙ... ගොඩට මතක තියා ගනින්... උඹටත් වෙන්නෙ ඒ විතරම තමයි... මේ වැව මැද්දෙ තියෙන දිය සුළිය කිසිම දවසක රහස් පිටට දෙන්නෙ නෑ..."

ඔහු උමතුවෙන් මෙන් දොඩවද්දී දේවින්දි වහා නැගී සිටියාය. වැස්ස වඩාත් වැඩි වී තිබිණි. ගල් තලාව ද ලිස්සන සුළු විය. දෙදණ බෙහෙවින් වේදනා සහගත වූ බැවින් එතැනින් එක් වරම ඉවත්ව යන්නට නොහැකිව දේවින්දිගේ දෙපා පැකිළිණි. ඒ අවසරයෙන් නැගී සිටි පියතිලක නැවතත් ඇය අල්ලා ගැනීමට පැන්නේය. වේදනාව නොතකා ඇය නැවතත් දණ ගිස තමා නොවරදින පහරක් එල්ල කළේ පියතිලකගේ යටි බඩින් පහළ ප්‍රදේශයටය.

"ආහ් අම්මෝ..."

ඔහු යටි බඩ අල්ලාගෙන දෙකට නැමුණේය. දේවින්දි ඒ සමගම තවත් පා පහරක් එල්ල කළාය.

"බැල්ලි තෝ දිනුවා කියල හිතන්න එපා..."

www.sinhalaelibrary.com

කෙඳිරි ගාමින් ඔහු ගල් තලාව මත ඇද වැටිණි. දේවින්දි වහා ගල් තලාවෙන් බිමට බැස ගෙය දෙසට යන්නට සූදානම් වූවා පමණි. වැස්ස අතරින් අඩි පාර දිගේ මෙදෙසට දිව එන රුවක් ඇ නෙත ගැටිණි. ඇය වඩාත් බියපත් වූවාය.

වැස්ස අතරින් වේගයෙන් දිව ආ මාධවී නැවතුණේ දේවින්දිගේ සිරුරේ හැප්පුණාට ද පසුවය. තොප්පියක් පැළඳගෙන සිටිය ද මාධවී සිටියේ තෙත බරිතවය. ඇය නිවසේ සිටම පැමිණියේ නම් මෙතරම් තෙතබරිත වන්නට හැකියාවක් නැතැයි දේවින්දිට සිතිණි. නොඅනුමානවම ඇයත් පියතිලකත් පැමිණෙන්නට ඇත්තේ එකටමය.

"කෝ පියතිලක...? උඹ එයාට මොනවද කළේ...?"

මාධවී දේවින්දිගේ දෙඋරහිසින් අල්ලා සොලවමින් විමසද්දී තමාගේ සිතුවිල්ල සියයට සියයක්ම නිවැරදි බව ඇයට වැටහිණි.

"ඒ වගේ ජරා මිනිහෙකුට කරන්න ඕන දේ කෙරුවා... තමුසෙගෙ බොඩි ගාඩ්නෙ. හිහින් බලනවා මැරිල ද කියලා..."

කෝපයෙන් පවසා මාධවී පසෙකට තල්ලු කොට දමූ දේවින්දි එක් වරක්වත් හැරී නොබලාම දුවන්නට වූවාය. ඇය දිව්වේ ගතේ දිරියෙන් නොව සිතේ දිරියෙනි. ඇගේ දණහිසේ තුවාල බෙහෙවින් විදුම් දෙමින් තිබිණි. තෙත බරිත සාය දෙපාවල පැටලෙන්නට විය. කෝණාකාරව ඇද හැලුණු වැසි බිඳු මුහුණට වැදුණේ ඊතල තරම් විදුම් දෙමිනි. එහෙත් ඇය දිවීම නැවැත්වූයේ නැත.

"දේවින්දි..."



ඇය හති දමාගෙන පෝටිකෝව යටට එද්දී ඉස්තෝප්පුවේ විසල් කුළුණකට හේත්තු වී සිටි ධනුෂ්ක උස් හඬින් ඇය ඇමතුවේය. ඔහු හැඳින ගැනීමට නොහැකිවාක් මෙන් දේවින්දි මොහොතක් බලා සිටියාය.

"දේවින්දි මොකද මේ...?"

ඔහු ඉස්තෝප්පුවේ පඩි පෙළ බැස පෝටිකෝව යටට පැමිණියේ මවිතයෙන් එසේ අසමිනි. දේවින්දිගේ සිතේ මේ වන තුරු පැවති දිරිය අන්තිම බින්දුවටම සිඳී ගියේය. මහා අසරණ හැඟීමකින් මැඩුණු ඇය මහ හඬින් හඬමින් ධනුෂ්කගේ දෑතට වාරු වූවාය. තමා සිටින්නේ තෙතබරිතව බවක් වත් ඇයට එමොහොතේ සිහිපත් වූයේ නැත.

"ඇයි දේවින්දි මොකද වුණේ...?"

ධනුෂ්ක සිය ළමැදෙහි හිස හොවාගෙන හඬා වැටෙමින් සිටි යුවතියගේ තෙත හිස කෙස් සිය උණුසුම් සුරතින් පිරිමදිමින් විමසුවේය.

"පියතිලක... පියතිලක..."

ඇය හති දමමින් ගොත ගැසුවාය. ඔහු ඇගේ කම්මුල් දෙපසින් අත යවා මුහුණ තමා දෙසට හරවා ගත්තේය.

"කෝ පියතිලක...?" ඔහු විමසුවේ කුතුහලයෙනි.

"වැව ළඟ... මාධවීත් එතන..."

දේවින්දි කියන කිසිවක් අගක් මුලක් ධනුෂ්කට වැටහුණේ නැත. ඔහුගේ දෙබැම හැකිළී ගියේය.

www.sinhalaelibrary.com

"මේ මහ මැද්දෙ ඒ දෙන්නා වැව ළඟ මොනව කරනවද...?"

• "අනේ ගිහින් බලන්න සර්... මට බයයි... මට බයයි..." ඈය අනොරක් නැතිව හැඬුවාය.

"හරි දේවින්දි. මම ගිහින් බලන්නම් ඔයා කාමරේට ගිහින් ඇඳුම් මාරු කරගෙන ඔය තෙත කොණ්ඩෙ පිහදා ගන්නකෝ. පුළුවන් නම් කෝපි එකක් හදාගෙන බොන්න..."

ධනුෂ්ක පැවසුවේ අතිශයින් කාරුණික ස්වරයෙනි. එහෙත් දේවින්දිට ඔහුගේ දෑතේ රැකවරණයෙන් මිදෙන්නට සිතුණේ නැත. පියතිලකගේ දෑතේ ගොරහැඩි පහසත් ඔහුගේ මුහුණේ වූ වියරු වුණු පෙනුමත් සිහිපත් වෙද්දී ඇගේ සිරුර කිලිපොලා ගියේය. ඔහු මිනීමරුවෙකු බව සිහිපත් වීමෙන් ඒ හැඟීම දෙගුණ තෙගුණ වී දැනිණි.

"දේවින්දි ඉක්මනට ඇතුළට යන්න... මේ ඔයාව හොඳටම වෙව්ලනවා..."

තමා වෙව්ලන්නේ සීතල නිසා නොවන බව කීමට නොහැකි තරමටම ඇය කැළඹී සිටියාය. පියතිලක හෙළි කළ භයානක රහස පිළිබඳව ධනුෂ්කට කිව යුතු වුව ද ඇයට ඒ සඳහා දිරි උපදවා ගත නොහැකි විය.

"දේවින්දි... මට තේරෙනවා ඔයා හොඳටම බය වෙලා ඉන්නෙ කියලා. වුණ හැම දේම මට පස්සෙ කියන්නකෝ. දැන් ඔයා කාමරේට යන්න. මම හීන් බණ්ඩාත් එක්ක වැව ළඟට ගිහින් එන්නම්..."



දේවින්දි කිසිසේත්ම අපේක්ෂා නොකළ පරිද්දෙන් ධනුෂ්ක සෙමින් ඇගේ නළලත සිප ගත්තේය. මෙතෙක් වේලා ඔහුගේ සිරුරට හේත්තු වී සිටීමෙන් පවා ඇති නොවුණු ලැජ්ජාවක් දේවින්දිගේ සිතට දැනුණේ එමොහොතේය. ඇය වහා ඔහු අත හැර ගෙතුළට දිව්වාය.

තෙත බේරෙමින් සාලය හරහා දුවද්දී එක් වරම ඇගේ නෙත ගැටුණේ සූරියතැන්න මැතිණියගේ සේයාරුවය. ඇය මොහොතක් නැවතී ඒ කාරුණික මුහුණ දෙස බලා සිටියාය. ඇගේ කාරුණික බව පිළිබඳව වලව්වේ සේවය කළ සියලු දෙනාම දැන සිටියහ. ඇය සිය එකම පුතාත් රෝගී සැමියාත් අත් හැර දමා අතුරුදන් වීම පුදුමයක් වූයේ එහෙයිනි. නිවසේම සාමාජිකයෙකු ලෙස පසු වන පියතිලක මේ දයාබර කාන්තාව දූෂණය කොට මරා දැමූ බව ඔවුන්ට එවන් වඩා පුදුමය දනවන පුවතක් වෙනු ඇත. එම පුවතට සූරියතැන්න මහතා කෙසේ ප්‍රතිචාර දක්වනු ඇද්දැයි ඇයට සිතා ගැනීමට පවා නොහැකි විය.

"සුජානිගී මාගී නුගත් සන්තෝසෙන් හිටියෙ දේවින්දි... එයා පුතාටත් පණ වගේ ආදරේ කෙරුවා... එයා යනවා කියල එයාගෙම අත් අකුරින් ලියුමක් ලියල තියල නොගිය නම් මම හිතන්නෙ කවුරු හරි එයාව පැහැරගෙන ගිහින් කියලයි. ඒ තරම්ම ඒක මට පුදුමයක්. හැබැයි මට විශ්වාසයක් තියෙනවා ජීවතුන් අතර ඉන්නවා නම් මං මැරෙන්න මොහොතකට ඉස්සර වෙලා හරි සුජානි මාව බලන්න එයි කියලා. ඒ බලාපොරොත්තුව තමයි මාව ජීවත් කරවන්නෙ..."

සූරියතැන්න මහතා වරක් කී අයුරු දේවින්දිට සිහිපත් විය. ඔහු සිය බිරිඳගේ ආදරණීය මතකයට පවා ආදරය දක්විය

www.sinhalaelibrary.com

හැකි තරම් දයාබර හදවතක් ඇති මිනිසෙකි. දේවින්දි ඔහුට බෙහෙවින් ආදරය කළේ ඔහු සතු එවන් උදාර ගති ගුණ හැඳින ගත් බැවිනි. මාධවීත් පියතිලකත් ඒ ආදරය වරදවා සිතුවේ දේපොළ අයිති කර ගැනීමේ ආශාව නිසා ඇය සූරියතැන්න මහතාත් සමග සම්බන්ධයක් ඇති කර ගත් බවය. පියතිලක නම් අලජ්ජී කුහක මිනිසෙකු බව ඔහු දුටු දිනයේම දේවින්දි වටහා ගත්තාය. මාධවී ඊර්ෂ්‍යාවෙන් පිඩිතව සිටියත් ඔහුට අනුබල දීමට තරම් පහත් තත්ත්වයකට ඇද වැටෙනු ඇතැයි ඇය සිතුවේ නැත. මේ සියල්ල දැන ගත් විට සූරියතැන්න මහතා කුමන තත්ත්වයකට පත්වෙනු ඇද්ද ?

"ලොකු සර්ගෙ හිත තලන්නෙ නැතුව මේ භයානක රහස එළි කරන විදියක් මට කියල දෙන්න වලව්වෙ හාමුදුරුවනේ..."

දේවින්දි සූරියතැන්න මැතිණියගේ පින්තූරය ඉදිරියේ දණින් වැටී දෝතින් මුහුණ වසාගෙන හඬා වැටුණාය. සූරියතැන්න මහතාගේ රෝද පුටුවේ හඬ ඇසිණි. දේවින්දිට නැගිට එතැනින් පලා යාමට අවශ්‍ය වුවත් ඒ සඳහා දිරියක් තිබුණේ නැත. ඊටත් වඩා දණහිස්වල වූ තුවාල ද රිදුම් දුන්නේය.

"දේවින්දි... ඇයි මේ...?"

ප්‍රශ්නාර්ථයක හඬින් විමසූ සූරියතැන්න මහතා රෝද පුටුව පදවාගෙන එතැනට ආවේ වේගයෙනි. දේවින්දි සිටි ඉරියව්වෙන්ම නොසැලී සිටියාය.

"මොකද මේ ඔයා හොඳටම තෙමිලා...? කෝ මේ ගෙදර හිටිය මිනිස්සු කවුරුත් නැද්ද..?" සූරියතැන්න මහතා ඇගේ හිස මත පුරක තබමින් විමසීය.



## 14

**දේවින්දි** බියපත් මුවැත්තියක මෙන් ගෙතුළට දුවනු බලා සිටි ධනුෂ්කගේ මුවග ශෝකී මදහසක් ඇඳිණි. මඳ වේලාවකට පෙර සිය කම්මුල හරහා වේගවත් පහරක් එල්ල කළේ මේ යුවතියමදැයි ඔහු කල්පනා කළේය. සැබැවින්ම යුවතියකගේ අතැඟිලි එපමණටම රළු වෙනු ඇතැයි ඔහු කිසිදු දිනයෙක සිතා නොතිබිණි. ඔහු තවමත් පුපුරු ගසන සිය කම්මුල අල්ලා බැලුවේය.

"මේ කෙල්ලට මොකක් හරි ලොකු කරදරයක් වෙලා තියෙනවා. එහෙම නැත්නම් දුවගෙන ඇවිල්ලා මාව බදා ගන්නෙ නෑ..."

ධනුෂ්ක කල්පනා කළේය. මාධවීත් පියතිලකත් එයට සෘජුවම සම්බන්ධ බව නොඅනුමානය. ඔහුගේ සිතට සැකයක් දනෙන්නට විය.

www.sinhalaelibrary.com

"බලමුකො මේ මහ වැස්සෙ ඒ දෙන්නා මොනවද වැව ළඟ කරන්නෙ කියලා..."

ඉස්තෝප්පුවේ මුල්ලක හේත්තු කොට තිබූ කුඩය අතට ගත් ධනුෂ්ක එය දිග හරිමින් මිදුලට බසිද්දීම කුඩයක් ඉහලා ගත් හීන් බණ්ඩා මිදුල හරහා පැමිණියේය. ඔහු ධනුෂ්ක දෙස බැලුවේ කුතුහලයෙනි.

"පුංචි බණ්ඩාර මහත්තයා කොහෙ යන්ටද මිදුලට බැස්සෙ...?"

ධනුෂ්ක මොහොතක් කල්පනා කළේය. සිදු වී ඇත්තේ කුමක්දැයි ඔහු ද හරි හැටි දැන සිටියේ නැත. එම නිසාම හීන් බණ්ඩා කැටුව යාම නුවණට හුරුයයි ඔහුට සිතිණි.

"මම වැව ළඟට යන්න..."

"වැව ළඟට...? මේ මහ වැස්සෙ...?"

හීන් බණ්ඩා ඔහු දෙස බැලුවේ මවිතයෙනි. ධනුෂ්ක හැඳ සිටියේ සුදු පැහැති ටී ෂර්ට්යක් සහ ඔතික් සරමකි. දේවින්දි තෙත බේරෙන සිරුරින් පුතුව ඔහුට තුරුළු වී සිටීම නිසා එය දැනටමත් තෙමී තිබිණි. සරම වලා පොට ගසා ගැනීමේ පුරුද්දක් නොවූ බැවින් මිදුල හරහා ගලා යන වැසි දියෙන් සරමේ පහළ කොටස ද තෙමී ගියේය. හීන් බණ්ඩාගේ එක බැල්මට මේ සියල්ලම හසු වූයේය.

"පුංචි බණ්ඩාර මහත්තයා ඔය සරම කැහැපොට ගහ ගන්නනම්... දැනටමත් තෙමිලනෙ..."

සිය ප්‍රශ්නයට පිළිතුරක් නොලැබුණ නමුත් එහි හීන්



බණ්ඩා පැවසීය. කුඩ මිට නිකටින් සිර කොට ගත් ධනුෂ්ක ඔහු කී පරිදි කළේය.

"මේ වෙලාවෙ වැව ළඟට යන්නෙ මොකටද හාමුදුරුවනේ..?"

විරි විරි හඬින් මඩ පාගමින් ධනුෂ්ක පසුපස ගමන් කරමින් සිටි හීන් බණ්ඩා නැවතත් විමසුවේය. වත්තේ වැඩ කරමින් සිටි ඔහු මහ වැස්ස නිසා දර මඩුවට වී සිටියේය. වලව්වට පැමිණියේ දේවින්දි නෝනා ලවා උණුසුම් කෝපි කෝප්පයක් සාදවා ගන්නා බලාපොරොත්තුවෙනි. කුඩැල්ලන්ටත් මඩටත් ඉමහත් අකමැත්තක් දක්වන ධනුෂ්ක මෙවන් මොහොතක මිදුලට බසිතැයි ඔහු නිකමටවත් සිතුවේ නැත.

"වැව ළඟට යන්නෙ මොකටද කියල හරියටම කියන්න මමත් දන්නෙ නෑ... ඒත් මොකක්දෝ දෙයක් සිද්ද වෙලා තියෙනවා..."

හීන් බණ්ඩාට ධනුෂ්කගේ අණ්ඩර දෙමළය වැටහුණේ නැත. එහෙත් හාමුදුරුවන්ගෙන් දිගින් දිගටම ප්‍රශ්න ඇසීම ඔහුගේ සිරිත නොවන බැවින් හීන් බණ්ඩා නිහඬ වූයේය. බරපතල යමක් සිදු නොවී නම් පුංචි බණ්ඩාර මහත්තයා මේ වැස්සේ වැව ළඟට යාමට තබා ඒ පිළිබඳව සිතන්නේවත් නැත.

"කවුද ඒ වැව ළඟ ඉන්නෙ...?"

මහ වැස්සේ වුව ද ධනුෂ්කට වඩා දුර පෙනෙන හීන් බණ්ඩා විමසුවේ මවිතයෙන් මෙන්ම කුතුහලයෙනි. ධනුෂ්ක

www.sinhalaelibrary.com

වදනක්වත් දෙඩුවේ නැත. ඔහුට කෝපයක් දනෙමින් තිබිණි. එම නිසාම ඔහු පය ඉක්මන් කළේය.

පියතිලක ගල් තලාව මත වැතිරී කෙඳිරි ගාමින් ද මාධවී ඔහු අසළ දණ ගසාගෙන යමක් කියමින් ද සිටින දසුන දුටු ධනුෂ්කගේ කෝපය ඉහ වහා ගියේය. ඔවුන් දෙදෙනාම තෙමී බත් වී සිටියහ. ධනුෂ්කත් හීන් බණ්ඩාත් දුටු විගසම තිගැස්සුණු මාධවී වහා නැගී සිටියාය. ඇගේ දෙනෙත බියෙන් විවර විය.

"මොකක්ද මේ නටන නාඩගම...?"

ධනුෂ්ක කෝප දීප්ත නෙත්වලින් ඇය දෙස බැලුවේය. ඇය වෙව්ලන්නේ බියෙන් ද සීතලෙන් දැයි ඔහුට වැටහුණේ නැත. ඔහු ඇය වෙතින් දෙනෙත මුදා ගෙන පියතිලක දෙස බැලුවේය. හීන් බණ්ඩා නැඹුරු වී ඔහු ඔසවන්නට තැත් කළේය.

"එපා... එපා... මාව උස්සන්න එපා... අරකි මගෙ කොන්ද කැඩුවා..."

පියතිලක උස් හඬින් කෙඳිරි ගෑවේය. එහෙත් ධනුෂ්කගේ සිතේ අනුකම්පාවක් ඇති වුණේ නැත.

"මොකද්ද වුණේ...?"

ධනුෂ්ක නිදහසේ අත මිට මොළවා ගනිමින් විමසුවේ දත් මිටි කමිනි.

"දේවින්දි... දේවින්දි..."



මාධවී බිම බලාගෙන ගොත ගැසුවාය. ඇය හැඳ සිටි ටී ෂර්ටයත් කොට කලිසමත් තෙමී ඇඟටම ඇලී තිබිණි. හිසකෙස් ද හිසටම හේම වී තිබීම නිසා ඇය දිස් වූයේ පිරිමියෙකු පරිද්දෙනි.

"ඔව්... ඉතින්...? මොනවද දේවින්දි කළේ...?" ධනුෂ්ක දැඩි හඬින් විමසීය.

"දේවින්දි පියතිලකට ගහලා... එයාට දැන් නැගිට ගන්නවත් බෑ..."

මාධවී බියපත් හඬින් මිමිණුවාය. වරදක් කළ අයෙකුගේ හැසිරීම ඇගේ හැම ඉරියව්වකම තිබිණි.

"අනේ බණ්ඩාර මහත්තයා මම ඒකිට කිසිම වැරැද්දක් කෙරුවෙ නෑ... ඒකි නිකම්මයි මට ගහල තල්ලු කරල දැම්මෙ... ඒකිට හොඳක් නම් සිද්ද කරන්න එපා දෙයියනේ... අයියෝ... අම්මේ මගෙ කොන්ද..."

පියතිලක කෙඳිරි ගෑව ද ඔහුගේ කුඩුකේඩුකම් පිළිබඳව හොඳින් හඳුනන හීන් බණ්ඩාගේ සිතේ නම් අනුකම්පාවක් ඇති වූයේම නැත. ඔහු මාධවී දෙස නෙත් කොනකින්වත් බැලුවේ ද නැත.

ඇය පලා යන්නට මං සොයන බියපත් මුවැත්තියක මෙන් වටපිට බලමින් සිටියාය.

"මොකද පුංචි බණ්ඩාර මහත්තයො දැන් අපි කරන්නෙ..?"

පියතිලක ඔසවන්නට නොහැකි වූයෙන් හීන් බණ්ඩා

www.sinhalaelibrary.com

පිළිසරණ පතන දෑසින් ධනුෂ්ක දෙස බැලුවේය. පියතිලක දෑත එකතු කොට ගෙන ධනුෂ්ක දෙස බලමින් මොනවාදෝ කියවන්නට විය. කට කට ගා ගැහෙමින් සිටි බැවින් ඔහු කියූ දේවල් පැහැදිලිව ශ්‍රවණය වූයේ නැත.

"උස්සගෙන යන්නත් බැරි නම් පයින් යන්නත් බැරි නම් ඔන්න ඔහෙ මහනම මැරෙන්න අරිනවා..."

ධනුෂ්ක කිසි දිනෙක නොවූ තරම් නපුරු හඬකින් පැවසීය.

"අනේ...!"

මාධවීට එක්වරම කියැවිණි. ඒ සමගම ධනුෂ්ක හෙලූ බැල්මෙන් බිය වූ ඇය දෝතින්ම කට වසා ගත්තාය. හීන් බණ්ඩා ද ධනුෂ්ක දෙස බැලුවේ ඔහු එය පැවසුවේ විහිළුවට ද ඇත්තටම ද වටහා ගත නොහැකි වූ නිසාය.

"මාධවීට මොකද්ද පියතිලකත් එක්ක මෙතෙන්ට එන්න තිබුණු උවමනාව...?"

ධනුෂ්ක විමසුවේ විත්තිකරුවෙකුගෙන් කෝන්තර අසන නීතිඥයෙකුගේ හඬිනි. මාධවී පිළිතුරක් නොදී අසරණ ලෙස වටපිට බැලුවාය.

"හරි මම ඒක පස්සෙ බලා ගන්නම්... සිද්ද වෙලා තියෙන්නෙ මොකද්ද කියල මට දැන් හිතා ගන්න පුළුවන්... දේවින්දි කවදාවත් නිකරුණේ කෙනෙකුට හිංසා කරන කෙනෙක් නෙමෙයි..."

දේවින්දි සිය පියා සමග සම්බන්ධතාවයක් ඇතැයි



කනටත් සිනේ තිබුණත් එවර ධනුෂ්ක ඇගේ පැත්තට කතා කළේය. එය මාධවීගේ හිතලුවක්යයි හැඟීමක් මේ වන විට ඔහුගේ සිතට ඇතුළු වෙමින් පැවතිණි.

"ඒක නම් සහතික ඇත්ත බණ්ඩාර මහත්තයා... දේවින්දි නෝනත් අපේ වලව්වෙ හාමුදුරුවො වාගෙම කරුණාවන්තයි..." හීන් බණ්ඩාට කියැවිණි.

ධනුෂ්ක කිසිවක් නොකියා පියතිලක වෙත නැඹුරු වූයේය. පියතිලක කිසි දිනෙක නොවූ තරම් බැගෑපත් බැල්මකින් ධනුෂ්ක දෙස බැලීය.

"නුගත් අමාරුයි වාගෙ... අපිට නම් උස්සගෙන යන්න බැරි වෙයි..." හීන් බණ්ඩා පැවසීය.

"හීන් බණ්ඩා ගෙදර දුවල ගිහින් අර ස්ටෝර් රූම් එකේ තියෙන අකුලන ඇඳ අරගෙන එන්න. මාධවීත් යනවා හීන් බණ්ඩා එක්කම..."

ඔහු අණ කළේය. හීන් බණ්ඩා වහාම ඒ අණට කීකරු වුවත් මාධවී මදක් පැකිළෙමින් ධනුෂ්කගේ මුහුණ දෙස බැලුවාය.

"යනවා ඉතින් එක සැරයක් කිව්වම..."

ධනුෂ්ක සැර කළේය. තවත් මොහොතක්වත් ප්‍රමාද නොවූ මාධවී හීන් බණ්ඩා පසුපසින් ගාටන්නට වූවාය.

"අනේ පුංචි බණ්ඩාර මහත්තයො... මං අපරාධ කාරයෙක්... මිනීමරුවෙක්... මාව පොලීසියට බාර දෙන්න..."

www.sinhalaelibrary.com

හිටි හැටියේම පියතිලක මහ හඬින් විලාප දෙන්නට පටන් ගත්තේය. ධනුෂ්ක ඔහු දෙස බැලුවේ බොහෝ වේලාවක් නෙගෙමින් එක තැන සිටීම නිසා ඔහුගේ සිහිය විකල් වී ගොස් ඇද්දැයි සැකයෙනි.

* * *

දේවින්දිට කතා කර ගන්නට නොහැකි විය. ඇය සූරියතැන්න මහතාගේ දණහිස් මත මුහුණ හොවාගෙන හඬා වැටෙන්නට වූවාය. ඔහු අපමණ කරුණාවෙන් ඇගේ හිස පිරිමැද්දේය.

"මයාගෙ හිත හොඳටෝම කලබල වෙලා... හොඳ දරුවා වාගෙ ගිහින් ඇඳුම් මාරු කරගෙන කෝපි එකකුත් හදාගෙන එන්නකො..."

ඒ අවසරයෙන් නැගිට ගත් දේවින්දි සිය කාමරයට දිව්වාය. සූරියතැන්න මහතා මග හැරීමට ඇයට අවශ්‍යව තිබිණි. ඔහුට සත්‍යය හෙළි කළ යුතු ද නව දුරටත් බලාපොරොත්තුවේ එල්බගෙන සිටින්නට ඉඩ හළ යුතුදැයි දෙගිඩියාව ඇගේ සිතට වද දුන්නේය.

"තව ටිකෙන් වලව්වෙ හාමුදුරුවන්ට වුණ දේම තමයි මටත් වෙන්නෙ..."

දේවින්දි සිතුවේ උද්වේගයෙන් ගැහෙන සිය ළමැදට අතක් තබා ගනිමිනි. කාලයක් තිස්සේ විදේශ රටක පදිංචිව සිට පැමිණිය ද සුජානි, දේශීය සම්ප්‍රදායානුකූලව ජීවත් වෙන්නට උත්සාහ දරූ කාන්තාවක් බව දේවින්දි සූරියතැන්න මහතා වෙතින්ම දැනගෙන තිබිණි. ඇගේ කාලයේ සමාජය



මෙතරම්ම දූෂිත වී නොතිබුණ නිසා හෝ පියතිලක වැන්නෙකු සැක කිරීමට තරම් කරුණු නොතිබූ නිසා හෝ සුජානි මේ අනතුරට බඳුන් වෙන්නට ඇතත.

තමාට අතවරයක් කරන්නට එන පිරිමියෙකු මෙල්ල කිරීමට ඇති හොඳම ක්‍රමය ඔහුගේ රහසග පෙදෙසට දණහිසින් පහර දීම බව දේවින්දි දැන ගත්තේ ආත්මාරක්ෂක සටන් ක්‍රම ගැන කාන්තාව දැනුවත් කිරීම සඳහා පුවත්පතට ලියූ ලිපි පෙළකිනි. එම දැනුමෙන් පලක් වෙතු ඇතැයි එදා ඇය විශ්වාස කළේ නැත. අනෙක් අතට එදා සිටින්නට ඇත්තේ තරුණ ජවයෙන් මත් වූ පියතිලක කෙනෙකි. තවමත් ශක්තිමත් වුව ද එදා තරම් ශක්තියක් ඔහු තුළ දැන් ශේෂ වී තිබෙන්නට හැකියාවක් නැත. දේවින්දිට පහසුවෙන් ඔහු මෙල්ල කර ගැනීමට හැකි වූයේ එනිසාය.

"වලව්වෙ හාමුදුරුවොත් නිතරම වැව ළඟට යනවා ඒ කාලෙ..."

හින් බණ්ඩා කී අයුරු දේවින්දි සිහිපත් කළාය. සිත සැහැල්ලු කර ගැනීමට අවශ්‍යව තිබූ හැම විටෙකම සුජානි වැව ළඟට ගිය බව ඇයට පැවසුවේ සූරියතැන්න මහතාය. ඔහු හදිසි අනතුරට බඳුන් වූ පසුව සුජානි එතැනට වී ඒ පිළිබඳව කල්පනා කරමින් සිටින්නට ඇත. ඇය පිළිබඳව සෝදිසියෙන් පසු වූ මේ පාපතර මිනිසා ඇය බිල්ලට ගන්නට ඇත. දේවින්දිගේ සියොලඟම කිළිපොලා ගියේය. සුජානිට ඒ අවස්ථාවේ කුමන හැඟීමක් දැනෙන්නට ඇද්දැයි දේවින්දි සිතුවාය. ඇයට ආබාධිත සැමියා සිහිපත් වන්නට ඇත. මවත් පියාත් නැතුවම බැරි වයසේ සිටි දරුවා සිහිපත් වෙන්නට ඇත. ඇතැම් විටෙක ඇය පියතිලකගේ බල කිරීම මත ලිපියක්

ලියන්නට ඇත්තේ ද ඔහු ජීවිත දානය දෙනු අතැයි බලාපොරොත්තුවෙන් විය යුතුය.

"පව් දෙයියනේ..!"

දේවින්දිගේ දෑසට කඳුළු නැඟිණි. පියතිලකට නම් කිසිසේත්ම සමාවක් නොදිය යුතු යයි ඇයට සිතුණේ සුජානි පිළිබඳව දිගින් දිගටම සිතද්දීය.

"මාටව් ඕවා දනගෙන ද දන්නෙ නෑ පියතිලකට ඔච්චර සපෝට් කළේ..."

දේවින්දි සිතුවේ අප්‍රසන්න තිබූ ගමන් බෑගයක් විවෘත කරමිනි. එයින් ඇඳුමක් රැගෙන තෙත ඇඳුම් මාරු කර ගත් ඇය ඇඳ මත වාඩි වී මොහොතක් කල්පනා කරන්නට වූවාය. වහාම මේ නිවසින් පිටව් යන ලෙස ධනුෂ්ක ඇයට අණ කළේය. ඉතා දයාබර ලෙස මොහොතකට පෙර ඇගේ තළලත සිප ගත්තේත් ඒ ධනුෂ්කමය. කෙසේ වුවත් තව දුරටත් මෙහි රැඳෙන්නට ඇයට හිත හදා ගත නොහැකිය.

"මට ගෙදර යන්න වෙයි ද පොලීසියට යන්න වෙයි ද දන්නෙත් නැහැ..."

ඇය සිතුවේ සිය පා පහරින් ගල් තලාව මත ඇද වැටුණු පියතිලක පිළිබඳව සිතමිනි. එහෙත් ඇගේ සිතේ අබමල් රේණුවක තරම්වත් පසුතැවිල්ලක් හෝ ශෝකයක් ඇති වූයේ නැත.

"ඔය වගේ නපුරු මිනිහෙක් මරල දාල හිරේ ගියත් සැපයි..." ඇය සිතුවාය.



දේවින්දිට කෝපි කෝප්පයක අවශ්‍යතාව තදින් දැනිණි. එහෙත් කුස්සියට යා නොහැකි අන්දමේ හුදෙකලා බවක් ඇයට පීඩා කළේය. රන් මැණිකා හා ශීලා ද ආපසු ගියේ බොහෝ වේලාවකට පෙරය. සූරියකාන්ත මහතාට ද කෝපි ටිකක් අවශ්‍ය වී ඇතුවා නිසැකය. දේවින්දි කොට්ටයක් ද තුරුළු කර ගෙන ඇඳේ හාන්සි වූයේ විඩාබර ලෙසිනි. ඇගේ දණහිස් ද වේදනා දෙමින් තිබිණි.

"තව ටිකකින් ගිහින් කෝපි ටිකක් හදනවා..."

එසේ සිතමින් ඇය දෑස පියා ගත්තාය.

ඇය නිගැස්සී දෙනෙත් විවර කළේ කිසිවෙකු හිස පිරිමදිනු දැනීමෙනි. කාමරය පුරා වූයේ අඩ අඳුරකි. යමෙකු ඇඳේ ඇය අසලම වාඩි වී සිටිනු දුටු දේවින්දි බියපත් වූවාය. ඇය කෑ ගසන්නට මුව විවර කරත්ම ධනුෂ්ක ගේ කටහඬ ඇසිණි.

"දේවින්දි... නැගිටලා මේ කෝපි එක බොන්න..."

ඔහු කාරුණික හඬින් පැවසීය. දේවින්දිට කිසිවක් පැහැදිලිව වටහා ගත නොහැකි විය. නින්දේ ප්‍රතිඵලයක් ලෙස මෙතෙක් සිත පෙළමින් තිබූ බොහෝ වේදනාවන් සමනය වී ගොස් තිබිණි. ඇය හිස කෙස් සකසා ගනිමින් ඇඳ මත වාඩි වූයේ කුතුහලයෙන් යුතුවය.

"ඇයි මේ...?"

ඇය විමසිය යුතු හැම දෙයක්ම වචන දෙකකින් විමසුවාය.

"ඉස්සර වෙලා මේ කෝපි එක බීල ඉන්නකෝ... ඊට පස්සෙ මම ඔයාට හැම දේම කියන්නම්..."

අඩ අඳුර නිසා ධනුෂ්කගේ මුහුණේ හැඟීම් පැහැදිලිව පෙනුණේ නැත. එහෙත් ඔහු කතා කරන්නේ දැඩි සේ පාලනය කර ගත් හඬකින් බව ඇයට වැටහිණි.

ඇය ඔහු දිගු කළ කෝපි කෝප්පය අතට ගන්නේ විමසිය යුතු ප්‍රශ්න රැසක් සිතේ තෙරපෙද්දීය. ධනුෂ්ක කිසිම දිනයෙක ඇගේ කාමරයට පැමිණ තිබුණේ නැත. අනෙක් අතට ඇය ඔහුගේ සේවිකාවකි. ඇයට කෝපි සාදා ළඟට ගෙනැවිත් දීමට ඔහුට කිසිදු අවශ්‍යතාවයක් නැත.

කෝපි උගුරක් දෙකක් පානය කරන විට දේවින්දි ගේ මනසය පැහැදිලි විය. මෙතෙක් යටපත් වී තිබුණු කම්පනය නැවතත් ඇයට දැනෙන්නට විය. ඇය කෝපි කෝප්පය පසෙක වූ කුඩා ටීපෝව මත තබා ධනුෂ්ක දෙසට හැරුණාය. ඔහු දෑතින්ම හිස බදා ගෙන කල්පනා කරමින් සිටියේය.

"සර්..."

ඇය ඇඳෙන් බැස ඔහු සමීපයට ආවාය. ඇගේ තුවාල වූ දෙදණ වේදනා දුන්නේය.

" උහ්..." ඇයට ඉබේටම කෙඳිරි ගෑවිණි.

"ආ... ඇයි දේවින්දි...?"

ධනුෂ්ක සිහිනෙන් අවදි වූවෙකු මෙන් නැඟී සිටියේය.

"නෑ... මේ දණිස් දෙක ටිකක් තුවාල වෙලා..."



දේවින්දි එය සුළු කොට දක්වන්නට වෑයම් කළාය.

"කෝ බලන්න..."

ධනුෂ්ක ඇගේ අවසරයකින් තොරවම ගවුම මඳක් මෑත් කොට දණහිස් දෙස බැලීය. තමාට වකිතයක් නොදැනීම පිළිබඳව දේවින්දිට පුදුම සිතිණි.

"දෙවියනේ... හොඳටම තුවාල වෙලා නේද...? යමු යමු පහළට බෙහෙත් ටිකක් දාන්න..."

ඔහු ඇගේ අතකින් අල්ලා ගත්තේය. මෙතෙක් සිත තුළ තෙරපුණු භූදෙකලා බව පහ වී ගිය බවක් ඇයට දැනිණි.

"මෙතන එච්චර අමාරු නෑ සර්... පියතිලකට මොකද වුණේ...?"

ඇය වචන පිට කර ගත්තේ ඉමහත් වෑයමකින් යුතුවය. ඒ අභිහිරි සිද්ධිය මතක් කරන්නට පවා ඇය තුළ කැමැත්තක් නොවීය. ධනුෂ්ක දිගු සුසුමක් හෙලුවේ ඇය බියපත් කරවමිනි. පියතිලක මිය ගොස් ඇතැයි හැඟීම ඇයට දැනෙන්නට විය.

පියතිලක රෝහල් ගත කළ බවත් ඇතැම් විට ඔහුට ජීවිතයේ ඉතිරි කාලය මන්පලව ගත කිරීමට සිදු වන බවත් ධනුෂ්ක වෙතින් දැන ගත්ත ද දේවින්දිගේ සිතේ අනුකම්පාවක් ඇති වූයේම නැත. ඔහු සුජානිට කළ අපරාධයේ තරමත්, තමාට කරන්නට ගිය අපරාධයේ තරමත් සිහිපත් වෙද්දී ඔහු ලද්දේ ප්‍රමාණවත් දඬුවමක් නොවේ යයි ඇයට සිතෙන්නට විය.

"මට කිසිම දෙයක් හරියට හිතා ගන්න බැරි තරමට ඔළුව අවුල් වෙලා තියෙන්නෙ දේවින්දි..."

www.sinhalaelibrary.com

කොරිඩෝරයේ ගරාදි වැටට දෑත තබා නැඹුරුව මිදුල දිගේ ගලා යන බොර පැහැති දිය පහර දෙස බලාගත් ධනුෂ්ක පැවසුවේ සුසුමක් ද හෙළමිනි. ඔහුගේ කටහඬ බෙහෙවින් බිඳී තිබිණි. දේවින්දි ඔහු ආසන්නයේම ගරාදි වැටට පිට දී සිටගෙන සිටියාය. සිතට දනෙමින් තිබුණු නුදෙකලා බව නිසාම ඔහු වෙතින් ඈත් වෙන්නට ඇයට සිතුණේ නැත.

"මම හැම කෙනෙක් ගැනම හැම දෙයක් ගැනම හිතපු දේවල් කොයි තරම් වැරදි ද ?"

එවර ධනුෂ්ක පැවසුවේ තමාටම කතා කරගන්නාක් මෙනි. දේවින්දි ඕනෑකමින් ඔහු දෙස බැලුවාය.

"මොකක් ගැන ද සර් ඔය කතා කරන්නෙ...?" ඇය විමසුවේ කුතුහලයෙනි.

"පියතිලක ලොකු පාපොච්චාරණයක් කළා දේවින්දි.. එයා මගෙ අම්මව මරල දාපු හැටි, ඔයාවත් ඒ විදිහට මරන්න ට්‍රයි කරපු හැටි..."

ධනුෂ්ක කතා කළේ හැඬෙන්නට ආසන්න ස්වරයකිනි. දේවින්දි ඔහු සනසන්නට මෙන් තවත් පියවරකින් ඔහු වෙතට ළං වූවාය. නන්නාඳුනන සූරියතැන්න මැතිණිය වෙනුවෙන් තම සිත තුළ ඇති වූ වේදනාවේ තරම මෙන් සිය දහස් ගුණයක් ධනුෂ්කගේ සිත තුළ ඇති වෙන්නට ඇතැයි ඇයට සිතිණි.

"ඔයා දන්නෙ නෑ දේවින්දි... මම මගෙ අම්මට ආදරේ කරපු තරම්... අම්මත් ඒ වගේමයි. අම්මා අපිව දාලා ගියා කියල දැන ගත්තම මට දරා ගන්න බැරි වුණා. මම අසනීප වෙලා



හොස්පිටල් එකෙත් හිටියා. මම එදා ඉඳලා මගෙ අම්මට විතරක් නෙමෙයි අම්මගෙ පෙනුම තියෙන ගෑණුන්ටත් වෛර කළා. මාටව්ව බඳින්න කැමති වුණෙත් අප්පච්චිලාගෙයි නැන්දම්මලාගෙයි හිත් රිදවන්න බැරි හින්දා... දෙයියනේ... මට මොන තරම් පව් සිද්ද වෙන්න ඇද්ද...?"

ධනුෂ්ක කතා කළේ බලවත් වේදනාවෙනි. දේවින්දි ඔහුගේ අත මත සියත තැබුවාය.

"දැන් ඔව්වා ගැන හිතල වැඩක් නෑ සර්..."

ඇය කියද්දී ධනුෂ්ක ඇගේ අතැඟිලි තරයේ අල්ලා ගත්තේය.

"මම කොහොමද දේවින්දි ඒවා ගැන නොහිතා ඉන්නෙ...? ඔයා දන්නවද මම ඔයාව දැක්ක දවසෙ ජොබ් එකට ගන්න අකමැති වුණෙත් ඔයා මගෙ අම්මා වාගෙ හින්දා..."

තමා සූරියතැන්න මැතිණියගේ නෑදෑයෙකු දැයි බොහෝ දෙනෙකු විමසූ අයුරු දේවින්දි සිහිපත් කළාය. සත්‍යය නොදන මවට වෛර කිරීම පිළිබඳව දැන් ධනුෂ්ක පසුතැවිලි වෙනවා ඇතැයි දේවින්දිට සිතිණි. එහෙත් දැන් සිදු විය යුතු සියල්ල සිදු වී හමාරය. දැන් කළ යුත්තේ උද්ගත වී ඇති අලුත්ම තත්වයත් සමග අනාගතයට මුහුණ දීමය.

"දැන්මම ඔවා ලොකු සර්ට කියන්න එපා සර්... එයාට දරා ගන්න බැරි වෙවි..."

දේවින්දි යෝජනා කළාය. දේවින්දිගේ අත සෙමින් මුදා හැරිය ධනුෂ්ක නැඹුරුව සිටි ඉරියව්ව වෙනස් කොට ගරාදි වැටට පිට දී සිට ගත්තේය.

"අප්පච්චිට අලුතෙන් කියන්න දෙයක් නෑ දේවින්දි... පියතිලක හැම දේම කිව්වෙ අප්පච්චි ඉස්සරහමයි..."

"මොනවා...? කෝ දැන් ලොකු සර්...?"

දේවින්දි විමසුවේ කලබලයෙනි. මෙතෙක් වේලා කිසිම දෙයක් නොසොයා නොබලා නිදා ගැනීම තමා කළ විශාල වරදකැයි ඇයට සිතෙන්නට විය.

"දැන් හොඳටම නින්ද ගිහිල්ලා - ඉස්සර වෙලා නම් ඒ ෂොක් එක දරාගන්න බැරිව පොඩි ළමයෙක් වගේ ඇඬුවා... මෙච්චර කල්ම අප්පච්චි විශ්වාස කරගෙන හිටියෙ අම්මා කොහෙ හරි ජීවතුන් අතර ඇති කියලා... පියතිලකම ඒ අපරාදෙ කරපු එක අප්පච්චිට දරා ගන්න බෑ..." බලවත් වේදනාවකින් මෙන් දෙබැම මිරිකා ගත්තේය.

සූරියකැන්න මහතා පිළිබඳව දේවින්දි හොඳින්ම දැන සිටියාය. ඔහු සුජානි ගැන කිසි විටෙකත් අමතක කිහුවේ නැත. මිය යන්නට මොහොතකට පෙර හෝ නැවත වරක් ඇය දකින්නට ඔහු ප්‍රාර්ථනා කරමින් සිටියේය. ඒ පැතුම හිටි හැටියේම කුරිරු ලෙස බිඳ වැටී ගිය කල ඔහුගේ සංවේදී සිතට දැඩි කම්පනයක් දැනෙන්නට ඇත. දේවින්දි ඈදුර විසින් ගිල ගනිමින් තිබූ පරිසරය දෙස හිස් ඇසින් බලා සිටියාය. දැත ළමැද හරහා බැඳ ගත් ධනුෂ්ක ද සිටියේ අඳුර දෙස බලාගත්වනමය.

"පියතිලක සෑහෙන කාලයක් තිස්සෙ මේ වලව්වෙම ඉඳලත් ඒ වගේ දෙයක් කරන්න හිත හදා ගත්තෙ කොහොමද මන්දා..."



සෑහෙන වේලාවකට පසු දේවින්දි කට හඬ අවදි කළාය.

"මේ පරණ වලව්වල අපි නොදන්න පලහිලව් හුඟක් තියෙනවා දේවින්දි... ඔයා මේවා දැනගෙන හිටියට කමක් නෑ... ඔයා ලියන කතාවට හරි ප්‍රයෝජනයක් වෙයිනෙ..."

ඔහු දේවින්දි දෙස යටැසින් බලමින් පැවසුවේය. ඒ බැල්මෙන් කියැවුණේ 'හංගන්න හැදුවට මම සේරම දන්නවා...' වැන්නකි. මේ සේළම කියන්නට ඇත්තේ මාධවී විසින් යයි දේවින්දිට සිතිණි. පසු ගිය කාලයේ මාධවී හා පියතිලක නිතරම සිටියේ ඇය පිළිබඳව සෝදිසියෙනි. දිනක් ඇය ලියමින් සිටි අත් පිටපත පවා අවුස්සා දමා තිබූ අන්දම ඇයට මතකය.

"කවුද සේළම කිව්වෙ මාධවී ද පියතිලක ද...?"

කොරිඩෝරයේ දැල්වුණු පාණ්ඩු පැහැති විදුලි එළිය නැවරුණු ඔහුගේ මුහුණ දෙස නෝක්කාඩුවෙන් බැලූ දේවින්දි විමසුවාය.

"ඒකෙන් වැඩක් නෑ... පොතක් ලියන එක වැරදි දෙයක් නෙමෙයිනෙ... හැබැයි පියතිලක හිතල තියෙන්නෙ ඔයා සී.අයි.ඩී. එකෙන් ඇවිත් කියලා. ඒකයි හැම වෙලාවෙම තුහුරට ඔයා දිහාවෙ බැලුවෙ. මෝඩකමට මාධවීත් ඒකට අනුබල දුන්නා..."

"ඉතින් පියතිලක මොනවද කිව්වෙ කියලා කියන්නකො..."

දේවින්දි පැවසුවේ නොඉවසිලිමත්වය. තමා හොඳ හැටි

www.sinhalaelibrary.com

දන සිටින දේවල් නැවත නැවතත් කියනු ඇසීමට ඇයට අවශ්‍ය වූයේ නැත.

"අපේ අප්පච්චිගෙ බාප්පා කෙනෙක් ඉඳලා තියෙනවා කසාදා බැඳල නැති.. ඒ බාප්පා අතින් ගෙදර වැඩට හිටපු ගෑණියෙක් අනාථ වෙලා... ඒ ගෑණිට ලැබුණු පුතා තමයිලු පියතිලක... ඉතින් පියතිලක හිතනවා මේ වලව්වෙ එයාටත් අයිතියක් තියෙනවා කියලා..."

ධනුෂ්ක කට කොනකින් සිනාසුණේය. දෙව්න්දි ඔහුගේ මුහුණේ එවන් පහන් බවක් හෝ දුටුවේ බොහෝ වේලාවකට පසුවය.

"ඉතින් මෙච්චර කල්ම කවුරුවත් ඒ බව දනගෙන හිටියෙ නැද්ද...?"

"අප්පච්චි පියතිලක කාගෙ කවුද කියන එක නම් දනගෙන ඉඳල තියෙනවා... ඒත් ඔය වාගෙ දූෂ්ට අදහස් තියෙනවා කියලා දනගෙන ඉඳල නෑ... අද පියතිලක ඒ හැම දේම කිව්වා... අප්පච්චි අස්සයා පිටින් වැටිල තියෙන්නෙත් පියතිලක අස්සයා කුලප්පු වෙන්න මොනවදෝ බෙහෙතක් දීලලු..."

"දෙවියනේ මෙහෙමත් මිනිස්සු..." දෙව්න්දි හිල්ලුවාය.

"පියතිලක අම්මට බල කරල තියෙනවා ගෙදරින් යනවා කියල ලියුමක් ලියන්න... එහෙම හරි ජීවත් වෙන්න ඉඩ ලැබේවි කියලා අම්මා ලියුම ලියල තියෙන්නෙ... මගෙ පුතා වෙනුවෙන් මට ජීවත් වෙන්න ඉඩ දීපන් කියලා අම්මා ඇඬුවලු දෙව්න්දි..."



එය පවසද්දීම ධනුෂ්කට හැඬිණි. ඔහු දෝතින් මුහුණ වසා ගත්තේය. කිසිම දෙයකින් කම්පනයට පත් වෙන බවක් නොපෙන්වන ධනුෂ්ක වැනි දැඩි සිතැත්තෙකු හඬා වැටෙනවා දකින්නට දෙව්න්දිට නොහැකි විය.

"අඬන්න එපා සර්..."

ඇය ඔහුගේ දෝත මුහුණින් ඉවතට ගත්තාය. ඔහු එක්වරම ඇය වැළඳගෙන ඇගේ ගෙල මුල මුහුණ හොවා ගත්තේය. දෙව්න්දිට තැති ගැන්මක් හෝ ආගන්තුක බවක් දනුණේ නැත. මෙතෙක් දිනක් වෛර කළ ආදරණීය මව වෙනුවෙන් ඔහුගේ දෙනෙතින් ගැලූ කඳුළුවල සීතල ඇගේ ගෙල මුලට දනිණි.

www.sinhalaelibrary.com

## 15

**සූර්යතැන්න** මහතා මෙන්ම ධනුෂ්ක ද හැසිරුණේ හදිසියෙන්ම හිලන් වූ අය මෙන් මළානික ස්වභාවයෙනි. ඔවුන් දෙදෙනා තුළම වූ ජීව බව.පලා ගොස් තිබිණි. කෑමට බීමටවත් ඔවුන් එතරම් උනන්දුවක් දක්වූයේ නැත. මාධවී සිය කාමරයෙන් එළියට ආවේ කෑම වේලාවට පමණකි. ඒ ද සූරියතැන්න මහතා හා ධනුෂ්ක කෑම මේසයෙන් ඉවත් වූවාට පසුවය.

නිවස තුළ වූ අස්වාභාවික නිහඬතාවයත් සූරියතැන්න මැතිණියට සිදුවූ විපත දැන ගැනීම නිසා ඇති වූ කම්පනයත් නිසා දේවින්දි සිටියේ ද අන්ද මන්ද වූ ලෙසිනි.

ගෙදර යාමට ගත් තීරණය ක්‍රියාත්මක කළ යුතු යැයි ඇය සිතුවේ එනිසාය.



සෙමින් සෙමින් ගෙවත්තට ගිය දේවින්දි අඹ ගස යට වූ ලෑලි බංකුවේ වාඩි ගත්තාය. නිරන්තරයෙන්ම ඇද හැලෙන වැස්ස නිසා පරිසරය මෙන්ම බංකුව ද තෙත් වී තිබිණි. එහෙත් ඇය ඒ පිළිබඳව තැකීමක් කළේ නැත. අඹ ගසේ කොළ අතරින් පෙරී ආ හිරු රැස් පුල්ලි වශයෙන් බිම පතිත වී තිබිණි. ඇය කිසිදු හැඟීමකින් තොරව එදෙස බලා සිටියාය.

"ඔය බංකුව තෙමිලා නැතෑ නෝනා..."

ඇය අසලින්ම හීන් බණ්ඩාගේ කට හඬ නැඟී ආවේය. ඇය හැරී බැලුවාය. සරමකින් හා ජටාවකින් පමණක් සැරසුණු හීන් බණ්ඩා උදැල්ලක් ද කර තබාගෙන බංකුව අසල සිටගෙන සිටියේය.

"ඔන්න ඔහෙ ටිකක් තෙමුණාට කමක් නෑ හීන් බණ්ඩා..." දේවින්දි සිනාසෙන්නට තැත් දැරුවාය.

"නෝනා අද මල් කඩන්නෙ නැද්ද...?"

හීන් බණ්ඩා විමසුවේ වෙනදාට නම් ඇය මල් පෝච්චි සකස් කිරීම පිණිස මල් කැඩීම පුරුද්දක් වශයෙන් කළ නිසාය.

"නෑ... මට දැන් හැම දේම එපා වෙලා තියෙන්නෙ..." දේවින්දි සුසුමක් හෙළුවාය.

"මටත් එහෙම වුණා නෝනා අපෙ වලව්වෙ හාමුදුරුවන්ට සිද්ද වුණ දේ ඇහැව්වට පස්සෙ..."

සුසුමක් හෙළූ ඔහු උදැල්ල බිම තබා පසෙකින් ඇණ තබා ගත්තේය. සූරියතැන්න මැතිණිය සිය කැමැත්තෙන් නිවසින් නොගිය බව සූරියතැන්න මහතා මෙන්ම හීන් බණ්ඩා

www.sinhalaelibrary.com

ද විශ්වාස කළේය. එම නිසාම ඔහු තුළ ඇය කෙරෙහි වූ ආදරය හා ගෞරවය මඳකින් හෝ අඩු වී නොතිබිණි.

"ඒ කාලෙ ඉඳලම මට ඔය ලියන්නව දැනැට පෙන්නන්ට බැරුව හිටියෙ... ඔහොම දෙයක් දනගෙන හිටිය නම් මම මේ අත් දෙකෙන් බෙල්ල මිරිකල ඕකව මරල දාන්නෙ..."

හීන් බණ්ඩා කතා කළේ පහත් හඬින් වුවත් දත් මිටි කමිනි.

"දැන් ඔව්වා ගැන කතා කරලා වැඩක් නෑ හීන් බණ්ඩා... කතා කරනකොට වෙන්නෙ හිත් රිදෙන එක විතරයි...". දේවින්දි පැවසුවේ ඈත බලාගෙනය.

"සිද්ද වුණු දේ වෙලා ඉවරයි... අලුතින් කිසිම දෙයක් කරන එක සුජානිටත් අවනම්බුවක්... ඒ හින්දා මේ සිද්ධිය මෙහෙමම වැළලිලා ගියාවෙ... කවුරුවත් ඒ ගැන පිට තැන්වල කතා බහ කරන්න ඕනෙ නැහැ..."

සූරියතැන්න මහතා දේවින්දිටත් මාධවීටත් හීන් බණ්ඩාටත් කතා කොට පැවසුවේය. පියතිලක පොලීසියට බාර දෙන්නට හීන් බණ්ඩාට වුවමනාව තිබිණි. එහෙත් සූරියතැන්න මහතාගේ කතාවෙන් පසුව ඔහු ඒ අදහස නැවත ඉදිරිපත් කළේ නැත.

"මම මෙව්වා නෝනා එක්ක කතා කෙරුවට අපේ ගෑණි එක්කවත් කිව්වෙ නෑ නෝනා... කටවල් විශ්වාස නැනෙ... හැම තැනම කියන්ට බැරි නෑ..."

හීන් බණ්ඩා පැවසුවේ මැදගිල්ලත් දබරගිල්ලත් දෙතොලට තබා බුලත් කෙළ පහරක් ඈතට විදිමිනි.



"ඒක හොඳයි හීන් බණ්ඩා... හැමෝම හිතාගෙන ඉන්නෙ වලව්වෙ හාමුදුරුවො කොහෙ හරි ගිහින් කියලනෙ.. දැන් ආයෙ හාරා ඇවිස්සුවා කියලා ඇති වෙන සෙතක් නැනෙ..."

"ඒක නං හැබැව තමයි නෝනා... අපි කිව්වටත් බෑ... ඔව්වා පතා කියාගෙන එන හැටියට සිද්ද වෙන දේවල්..."

"දැන් පියතිලකට කොහොමද දන්නෙ නෑ නේද හීන් බණ්ඩා..."

දේවින්දි විමසුවේ කතාව වෙනතකට හරවන්නටත් සමගය. චතුෂ්ක හෝ සූරියතැන්න මහතා පියතිලක බැලීමට රෝහලට යාමට කැමැත්තක් දැක්වූයේ නැත. හීන් බණ්ඩා වරක් දෙවරක් ගියේ සූරියතැන්න මහතාගේ ඉල්ලීම ඉටු කිරීමටය.

"අර බණ්ඩාර හාමුදුරුවන්ගෙ වචනෙට පිටු පාන්ට බැරි හින්දා ගියා මිසක් නැත්තං මගෙ බල්ලවත් යවන්නෙ නෑ ඔය යකාව බලන්ට... ඔය ඉන්නෙ නැගිට ගන්ටවත් බැරුව දපා කියලා... ඔව්වට තමයි නෝනා කියන්නෙ කළ කම් පල දෙනවා කියලා..."

"දැන් පියතිලක බලා ගන්නෙ කවුද...?"

"කාත් කවුරුවත් නෑ කියලා අපි හිතාගෙන හිටියට ඔය කටුගස්තොට පැත්තෙන් කසාදයක් කරගෙන ඉඳල තියෙන්නෙ... ලොකු ළමයි දෙන්නෙකුත් ඉන්නවා... ගෑණිත් එදා ඇවිත් හිටියෙ..."

පියතිලක ආබාධිත බවට පත් කළේ තමා විසිනැයි හැඟීම පිටු දකින්නට නොහැකිව සිටි දේවින්දිගේ සිතට එම

ආරංචිය සැනසුමක් දනවීය. ගැහැණු සිත් සැබැවින්ම සංවේදීය. මුදු මොළොක්ය. තමන්ට මෙහෙවින් විද වූ අයෙකු වුව ද විපතකට වැටුණු කල එය දරා සිටීමට ඔවුනට හැකියාවක් නැත. පිරිමි ඔවුන් විදවන්නේ ද මේ චරිත ස්වභාවය ආයුධ බවට පත් කොටගෙනය. දේවින්දි සුසුමක් හෙලුවාය.

"මම හෙට ගෙදර යනවා හීන් බණ්ඩා..."

දේවින්දි කියද්දී හීන් බණ්ඩා ඇය දෙස බැලුවේ නිගැස්සීගෙනය.

"ඒ මොකටද දේවින්දි හදිස්සියෙන්ම ගෙදර යන්නෙ...?"

එසේ විමසන තුරුම ධනුෂ්ක එතැනට පැමිණි බව ඔවුන් දෙදෙනාගෙන් එක් අයෙක්වත් දුටුවේ නැත. හීන් බණ්ඩා වතු උදල්ල ද රැගෙන එතැනින් ඉවත් වී ගියේය. දේවින්දිට නැඟී සිටින්නට අවශ්‍ය වුවත් ඊට පෙර ධනුෂ්ක බංකුවේම පසෙකින් වාඩි ගත්තේය. ඔහුගේ දෑස නිමේෂයකටවත් ඇය වෙතින් ඉවත් වූයේ නැත. දේවින්දි අඹ ගසෙන් ගිලිහුණු ඉදුණු කොළයක් නිය තුඩින් කොනහමින් ඔහු දෙස බැලුවේ යටැසිනි.

"ඇයි ගෙදර යන්නෙ...?" ඔහු නැවත ද විමසුවේය.

"ආවට පස්සෙ මං ගෙදර ගියෙ නැනෙ... අනික් එක මාධවී මිසුත් ඉන්න හින්දා සර්ලට කෑම ප්‍රශ්නයක් එන එකකුත් නැතෙ..."

"මාධවී එක දවසක් කෑම උයන්න ගිහින් දක්කනෙ වුණ දේ... තව පොඩ්ඩෙන් අපි හැමෝම බඩගින්නෙ..."



"එක දවසක් එහෙම වුණාට හැමදාම එහෙම වෙන එකක් නෑ..."

එසේ පැවසුව ද ඇයට අවශ්‍යව තිබුණේ ධනුෂ්කම ඇයට රැකියාවෙන් ඉවත් වී පිටව යන ලෙස අණ කළ බව මතක් කොට දීමටය.

"මාධවියි මායි බැන්දට පස්සෙ දේවින්දිට මේ ගෙදර ඉන්න බෑ..."

ඔහු කියූ ආකාරය මේ මොහොතේත් ඇය ඇසෙන්නාක් මෙන් විය.

"මං දන්නවා දේවින්දි ඔයා මොනවද හිතන්නෙ කියලා... ඒත් මාධවී නෙමෙයි කවුරු හිටියත් අප්පච්චිගෙයි මගෙයි ජීවිතවල ඔයා නැති අඩුව පුරවන්න පුළුවන් වෙන එකක් නෑ..."

ධනුෂ්ක පැවසුවේ අතිශයින්ම හැඟුම්බර හඬකිනි. ඔහුගෙන් මෙවන් වදන් පෙළක් හෝ ස්වරයක් බලාපොරොත්තු නොවුණ දේවින්දි විස්මයෙන් දෙනෙත විකසිත කොට ඔහු දෙස බැලුවාය.

කෝපලගෙන් හිස් වූ හද මැදුරට ධනුෂ්ක සෙමින් පිවිසෙමින් සිටින්නේ යයි දේවින්දිට සිතිණි. එසේ නොවුණේ නම් ඇය ආපසු නිවසට යාමේ තීරණය වෙනස් කරන්නේ නැත.

"මේ වෙලාවෙ අප්පච්චියි මාවයි තනි කරන්න එපා දේවින්දි..."

www.sinhalaelibrary.com

ධනුෂ්ක පැවසුවේ බැගෑපත් ලෙසය. දේවින්දිට එවදන්වලට පිටුපෑමට හැකියාවක් නොවිණි. අනෙක් අතට සූරියතැන්න මහතා සිත වේදනා කරගනු ඇතැයි හැඟීම ද ඇය පසුබට කරවන්නට සමත් විය.

දේවින්දිගේ පුරුදු දින චරියාව එහෙම සිටින්ම වෙනස් වී තිබිණි. ඇය ඇවිදින්නට ගියේ නැත. වැව තිබෙන පැත්ත බැලීමටවත් ඇයට හැකියාවක් නොවීය. පෝච්චිවල දමූ මල් එතුළම පර වී තිබිණි. මහ හුදෙකලා බවක් නිරන්තරයෙන්ම සිත පෙළන්නට විය. රණ්ඩු වීම පිණිසවත් මාධවී කතාබහ කරන්නේ නම් හොඳයයි ඇයට සිතිණි.

ධනුෂ්ක හා මාධවී අතර ද නිරන්තරයෙන්ම ගැටුම් ඇති වන බව දේවින්දිට දැනිණි. එවන් විටෙක ධනුෂ්කගේ කාර්ය ගෙන වලව්වෙන් පිට වී යන මාධවී ආපසු පැමිණියේ බොහෝ වේලාවකට පසුවය.

ගැටුමක් ඇති වූ හැම විටෙකම ධනුෂ්ක නොසන්සුන් පියවරින් ඒ මේ අත සක්මන් කරන ආකාරය දේවින්දි බලා සිටියේ අනුකම්පාවෙන් යුතුවය. ඔහුගේ හිස අත ගා තළල සිපගෙන ඔහු සැනසීමේ ආශාවක් ඒ හැම විටෙකම ඇය තුළ හට ගත්තේය. ඇය ඒ හැඟීම පාලනය කර ගත්තේ සිත සමග දැඩි සටනක් කිරීමෙන් අනතුරුවය. ඔහු දේවින්දිගේ ගෙල මුල මුහුණ හොවාගෙන හඬා වැටුණු දිනයේ ඇය එලෙස කර තිබිණි. එහෙත් නැවත වරක් එසේ කිරීමෙන් ඔහු තමා පිළිබඳව වැරදි වැටහීමක් ඇති කර ගනු මිසක සිදු වන වෙනත් යහපතක් නැතැයි ඇයට සිතිණි.

"මම අම්මයි අප්පච්චියි ලංකාවට එනකම් ඉන්නෙ නෑ... යනවා ආපහු එංගලන්තෙටම..."



ධනුෂ්ක හා බහින්බස් වූ දිනෙක මාධවී මහ හඬින් පවසනු දේවින්දිට ඇසිණි. එමොහොතේ දේවින්දි සිටියේ පර වූ මල් ඉවත් කොට මල් පෝච්චි සකස් කරමිනි. මාධවී සාලයේ සිටි ඇය නොදුටුවේ ද දැන දැනත් නොතකා හැරියේ දැයි දේවින්දි දැන සිටියේ නැත.

"එංගලන්තෙ බැරි නම් අයිස්ලන්තේ ගියත් මට කමක් නෑ..." ධනුෂ්ක පැවසුවේ කෝපයෙනි.

"ඔව් එතකොට ඕන ඕන විදියට නටන්න බැරියැ... හිතන්න එපා මම මොකුත් නොදැන ඉන්නෙ කියලා... මං ඇස් දෙකින්ම දැක්කා අරකිව බදාගෙන හිටපු විදිය..."

මාධවී දත් මිටි කමින් කියාගෙන යද්දී දේවින්දිගේ සිරුර සීතල වී ගියේය. ඇය කතා කරන්නේ තමා පිළිබඳව බව නිසැකය. එහෙත් ඒ සිදුවීම සිහිපත් වෙද්දී දේවින්දිගේ සිතේ ලැජ්ජාවක් හෝ පසුතැවිල්ලක් ඇති වූයේ නැත. එදා ධනුෂ්ක ඇය වැළඳගෙන සිටියේ කිසිදු රාගී චේතනාවකින් තොරව අසරණ හැඟීමෙනි. එහෙත් හැම දෙයක්ම වරදවා සිතන මාධවීට එය වැරදි හැසිරීමක් වශයෙන් පෙනීම පුදුමයක් නොවේ. එදා එය දැක දැකත් ඇය නිහඬව සිටින්නට ඇත්තේ සිදුවූ දේවල්වලට ඇය ද යම් තරමකින් හෝ වග කිව යුතු නිසා විය යුතුය.

"මාධවී අනික් අය දිහාවට ඇඟිල්ලක් දික් කරනකොට තමන් දිහාවට ඉතුරු ඇඟිලි ටික දික් වෙලා තියෙනවා කියල මතක තියා ගන්නවා. තමුසෙ හැදුවෙ පියතිලකත් එක්ක එකතු වෙලා දේවින්දිව මෙහෙන් පන්න ගන්න..." ධනුෂ්ක කතා කළේ ද උස් හඬිනි.

www.sinhalaelibrary.com

"ඒකිව පන්න ගන්න මට පියතිලකගෙ උදව් ඕනෙ නෑ... මට දන් වුණත් ඒක කරන්න පුළුවන්..."

කටහඬවල් ඇසුණ ද දේවින්දිට ඔවුන් පෙනුණේ නැත. එහෙත් කෝපයට පත්වූ විට මාධවීගේ මුහුණේ ස්වභාවය කෙබඳුදැයි ඇය දැන සිටියාය. කළු වී විරූප වන ඒ මුහුණ දෙස වරකට වඩා බැලීමට කෙනෙකුට හැකියාවක් නැත. වියරු වැටුණ කලෙක මෙන් ඇගේ ඇස් පිය වහා සැලෙයි. මෙමොහොතෙහි ද ඇගේ ස්වභාවය එලෙස විය යුතුය.

දුඩි බවක් පැව ද ධනුෂ්ක නිතරම කෝපයට පත් වෙන අන්දමේ තැනැත්තෙකු නොවීය. ඔහුගේ කෝපය පුර කොට තැකිය හැකි නොවූයේ එහෙයිනි.

"දේවින්දිව පන්න ගන්න කිසිම කෙනෙකුට හම්බ වෙන්නෙ නෑ. තමුසෙයි පියතිලකයි එකතු වෙලා අර අහිංසක අප්පච්චිටත් කතන්දරයක් හැදුවා... මොනවට සමාව දුන්නත් තමුසෙට මම ඒකට නම් සමාව දෙන්නෙ නෑ... අන්න ඒක හොඳට මතක තියා ගන්නවා මාධවී..."

ඔහු කතා කළේ ඇය දෙසට ඇඟිල්ල දිගු කරමින් විය යුතු යයි දේවින්දිට සිතිණි. ඔවුන්ගේ ඇය නොගැසී මෙතැනින් පලා යාමේ ක්‍රමයක් සොයන්නාට මෙන් දේවින්දි වට පිට බැලුවාය. සිය කාමරයේ දොරකඩට වී ඔවුන්ගේ කතාවට සවන් යොමා සිටින සූරියතැන්න මහතා ඇගේ නෙත ගැටුණේ එවිටය.

"දෙවියනේ...!"

දේවින්දි අතින් මුව වසා ගත්තාය. ඒ සිත රිදවන කතාව



සූරියතැන්න මහතා විසින් දැන නොගත යුතු දෙයක් යයි ඇය කල්පනා කළාය.

"මොකද පුතා ඔය මහ හයියෙන් කරන කතාව...?"

සූරියතැන්න මහතා විමසුවේ ඔවුන් දෙදෙනා අසලට රෝද පුටුව පදවාගෙන එමිනි. වැස්සක් එක් වරටම ඇදුණු විටෙක මෙන් ඔවුන් දෙදෙනා නිහඬ වූහ. දේවින්දි තැති ගත් සිතින් යුතුව බලා සිටියාය.

"මේ වලව්ව ඇතුළෙ කවදාවත් කිසිම කෙනෙක් ඔය විදියට රණ්ඩු වෙලා නෑ... මොකක්ද ඔය හැම තිස්සෙම පොර කුකුළ්ලු වාගෙ කා කොටා ගන්න එකේ තේරුම...?"

ඔහු විමසුවේ ඔවුන් දෙදෙනා අතර ඇතිවන ගැටුම් ඔහුට රහසක් නොවේ යයි අඟවන හඬකිනි.

"අප්පච්චි මම මේ මඟුලට කැමති වුණේ අප්පච්චිගෙ හිත රිදවන්න බැරි හින්දා... දැන් අප්පච්චිටම පේනව නේද මාධවීටයි මටයි එක වහලක් යට ඉන්න බැරි විත්තිය...?"

ධනුෂ්ක නොඉවසුම් සහගතව විමසන හඬ දේවින්දිට ඇසිණි.

"මෙච්චර කාලයක් ඔය වගේ ප්‍රශ්නයක් තිබුණෙ නෑ... අර වැඩකාර ගෑණි හින්දා තමයි මේ ඔක්කොම... හොඳයි ඒක මං බලා ගන්නම්කො..." මාධවී දත් සැපුවාය.

"මාධවී මං එදත් ඔයාට කිව්වා දේවින්දි කියන්නෙ අහිංසක කෙල්ලක්... ඔයාට ඇයි බැරි ඒ කෙල්ලත් එක්ක සහයෝගෙන් ඉන්න...?"

www.sinhalaelibrary.com

කවදාත් කරන්නාක් මෙන් සූරියතැන්න මහතා දේවින්දිගේ පැත්තට කතා කළේය. එයින් මාධවී තවත් කෝප වූවාය.

"වැඩකාර ගෑණු එක්ක මට කිසිම ගණුදෙනුවක් නෑ.. දන් බලනකොට මේ දෙන්නටම ලොකුවෙලා තියෙන්නෙ ඒකිනෙ.."

"මින් මාධවී මං හිතුවෙ නෑ ඔය ළමයා ඔය තරම් පහත් විදියට මිනිස්සු ගැන කතා කරන කෙනෙක් කියලා.."

සූරියතැන්න මහතා කතා කළේ කලකිරීමෙනි.

"අප්පච්චි හරියටම දන්නෙ නෑ මෙයා පියතිලකත් එක්ක එකතු වෙලා කියපු කරපු දේවල්... කොහොම වුණත් මම නම් මාධවීව බඳින්නෙ නෑ... අප්පච්චි මට බල කළොත් එහෙම මම ලංකාවෙ ඉන්නෙත් නෑ..."

ධනුෂ්ක කතා කළේ කවදාවත් නැති තරම් ආවේගයෙනි. මෙම ගැටුම තීරණාත්මක එකක් වනු ඇතැයි දේවින්දිට සිතිණි.

"මම ළඟදීම මාධවී ව බඳිනවා. එතකොට දේවින්දිටයි මාධවීටයි එක ගෙදරක ඉන්න බෑ... ඒ හින්දා දේවින්දි මෙහෙන් යන්න ඕන.."

එදා ධනුෂ්ක එලෙස කතා කළෙත් මේ ස්වරයෙන්මය.

"මම වැරදියි කියල දන් මට තේරෙනව පුතා... මම හැමදාම ඕනවට වැඩිය මිනිස්සු විශ්වාස කෙරුවා... පියතිලකව ඔය තරම් විශ්වාස කරන්න එපා කියල පුතාගෙ



අම්මා කියද්දි මම එයාට දොස් කිව්වා... ඒත් ඒක ඇත්තටම නම් අදත් එයා ජීවතුන් අතර..."

සෙම්ප්‍රතිශ්‍යාව වැළඳුණු කලෙක මෙන් සූරියතැන්න මහතාගේ කටහඬ වෙනස් වී තිබිණි. දේවින්දිට තව දුරටත් එයට සවන් දී සිටීමට හැකි වූයේ නැත. ඇය ඔවුනට නොපෙනෙන ලෙස පහත් වී උඩු මහලට යොමු වූ පියගැට පෙළ අද්දරින් අනෙක් පැත්තට පැන ගත්තාය.

"නැන්දලා ආවට පස්සෙ අපි තීරණයක් ගනිමු පුතා..."

සූරියතැන්න මහතා පවසනු ඇයට ඇසිණි.

* * *

"මොකද දරුවෙ ඔයාට ගෙදර එන්න බැරි..?"

අම්මාගේ කටහඬ නෝක්කාඩුවෙන් පිරී තිබිණි. ඇය තමා දකින්නට නැති සාංකාවෙන් පෙළෙමින් ඇතැයි දේවින්දිට සිතිණි. පසු ගිය දිනවල දිගින් දිගටම ඇති වූ පීඩාකාරී සිදුවීම් නිසා ඇයට ගෙදරට දුරකථන ඇමතුමක් දීමටවත් සිහිපත් වූයේ නැත. අයියා අප්පච්චි හෝ අක්කා දිනකට දෙකකට වරක් කතා කොට සැප දුක විමසූහ. දේවින්දි අම්මා සමග කතා කිරීම අඩු කළේ කතා කළ හැම විටෙකම ඇය ආපසු එන ලෙස බල කිරීම නිසාය.

"මම හෙට අනිද්දා දවසක ඇවිත් යන්න එන්නම් අම්මා..."

දේවින්දි පැවසුවේ අම්මා දොස් පවරනු ඇතැයි බිය නිසාය.

www.sinhalaelibrary.com

"තනියම එන්න ඕන නෑ... මන්න බුද්ධි පුතාගෙ මනමාලි බලන්න අයියල එන්න ලෑස්ති වෙලා ඉන්නවා. එයාලත් එක්කම ඔයත් එන්න..."

"හොඳයි අම්මා"

පසුගිය දිනවල සිතේ වූ පීඩාකාරී ස්වභාවයත් සූරියතැන්න මහතා තනි කොට නිවසින් පිට යාමට හැකියාවක් නොවීමත් නිසා දෙවින්දි සාගරිගේ නිවසට යාමටවත් ගෙයින් එළියට බැස්සේ නැත. සූරියතැන්න මහතා තවමත් යථා තත්ත්වයට පත්ව නොසිටිය ද මුලදී තිබූ කම්පන සහගත ස්වභාවයෙන් අත් මිදී සිටියේය. එම නිසා ධනුෂ්ක නිවසේ නොසිටියත් හීන් බණ්ඩාගේ රැකවරණය යටතේ සූරියතැන්න මහතා තබා යාම ප්‍රශ්නයක් නොවීය. බෙහෙවින් මුරණ්ඩු බවට පත් වී සිටි මාධවීගෙන් නම් එවන් උපකාරයක් ඉල්ලීම තබා ඇගේ මුහුණ බැලීමවත් කළ හැකි දෙයක් නොවීය. මාධවී සිටියේ කෝප වූ දිවි දෙනක පරිද්දෙනි. ඇය කොයි මොහොතේ හෝ තමාගෙන් පළි ගන්නට ඉඩ ඇතැයි හැඟීමක් දෙවින්දි තුළ තිබිණි.

"අප්පච්චිටයි පුතාටයි දෙන්නටම ලොකු අර කොහෙද ඉඳල ආව වැඩකාරි තමයි..."

ධනුෂ්කත් සමග ගැටුම් ඇති කර ගත් කිහිප වරක්ම ඇය කියනවා දෙවින්දිට ඇසී තිබිණි. එවන් අවස්ථාවල දෙවින්දි කෝපයට පත් වුව ද ඇය ඉවසුවේ මාධවී කෙළින්ම ඇයට අභියෝග කරන්නට නොආ බැවිනි.

"මට තේරෙනවා පුතා, මාධවීටයි ඔයාටයි කවදාවත් අම්මයි මායි හිටියා වගේ සන්තෝසෙන් ඉන්න පුළුවන් වෙන



එකක් නෑ. දේපොළ පිට ගියා නෙමෙයි. නැත්තටම නැති වුණත් කමක් නෑ... ඔයා තමන්ට ගැලපෙන කෙනෙක් තෝර ගන්න"

සූරියතැන්න මහතා පැවසුවේ ධනුෂ්ක හා මාධවී අතර ගැටුම් උත්සන්න බවට පත් වෙමින් පවතිද්දීය. එදාම මාධවී ආපසු සිය නිවසට යාමට සූරියතැන්න මහතාගෙන් අවසර පැතුවාය.

"අම්මයි අප්පච්චියි මාධවීව භාර දීල ගියෙ මට... ඒ දෙන්නා ආවට පස්සෙ ඕන දෙයක් කරගන්න... ඒ දෙන්නා එනකම් මේ ගෙදරින් පිට වෙන්න මං ඉඩ දෙන්නෙ නෑ..."

ඔහු පැවසුවේ තිර හඬිනි. මාධවී ගස්සාගෙන එතැනින් ඉවත් වී ගියාය.

ලෙව්කේ බණ්ඩාර මහතාත් මැතිණියත් පැමිණියේ සෙනසුරාදා දිනෙකය. ඔවුන් ඉක්මනින්ම ආපසු පැමිණියේ මාධවී විසින් දෙන ලද දුරකථන ඇමතුමක් නිසා බව ඔවුන්ගේ කතා බහින් දෙවින්දි තේරුම් ගත්තාය. එය ඔවුන්ගේ පවුලේ තීරණාත්මක සාකච්ඡාවක් බැවින් ඕනට යමක් රැගෙන එතැනට යාමට ද දෙවින්දි තුළ වූයේ චකිතයකි. අනෙක් අතට ලෙව්කේ බණ්ඩාර මැතිණියගේ හා මාධවීගේ කුරිරු බැලුම්වලට ඉලක්ක වීමට ද ඇය තුළ කිසිදු කැමැත්තක් නොවීය. ධනුෂ්ක කුස්සියට පැමිණියේ ඇය තේ කළය ලිප තබා කල්පනා කරමින් සිටියදීය.

"දෙවින්දි... තේ ටිකක් හැදුව නම් හොඳයි නේද...?"

ඔහු විමසුවේ ඇය දෙස ඕනෑකමින් බලමිනි.

www.sinhalaelibrary.com

"මොනවද ඔයා කල්පනා කරන්නෙ...?"

"වතුර රත් වෙන්න තිබ්බා... මම කල්පනා කළේ කුල් ඩ්‍රින්ක් හදනව ද තේ හදනව ද කියලයි"

දෙව්න්දි සිනාසෙන්නට තැත් දරමින් පිළිතුරු දුන්නාය.

"දැන් අම්මයි දුවයි රත් වෙලා ඉන්න විදියට කුල් වතුර බවුසරයක් දාලවත් නිවන්න බැරි වෙයි මට පේන්නෙ..."

ධනුෂ්ක කීවේ සිනාසෙමිනි. ඔහු මෙවන් විහිළුවක් කරන්නේ ඉතා කලාතුරකිනි. ඇය හඬ නගා සිනාසුණාය. ධනුෂ්ක අඩියකින් දෙකකින් ඇය සමීපයට පැමිණ ඇගේ දෙඋරහිස් මත දෑත තැබුවේය. දෙව්න්දිගේ සිනාව වියැකී ගියේය. ඇයට කෙළ බිඳක් ගිලිණි. ඇය දෑස විදහාගෙන ඔහු දෙස බලා සිටියාය.

"ඔය හිනාව මගෙ ජීවිතෙන් ඈතට ගියොත් මම නිකම්ම නිකම් හිස් මිනිහෙක් වෙච්චි... මට ඔයා නැතුව බෑ දෙව්න්දි..." ඔහු පැවසුවේ ඉංග්‍රීසියෙනි.

"මොනවද සර් මේ කියන්නෙ...?" දෙව්න්දි නැති ගැන්මෙන් යුතුව ගොත ගැසුවාය.

"මට ඔහෙ ඔහොම සීදේවි විදිහට හිනා වෙලා ඉන්න කෙනෙක් ඕසක් හැම වෙලාවෙම මගෙන්තෙන්ක රණ්ඩුවට එන උද්දච්ච ගෑනියෙක් නෙමෙයි... අප්පච්චිත් කැමතියි මම දෙව්න්දිව බඳිනවට..."

"සර්..."



"කිසි දෙයක් කියන්න එපා දෙව්න්දි... ඔයා නොදන්න හිටියට මම ඔයාට ආදරේ කරන්න පටන් ගත්තෙ ඔයා මෙහෙ ආව දවස්වල ඉඳලමයි... ඔයාව මට හිමි වෙන්නෙ නැති වෙයි කියන බය හින්දමයි මම ඔයාට තදුරුකම් කළේත්..."

ඇගේ මුහුණ දෝතින් ගත් ඔහු මලක් සිප ගන්නා තරම් මුදුව ඇගේ නළලත සිප ගත්තේය. තමා බිම ඇද වැටෙනු ඇතැයි බියක් දෙව්න්දිට දැනිණි. ඇය ඔහුගේ බඳ වටා සුරත යවා ගත්තේ එහෙයිනි.

"එහෙනම් මේකයි සෙල්ලම...?"

දෙදෙනාම තිගැස්සුණේ හෙණ හඬක් බඳු ඒ උස් හඬටය. ලෙව්කේ බණ්ඩාර මැතිණිය දෑත ඉණේ රුවාගෙන ගිනි පුපුරු පිට වෙන දෑසින් ඔවුන් දෙදෙනා දෙස බලා සිටියාය. ඇය පිටුපසින් වූයේ කෝපයෙන් මුහුණ කළු කර ගත් මාධවීය. දෙව්න්දිට පොළව පලාගෙන යන තරමේ ලැජ්ජාවක් මෙන්ම මහා අසරණ හැඟීමක් ද දැනිණි. මෙතැනින් පලා යාමට ඇයට අවශ්‍ය විය. එහෙත් ධනුෂ්ක සිය ශක්තිමත් අතින් ඇගේ ඉග ග්‍රහණය කොට ගෙන සිටියේ ඇයට ආරක්ෂාවරණය සලසන්නට මෙනි.

"අම්මට මං කිව්වෙ... ඕකි මේ පවුල නැති නාස්ති කරන්න ආව යකින්නියක්..."

මාධවී සිය මව පසෙකට තල්ලු කොට ඉදිරියට පැන්නේ දෙව්න්දිට පහර දීමට මෙනි. එහෙත් පසුපසින් පැමිණි ලෙව්කේ බණ්ඩාර මහතා ඇගේ බාහුවෙන් අල්ලා ගත්තේය.

"කලබල වෙන්න එපා කොරුවට... මේවා ගින් සීරුවේ කතා බහ කරල බේරා ගන්න ඕන දේවල්..."

www.sinhalaelibrary.com

ඔහු පැවසුවේ සන්සුන් හඬිනි.

"මෙතන ආයෙ කතා බහ කරන්න දෙයක් ඉතුරු වෙලා නෑ... ධනුෂ්ක දේවින්දිව බඳිනවට මං කැමතියි..."

රෝද පුටුව පදවාගෙන කුස්සියට පැමිණි සූරියතැන්න මහතා ප්‍රසිද්ධියේම නිවේදනය කළේය. ලෙව්කේ බණ්ඩාර මැතිණිය වේගයෙන් ඔහු දෙසට හැරුණේ බමරයක් මෙනි.

"අයෙයි අයියගෙත් කතාව... පුතාට මගෙ කෙල්ල ගැලපෙන්නෙ නෑ කියමුකො. එතකොට මේ වැඩකාරකමට ආව ගෑණි පවුලට බන්දා ගන්න ද ලෑස්තිය...? මොන නව නින්දාවක් ද මේක...?"

"දේවින්දි ගැන හැන්දම්මා හරියට දන්නෙ නෑ. මෙයා මේ වලව්වක් සල්ලිවලට ගන්න පුළුවන් විදියෙ කෙනෙක්..."

ධනුෂ්ක පැවසුවේ සිනාසෙමිනි. දේවින්දි මවිතයෙන් ඔහු දෙස බැලුවාය.

"මට ඉතින් ඔය විදිහට නම් සල්ලිවලට ගන්න බැරි දෙයක් තියෙන්න බෑ..."

ලෙව්කේ බණ්ඩාර මැතිණිය පැවසුවේ අපහාසාත්මකවය.

"ඒකි කවුරු වුණත් මට කමක් නෑ... වැඩ කාරි කසාද බැඳ ගත්තා කියලා කතන්දර හැදෙන කොට කාටද රිදෙන්නෙ කියලා බලමුකො... අපි යමු අම්මා..."

මාධවී පිට වී ගියේ වේගයෙනි. තමාට පහර නොදී ඇය පිට වීම පිළිබඳව දේවින්දි මවිත වූවාය.



"උඹලා දෙන්නා හොඳට මැච් වෙනවා... මම උඹලාට සුබ පතනවා පුතා..."

ලෙව්කේ බණ්ඩාර මහතා නික්ම ගියේ එසේ ඔවුන් දෙදෙනාටම පැවසීමෙන් අනතුරුවය. තවමත් ධනුෂ්කගේ ග්‍රහණයට සිර වී සිටි දේවින්දි බිම බලා ගත්තාය. ඔවුන් දෙදෙනාට තනි වෙන්නට ඉඩ දෙන්නාක් මෙන් සූරියතැන්න මහතා ද නික්ම ගියේය. දේවින්දි පහසුවෙන් හුස්ම ගන්නට වූයේ ඉන් අනතුරුවය.

"බය වුණා නේද හොඳටම...?"

ධනුෂ්ක ඇගේ නිකටින් අල්ලා මුහුණ එසවූයේය. ඇගේ පියකරු වත සුදුමැලි පැහැ ගැන්වී තිබිණි.

"මට මොකුත් හිතා ගන්න බෑ..." ඇය මිමිණුවාය.

"ඔයා මොකුත් හිතන්න එපා... මම හැම දේම හිතල තියෙන්නෙ ඔයාටත් එක්කමයි... හැබැයි මගෙ හිතේ තියෙනවා ඔයාට හොඳ දඬුවමක් දෙන්න..."

"ඒ මොකක් ද ?"

"හැම දේම මට හැංගුවට..."

"මම කිසිම දෙයක් හැංගුවෙ නැහැ. ජොබ් එකට අදාළ තොරතුරු ඔක්කොම කිව්වා..."

දේවින්දි මිමිණුවේ සැබැවින්ම වරදක් කළ අයෙකුගේ හඬිනි.

"මාධවී ඔයයි අපේ අප්පච්චියි ගැන අර කතාව කිව්වට

www.sinhalaelibrary.com

පස්සෙ මම හොඳටම අප්සෙට් වුණා... ඊට පස්සෙ තමයි ඔයා ගැන හෙව්වෙ... අයේෂ්ලත් මට උදව් කළා..."

"මං ඔය කිසිම දෙයක් දනගෙන හිටියෙ නැහැ..."

"මං ඔයාට ආදරෙයි කියලත් ඔයා දනගෙන හිටියෙ නැහැ..."

"මං ඔයාට ආදරෙයි කියල නම් මම දනගෙන හිටියා..."

දේවින්දිට ඉබේටම කියැවිණි. එවදන් සමගම ධනුෂ්කගේ දෑතේ ග්‍රහණය දැඩි විය. ඔහුගේ දෑස සතුටින් දැල්විණි.

"ඔය වචන ටික අහගන්න මං පෙරුම් පිරුව තරම් දන්නෙ මම විතරයි..."

ඔහු ඇගේ සැලෙන දෙතොලට සිය උණුසුම් දෙතොල ළං කරමින් මිමිණීය.

- අවසානයි -

www.sinhalaelibrary.com